සැ. යු.- මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් වෙන වෙන ම පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1851/21 - 2014 පෙබරවාරි මස 26 වැනි බදාදා - 2014.02.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත**

4 (2) උපවගන්තිය යටතේ කරනු ලබන පළකිරීම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය (මෙහි මින් මතු 'ආයතනය' යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත පැවරී ඇති බලතල අනුව, ආයතනය විසින් මේ සමග පළකර ඇති, වර්ෂ දෙදහස් දහතුනේ ජනවාරි මස පළමුවැනි දින සිට බලපැවැත්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් - SLFRS සහ LKAS සඳහාවන සංශෝධන, සම්මත කර ඇති අතර, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනතේ අරමුණු සඳහා මෙම ප්‍රමිතීන් වර්ෂ දෙදහස් දහතුනේ ජනවාරි මස පළමුවැනි දින හෝ ඊට පසුව ආරම්භවන කාලපරිච්ඡේද ආවරණය කෙරෙන මුල්‍ය ප්‍රකාශන සඳහා බලාත්මක වේ.

ආයතනයේ පාලක සභාවේ අණ පරිදි,

අරුණ අල්විස්,
ලේකම්.

2014 පෙබරවාරි මස 26 වැනි දින,
කොළඹ 07,
මලලසේකර මාවත,
අංක 30 ඒ,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ දී ය.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1A - PG 1985— (2015/02)

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 2013 ජනවාරි 1 දින සිට බලාත්මක වන වෙනස්වීම්.**

පටුන

| | | | |
|---|---|---|---|
| (1) | SLFRS 1 | - | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ($SLFRS_S$) මුල්වරට භාවිත කිරීම |
| (2) | SLFRS 3 | - | ව්‍යාපාර සංයෝජන |
| (3) | SLFRS 4 | - | රක්‍ෂණ ගිවිසුම් |
| (4) | SLFRS 5 | - | විකිණීම සඳහා තබාගෙන ඇති ජංගම නොවන වත්කම් සහ අසන්තතික මෙහෙයුම් |
| (5) | SLFRS 7 | - | මූල්‍ය සාධන පත්‍ර : හෙළිදරව් කිරීම |
| (6) | LKAS 1 | - | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම |
| (7) | LKAS 2 | - | තොග |
| (8) | LKAS 8 | - | ගිණුම් ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි |
| (9) | LKAS 12 | - | ආදායම් බදු |
| (10) | LKAS 18 | - | අයභාරය |
| (11) | LKAS 19 | - | සේවක ප්‍රතිලාභ |
| (12) | LKAS 20 | - | රාජ්‍ය ප්‍රදාන සඳහා ගිණුම්කරණ සහ රාජ්‍ය අනුග්‍රහයන් හෙළිදරව් කිරීම |
| (13) | LKAS 21 | - | විදේශ විනිමය අනුපාතිකයන්හි වෙනස්කම්වල බලපෑම |
| (14) | LKAS 27 | - | ඒකාබද්ධ සහ වෙන් වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශන |
| (15) | LKAS 28 | - | ආශ්‍රිතයන්හි ආයෝජන |
| (16) | LKAS 31 | - | බද්ධ ව්‍යාපාරයන්හි හිමිකම් |
| (17) | LKAS 32 | - | මූල්‍ය සාධනපත්‍ර ඉදිරිපත් කිරීම |
| (18) | LKAS 36 | - | වත්කම් හානිකරණය |
| (19) | LKAS 37 | - | ප්‍රතිපාදන අසම්භව්‍ය වගකීම් සහ අසම්භව්‍ය වත්කම් |
| (20) | LKAS 39 | - | මූල්‍ය සාධනපත්‍ර හඳුනාගැනීම සහ මැණීම |

SLFRS 1 - **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මුල්වරට භාවිත කිරීම**

| *ප්‍රමිතය* | *පවත්නා ඡේදය යොමු කිරීම* | *ආදේශ කළ / එකතු කළ ඡේදය* |
|---|---|---|
| SLFRS 1 | 29 ඡේදය | ඇ19 ඡේදය ප්‍රකාර අස්තිත්වයකට කලින් හඳුනාගත් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වගකීමක්, ලාභ හෝ අලාභ මගින් සාධාරණ වටිනාකමට මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වගකීමක් ලෙස හෝ විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කමක් ලෙස නම් කිරීමට අවසර ඇත. අස්තිත්වයක් එක් එක් ප්‍රභේදයට නම් කල මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම්, ඒවා නම්කළ දිනට සාධාරණ වටිනාකම සහ ඒවායේ කලින් මූල්‍ය ප්‍රකාශනයන්හි වර්ගීකරණය සහ ධාරණ වටිනාකම හෙළිදරව් කළ යුතු ය. |
| | 29 අ ඡේදය | (ඉවත් කරන ලදී) |

SLFRS3 **ව්‍යාපාර සංයෝජන**

| *ප්‍රමිතය* | *පවත්නා ඡේදය යොමු කිරීම* | *ආදේශ කළ / එකතු කළ ඡේදය* |
|---|---|---|
| SLFRS 3 | 16 (අ) ඡේදය | LKAS 39 *මූල්‍ය සාධන පත්‍ර, හඳුනා ගැනීම සහ මැනීම* ප්‍රකාර විශේෂ මූල්‍ය වත්කමක් හෝ වගකීමක් ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම හෝ විකිණීම සඳහා තබාගත් මූල්‍ය වත්කමක් ලෙස හෝ කල්පිරීම තෙක් තබාගන්නා මූල්‍ය වත්කම් ලෙස හෝ වගකීම් ලෙස ''වර්ගීකරණය'' කළ හැකිය. |
| | 16 (ඇ) ඡේදය | LKAS 39 ප්‍රකාර නිහිත ව්‍යුත්පන්නයක්, සත්කාරක ගිවිසුමකින් වෙන්කළ යුතු ද යන්න තක්සේරු කිරීම (මෙම SLFRS එම පදය භාවිතා කරන නිසා එය ''වර්ගීකරණය'' පිළිබඳ කරුණකි). |
| | 42 ඡේදය | අදියර වශයෙන් සපුරාගන්නා ව්‍යාපාර සංයෝජනයක, අත්පත්කරගන්නා විසින්, අත්පත්කර ගැනීමට භාජනය වන්නාගේ ව්‍යාපාරයෙහි, මුලින් අත්පත්කරගෙන තිබුණ ස්කන්ධ අයිතිය, අත්පත්කරගනු ලබන දිනයේ සාධාරණ වටිනාකමම නැවත මිණුම්කර, ප්‍රතිඵලය වන ප්‍රතිලාභ හෝ අලාභ ඇතොත්, ඒවා ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනාගත යුතු ය. පෙර වාර්තාකරණ කාලපරිච්ඡේදවල දී අත්පත්කරගන්නා විසින් අත්පත් කරගැනීමට භාජනය වන්නාගේ ස්කන්ධ අයිතියෙහි, හඳුනාගත් වටිනාකමේ වෙනස්වීම්, වෙනත් විස්තීර්ණ ආදායමෙහි හඳුනාගෙන තිබිය හැකිය. (උදාහරණ ලෙස, ආයෝජනය විකිණීම සඳහා තැබූ ලෙස වර්ගීකරණයකර තිබීම නිසා). එසේනම්, වෙනත් විස්තීර්ණ ආදායමෙහි හඳුනාගෙන ඇති මුදල් ප්‍රමාණය, අත්පත්කරගන්නා කලින් අයත්කර ගෙන තිබුණ ස්කන්ධ අයිතිය, අවශ්‍යතාවය නිසා ඍජුවම බැහැර කළේ නම් යන පදනම මතම හඳුනාගත යුතු ය. |
| | 53 ඡේදය | ව්‍යාපාර සංයෝජනය ක්‍රියාත්මක කිරීමට, අත්පත්කරගන්නා විසින් දරණු ලබන පිරිවැය, අත්පත්කරගැනීමට සම්බන්ධ පිරිවැයයි. එම පිරිවැය සොයාගන්නාගේ ගාස්තු, උපදෙස් ලබා ගැනීම, නීති, ගිණුම්කරණ, තක්සේරු සහ වෙනත් වෘත්තීයමය හෝ උපදේශන ගාස්තු, අභ්‍යන්තර අත්පත් කරගැනීමේ දෙපාර්තමේන්තුවක් නඩත්තු කිරීමේ පිරිවැය ඇතුළත්ව, පොදු පරිපාලන පිරිවැය, සහ ලියාපදිංචි කිරීම, ණය නිකුත් කිරීම සහ ස්කන්ධ සුරැකුම් පිරිවැය ඇතුළත් වෙයි. අත්පත් කරගන්නා විසින් එක් ව්‍යතිරේකයක් සමඟ අත්පත් කරගැනීමට සම්බන්ධ පිරිවැය සඳහා එම පිරිවැය, වැයවූ සහ සේවාවන් ලැබුණු කාලපරිච්ඡේදයන්හි වියදම් ලෙස ගිණුම්ගතකළ යුතු ය. ණය හෝ ස්කන්ධ සුරැකුම් නිකුත් කිරීමට වූ පිරිවැය LKAS 32 සහ LKAS 39 ප්‍රකාරව හඳුනාගත යුතු ය. |

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශ කළ / එකතු කළ ඡේදය |
|---|---|---|
| | 56 ඡේදය | මෙම අවශ්‍යතාවය <u>LKAS 39</u> ප්‍රකාර ගිණුම්ගත කර ඇති ගිවිසුම්වලට භාවිතා නොකරයි. |
| | 58 (අ) (i) ඡේදය | මුල්‍ය සාධන පත්‍රයක් සහ LKAS 39 හි විෂයය පථය තුළ සාධාරණ වටිනාකමට මිණුම් කළ යුතු, ප්‍රතිඵලයවන යම් ප්‍රතිලාභ හෝ අලාභ, ලාභයේ හෝ අලාභයේ හෝ වෙනස් විස්තීර්ණ ආදායමක ඒ SLFRS ප්‍රකාරවම හඳුනාගත හැකිවීම. |
| | 58 (ආ)(ii) ඡේදය | LKAS 39 විෂයය පථය තුළ නොවේ නම්, LKAS 37 හෝ වෙනත් උචිත SLFRS ප්‍රකාරව ගිණුම්ගත කළ යුතු ය. |

SLFRS 4 **රක්ෂණ ගිවිසුම්**

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශ කළ / එකතු කළ ඡේදය |
|---|---|---|
| SLFRS 4 | 3 ඡේදය | **<u>ඡෙද අංක 45</u>** වන ඡේදයේ දක්වා ඇති සංක්‍රාන්ති ප්‍රතිපාදන හැර, රක්ෂණකරු විසින් පවත්වා ගන්නා මුල්‍ය වත්කම් සහ රක්ෂණකරු විසින් නිකුත් කරන මුල්‍ය වගකීම් සඳහා ගිණුම්කරණය වැනි, රක්ෂණකරු විසින් අනෙකුත් ආකාරයන් පිළිබඳව මෙම SLFRS ආමන්ත්‍රණය නොකරයි. (LKAS 32 **මුල්‍ය සාධන පත්‍ර ඉදිරිපත් කිරීම**, LKAS 39 **මුල්‍ය සාධන පත්‍ර හඳුනාගැනීම සහ මැනීම සහ <u>SLFRS 7</u>** බලන්න.) |
| | 4 (ඇ) ඡේදය | නිකුත් කරනා විසින් එවැනි ගිවිසුමක් රක්ෂණ ගිවිසුමක් ලෙස සලකන බව පැහැදිලිව කළින් තහවුරු කර නොමැති නම්, සහ රක්ෂණ ගිවිසුම්වලට අදාළ ගිණුම්කරණය භාවිතාකර නොමැති නම්, එවැනි මුල්‍ය සහතික ගිවිසුම්, මෙවැනි අවස්ථාවල නිකුත්කරන්නා විසින් **<u>LKAS 39, LKAS 32 සහ SLFRS 7</u>** හෝ මෙම ප්‍රමිතය එවැනි මුල්‍ය සහතික ගිවිසුම් සඳහා ව්‍යවහාරයට ගත හැකි ය. නිකුත්කර ගන්නා විසින් ගිවිසුමෙන් ගිවිසුමට මෙම තෝරා ගැනීම සිදු කිරීමට ඉඩ තිබෙන නමුත් සෑම ගිවිසුමක් සඳහාම තෝරාගැනීම අවලංගු කළ නොහැකිය. |
| | 7 ඡේදය | අස්තිත්වයකට සමහර නිහිත ව්‍යුත්පන්න ද, ඔවුන්ගේ සත්කාරක ගිවිසුමෙන් වෙන් කිරීමට ඒවා සාධාරණ වටිනාකමට මිණුම් කිරීම සහ ඒවායේ සාධාරණ වටිනාකම් වෙනස්වීම් ලාභයෙහි හෝ අලාභයෙහි ඇතුළත් කිරීම, **<u>LKAS 39</u>** මගින් අවශ්‍ය වේ. නිහිත ව්‍යුත්පන්නයන් එය විසින්ම රක්ෂණ ගිවිසුමක් නොවන්නේ නම් මිස රක්ෂණ ගිවිසුමක් තුළ ඇති නිහිත ව්‍යුත්පන්නයන්ම **<u>LKAS 39</u>** අදාළ වේ. |
| | 8 ඡේදය | **<u>LKAS 39 හි අවශ්‍යතාවයන්ට</u>** ව්‍යාතිරේඛයක් වශයෙන්, **සත්කාරක රක්ෂණ වගකීමෙහි** ධාරණ අගයෙන් යොදාගනු ලබන මිල වෙනස් වුවත්, ස්ථිර අගයකට (හෝ ස්ථිර සහ පොලී අනුපාතිකයක් පදනම් කරගත් අගයක් සඳහා) රක්ෂණ ගිවිසුමක් පවාරණය කිරීමේ රක්ෂණ ඔප්පු හිමියකුගේ විකල්පය, රක්ෂණකරුවෙකු විසින් වෙන්ව දක්වීම හෝ සාධාරණ අගයට මැණීම අවශ්‍ය නොවේ. කෙසේ වෙතත්, මුල්‍ය විචල්‍යයන්ගේ (ස්කන්ධය හෝ භාණ්ඩ මිල හෝ දර්ශක) හෝ ගිවිසුමෙහි පාර්ශවයකට විශේෂිත නොවන මුල්‍ය විචලනයක වෙනස්වීම්වලට ප්‍රතිචාර ලෙස, පවාරණ අගය වෙනස්වේ නම්, **<u>LKAS 39 හි අවශ්‍යතාවයන් ගැණුම්</u>** විකල්පයකට හෝ රක්ෂණ ගිවිසුමක අන්තර්ගත මුදල් පවාරණ විකල්පයකට අදාළ වේ.<br><br>තවදුරටත් යෙදවුම් විකල්පයක් යොදාගැනීමට දරන්නාගේ හැකියාව හෝ මුදල් පවාරණ විකල්පය එවැනි විචල්‍යයකින් වෙනස්වීමක් මගින් උත්තේජනය වූ විට, **<u>එම අවශ්‍යතාව යොදාගනු ලබයි</u>**. (උදාහරණ ලෙස, කොටස් වෙළඳ පොළ දර්ශක විශේෂිත මට්ටමකට ලඟාවන්නේ නම් ගැණුම් විකල්ප යොදාගත හැකි ය.) |

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශ කළ / එකතු කළ ඡේදය |
|---|---|---|
| | 12 (ආ) ඡේදය | **LKAS 39** තැන්පතු සංවරවකයට ව්‍යවහාර කළ යුතු ය |
| | 34 (ඇ) ඡේදය | **LKAS 39** හි විෂය පථය තුළ ඇති නහිත ව්‍යුත්පන්නයක් ගිවිසුම තුළ ඇතුලත්වේ නම්, එම නිහිත ව්‍යුත්පන්නයම **LKAS 39** ව්‍යවහාර වෙයි. |
| | 35 (අ) ඡේදය | නිකුත්කරන්නා විසින් සමස්ථ අභිමතානුසාරී සහභාගිවීමේ ලක්‍ෂණය වගකීමක් ලෙස වර්ගීකරණය කරයි නම් 15-19 ඡේදවල ඇති වගකිම් ප්‍රමාණවත් පරීක්‍ෂාව සමස්ථ ගිවිසුමට ව්‍යවහාර කළ යුතු ය. (එනම්, සහතික කළ මුලිකාංග සහ අභිමතානුසාරි සහභාගිවීමේ ලක්‍ෂණය යන දෙකම). LKAS 39 සහතික කළ මුලිකාංගය ව්‍යවහාර කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන අගය නිකුත් කරන්නා විසින් නිර්ණය කිරීම අවශ්‍ය නොවේ. |
| | 35 (ආ) ඡේදය | නිකුත් කරන්නා විසින් එම ලක්‍ෂණ කොටසක් හෝ සමස්ථයම වෙනම ස්කන්ධ සංරචකයන් වශයෙන් වර්ගීකරණය කරයි නම්, සමස්ත ගිවිසුම සඳහා හඳුනාගන්නා ලද වගකීම් LKAS39 සහතික මුලිකාංගය ව්‍යවහාර කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන අගයට වඩාත් අඩු නොවිය යුතු ය. ගිවිසුම පවාරණය කිරීමට විකල්පයේ නෛසර්ගික වටිනාකම එම අගයට ඇතුලත් කළ යුතු නමුත් 9 වන ඡේදය මගින් එම විකල්පය සාධාරණ වටිනාකමක මැනීමෙන් නිදහස් කරනු ලබන්නේ නම්, එහි කාලීන වටිනාකම ඇතුළත් කිරීම අවශ්‍ය නොවේ. නිකුත් කරන්නා විසින් සහතික කළ මුලිකාංගයට LKAS 39 ව්‍යවහාර කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවන අගය හෙළිදරව් කිරීම මෙන්ම එම අගය වෙනම ඉදිරිපත් කිරීම ද අවශ්‍ය නොවේ. තවදුරටත් හඳුනාගන්නා ලද මුළු වගකීම පැහැදිලිවම ඉහළ නම් නිකුත් කරන්නා එම අගය නිර්ණය කිරීම අවශ්‍ය නොවේ. |

## SLFRS 5 විකිණීම සඳහා තබාගෙන ඇති සහ අසන්තතික මෙහෙයුම්වල ජංගම නොවන වත්කම්

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශ කළ / එකතු කළ ඡේදය |
|---|---|---|
| SLFRS 5 | 5 (ඇ) ඡේදය | LKAS 39 ***මූල්‍ය සාධන පත්‍ර හඳුනා ගැනීම සහ මැණීම්*** **කිරීමේ** විෂය පථය ඇතුළත මූල්‍ය වත්කම් |

## SLFRS 7 මූල්‍ය සාධන පත්‍ර හෙළිදරව් කිරීම

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශ කළ / එකතු කළ ඡේදය |
|---|---|---|
| SLFRS 7 | 2 ඡේදය | මෙම SLFRS හි අඩංගු මුලධර්ම, LKAS 32 මූල්‍ය සාධන පත්‍ර ඉදිරිපත් කිරීම සහ ***LKAS 39 මූල්‍යසාධන පත්‍ර හඳුනාගැනීම සහ මැනිම*** යන ඒවායේ සඳහන් වන, මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හඳුනා ගැනීම, මැනීම සහ ඉදිරිපත් කිරීම වූ මුලධර්මවලට අනුපුරකයක් වේ. |
| | 3 (අ) ඡේදය | ***ඒකාබද්ධ සහ වෙන්ව මූල්‍ය ප්‍රකාශන*** සඳහා වන LKAS 27 සහ ආශ්‍රිතයන්ගේ ආයෝජන සඳහා වන LKAS 28 හෝ බද්ධ ව්‍යාපාරවල හිමිකම් සඳහා වන LKAS 31 ප්‍රකාරව ගිණුම් තබා ඇති පරිපාලිතයන්ගේ, ආශ්‍රිතයන්ගේ හෝ බද්ධ ව්‍යාපාරයන්හි අයිතීන් ගිණුම් තැබීම. කෙසේ වෙතත් සමහර අවස්ථාවල LKAS 27, LKAS 28 හෝ LKAS 31 මගින් පරිපාලිතයක, ආශ්‍රිතයක හෝ බද්ධ ව්‍යාපාරයක හිමිකමක්, **LKAS 39** යොදාගනිමින් ගිණුම් තැබීමට අස්තිත්වයන්ට අවසර දී ඇත. එවැනි අවස්ථාවල දී අස්තිත්වය විසින් මෙම SLFRS හි අවශ්‍යතා ව්‍යවහාර කළ යුතු ය. යම්කිසි ව්‍යුත්පන්නයක් LKAS 32 හි නිර්වචනය කර ඇති ස්කන්ධ සාධන පත්‍රයක අවශ්‍යතා සපුරාලන්නේ නම් හැර, පරිපාලිතයක, ආශ්‍රිතයක, බද්ධ ව්‍යාපාරයක අයිතිය හා බැඳුන සියලුම ව්‍යත්පන්නයන් සඳහා අස්තිත්වයන් මෙම SLFRS ව්‍යවහාර කළ යුතු ය. |

| ප්‍රමිතය | පවත්නා ජේදය යොමු කිරීම | ආදේශ කළ / එකතු කළ ජේදය |
|---|---|---|
| | 3 (ඈ) ජේදය | SLFRS 4 **රක්‍ෂණ ගිවිසුම්** හි නිර්වචනය කර ඇති පරිදි රක්‍ෂණ ගිවිසුම් කෙසේ වෙතත් ඒවා LKAS 39 අනුව අස්තිත්වය වෙනම ගිණුම්ගත කිරීම අවශ්‍ය වනවිට, රක්‍ෂණ ගිවිසුම්වල අනුයුක්ත ව්‍යුත්පන්න සඳහා මෙම SLFRS ව්‍යවහාර වේ, එම නිකුත් කරන්නා මෙම SLERS ව්‍යවහාර කළ යුතුය. ඒ ඇරත් නිකුත් කරන්නා ගිවිසුම හඳුනා ගැනීමේ දී සහ මැනීමේ දී LKAS 39 ව්‍යවහාර කරන්නේ නම් නිකුත් කරන්නා මූල්‍ය ඇප ගිවිසුම සඳහා මෙම SLFRS ව්‍යවහාර කළ යුතුය. එහෙත් ඒවා හඳුනාගැනීම සහ මැණීම සඳහා නිකුත් කරන්නා SLFRS හි ජේදය 4 (ඈ) ප්‍රකාරව කරන්නේ නම්, එවැනි අවස්ථාවල දී නිකුත් කරන්නා විසින් SLFRS 4 ව්‍යවහාර කළ යුතු ය. |
| | 3 (ඉ) ජේදය | SLFRS 2 කොටස් පදනම් ගෙවීම්, ව්‍යවහාර වන ගෙවීම් ගණුදෙනු යටතේ වූ මූල්‍ය සාධන පත්‍ර ගිවිසුම් හා බැඳීම් හැර, LKAS 39 (5-7) ජේද දක්වා විෂය පථය යටතේ ගැනෙන ගිවිසුම් සඳහා මෙම SLFRS ව්‍යහාර වේ. |
| | 4 ජේදය | මෙම SLFRS හඳුනාගත් හෝ හඳුනා නොගත් මූල්‍ය සාධන පත්‍ර, සඳහා ව්‍යවහාර වේ. හඳුනාගත් මූල්‍ය සාධන පත්‍ර වලට **LKAS 39** හී විෂය පථය යටතේ ගැනෙන මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් ඇතුළත් වේ. **LKAS 39** විෂය පථයෙන් පරි බාහිර වුවද මෙම SLFRS හි පථයට යටත්ව ගැනෙන සමහර මූල්‍ය සාධන පත්‍ර හඳුනා නොගත් මූල්‍ය සාධන පත්‍ර වලට ඇතුළත් වේ. (සමහර ණය සඳහා බැඳීම් මෙන්) |
| | 5 ජේදය | LKAS 39 ( LKAS 39 ජේද 5-7 බලන්න) විෂය පථයට වැටෙන විකිණීම හෝ මිලදී ගැනීම සඳහා වන මූල්‍ය නොවන අයිතමයක් සඳහා වන ගිවිසුම් සඳහා මෙම SLFRS , ව්‍යවහාර වේ. |
| | 8 ජේදය | **LKAS** 39 **හි** නිර්වචනය කර ඇති පරිදි සඳහන් සෑම ප්‍රවර්ගයකම ධාරණ අගයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනගේ හෝ සටහන් වල හෙළිදරව් කළ යුතු ය. |
| | 8 (අ) ජේදය | ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට වන මූල්‍ය වත්කම් පහත පරිදි වෙනම පෙන්නුම් කරමින් (i) මූලික හඳුනා ගැනීම මත නම් කල මූල්‍ය වත්කම් සහ (ii) LKAS 39 ප්‍රකාරව වෙළෙඳාම සඳහා තබා ගෙන ඇති මූල්‍ය වත්කම ලෙස නම් කරන ලද වැනි |
| | 8 (ආ) ජේදය | **පරිණතවීම තෙක් තබා ගන්නා ආයෝජන** |
| | 8 (ඇ) ජේදය | ණය සහ ලැබිය යුතු දෑ |
| | 8 (ඈ) ජේදය | විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් |
| | 8 (ඉ) ජේදය | (i) මුල්වරට හඳුනාගැනීම අනුව නම් කරන ලද ඒවා ; සහ<br>(ii) **LKAS 39 ප්‍රකාරව වෙළඳාම සඳහා තබාගන්නා ලද** ඒවා, වෙන වෙනම පෙන්වමින් ලාභ හෝ අලාභ මගින් මූල්‍ය වගකීම් සාධාරණ අගයට ; සහ |
| | 8 (උ) ජේදය | [ඉවත්කරන ලදී.] |
| | 8 (ඌ) ජේදය | [ඉවත්කරන ලදී.] |
| | 9 ජේදය | අස්තිත්වය විසින් **ණයක් හෝ ලැබිය යුතු මුදලක් ලාභ හෝ අලාභ මගින් සාධරණ වටිනාකමට නම්කර ඇත්නම්, (ණය කාණ්ඩයක් හෝ ලැබිය යුතු දෑ)** අස්තිත්වය පහත දෑ හෙළිදරව් කළ යුතු ය. |
| | 9 (අ) ජේදය | වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ දී ණය හෝ ලැබිය යුතු දෑ (**ණය කාණ්ඩයක් හෝ ලැබිය යුතු දෑ)** පිළිබඳව ණය අවදානම් මුහුණ දෙන උපරිමය අනාවරණය (ජේද 36 (අ) බලන්න); |

| ප්‍රමිතය | පවත්නා ජේදය යොමු කිරීම | ආදේශ කළ / එකතු කළ ජේදය |
|---|---|---|
| | 9 (ඇ) ජේදය | ණය හෝ ලැබිය යුතු දැවල (ණය කාණ්ඩයක් හෝ ලැබිය යුතු දෑ) කාලපරිච්ජේදය තුළ සහ සමුච්චිත සාධාරණ වටිනාකමේ වෙනස්වීම් ප්‍රමාණය මූල්‍ය වත්කම්වල ණය අවදානමේ වෙනස්වීම්වලට ආරෝපනය නිර්ණය කළ යුත්තේ,එක්කෝ ; |
| | 9 (ඇ) ජේදය | කිසියම් ණය යුත්පන්නයක හෝ සමාන සාධන පත්‍රයක කාලපරිච්ජේදය තුළදී සිදුවූ සහ **ණය හෝ ලැබිය යුතු දෑ ලෙස නම් කල** දින සිට සමුච්චිත සාධාරණ වටිනාකමේ වෙනස්වීමේ ප්‍රමාණය. |
| | 10 ජේදය | අස්තිත්වයක් විසින් මූල්‍ය වගකීමක් ලාභ හෝ අලාභ මගින් සාධාරණ වටිනාකමට නම්කර ඇත්නම් එය **LKAS 39 හි 9** වන ජේදය ප්‍රකාරව පහත සඳහන් දෑ හෙළිදරව් කළ යුතු ය.<br>(අ) මූල්‍ය වගකීමේ **කාලපරිච්ජේදය තුල** සහ සමුච්චිත සාධාරණ වටිනාකමේ වෙනස්වීම, එම වගකීමේ ණය අවදානමේ වෙනස්වීම් වලට ආරෝපණය නිර්ණය කළ යුත්තේ එක්කෝ,<br>(i) වෙළඳපොළ අවදානම් මතුවීමට (පරිශිෂ්ට ආ හි ආ 4 ජේදය බලන්න) ආරෝපණීය නොවන වෙළඳපොළ තත්ත්වයන් වෙනස්වීම් මත සාධාරණ වටිනාකමේ වෙනස්වන ප්‍රමාණය, හෝ<br>(ii) අස්තිත්වය විශ්වාස කරන අන්දමට එහි සාධාරණ වටිනාකමේ වෙනස්වීමට අදාල වගකීමේ ණය අවදානමේ ආරෝපණීය වෙනස්වීම විශ්වාසදායක ලෙස නියෝජනය වන වෙනත් විකල්ප ක්‍රමයක් භාවිතා කිරීම මගිනි.<br>වෙළඳපොළ අවදානම පැනනැගීමට තුඩුදෙන වෙළඳපොළක තත්ත්වයක් හෝ වෙනස්වීම්වලට පාදක මිම්ම වූ පොලී අනුපාතිකය, වෙනත් අස්තිත්වයක මූල්‍ය සාධන පත්‍රවල මිල, වෙළඳ භාණ්ඩයක මිල, විදේශ විනිමය අනුපාතික මිල හෝ අනුපාතික දර්ශකයක වෙනස්වීම් ඇතුළත්වේ. ඒකක සම්බන්ධිකරණ ලක්ෂණ ඇතුළත් ගිවිසුම් සඳහා වෙළඳපොළ තත්වයන් වෙන්සවීම්වලට අදාළ අභ්‍යන්තර හෝ බාහිර ආයෝජන අරමුදල්වල කාර්ය සාධනයෙහි වෙනස්වීම් ඇතුළත්ය.<br>(ආ) කල්පිරීමේ දී අස්තිත්වය විසින් බැඳීම දරන්නාට ගිවිසුම අනුව ගෙවිය යුතු මුදල සහ මූල්‍ය වගකීම්වල ධාරණ අගය අතර වෙනස |
| | 10 (ඇ) (ඈ) ජේදය | ඉවත් කරන ලදී |
| | 10 (අ) ජේදය | ඉවත් කරන ලදී |
| | 11ජේදය | අස්තිත්වයක් විසින් **හෙළිදරව් කළ යුතුය**. |
| | 11 (අ) ජේදය | 9 (ඇ) සහ 10 (අ) ජේදවල, සඳහන් අවශ්‍යතාවලට අනුකූලවීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රම. |
| | 11 (ආ) ජෙදය | 9 (ඇ) හෝ 10 (අ) ජේද වල කරුණුවලට අනුකූලවීම සඳහා අස්තිත්වයක් විසින් හෙළිදරව් කළ එහි ණය අවදානම වෙනස්වීමේ ආරෝපණය මූල්‍ය වත්කම්වල සහ මූල්‍ය වගකීම්වල සාධාරණ වටිනාකමේ වෙනස්වීම් විශ්වාසදායක ලෙස නියෝජනය නොවන බව අස්තිත්වය විශ්වාස කරන විට එම නිගමනයට එළඹීමට හේතු සහ අදාළයැයි එය විශ්වාස කරන සාධක අස්තිත්වය විසින් හෙළිදරව් කළ යුතුය. |
| | 11 (ඇ) ජේදය | [ඉවත්කරන ලදී] |
| | | **යළිවර්ගීකරණය** |
| | 11 අ ජේදය | [ඉවත්කරන ලදී] |
| | 11 ආ ජේදය | [ඉවත් කරන ලදී] |

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශ කළ / එකතු කළ ඡේදය |
|---|---|---|
| | 12 ඡේදය | අස්තිත්වයක් පහත දැක්වෙන පරිදි මනින ලද මූල්‍ය වත්කමක් (LKAS 39, ඡේද අංක 51- 54 ප්‍රකාර) යළි වර්ගීකරණය කර ඇත්නම්,<br>(අ) සාධාරණ වටිනාකම වෙනුවට පිරිවැයට හෝ ක්‍රමක්ෂය පිරිවැයට ; හෝ<br>(ආ) පිරිවැයට හෝ පිරිවැය වෙනුවට සාධාරණ වටිනාකමට, එක් එක් ප්‍රභේදය තුළට හෝ ඉන් පිටතට යළි වර්ගීකරණය කරන ලද වටිනාකම සහ එසේ යළි වර්ගීකරණය කිරීමට හේතූන් හෙළිදරව් කළයුතු ය. |
| | 12 අ ඡේදය | අස්තිත්වය විසින් LKAS 39 හි 50 (ආ) ඡේදය හෝ 50 (ඇ) ඡේදය ප්‍රකාරව ලාභ හෝ අලාබ මගින් සාධාරණ වටිනාකම ප්‍රභේදය යටතේ හෝ LKAS 39 හි 50 (ඉ) ඡේදය ප්‍රකාරව විකිණීම සඳහා ඇති ප්‍රභේදය යටතේ වූ මූල්‍ය වත්කමක් යළි වර්ගීකරණය කළහොත්, එවිට හෙළිදරව් කළ යුතු ය.<br>(අ) එක් එක් ප්‍රභේදය තුළට හෝ ඉන් පිටතට වර්ගීකරණය කරන ලද වටිනාකම්;<br>(ආ) ප්‍රතිහඳුනාගැනීම කරනතෙක් සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් සඳහා ප්‍රවර්තන සහ පෙර වාර්තා කරන ලද කාලපරිච්ඡේදයක් තුළදී යළි වර්ගීකරණය කරන ලද සියලුම මූල්‍ය වත්කම්වල ධාරණ වටිනාකම් සහ සාධාරණ වටිනාකම්,<br>(ඇ) 50 (අ) ඡේදය යටතේ මූල්‍ය වත්කමක් යළි වර්ගීකරනය ලද්දේ නම්, එම විරල අවස්ථාව සහ එම අවස්ථාව විරලබව දැක්වීමට හේතු සහ පසුබිම්,<br>(ඈ) වාර්තාකරණ කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය වත්කමක් යළි වර්ගීකරණය කිරීම නිසා, එම වාර්තාකරන කාලපරිච්ඡේදය තුළදී ලාභ හෝ අලාභ හෝ වෙනත් විස්තීර්ණ ආදායම්වල හඳුනාගත් මූල්‍ය වත්කමක සාධාරණ වටිනාකමේ ප්‍රතිලාභ හෝ අලාභයන්,<br>(ඉ) යළි වර්ගීකරණය කිරීමෙන් පසුව එළඹෙන වාර්තාකරණ සෑම කාලපරිච්ඡේදයක් සඳහා (මූල්‍ය වත්කම් යළි වර්ගීකරණය කරන කාල පරිච්ඡේදය ඇතුළත්ව) මූල්‍ය වත්කම ප්‍රතිහඳුනා ගැනීම, කරන තෙක් ලාභ හෝ අලාභවල හෝ වෙනත් විස්තීර්ණ ආදායම්වල හඳුනාගත් සාධාරණ වටිනාකමේ ප්‍රතිලාභ සහ අලාභයන් මූල්‍ය වත්කම යළි වර්ගීකරණයක් නොකළේ නම්, ලාභ හෝ අලාභවල හඳුනාගත් ප්‍රතිලාභ, අලාභ, ආදායම් සහ වියදම්, සහ<br>(ඊ) මූල්‍ය වත්කම් යළි වර්ගීකරණය කළ දිනට සඵල පොළී අනුපාතිකය සහ අස්තිත්වය අයකර ගැනීමට බලාපොරොත්තු වන මුදල් ප්‍රවාහවල ඇස්තමේන්තු කළ මුදල. |
| | 12 ආ ඡේදය | [ඉවත් කරන ලදී] |
| | 12 ඇ ජෙදය | [ඉවත් කරන ලදී] |
| | 12 ඈ ඡේදය | [ඉවත් කරන ලදී.] |
| | 14 (අ) ඡේදය | LKAS39 හි 37 (අ) ඡේදය ප්‍රකාරව යළි වර්ගීකරණය කරන ලද වගකීම්වල වටිනාකම ද ඇතුළුව වගකීම් හෝ අසම්භාව්‍ය වගකීම් සඳහා අතිරේක ඇපයක් ලෙස ඔඩපනය කරන ලද මූල්‍ය වත්කම්වල ධාරණ වටිනාකම; සහ |
| | 20 (අ)(i) ඡේදය | ලාභ හෝ අලාභ මගින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සාධාරණ වටිනාකමට, මූලික හඳුනාගැනීමේ දී මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් ලෙස නම් කළ ඒවා සහ LKAS 39 ප්‍රකාරව විකිණීම සඳහා තබාගත් ලෙස වර්ගිකරණය කළ මූල්‍ය වත්කම් සහ වගකීම් මත වෙන්ව පෙන්වමින්, ලාභ හෝ අලාභ තුළින් සාධාරණ වටිනාකමට වූ මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් ; |

| ප්‍රමිතය | පවත්නා ජේදය යොමු කිරීම | ආදේශ කළ / එකතු කළ ජේදය |
|---|---|---|
| | 20 (අ)(ii) ජේදය | විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්, කාලපරිච්ජේදය සඳහා විස්තීර්ණ ආදායමේ, හඳුනාගත් ප්‍රතිලාභ සහ අලාභවල වටිනාකම සහ කාලපරිච්ජේදය සඳහා ස්කන්ධයෙන් ලාභයට හෝ අලාභයට යලි වර්ගකරණ ලද වටිනාකම වෙන්ව පෙන්වමින්, විකිණීමට ඇති මූල්‍යවත්කම්, |
| | 20 (අ)iii ජේදය | කල්පිරීම තෙක් තබාගෙන ඇති ආයෝජන, |
| | ජේදය 20 (අ)iv | ණය සහ ලැබිය යුතු දෑ; සහ |
| | 20 (අ)vi ජේදය | [ඉවත්කරන ලදී] |
| | 20 (අ)vii ජේදය | [ඉවත්කරන ලදී] |
| | 20 (ආ) ජේදය | ලාභ හෝ අලාභ තුළින් සාධාරණ වටිනාකම නොමැති මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් සඳහා මුළු පොළී ආදායම සහ මුළු පොළී වියදම (සඵල පොළී ක්‍රමය භාවිතා කර ගණනය කළ) |
| | 20 (ඇ) (i) ජේදය | සාධාරණ වටිනාකමට නොමැති මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ හරහා සහ |
| | 20 (ඈ) ජේදය | LKAS 39 හි අළ 93 ජේදය ප්‍රකාරව හාණිකරණය වූ මූල්‍ය වත්කම්වල උපචිත පොළී ආදායම් සහ |
| | 20 අ ජේදය | [ඉවත්කරන ලදී.] |
| | 28 ජේදය | මූල්‍ය සාධන පත්‍රයක් සඳහා ඇති වෙළඳපොළ සක්‍රීය නොවන්නේ නම් අස්තිත්වයක් විසින් එහි සාධාරණ වටිනාකම තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රමයක් භාවිතා කිරීමෙන් ස්ථාපිත කරයි. (*LKAS* 39 හි ජේද අළ 74 අළ 79 බලන්න) එහෙත් *LKAS* 39 හි අළ 76 ජේදය විස්තර කර ඇති කොන්දේසි සපුරා නැත්නම් මූලික හඳුනාගැනීමේදී සාධාරණ වටිනාකම සඳහා හොඳම උදාහරණය වන්නේ ගණුදෙනු මිලයි. තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රමයක් භාවිතා කරමින් එම දිනට නිර්ණය කළ වටිනාකම සහ මූලික හඳුනාගැනීමේ දී වූ සාධාරණ අගය අතර වෙනසක් තිබිය හැකි බවය. එවැනි වෙනසක් පවතින්නේ නම් අස්තිත්වය විසින් මූල්‍ය සාධන පත්‍ර පන්ති අනුව හෙළිදරව් කළයුතුය. |
| | 28 (අ) ජේදය | වෙළඳපොල සහභාගි වන්නන් මිල තීරණය කිරීමේදී සලකා බැලිය හැකි සාධක වල (කාලය ඇතුලුව) ලාභ හෝ අලාභවල වෙනස්වීම් පිළිඹිඹුව සඳහා එම වෙනස හඳුනාගැනීමේදී LKAS 39 හි ජේද අළ 76 බලන්න) එය අනුගමනය කරන ගිණුම් ප්‍රතිපත්තිය; සහ |
| | 29 (ආ) ජේදය | සක්‍රිය වෙළඳ පොලක මිල ප්‍රකාශිත වෙළඳපොල මිලක් නොමැති ස්කන්ධ සාධන පත්‍ර ආයෝජනයක් සඳහා හෝ එවැනි ස්කන්ධ සාධන පත්‍රවලට සම්බන්ධිත ව්‍යුත්පන්න, විශ්වාසදායක ලෙස සාධාරණ වටිනාකමට මිණුම් කිරීම නොහැකි හෙයින් *LKAS* 39 ප්‍රකාර එය පිරිවැයට මිණුම්කරණු ලැබීම ; හෝ |
| | 30 ජේදය | 29 (ආ) සහ (ඇ)ජේදයන්හි විස්තර කරන ලද අවස්ථා පිළිබඳව, අස්තිත්වයක් විසින් මූල්‍ය ප්‍රකාශ පරිශීලනය කරන්නට එම මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම්වල ඒවායේ ධාරණ වටිනාකම සහ සාධාරණ වටිනාකම අතර තිබිය හැකි වෙනස්කම් වල ප්‍රමාණය පිළිබඳව ඔවුන්ගේම තීරණ ගැනීමට උදව්වන පහත සඳහන් දෑ ද ඇතුළත්ව තොරතුරු හෙළිදරව් කළ යුතුය. |

| *ප්‍රමිතිය* | *පවත්නා ජේදය යොමු කිරීම* | *ආදේශ කළ / එකතු කළ ජේදය* |
|---|---|---|
| | 42 ඈ ජේදය | ***LKAS*** **39 හි 19 (අ).(ඈ)** ජේදවල කොන්දේසි සපුරා ඇති කල්හි, මූල්‍ය වත්කමක මුදල් ප්‍රවාහ ලැබීමට ගිවිසුම්ගත හිමිකමද, නමුත් අස්තිත්වයන් එකකට හෝ වැඩි ගණනකට මුදල් ප්‍රවාහ ගෙවීමට ගිවිසුම්ගත බැඳීම්, භාර ගත්තද යොදාගන්නා පිළිවෙලක් මගින් අස්තිත්වයක් රඳවාගනී. |
| | 42 ඈ (ඊ) ජේදය | අස්තිත්වයක්, අඛණ්ඩව පවත්නා සහභාගිත්වයේ ප්‍රමාණයට, වත්කම් දිගටම හඳුනාගන්නා විට **(20 (ඇ) (*ii*) සහ *LKAS* 39 හි 30** ජේදය බලන්න). පැවරීමට පෙර මුල් වත්කමේ ධාරණ අගය, අස්තිත්වය අඛණ්ඩව හඳුනාගන්නා වත්කම්වල ධාරණ අගය සහ අශ්‍රිත වත්කම්වල ධාරණ අගය. |
| | 42 ඊ ජේදය | 42 ආ (අ) ජේදයෙහි දක්වා ඇති පරමාර්ථ සපුරාගැනීමට අස්තිත්වයක් මුළුමනින්ම පැවරූ මූල්‍ය වත්කම් ප්‍රති හඳුනාගන්නා කල්හි **(20 (අ) සහ *LKAS* 39 හි (ඇ) (*i*)** ජේද බලන්න), නමුත් ඒවායේ සම්බන්ධතා අඛණ්ඩව පවත්වා ගනීද, අස්තිත්වය සෑම වාර්තාකරණ දිනටම, සෑම වර්ගයකම අඛණ්ඩ සහභාගිත්වය සඳහා අවමයක් ලෙස අනාවරණය කළ යුතුය. |

## LKAS 1 . මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| *ප්‍රමිතිය* | *පවත්නා ජේද යොමු කිරීම* | *ආදේශ කළ / එකතු කළ ජේදය* |
|---|---|---|
| LKAS 1 | 7 ජෙදය | පහත දක්වා ඇති විශේෂිත තේරුම් සහිතව පහත සඳහන් පද මෙම ප්‍රමිතය සඳහා භාවිතා කරයි.<br>**පොදු අරමුණු මූල්‍ය ප්‍රකාශන** (මූල්‍ය ප්‍රකාශන ලෙස සඳහන් කරන) යනු ඔවුන්ගේ නිශ්චිත තොරතුරු අවශ්‍යතා සඳහාම සකස් කළාවූ වාර්තා අස්තිත්වයකින් පිළියෙල කරගැනීමට හැකියාවක් නොමැති පරිශිලකයන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා අදහස් කරන ලද ඒවාය.<br>ප්‍රායෝගික නොවන සියළු සාධාරණ උත්සාහ දැරීමෙන් පසුවත්, අවශ්‍යතාවයක් අස්තිත්වයට ව්‍යවහාර කිරීමට නොහැකි වීම.<br><br>**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත *(SLFRSs)*** ශ්‍රී ලංකා වරළත් ගණකාධිකාර ආයතනයේ පාලක සභාව (CA Sri Lanka) විසින් පිළිගත් ප්‍රමිත සහ අර්ථ නිරූපන. ඒවා සමන්විත වනුයේ<br>**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRSs);**<br>**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණය ප්‍රමිත (LKASs);**<br>**(ඇ) නිර්දේශිත පරිචය ප්‍රකාශනය (SoRPs);**<br>**(ඈ) විකල්පව සලකන ආකාරය පිළිබඳ ප්‍රකාශනය (SoATs);**<br>**(ඉ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ පාලක සභාව විසින් පිළිගත් අර්ථ නිරූපනයක් (IFRIC & SIC);**<br>**(ඊ) ශ්‍රී ලංකා වරත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කළ මූල්‍ය වාර්තාකරන උපදේශන.**<br><br>**ප්‍රමාණවත් අත්හැරීම් හෝ අයිතම පිළිබඳ අව ප්‍රකාශන තනිව හෝ එකතුව මූල්‍ය ප්‍රකාශන පදනම මත පරිශීලකයන්ගේ ආර්ථික තීරණ කෙරෙහි බලපෑම ප්‍රමාණාත්මක වෙයි. ප්‍රමාණාත්මක බව රදා පවතින්නේ, අත්හැරීමේ ප්‍රමාණය සහ ස්වභාවය හෝ අත්හැරීම අවට ඇති තත්වයන් අනුව විනිශ්චය මතය. තීරණයවීමේ සාධකය වන්නේ අයිතමයේ ප්‍රමාණය හෝ ස්වභාවය හෝ ඒ කරුණු දෙකෙහිම සංයෝජනයකි.**<br><br>අත්හැරීම හෝ අවප්‍රකාශනය පරිශීලකයන්ගේ ආර්ථිකමය තීරණ කෙරෙහි බලපෑම් කරන්නේ ද, නැද්ද තීරණය කිරීමේ දී සහ එසේ නම් එය ප්‍රමාණාත්මක ද යන්න කෙරෙහි පරිශීලකයන්ගේ ගති ලක්ෂණ සලකා බැලීම අවශ්‍ය වේ. මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම |

| ප්‍රමිතය | පවත්නා ජේදය යොමු කිරීම | ආදේශ කළ / එකතු කළ ජේදය |
|---|---|---|
| | | සඳහා වූ ආකෘතිමය රාමුවේ 25 වන ඡෙදයෙහි, පරිශීලකයා ව්‍යාපාර සහ ආර්ථික කටයුතු සහ ගිණුම් පිළිබඳ සාධාරණ දැනුමක් සහ සාධාරණ සැලකිල්ලකින් යුතුව තොරතුරු අධ්‍යයනයට කැමැත්ත ඇති අය බව උපකල්පනය කරයි. එම නිසා එබඳු ගුණාංග සහිත පරිශීලකයන් ආර්ථික තීරණ ගැනීමේ දී බලපෑමට ලක්වේදැයි සාධාරණ අන්දමට අපේක්ෂා කළ හැක්කේ කෙසේදැයි තක්සේරුව සැලකිල්ලට ගත යුතුවේ.<br><br>**සටහන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය වෙන්ව ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශනය (ඉදිරිපත් කර ඇත්තේ) ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි ඇතුලත්ව ඇති දෑට අමතර ඇතුල්වීම් විස්තරාත්මකව දැක්වීම හෝ ඉහත ප්‍රකාශ වල ඉදිරිපත් කර ඇති අයිතමයන් සරාංශගත වී ඇති ආකාරය පෙන්වීම සහ එම ප්‍රකාශනයන් හි හඳුනාගැනීම සුදුසුකම් නොලබන අයිතමයන් පිළිබඳ තොරතුරු සටහන් වලින් ඉදිරිපත් කෙරේ.**<br><br>**වෙනත් විස්තීර්ණ ආදායම වෙනත් SLFRS මගින් අවශ්‍යවන්නා වූ හෝ අවසර ලබන්නා වූ ආකාරයට ලාභ හෝ අලාභයෙන් හඳුනාගනු නොලබන ආදායම් හා වියදම් (යලි වර්ගීකරණය කිරීමේ ගැලපුම ඇතුළුව) අයිතම වලින් සමන්විත වෙති.**<br><br>වෙනත් විස්තීර්ණ ආදායම් වල ඇතුළත් සංරචකයන්<br>(අ) ප්‍රත්‍යාගණන අතිරික්තයේ වෙනස්වීම් (LKAS 16 දේපළ , පිරියත සහ උපකරණ සහ LKAS 38 (අස්පෘශ්‍ය වත්කම් බලන්න);<br>(ආ) LKAS 19 සේවක ප්‍රතිලාභ, 93 අ ඡේදය ප්‍රකාර හඳුනාගැනෙන නිර්වචිත ප්‍රතිලාභ සැලසුම මත ආයුගණක ප්‍රතිලාභ සහ අලාභ;<br>(ඇ) විදේශ මෙහෙයුම් වලට අදාළ මූල්‍ය ප්‍රකාශන පරිවර්තන කිරීමෙන් ඇතිවන ප්‍රතිලාභ සහ අලාභ ( LKAS21 විදේශ විනිමය අනුපාතිකයන්ගේ වෙනස්වීම් වල බලපෑම් බලන්න);<br>(ඈ) විකිණීමට ඇති මූල්‍ය වත්කම් නැවත මැනීම නිසා ඇතිවන ප්‍රතිලාභ සහ අලාභ (LKAS 39, මූල්‍ය සාධන පත්‍ර හඳුනාගැනීම සහ මැනීම බලන්න);<br>(ඉ) මුදල් ප්‍රවාහ ඉදිරි රැකුමකදී, ඉදිරි රැකුම් සාධන පත්‍රවල ප්‍රතිලාභ සහ අලාභ වල සඵලදායි කොටස (LKAS 39 බලන්න).<br><br>**ස්කන්ධය ලෙස වර්ගීකරණය කළ සාධන පත්‍ර දරන්නන් අයිතිකරුවන් වේ.**<br><br>**ලාභ හෝ අලාභ යනු වෙනත් විස්තීර්ණ ආදායම් සංරචක හැර ආදායමෙන් වියදම් අඩුකළ විට ලැබෙන එකතුවයි. යලි වර්ගීකරණය ගැලපුම් යනු ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ හෝ පෙර කාලපරිච්ඡේදයේ වෙනත් විස්තීර්ණ ආදායම් ලෙස හඳුනාගෙන ඇති, ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ ලාභය හෝ අලාභ ලෙස වර්ගීකරණය කළ වටිනාකම වේ.**<br><br>**මුළු විස්තීර්ණ ආදායම යනු අයිතිකරු සමඟ අයිතිකරු ලෙස ව්‍යාපාර තුළ සිටිමින් කර ඇති ගනුදෙනු වලින් වන ප්‍රතිඵලය වෙනස්වීම හැර කාලපරිච්ඡේදය තුළ සිදුකරන ලද ගනුදෙනු සහ වෙනත් සිද්ධීන් වල ප්‍රතිඵලයක් ලෙස ස්කන්ධයේ වෙනස්වීමයි. මුළු විස්තීර්ණ ආදායම සියළුම 'ලාභ හෝ අලාභ' සංරචකයන්ගෙන් සහ වෙනත් විස්තීර්ණ ආදායමෙන් සමන්විත වේ.** |
| | 68 ඡේදය | **අස්තිත්වයක මෙහෙයුම් චක්‍රය යනු සැකසුම් කිරීම් සඳහා වත්කම් අත්පත් කරගැනීමේ අවස්ථාවේ සිට ඒවා මුදල් වලට හෝ මුදල් හා සමාන දෑ වලට උපලබ්ධි වීම දක්වා වන අතරතුර කාලය වේ. අස්තිත්වයක සාමාන්‍යය මෙහෙයුම් චක්‍රය පැහැදිලිව හඳුනාගත** |

| ප්‍රමිතිය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශ කළ / එකතු කළ ඡේදය |
|---|---|---|
| | | **නොහැකි කල්හි එම කාල සීමාව මාස දොළහක් යැයි උපකල්පනය කෙරේ. වාර්තා කරන කාලපරිච්ඡේදයෙන් පසු මාස දොළහක් ඇතුලත උපලබ්ධි වීම අපෙක්ෂා නොකලත් සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුල විකුණන, පාරිභෝජනය කරන හෝ උපලබ්ධි වන වත්කම් (තොග සහ වෙළඳ ලැබිය යුතු දෑ වැනි) ජංගම වත්කම් වලට ඇතුලත් වේ. වෙළඳාමේ කාර්යය සඳහා මූලික වශයෙන් තබාගන්නා වත්කම් (*LKAS* 39 අනුව වෙළඳාම සඳහා තබාගෙන ඇති ලෙස වර්ගීකරණය කර ඇති සමහර මූල්‍යවත්කම් උදාහරණයන්ට ඇතුළත් ය.) සහ ජංගම නොවන මූල්‍ය වත්කම්වල ජංගම කොටසද ජංගම වත්කම් වලට ඇතුලත් වෙයි.** |
| | 71 ඡේදය | සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේ කොටසක් ලෙස නිරවුල් නොකරන එහෙත් වාර්තාකරන කාලපරිච්ඡෙදයෙන් පසු මාස දොළහක් ඇතුලත නිරවුල් කිරීමට නියමිත හෝ මූලික වශයෙන් වෙළඳාම් කිරීමේ පරිමාර්ථයෙන් තබාගන්නා අයිතම වෙනත් ජංගම වගකීම් වේ. උදාහරණ ලෙස **_LKAS_ 39 අනුව වෙළඳාම සඳහා තබාගන්නා ලෙස වර්ගීකරණය කර ඇති සමහර** මූල්‍ය වගකීම්, බැංකු අයිරා, ජංගම නොවන මූල්‍ය වගකීම් වල ජංගම කොටස, ගෙවිය යුතු ලාභාංශ, ගෙවිය යුතු ආදායම් බදු සහ අනෙකුත් වෙළඳ නොවන ගෙවිය යුතු දෑ දක්විය හැකිය. 74 සහ 75 ඡේදවලට යටත්ව වාර්තාකරන කාලපරිච්ඡේදයෙන් පසු මාස දොළහක් ඇතුලත නිරවුල් කිරීමට නියමිත නොවන දිගු කාලීන පදනමක් මත (එනම්, අස්තිත්වයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ දී කාරක ප්‍රාග්ධනයේ කොටසක් ලෙස භාවිතා නොවන) මූල්‍යකරණය සපයා ඇති මූල්‍ය වගකීම්, ජංගම නොවන වගකීම් වේ. |
| | 82(අ.අ) ඡේදය | ඉවත් කරන ලදී |
| | 82(ඇ.ඇ) ඡේදය | ඉවත් කරන ලදී. |
| | 93 ඡේදය | වෙනත් විස්තීර්ණ ආදායම් වල මීට පෙර හඳුනාගත් වටිනාකම් ලාභ හෝ අලාභ වලට යළි වර්ගීකරණය කළ යුතු ද හෝ එසේ කළ යුත්තේ කිනම් අවස්ථාවේ ද යන්න වෙනත් SLFRSs වල පැහැදිලිව සඳහන් කර ඇත. එවැනි යළි වර්ගීකරණයක් මෙම ප්‍රමිතියේ යළි වර්ගීකරණය ගැලපුම් ලෙස, හැඳින්වේ. එම ගැලපුම ලාභ හෝ අලාභය යළි වර්ගීකරණය කරන ලද කාලපරිච්ඡේදයන් වෙනත් විස්තීර්ණ ආදායම් සම්බන්ධිත සංරචකය සමග යළි වර්ගීකරණය කළ ගැලපුම ඇතුළත් ය. **උදාහරණයක් ලෙස විකිණීම සඳහා තබා ඇති මූල්‍ය වත්කම් බැහැර කිරීමෙන් උපලබ්ධි වූ ප්‍රතිලාභ ප්‍රවර්තන කාල පරිච්ඡේදයේ ලාභ හෝ අලාභ වල ඇතුලත් වේ.** |
| | 95 ඡේදය | උදාහරණයක් වශයෙන් නැවත වර්ගීකරණය කිරීමේ ගැලපුම් පැන නගින්නේ, විදේශ මෙහෙයුම් **(_LKAS_ 21 බලන්න) බැහැර කිරීම, විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් ප්‍රතිහඳුනා ගැනීම** (LKAS 39 බලන්න ) සහ පුරෝකතනය කළ ඉදිරි රැකුම් ගනුදෙනුවක් ලාභ හෝ අලාභයට බලපාන කල්හිය (ඉදිරි සුරැකුම් මුදල් ප්‍රවාහවලට සම්බන්ධ LKAS 39 හි 100 ඡේදය බලන්න ) |
| | 123 (අ) ඡේදය | **මූල්‍ය වත්කම් කල්පිරෙන තෙක් තබාගෙන ඇති වත්කම් ද යන්න.** |

## LKAS 2 තොග

| ප්‍රමිතිය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශ කළ / එකතු කළ ඡේදය |
|---|---|---|
| LKAS 2 | 2 අ ඡේදය | මූල්‍ය සාධන පත්‍ර (LKAS 32 මූල්‍ය සාධන පත්‍ර ඉදිරිපත් කිරීම සහ *LKAS* 39 මූල්‍ය සාධන පත්‍ර හඳුනාගැනීම සහ මැනීම බලන්න) ; සහ |

LKAS 8 **ගිණුම් ප්‍රතිපත්ති, ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි**

| ප්‍රමිතිය | පවත්නා ජේදය යොමු කිරීම | ආදේශ කළ / එකතු කළ ජේදය |
|---|---|---|
| LKAS 8 | 5 ජේදය | පහත දැක්වෙන පද නිශ්චිතව දක්වා ඇති තේරුම් ද සහිතව මෙම ප්‍රමිතයෙහි භාවිතා කෙරේ : ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRSs) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CASL) පාලක මණ්ඩලය විසින් පිළිගත් ප්‍රමිතීන් සහ අර්ථ නිරූපණය ඒවා සමන්විත වනුයේ,<br>(අ) ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත (SLFRS)<br>(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS)<br>(ඇ) නිර්දේශිත පරිචය ප්‍රකාශනය (*SoRPs*)<br>(අ) විකල්ප සලකන ආකාරය පිළිබඳ ප්‍රකාශන (*SOATs*)<br>(ඉ) ශ්‍රී ලංකා වරළත් ගණකාධිකාරී ආයතනයේ පාලක මණ්ඩලය විසින් පිළිගත් අර්ථ නිරූපණයන් (IFRIC & SIC)<br>(ඊ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය මගින් නිකුත් කරනු ලබන මූල්‍ය වාර්තාකරණ උපදේශන |
| | 53 ජේදය | අළුත් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් පෙර කාලපරිච්ඡේදයකට ව්‍යවහාර කිරීමේ දී හෝ පෙර කාලපරිච්ඡේදයන් සඳහා අගයන් නිවැරදි කිරීමේ දී එක්කෝ, පෙර කාලපරිච්ඡේදයක දී පැවතිය හැකිව තිබූ කළමනාකාරිත්වයේ අභිප්‍රායන් පිළිබඳ උපකල්පනය කිරීමේ දී හෝ පෙර කාලපරිච්ඡේදයක හඳුනාගත් මැනිය හෝ හෙළිදරව් කළ හැකිව තිබූ අගයන් ඇස්තමේන්තු කිරීමේ දී අපරදෘෂ්ඨිය භාවිතා නොකළ යුතු ය. උදාහරණයක් ලෙස *LKAS* 39 මූල්‍ය සාධනපත්‍ර හඳුනාගැනීම සහ මැණුම ප්‍රකාර මූල්‍ය වත්කමක් ගිණුම්කරණයේ දී අස්තිත්වයක් විසින් පෙර කාලච්ඡේදයේ දී කල්පිරේනතුරු තබා ගැනීමට ඇති ලෙස පළමුවෙන් වර්ගීකරණය කළ ආයෝජනයක් එහි පෙර කාලපරිච්ජේදයේ වරද නිවැරදි කිරීමට කළමණාකරනය කල්පිරෙන තුරු තබා නොගන්නා ලෙස පසුව තීරණය කළහොත්, ඒවායේ ගිණුම්කරන පදනම එම කාලපරිච්ඡේදය සඳහා වෙනස් නොකරයි. ඊට අමතරව LKAS 19 සේවක ප්‍රතිලාභවලට අනුකූලව අස්තිත්වයක් සේවකයන්ගේ සමුච්චය අසනීප නිවාඩු සඳහා එහි වගකීම පෙර කාලපරිච්ජේය සඳහා නිවැරදි කිරීම් ගණනය කිරීමේ දී පෙර කාල පරිච්ඡේදය සඳහා නිකුත් කිරීමට මූල්‍ය ප්‍රකාශන අනුමත කලපසු, ලබා ගැනීමට හැකි ඊළඟ කාලපරිච්ඡේදයේ අසාමාන්‍ය තද බල සෙම්ප්‍රතිශ්‍යා සමයක තොරතුරු සැලකිල්ලට නොගනී. පෙර කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත්කර ඇති සංසන්දනාත්මක තොරතුරු සංශෝධනය කරන කල්හි වැදගත් ඇස්තමේන්තු නිරන්තරයෙන් අවශ්‍ය වුවද එය විශ්වාසදායක ගැලපීමක් හෝ සංසන්දනාත්මක තොරතුරක් නිවැරදි කිරීමට බාධාවක් නොවේ. |

LKAS 12 **ආදායම් බදු**

| ප්‍රමිතිය | පවත්නා ජේදය යොමු කිරීම | ආදේශකළ / එකතුකළ ජේදය |
|---|---|---|
| LKAS12 | 20 ජේදය | ඇතැම් වත්කම් සාධාරණ අගයට පවත්වාගෙන යාමට හෝ ප්‍රත්‍යාගණනය කිරීම සඳහා SLFRSs අවසර දීම හෝ අවශ්‍ය කරයි. (උදාහරණ ලෙස LKAS 16 දේපල පිරියත සහ උපකරණ *LKAS* 38 **අස්පෘශ්‍ය වත්කම්,** *LKAS* 40 **ආයෝජන දේපළ** බලන්න) සමහර අධිකරණ බලප්‍රදේශවල ප්‍රත්‍යගණනය හෝ වත්කම්වල සාධාරණ වටිනාකම දක්වා කරනු ලබන නැවත ප්‍රකාශ කිරීම් ප්‍රවර්තනය කාලපරිච්ඡෙදයේ බදු අය කළ හැකි ලාභයට (බදු අලාභ) බලපායි. එහි ප්‍රතිඵලයක් ලෙස වත්කමේ බදු පදනම ගලපන අතර තාවකාලික වෙනස්වීම් පැනනොනගියි. වෙනත් අධිකරණ බලප්‍රදේශවල වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් හෝ නැවත ප්‍රකාශ කිරීමෙන් ප්‍රත්‍යාගණනය කළ හෝ නැවත ප්‍රකාශ කළ කාලපරිච්ඡේදයේ බදු අය කළ හැකි ලාභයට බල නොපායි. ඒ නිසාවෙන් |

| ප්‍රමිතිය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකළ / එකතුකළ ඡේදය |
|---|---|---|
| | | ලාභයට බලනොපාන අතර, එනිසා වත්කම් බදු පදනම ගලපනු නොලැබේ. එසේ වුව ද ධාරණ අගය අනාගතයේ දී අයකර ගැනීමේ දී බද්දට යටත්වන ආර්ථික ප්‍රතිලාභ වශයෙන් ලැබෙන මුදලට වෙනස්වනු ඇත. ප්‍රත්‍යාගනය කළ වත්කමක ධාරණ අගය සහ එහි බදු පදනම අතර වෙනස තවකාලික වෙනසක් වන අතර එයින් විලම්බිත බදු වගකීමෙන් හෝ වත්කමක් පැන නගී. මෙය පහත තත්ත්වයන් යටතේ ද සත්‍ය වේ; |

LKAS 18 -. **අයභාර**

| ප්‍රමිතිය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකළ / එකතුකළ ඡේදය |
|---|---|---|
| LKAS 18 | 6 (ඈ) ඡේදය | මෙම ප්‍රමිතිය, මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්වල සාධාරණ වටිනාකමෙහි වෙනස්වීම් හෝ ඒවායේ බැහැර කිරීම (*LKAS* **39 සාධන පත්‍ර හඳුනාගැනීම සහ මැණීම බලන්න)** මගින් පැන නගින්නා වූ අයභාර සම්බන්ධයෙන් කටයුතු නොකෙරේ. |
| | 11 ඡේදය | ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකම සහ නාමික අගය අතර වෙනස 29 සහ 30 වන ඡේද ප්‍රකාරව සහ LKAS 39 ප්‍රකාරව පොළී අයභාර ලෙස හඳුනාගනී. |

**LKAS 19 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

***සේවක ප්‍රතිලාභ***

ශ්‍රී ලංකාවේ ගිණුම් ප්‍රමිත LKAS 19 සේවක ප්‍රතිලාභ ඡේද 1-173 හි දක්වා නියමකර ඇත. සියලුම ඡේදයන්ට සමාන වූ අධිකාරිබලයක් ඇත. LKAS 19 හි අරමුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පූර්විකාව සහ මූල්‍ය වාර්තාකරණය සහ මූල්‍ය වාර්තාකරණ සඳහා වන සංකල්පමය රාමුවට අනුගතව අධ්‍යනය කළ යුතුය. විශේෂිත මාර්ගෝපදේශකත්වයක් නොමැති විට ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ ව්‍යවහාර කිරීම සඳහා LKAS 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම්කරණ ඇස්තමේන්තු සහ වැරදි පදනමක් සලසයි.

අරමුණු :

1. මෙම ප්‍රමිතියේ අරමුණ වන්නේ සේවක ප්‍රතිලාභ ගිණුම්කරනය සහ හෙළිදරව් කිරීම් පිළිබඳ රෙකමදාරු කිරීමය. මෙම ප්‍රමිතිය මගින් අස්තිත්වයක් පහත දෑ හඳුනා ගැනීමට අවශ්‍ය වේ.

   (අ) සේවක ප්‍රතිලාභ සඳහා අනාගතයේ දී ගෙවිය යුතුය. යන හුවමාරු පදනමින් සේවකයකු සේවය සපයා ඇති කල්හි ඇතිවන වගකීම්; සහ

   (ආ) සේවක ප්‍රතිලාභ හුවමාරුවක් සඳහා සේවකයකු විසින් සපයන සේවාව තුලින් අස්තිත්වය පරිභෝජනය කරන ආර්ථික ප්‍රතිලාභ උපයන අවස්ථාවලදී පැනනගින වියදම්.

විෂය පථය :

2. **SLFRS කොටස් පදනම් ගෙවීමේ ප්‍රමිතය අදාළවන දෑ හැර අනෙකුත් සියලුම සේවක ප්‍රතිලාභ ගිණුම්කරණය සඳහා සේවා යෝජකයන් විසින් මෙම ප්‍රමිතිය ව්‍යවහාර කළ යුතුය.**

3. මෙම ප්‍රමිතය සේවක ප්‍රතිලාභ සැලසුම් වාර්තාකරණය පිළිබඳ කටයුතු නොකරයි. ( LKAS 26 විශ්‍රාමික ප්‍රතිලාභ සැලසුම් ගිණුම්කරණය සහ වාර්තාකරණය බලන්න)

4. මෙම ප්‍රමිතිය සලසනු ලබන පහත සඳහන් සේවක ප්‍රතිලාභවලට ව්‍යවහාර වෙයි.

   (අ) අස්තිත්වය එක් එක් සේවකයෙක්, සේවක කණ්ඩායම් හෝ ඔවුන්ගේ නියෝජිතයන් අතර ඇති විධිමත් සැළසුම් හෝ වෙනත් විධිමත් ගිවිසුම් යටතේ; ගැනේ.

(ආ) ව්‍යවස්ථාපිත අවශ්‍යතා හෝ කාර්මික වැඩ පිළිවෙළ යටතේ ජාතික, රාජ්‍ය, කාර්මික හෝ වෙනත් බහුවිධ සේව්‍ය සැලසුම් මගින් අස්තිත්වයන් දායකත්වය යුතුවීම; හෝ

(ඇ) අවිධිමත් පරිචයන් මගින් සම්මුතික බැඳීම් පැන නගී. අවිධිමත් පරිචයන් සම්මුතික බැඳීම්වලට තුඩු දෙන අතර, අස්තිත්වයට සේවක ප්‍රතිලාභ ගෙවීම හැර වෙනත් යථාර්ථවාදී විකල්පයක් නොමැත. සම්මුතික බැඳීම් පිළිබඳ උදාහරණයක් නම්, අවිධිමත් පරිචයන්ගෙන් අස්තිත්වය ඇත්වන කල්හි සේවකයින් සමඟ එහි සම්බන්ධතාවලට පිළිගත නොහැකි හානි ඇතිවිය හැකිය.

5. **සේවක ප්‍රතිලාභවලට ඇතුළත් දෑ :**

(අ) කෙටි කාලීන ප්‍රතිලාභවලට, සේවකයන් සම්බන්ධිත සේවය සපයා වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් මාස දොළහකට පෙර, සම්පූර්ණයෙන්ම බේරුම් කිරීමට අපේක්‍ෂා කරන්නේ නම්, පහත සඳහන් වැනි දෑ ඇතුළත් වෙයි.

(i) වැටුප්, වේතන සහ සමාජ ආරක්‍ෂණ දායක වීම්;

(ii) ගෙවීම් කරණ වාර්ෂික නිවාඩු සහ ගෙවීම් කරන අසනීප නිවාඩු ;

(iii) ලාභයට -හවුල්වීම සහ පාරිතෝෂික සහ ;

(iv) සේවයේ සිටින සේවකයන් සඳහා මූල්‍ය නොවන ප්‍රතිලාභ (වෛද්‍ය පහසුකම්, නිවාස, මෝටර් රථ සහ නිදහස් හෝ සහන සහිත භාණ්ඩ සේවා වැනි)

(ආ) පහත සඳහන් දෑ වැනි, පශ්චාත් සේවා නියුක්තියෙන් වන ප්‍රතිලාභඃ

(i) විශ්‍රාම ප්‍රතිලාභ (උදාහරණ, විශ්‍රාම වැටුප් සහ විශ්‍රාම ගන්නා විට එකවර ගෙවීම්)ඃ සහ

(ii) පශ්චාත් සේවා නියුක්ති ජීවිත රක්‍ෂණය සහ පශ්චාත් සේවා නියුක්ති වෛද්‍ය පහසුකම් වැනි වෙනත් පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ;

(ඇ) පහත සඳහන් දෑ වැනි දිගු කාලින වෙනත් සේවක ප්‍රතිලාභ;

(i) දීර්ඝ සේවා නිවාඩු හෝ අනුසප්තා බැදෙන නිවාඩු වැනි පඩි සහිත දීර්ඝ කාලයක් සේවයෙන් බැහැරව සිටීමේ නිවාඩු;

(ii) සංවත්සර හෝ වෙනස් දීර්ඝ සේවා ප්‍රතිලාභ; සහ

(iii) දීර්ඝ කාලීන දුබලතා ප්‍රතිලාභ; සහ

(ඈ) සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ.

6. සේවක ප්‍රතිලාභවලට සේවකයාට හෝ ඔවුන්ගේ යැපෙන්නන්ට හෝ ප්‍රතිලාභන්ට ප්‍රතිලාභ ඇතුළත්වන අතර, ඒවා එක්කෝ සේවකයන්ට ඔවුන්ගේ භාර්යාවන්ට දරුවන්ට හෝ වෙනත් යැපෙන්නන්ට හෝ රක්ෂණ සමාගම් වැනි වෙනත් අයට සෘජුව ගෙවීම් මගින් බේරුම් කිරීම (හෝ භාණ්ඩ හෝ සේවා සැපයීමෙන්) කළ හැකිය.

7. සේවකයන් අස්තිත්වයක සේවාවන් පූර්ණ කාලින, අර්ධ කාලීන, ස්ථිර දෛනික හෝ තාවකාලික පදනම් මත සේවා සැපයිය හැකිය. මෙම ප්‍රමිතියේ අරමුණු සඳහා අධ්‍යක්ෂවරු සහ අනෙක් කළමණාකරණ පිරිස් සේවකයන් ලෙස සැලකේ.

## නිර්වචන

8. **පහත දක්වා ඇති පද නිශ්චිතව දක්වා ඇති තේරුම සහිතව මෙම ප්‍රමිතයේ දී භාවිතා කෙරේ :**

- **සේවක ප්‍රතිලාභ නිර්වචන**

  **සේවක ප්‍රතිලාභ යනු සේවකයින් තම සේවාවන් ලබාදීම සඳහා හුවමාරු හෝ රැකියාව අවසන් කිරීම සඳහා අස්තිත්වය මගින් දෙනු ලබන සියලුම අකාරයේ ප්‍රතිශ්ධාවන්ය.**

- **කෙටි කාලින සේවක ප්‍රතිලාභ යනු සේවකයින් සම්බන්ධිත සේවාවන් ලබා දී ගිණුම්කරණ කාලපරිච්ඡේදයට පසුව මාස දොළහකට පෙර බේරුම් කිරීමට අපේක්ෂිත සේවක ප්‍රතිලාභයන්ට (සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ හැර)**

  **පශ්චාත් සේවක ප්‍රතිලාභ යනු සේවය අවසන් කිරීමෙන් පසුව ගෙවිය යුතු සේවක ප්‍රතිලාභයන්ය. (සේවය අවසන් කිරීමේ වෙනත් ප්‍රතිලාභ සහ කෙටි කාලීන සේවක ප්‍රතිලාභ හැර)**

වෙනත් දිගු කාලීන සේවක ප්‍රතිලාභ යනු කෙටි කාලීන සේවක ප්‍රතිලාභ පශ්චාත් සේවක ප්‍රතිලාභ සහ සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ හැර අනෙක් සියලුම ප්‍රතිලාභයන්ය.

සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ යනු එක්කෝ පහත සඳහන් කරුණක ප්‍රතිඵලයක් හුවමාරුවක් ලෙස රැකියාව අවසන් කිරීම වෙනුවෙන් සේවකයන්ට සලස්වනු ලබන ප්‍රතිලාභයන්ය.

(අ) සාමාන්‍යයෙන් විශ්‍රාම දිනට පෙර සේවකයින්ගේ රැකියාව අවසන් කිරීමට අස්තිත්වයේ තීරණයන් වෙනුවෙන් සේවකයන්ට සලසනු ලබන ප්‍රතිලාභයන් ; හෝ

(ආ) රැකියාව නිම කිරීමට පිරිනමනු ලැබීමක් සේවකයින් පිළිගැනීමට තීරණය කිරීම වෙනුවෙන් හුවමාරු කරන ප්‍රතිලාභ

සැළසුම් වර්ගීකරණයට අදාළ නිර්වචන

පශ්චාත් සේවක ප්‍රතිලාභ සැළසුම් යනු අස්තිත්වයක් තම සේවකයෙක් හෝ වැඩි ගණනකට පශ්චාත් සේවා ප්‍රතිලාභ සපයනු ලබන විධිමත් හෝ අවිධිමත් වැඩ පිළිවෙලවල

සේවක ප්‍රතිලාභ නිර්වචන

නිර්වචිත දායක සැළසුම් යනු අස්තිත්වයක් විසින් වෙනත් අස්තිත්වයකට (අරමුදලකට) ස්ථාවර දායක මුදලක් ගෙවනු ලැබීම සහ ප්‍රවර්තන සහ පෙර කාලපරිච්ඡේදවල සේවය සඳහා සේවක ප්‍රතිලාභ ගෙවීමට තරම් ප්‍රමාණාත්මක වත්කම් අරමුදල සතු නොවන්නේ නම්, තව දුරටත් දායක මුදල් ගෙවීමට නෛතික හෝ සම්මුතික බැඳීමක් ඇති නොවන පශ්චාත් සේවක ප්‍රතිලාභ සැළසුම්ය.

නිර්වචිත ප්‍රතිලාභ සැළසුම් යනු නිර්විත දායක සැළසුම් හැර අනෙකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැළසුම් වේ.

බහු සේව්‍ය සැළසුම් යනු පහත දැක්වෙන දෑ අඩංගු වන නිර්වචිත දායක සැළසුම් (රාජ්‍ය සැළසුම් හැර) හෝ නිර්වචිත ප්‍රතිලාභ සැළසුම්ය. (රාජ්‍ය සැළසුම් හැර)

(අ) පොදු පාලනයක් යටතේ නොපවතින විවිධ අස්තිත්වයන් මගින් දායකත්වය ලැබූ වත්කම් එක් රැස් කිරීමක්;සහ

(ආ) එම වත්කම් දායකත්වය සහ ප්‍රතිලාභ මට්ටම සේවකයන් යොදවා ගන්නා අස්තිත්වයෙහි අනන්‍යතාවය නොසලකා සේවකයන්ගේ යහපත සැලසීම පදනම මත එක් අස්තිත්වයකට වැඩි ගණනක සේවකයන්ට ප්‍රතිලාභ සැලසීම සඳහා යොදා ගැනීම

ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම්) වලට අදාළ නිර්වචන

ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම්), වත්කමේ ඉහල සීමාවට ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ සීමා කිරීමේ යම් බලපෑමක් සඳහා වත්කමේ ඉහලම මට්ටමට ගැලපීම් කළ විට ඇතිවන ඌනතාවය හෝ අතිරික්තයයි.

පාඩු විඳින්නාගේ අතිරික්තය යනු ඃ

(අ) නිර්වචිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගය අඩු කළා

(ආ) සැලසුමේ වත්කම්වල (ඇතොත්) සාධාරණ වටිනාකම

නියම කළ සීමාව යනු සැලසුමෙන් ආපසු ගෙවීමේ ආකාරයන් පවතින යම් ආර්ථික ප්‍රතිලාභයක වර්තමාන අගය හෝ සැලසුමට අනාගතයේ දී දායකවන මුදල් අඩුවීම

නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගය යනු වර්තමාන සහ පූර්ව කාලපරිච්ඡේදවල දී සේවකයන් සපයන ලද සේවාවලින් ඇතිවන ප්‍රතිඵලයෙන් ඇති වූ බැඳීමක් නිරවුල් කිරීමට අවශ්‍ය අනාගත ගෙවීම් වෙනුවෙන්වන සැලසුම් කළ වත්කම් සඳහා අඩු කිරීම් නොකරන ලද වර්තමාන අගය වේ.

සැලසුම් වත්කම් සමන්විත වනුයේ ඃ

(අ) දිගු කාලීන සේවක ප්‍රතිලාභ අරමුදලක් මගින් රඳවා ගෙන ඇති වත්කම් ; සහ

(ආ) සුදුසුකම් ලබන රක්ෂණ ඔප්පු

දිගු කාලීන සේවක ප්‍රතිලාභ අරමුදලක් රඳවා ගනු ලබන වත්කම්, යන්නට පහත වත්කම් (වාර්තාකරණ අස්තිත්වය විසින් නිකුත් කරන ලද පැවරිය නොහැකි මූල්‍ය සාධනපත්‍ර හැර) අයත් වේ :

(අ) වාර්තාකරණ අස්තිත්වයෙන් නීත්‍යානුකූලව වෙන්වූ, සහ සේවක ප්‍රතිලාභ ගෙවීමට හෝ සේවක ප්‍රතිලාභ අරමුදල්කරණය සඳහාම පමණක් පවත්වා ගෙන යනු ලබන අස්තිත්වයක් (අරමුදලක්) මගින් පවත්වා ගනු ලබන වත්කම්; සහ

(ආ) සේවක ප්‍රතිලාභ සඳහා අරමුදල් සැපයුමට හෝ ගෙවීම් කිරීමට පමණක් යොදාගනු ලබන, වාර්තාකරණ අස්තිත්වයෙහි ණය හිමියන්ට (බංකොලොත් අවස්ථාවක දී වුව ද) ගෙවීමට යොදා නොගත යුතු, පහත අවස්ථාවල දී මිස වාර්තාකරණ අස්තිත්වයට ආපසු එවීමට නොහැකි වත්කම්; එක්කෝ,

(i) අරමුදලේ ඉතිරිව ඇති වත්කම්, සැලසුමේ හෝ වාර්තාකරණ අස්තිත්වයේ සම්බන්ධිත සියලුම සේවකයන්ගේ ප්‍රතිලාභ බැඳීම් ගෙවීමට ප්‍රමාණවත් වීම; හෝ

(ii) සේවකයන් සඳහා දැනටමත් ගෙවා ඇති සේවක ප්‍රතිලාභ ප්‍රතිපූර්ණ කිරීමට එය වාර්තාකරණය අස්තිත්වයට වත්කම් ආපසු එවීම.

'සුදුසුකම් ලබන රක්‍ෂණ ඔප්පුවක්' යනු වාර්තාකරණ අස්තිත්වයෙහි සම්බන්ධිත පාර්ශ්වයක් නොවන ("LKAS 24- සම්බන්ධිත පාර්ශ්වයන් හෙළිදරව් කිරීම" හි නිර්වචනය කරන ලද) රක්‍ෂණකරු විසින් නිකුත් කරන ලද රක්‍ෂණ ඔප්පුවක්[1] වන අතර එම රක්‍ෂණ ඔප්පුවේ දීමනාව :

(අ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුමක් යටතේ සේවක ප්‍රතිලාභ ගෙවීමට හෝ අරමුදල් සැපයීමට පමණක් යොදාගත හැකි; සහ

(ආ) අස්තිත්වයෙහි ණයහිමියා තම (බංකොලාත් අවස්ථාවක වුව ද) ගෙවීමට යොදානොගත යුතු පහත අවස්ථාවල දී මිස වාර්තා කරන අස්තිත්වයට ආපසු ගෙවීමට නොහැකි ඔප්පුවේ දීමනාව,

(i) එක්කෝ, සේවක සම්බන්ධිත ව සියලුම ප්‍රතිලාභ බැඳීම් සපුරාලීමට අවශ්‍ය නොවන අතිරික්ත වත්කම් ඔප්පුවේ දීමනාවෙන් නියෝජනය වීම; හෝ

(ii) දැනටමත් ගෙවන ලද සේවක ප්‍රතිලාභ ප්‍රතිපූර්ණය සඳහා වාර්තාකරණ අස්තිත්වයට ආපසු එවන ලැබීම්

'සාධාරණ වටිනාකම' යනු දැනුම සහ කැමැත්ත ඇති පාර්ශ්වයන් අතර අතේ දුරින් වූ වත්කමක් හුවමාරුවකට හෝ වගකීමක් නිරවුල් කිරීමේ ගණුදෙනුවක දී වන වටිනාකම් වේ.

නිර්වචිත ප්‍රතිලාභ පිරිවැයට සම්බන්ධිත නිර්වචන

සේවා පිරිවැය සමන්විත වනුයේ :

(අ) ප්‍රවර්තන සේවා පිරිවැය යනු සේවකයෙකුගේ ප්‍රවර්තන සේවා කාලපරිච්ඡේදයේ ප්‍රතිඵලයක් ලෙස, නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගයේ වැඩිවීමයි.

(ආ) පෙර සේවා පිරිවැය යනු සැලැස්මේ සංශෝධනයක ප්‍රතිඵලයක් (නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මේ හඳුන්වා දීමක් හෝ ආපසු ගැනීමක් හෝ නිර්වචිත ප්‍රතිලාභ සැලසුමට වෙනත්) තුළින් හෝ කපා හැරීමකින් (සැලසුම මගින් ආවරණය කරන සේවක සංඛ්‍යාව අස්තිත්වය මගින් සැලකිය යුතු ලෙස අඩු කිරීම) පෙර කාලපරිච්ඡේදවල දී සපයන ලද සේවා වෙනුවෙන් වන නිර්වචිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගයෙහි ඇතිවන වෙනසයි.

(ඇ) නිරවුල් කිරීමක් මත යම් ප්‍රතිලාභ හෝ අලාභ

ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීමක් (වත්කමක්) මත ශුද්ධ පොලිය යනු කාලය ගතවීම මගින් පැන නගින ශුද්ධ නිර්වචිත වගකීමක (වත්කමක) කාලපරිච්ඡේදයක් තුළ ඇතිවන වෙනස්කමය.

[1] SLFRS 4 රක්ෂණ ගිවිසුම්වල නිර්වචනය කර ඇති පරිදි රක්ෂණ ඔප්පුවක් රක්ෂණ ගිවිසුමක් වීමට අවශ්‍ය නොවේ.

ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීමක (වත්කමක) යළි මිණුම් කිරීම සමන්විත වනුයේ :

(අ) ආයුගණක ප්‍රතිලාභ හා අලාභ;

(ආ) ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම්) මත ඇතුළත් කර ඇති ශුද්ධ පොලී ප්‍රමාණයන් හැර, සැලසුම් වත්කම් මත ප්‍රතිලාභ; සහ

(ඇ) ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම්) මත ඇතුළත් කර ඇති ශුද්ධ පොලී ප්‍රමාණයන් හැර, වත්කම් සීමාවන් මත යම් වෙනසක බලපෑම.

ආයු ගණක ප්‍රතිලාභ සහ අලාභ යනු නිර්වචිත ප්‍රතිලාභ වගකීමක පහත සඳහන් දෑ වල ප්‍රතිඵලයක් මගින් වර්තමාන අගයේ වෙනස් වීම්:

(අ) අත්දුටු ගැලපීම් (කලින් ආයු ගණක උපකල්පන හා ඇත්ත වශයෙන්ම සිදුවූ වෙනස්කම් අතරෙහි බලපෑම්); සහ

(ආ) ආයුගණක උපකල්පන වෙනස්වීම් හි බලපෑම්.

සැළසුම් වත්කම් මත ඵලදාව යනු සැළසුම්ගත වත්කම්වලින් ඉපදවිය හැකි පොලී ලාභාංශ සහ වෙනත් ආදායම් සහ සැලසුම්ගත වත්කම් මත වෙනත් ආදායම් සහ උපලබ්ධි වූ සහ උපලබ්ධි නොවූ ප්‍රතිලාභ හෝ අලාභ ඇතුළත් සහ ඒ මත පහත දේ අඩුකර,

(අ) සැළසුම් වත්කම් කළමණාකරණයේ යම් පිරිවැය; සහ

(ආ) නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගය මිනුම් කිරීමට භාවිතා කළ ආයු ගණන උපකල්පනයන් හි ඇතුළත් බදු හැර සැළසුම මගින්ම ගෙවිය යුතු කිසියම් බද්දක්

නිරවුල් කිරීමක් යනු ආයු ගණන උපකල්පනයක් ඇතුළත් සැලසුමේ කොන්දේසිවල දක්වෙන සේවකයන්ට හෝ ඔවුන් වෙනුවෙන් ගෙවනු ලබන ප්‍රතිලාභ හැර නිර්වචිත ප්‍රතිලාභ සැලසුමක් යටතේ ප්‍රතිපාදනය කර තිබෙන සියලුම ප්‍රතිලාභ හෝ ඉන් කොටසක් වෙනුවෙන් අනාගත නෛතික හෝ සම්මුතික බැඳීම් සියල්ලම මුළුමණින්ම ඉවත් කරන ගණුදෙනුවකි.

## කෙටි කාලීන සේවක ප්‍රතිලාභ

9. සේවකයන් ඉටුකරන ලද සම්බන්ධිත සේවාවන් සඳහා වාර්තා කරන කාලපරිච්ඡේදයෙන් පසු මාස දොළහකට පෙර සම්පූර්ණයෙන් බේරුම් කිරීමට අපේක්ෂා කරන්නේ නම්, පහත සඳහන් අයිතම කෙටි කාලීන සේවක ප්‍රතිලාභවලට ඇතුළත් ය;

(අ) වැටුප්, වේතන සහ සමාජ ආරක්‍ෂණ දායක වීම්;

(ආ) ගෙවීම් කරන වාර්ෂික නිවාඩු හා ගෙවීම් කරන අසනීප නිවාඩු;

(ඇ) ලාභයට හවුල්වීම සහ පාරිතෝෂික; සහ

(ඈ) ප්‍රවර්තන සේවකයන් සඳහා මුල්‍ය නොවන ප්‍රතිලාභ(සෞඛ්‍ය රැකවරණය, නිවාස, මෝටර් රථ සහ අය කිරීමකින් තොර හෝ සහනදායි භාණ්ඩ හෝ සේවා වැනි).

10. අස්තිත්වයේ අපේක්‍ෂාව බේරුම් කිරීමේ කාලයේ වෙනස තාවකාලිකව වෙනස් වන්නේ යයි අපේක්‍ෂා කරන්නේ නම්, එවිට අස්තිත්වය කෙටි කාලීන සේවක ප්‍රතිලාභ යලි වර්ගීකරණය අවශ්‍ය නොවේ. කෙසේ වෙතත් ප්‍රතිලාභ වෙනසේ ගති ලක්‍ෂණ (සමුච්චය නොවන ප්‍රතිලාභවලින් සමුච්චය වන ප්‍රතිලාභවලට වෙනස් වීම් වැනි) හෝ බේරුම් කිරීමට පිළිබඳ කාලයේ වෙනස තාවකාලික නොවේ යැයි අපේක්‍ෂා කරන්නේ නම්, එවිට අස්තිත්වය ප්‍රතිලාභ තවමත් කෙටිකාලීන සේවක ප්‍රතිලාභ නිර්වචනය සපුරා ලන්නේ දැයි සලකා බැලිය යුතු ය.

**හඳුනා ගැනීම සහ මැනීම**

**සියලු කෙටි කාලීන සේවක ප්‍රතිලාභ**

**11. සේවකයෙකු විසින් ගිණුම් කාලපරිච්ඡේදයක් තුළදී අස්තිත්වයකට සේවාවක් සපයා ඇති කල්හි අස්තිත්වය විසින් එම සේවාව සඳහා හුවමාරුව වශයෙන් ගෙවීමට අපේක්ෂිත ප්‍රතිලාභයේ වට්ටම් නොකළ වටිනාකම, කෙටි කාලීන සේවක ප්‍රතිලාභයක් ලෙස හඳුනාගත යුතු ය.**

**(අ) දැනටමත් ගෙවා ඇති යම් මුදලක් අඩු කිරීමෙන් පසු වගකීමක් ලෙස (උපචිත වියදම) දැනටමත් ගෙවා ඇති මුදල ප්‍රතිලාභයෙහි වට්ටම් නොකළ අගය ඉක්මවා යන්නේ නම්, අස්තිත්වයක් විසින් එම ඉදිරි ගෙවීම නිසා ඇතිවන ප්‍රමාණයට එම වැඩියෙන් ගෙවූ මුදල (පෙර ගෙවූ වියදම්) වත්කමක් වශයෙන් හඳුනාගත යුතුය. උදාහරණ ලෙස, අනාගත ගෙවීම්වල අඩු වීමක් හෝ මුදල් ආපසු ගෙවීමක් වැනි,**

**(ආ) වෙනත් SLFRS කින් වත්කමක පිරිවැය තුළ එම ප්‍රතිලාභය ඇතුළත් කළ යුතු යයි අවශ්‍ය කිරීම හෝ අවසර දීමක් නොමැති නම්, වියදමක් ලෙස (උදාහරණ ලෙස, LKAS 2 තොග සහ LKAS 16 දේපල, පිරියත හා උපකරණ බලන්න)**

**12. නොපැමිණීම් සඳහා ගෙවීම, ලාභයට හවුල් වීම සහ පාරිතෝෂික සැලසුම් ආකාරයේ කෙටිකාලීන සේවක ප්‍රතිලාභවලට, අස්තිත්වයක් 11 වන ඡේදය ව්‍යවහාර කරන්නේ කෙසේ ද යන්න 13, 16 සහ 19 ඡේද පැහැදිලි කරයි.**

**කෙටිකාලීන නොපැමිණීම් සඳහා ගෙවීම් -**

**13. අස්තිත්වයක් විසින් 11 වන ඡේදය යටතේ නොපැමිණීම සඳහා ගෙවීම ආකාරයේ අපේක්ෂිත කෙටිකාලීන සේවක ප්‍රතිලාභ පිරිවැය ලෙස පහත පරිදි හඳුනාගත යුතු ය ඃ**

**(අ) නොපැමිණීම වෙනුවෙන් ගෙවීම සම්මුච්චිතවන අවස්ථාවල සේවකයා අනාගත නොපැමිණීම සඳහා ගෙවීම් හිමිකම වැඩිකරන සේවා සපයන කල්හි ;**

**(ආ) ගෙවීම් කරන නොපැමිණීම සමුච්චිත නොවන අවස්ථා වලදී, නොපැමිණීම ඇති වූ කල්හි.**

14. අස්තිත්වයක් අසනීප නිවාඩු සහ කෙටිකාලීන දුර්වලතා, පීතෘත්වය, මාතෘත්වය ජූරි සේවය සහ හමුදා සේවය ඇතුළත්ව විවිධ හේතූන් සඳහා නොපැමිණීමට සේවකයන් සඳහා ගෙවීම් කළ හැකිය. නොපැමිණීම සඳහා ගෙවීම් කාණ්ඩ දෙකකට ගැනේ ඃ

(අ) සමුච්චිත; සහ

(ආ) සමුච්චිත නොවන.

15. නොපැමිණීම සඳහා ගෙවීම සම්මුච්චිත කිරීම් ප්‍රවර්තන කාලපරිච්ඡේදය තුළ දී අදාළ හිමිකම සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට නොගන්නේ නම් ඉදිරියට ගෙන ගොස් අනාගත කාල පරිච්ඡේදයක දී එම හිමිකම ප්‍රයෝජනයට ගත හැකිය. ගෙවීම් සහිත නොපැමිණීම් එකඟවීමට එක්කෝ නීතිමය හිමිකම් තිබීමකි (වෙනත් වචන වලින් කිවහොත් අස්තිත්වයෙන් ඉවත්ව යාමේ දී ලබා නොදුන් හිමිකම් සඳහා සේවකයකට මුදලින් ගෙවනු ලැබීමට හිමිකමක් ඇත). නැතහොත් නීතිමය වශයෙන් හිමිකම් නොතිබීමකි. (ඉවත්ව යාමේ දී ලබා නොගත් හිමිකම් සඳහා ගෙවනු ලැබීමකට සේවකයන්ට හිමිකමක් නැත). සේවකයන්ගේ නොපැමිණීම සඳහා ගෙවීම් හිමිකම අනාගතයේ දී වැඩිවන සේවා සැපයීම හේතුවෙන් වගකීමක් පැන නගී. එකගව තිබෙන නීතිමය වශයෙන් නොතිබෙන හිමිකමක් භාවිතා කිරීමට පෙර සේවකයන් ඉවත්ව යාම එම බැඳීම් මිනුම කෙරෙහි බලපෑමේ හැකියාව තිබෙන නමුත් ගෙවීම් සහිත නොපැමිණීම නීතිමය වශයෙන් හිමිකම් නොතිබෙන වුව ද බැඳීම් පවතින්නේ ය. එමෙන්ම හඳුනාගනු ලබන්නේ ය.

**16. අස්තිත්වය වර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයට සමුච්චිතව ඇති ප්‍රයෝජනයට නොගත් හිමිකමෙහි ප්‍රතිඵලයක් වශයෙන් අස්තිත්වයක් ගෙවීමට අපේක්ෂිත අතිරේක මුදලක් වශයෙන් එම සමුච්චිත නොපැමිණීම සඳහා ගෙවීමේ අපේක්ෂිත පිරිවැය මැනිය යුතුය.**

17. ඉහතින් දැක්වෙන ඡේදයෙහි දක්වා ඇති ක්‍රමය, අදාළ ප්‍රතිලාභය සමුච්චිත වීම යන කරුණ නිසාම ඇතිවනු ඇතැයි අපේක්ෂිත අතිරේක ගෙවීමෙහි වටිනාකමින් ඇතිවන බැඳීම මිණුම් කරයි. බොහෝ අවස්ථාවන්වල දී, අස්තිත්වයක් එහි භාවිතා නොකළ ලබා නොගත් නොපැමිණීම සඳහා ගෙවීම් බැඳීම් ප්‍රමාණාත්මක නොවන බවට ඇස්තමේන්තු කර ගැනීම සඳහා විස්තරාත්මක

ගණනය කිරීම් අවශ්‍ය නොවේ. උදාහරණය වශයෙන්, අසනීප නිවාඩු බැඳීම ප්‍රමාණාත්මක වියහැකි වන්නේ ලබානොගත් අසනීප නිවාඩු ගෙවීම්, විවේක නිවාඩු ගෙවීමක් වශයෙන් ගත හැකි බවට විධිමත් හෝ අවිධිමත් අවබෝධයක් පවතින්නේ නම් පමණි.

**16 සහ 17 වැනි ඡේද නිදර්ශන මගින් පහදා දීමේ උදාහරණය**

අස්තිත්වයකට වාර්ෂිකව එක් එක් සේවකයාට වැඩ කරන දින පහක අසනීප ගෙවීම් ලැබෙන නිවාඩු හිමිකම් ඇති සේවකයන් 100ක් සිටියි. ලබානොගත් අසනීප නිවාඩු එක් ලිත් වර්ෂයක් සඳහා ඉදිරියට ගෙන යා හැකිය. අසනීප නිවාඩු ලබා ගන්නේ පළමුව ප්‍රවර්තන වර්ෂයෙහි හිමිකමෙන්ද, ඉතිරිය පෙර වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ යම් නිවාඩුවලින් ද වශයෙන් ලබා ගනු ලැබේ (අන්තිමට පිවිසි මුලන් නිකුතු පදනම මතය). 20x1 දෙසැම්බර් 31 දිනට ලබානොගත් සාමාන්‍ය හිමිකම සේවකයෙකු වෙනුවෙන් දින දෙකක් බැගිනි. අස්තිත්වය පසුගිය අත්දැකීම් පදනම් මත ඉදිරියට ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂා කරන අතර 20x2 දී සේවකයන් 92ක් දින 5 කට වඩා ගෙවීම් කරනු ලබන අසනීප නිවාඩු ලබා නොගනු ඇතැයි ද, ඉතිරි සේවකයන් 8 සාමාන්‍යයෙන් දින හයහමාරක් බැගින් ගෙවීම් කරනු ලබන අසනීප නිවාඩු ලබාගනු ඇතැයිද අපේක්ෂා කරයි.

*අස්තිත්වය 20x1 දෙසැම්බර් 31 ට ලබා නොගත් සමුච්චය හිමිකමෙහි ප්‍රතිඵල වශයෙන් අමතර දින 12 ක් අසනීප නිවාඩු ගෙවනු ඇතැයි අපේක්ෂා කෙරේ (දින එකහමාර බැගින් සේවකයන් 8 දෙනාට) එබැවින්, අස්තිත්වය දින 12 කට සමාන අසනීප නිවාඩු ගෙවීම් වගකීමක් ලෙස හඳුනා ගනී.*

18. සමුච්චිත නොවන නොපැමිණීමේ ගෙවීම් ඉදිරියට ගෙන යනු නොලබයි. ප්‍රවර්තන හිමිකම සම්පූර්ණයෙන් ලබා නොගතහොත් එය කල් ඉකුත්වන අතර, සේවකයන් අස්තිත්වය හැර යාමේදී එම ලබා නොගත් හිමිකම් වෙනුවෙන්, මුදල් ගෙවීමකට හිමිකම් නොලබයි. මෙය අසනීප නිවාඩු ගෙවීම් (ලබා නොගත් අතීත හිමිකම ඉදිරි අනාගත හිමිකම ඉහළ නැංවීම නොවන ප්‍රමාණයට) මාතෘත්ව හෝ පීතෘත්ව නිවාඩු, ජූරි සේවා සහ හමුදා සේවා සඳහා ගෙවීම් වැනි අවස්ථාවලට පොදුවේ. සේවකයාගේ සේවය මගින් ප්‍රතිලාභ වටිනාකම වැඩි නොවන නිසා, නොපැමිණෙන අවස්ථාව තෙක් අස්තිත්වය වගකීමක් හෝ වියදමක් හඳුනා නොගනී.

**ලාභයට හවුල් වීමේ සහ ප්‍රසාද දීමනා සැලසුම්**

**19. අස්තිත්වයක් ලාභයට හවුල්වීම සහ ප්‍රසාද දීමනාවල අපේක්ෂිත පිරිවැය 11වැනි ඡේදය යටතේ පහත දැක්වෙන අවස්ථාවලදී පමණක් හඳුනාගත යුතුය :**

**(අ) අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස එවැනි ගෙවීමක් කිරීම අස්තිත්වයට වර්තමානයේ නෛතික හෝ සම්මුතික බැඳීමක් තිබීම ; සහ**

**(ආ) එම බැඳීමේ විශ්වාසදායක ඇස්තමේන්තුවක් ලබා ගත හැකි වීම.**

**වර්තමාන බැඳීමක් ඇති වන්නේ ගෙවීම් කිරීම විනා වෙනත් කිසිදු යථාර්තවාදී විකල්පයක් නොමැති අවස්ථාවකදී පමණි.**

20. ඇතැම් ලාභ හවුල් වීමේ සැලසුම් යටතේ සේවකයන් අදාළ අස්තිත්වය සමග නිශ්චිත කාලසීමාවක් රැඳී සිටියේ නම් පමණක් ඔවුන්ට ලාභ කොටසක් ලැබේ. සේවකයන් නිශ්චිත කාල සීමාව අවසාන වනතුරු සේවයේ රැඳී සිටින්නේ නම් ඔවුනට ගෙවිය යුතු වටිනාකම ඉහළ යන බැවින් එවැනි සැලසුම් සම්මුතික බැඳීමක් ඇති කරයි. එවැනි සම්මුතික බැඳීම් මැනීම තුළින් ඇතැම් සේවකයන් ලාභයට හවුල්වීමේ ගෙවීම් නොලබා සේවයෙන් ඉවත් වීමේ හැකියාව පිළිඹිබු කරයි.

**20 වැනි ඡේදය නිදර්ශන මගින් පහදාදීමේ උදාහරණය**

ලාභ හවුල්වීමේ සැලසුමක් මගින් අස්තිත්වයක් එහි ශුද්ධ ලාභයෙන් නිශ්චිත අනුපාතයක් වර්ෂය පුරා සේවයේ නියුක්ත සේවකයන්ට ගෙවීමට අවශ්‍ය වර්ෂය තුළදී එක් සේවකයෙකු හෝ සේවය අත් නොහැරී නම්, මුළු ලාභ හවුල්වම ලාභයෙන් සියයට 3කි. සේවක පිරිවැටුම නිසා එම ගෙවීම ලාභයෙන් සියයට 2.5 කට අඩුවෙතැයි අස්තිත්වය ඇස්තමේන්තු කර ඇත. *අස්තිත්වය එහි ශුද්ධ ලාභයෙන් සියයට 2.5 ක වගකීමක් හඳුනා ගනී.*

21. අස්තිත්වයකට ප්‍රසාද දීමනා ගෙවීමේ නීතිමය බැඳීමක් නොතිබිය හැකිය. එසේ වුවද සමහර අවස්ථාවල අස්තිත්වයට ප්‍රසාද දීමනා ගෙවීමේ පුරුද්දක් ඇත. එවැනි අවස්ථාවල ප්‍රසාද දීමනා ගෙවීම හැර වෙනත් යථාර්තවාදී විකල්පයක් නොමැති හෙයින්, අස්තිත්වයට සම්මුතික බැඳීමක් ඇත. මෙම සම්මුතික බැඳිම මැනීම, ප්‍රසාද දීමනා නොලබා සේවකයන් සේවය හැර යාමට ඇති ඉඩ ඇති බව පිළිබිඹු කරයි.

22. අස්තිත්වයට එහි ලාභයට හවුල් වීම හෝ ප්‍රසාද දීමනා සැලසුම් යටතේ ඇතිවන නෛතික හෝ සම්මුතික බැඳීම විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළ හැක්කේ පහත සඳහන් අවස්ථාවන්වලදී පමණි.

(අ) සැලසුමක් විධිමත් කොන්දේසි ප්‍රතිලාභමුදල් ගණන් බැලීම නිර්ණය කිරීම සඳහා සූත්‍රයක් අන්තර්ගත වීම.

(ආ) අස්තිත්වය තම මූල්‍ය වාර්තා නිකුත් කිරීම සඳහා අනුමත කිරීමට පෙර ගෙවිය යුතු වටිනාකම අස්තිත්වයට නිර්ණය කිරීම ; හෝ

(ඇ) පෙර පරිචයන් අස්තිත්වයේ සම්මුතික බැඳීම් වටිනාකම පිළිබඳ පැහැදිලි සාක්ෂි ලබාදීම.

23. ලාභයට සහභාගී වීමේ සහ ප්‍රසාද ගෙවීම්, සේවක සේවාවල ප්‍රතිඵලයක් ලෙස ඇතිවන බැඳීමක් වන අතර, අස්තිත්වයේ අයිතිකරුවන් සමඟ වන ගණුදෙනුවක් නොවේ. එබැවින් ලාභයට සහභාගිවීමේ සහ ප්‍රසාද සැලසුම් පිරිවැය ලාභය බෙදාහැරීමක් නොව වියදමක් ලෙස අස්තිත්වය හඳුනා ගනී.

24. සේවකයා තම සේවය සැපයූ වාර්තාකරණ කාලපරිච්ඡේදය පසුවී මාස දොළහකට පෙර ලාභයට සහභාගී වීමේ සහ ප්‍රසාද ගෙවීම් සම්පූර්ණයෙන් පියවීමට අපේක්ෂා නොකරයි නම්, එම ගෙවීම් වෙනත් දිගු කාලීන සේවක ප්‍රතිලාභවේ (153.-158) ඡේද බලන්න.

**හෙළිදරව් කිරීම**

25. මෙම ප්‍රමිතිය අනුව කෙටිකාලීන සේවක ප්‍රතිලාභ පිළිබඳව නිශ්චිත හෙළිදරව් කිරීම් අවශ්‍ය නොවුවනද, වෙනත් SLFRS වලින් හෙළිදරව් කිරීමේ අවශ්‍යතා දක්වා තිබිය හැකිය. උදාහරණයක් ලෙස LKAS 24 අනුව කළමණාකාරීත්වයේ ප්‍රමුඛ තනතුරු දරණ පුද්ගලයන්ගේ, සේවක ප්‍රතිලාභ හෙළිදරව් කිරීම අවශ්‍ය වේ. LKAS 1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම අනුව සේවක ප්‍රතිලාභ වියදම හෙළිදරව් කිරීම අවශ්‍ය වෙයි.

**පශ්චාත් - සේවක ප්‍රතිලාභ නිර්වචිත දායක සැලසුම් සහ නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් අතර වෙනස**

26. පශ්චාත් සේවක ප්‍රතිලාභවලට පහත සඳහන් අයිතම වැනි දෑ ඇතුළත් වෙයි.

(අ) විශ්‍රාම ප්‍රතිලාභ(උදාඃ විශ්‍රාම වැටුප සහ විශ්‍රාම ගැනීමේදී එකවර ගෙවන මුදල); සහ

(ආ) පශ්චාත් සේවක ජීවිත රක්ෂණ සහ පශ්චාත් සේවක වෛද්‍ය සේවා වැනි වෙනත් පශ්චාත් - සේවා ප්‍රතිලාභ

අස්තිත්වයක් පශ්චාත් සේවා ප්‍රතිලාභ වැඩපිළිවෙළ මගින් සලසනු ලබන පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් ප්‍රතිලාභවෙයි. දායක මුදල් ලැබීමට සහ ප්‍රතිලාභ ගෙවීමට වෙනම අස්තිත්වයක් ස්ථාපනය කර ඇතත්, නැතත්, එවැනි සියලුම වැඩපිළිවෙල සඳහා අස්තිත්වයන් මෙම ප්‍රමිතිය ව්‍යවහාර කරයි.

27. පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් සැලසුමේ මූලික කරුණු සහ කොන්දේසි තුළින් පැන නගින ආර්ථික හරය මත පදනම්ව , නිර්වචිත ප්‍රතිලාභසැලසුම් හෝ නිර්වචිත දායක සැලසුම් වශයෙන් වර්ගීකරණය කෙරේ.

28. නිර්වචිත දායක සැලසුම් යටතේ අස්තිත්වයක නෛතික හෝ සම්මුතික බැඳීම, අරමුදලට දායක වීමට එකගවූ ප්‍රමාණයට සීමා වෙයි. එබැවින් සේවකයාට ලැබෙන පශ්චාත් - සේවා ප්‍රතිලාභයෙහි වටිනාකම අස්තිත්වය විසින් (සහ ඇතැම් විට සේවකයා විසින්) පශ්චාත්- සේවා ප්‍රතිලාභ සැලසුමට හෝ රක්ෂණ සමාගමට, අදාළ දායක මුදල තුළින් ජනිතවන ආයෝජන ප්‍රතිලාභද සමඟ ගත්විට ලැබෙන වටිනාකම මත තීරණය කෙරේ. එහි ප්‍රතිඵලයක් ලෙස, ආයුගණක අවදානම (අපේක්ෂිත මට්ටමට වඩා ප්‍රතිලාභය අඩු වීම) සහ ආයෝජන අවදානම (අපේක්ෂිත ප්‍රතිලාභ සපුරාලීමට ආයෝජන වත්කම් ප්‍රමාණාත්මක නොවීම) සේවකයා මත පතිත වෙයි.

29. අස්තිත්වයක බැඳීම එය අරමුදලට දායක වීමට එකඟ වූ ප්‍රමාණයට සීමා නොවන බව, පහත දැක්වෙන නෛතික සහ සම්මුතික බැඳීම් තුළින් ඇතිවීමේ අවස්ථා පිළිබඳ උදාහරණ වෙයි;

(අ) සැලසුම් ප්‍රතිලාභ සූත්‍රය සම්පූර්ණයෙන්ම දායක මුදලට සම්බන්ධ නොවී, සැලසුමේ ප්‍රතිලාභ සැලසුම් සූත්‍රය අනුව සපුරාලීමට නොහැකි නම්, අස්තිත්වය තවදුරටත් දායක මුදල් සැපයීම අවශ්‍ය වෙයි.

(ආ) එක්කෝ සැලසුමක් හරහා වක්‍රව හෝ සෘජුව දායකත්වය මත නිශ්චිත එලදා සහතික වීමක්; හෝ,

(ඇ) සම්මුතික බැඳීමක් ඇති කිරීමට තුඩු දෙන අවිධිමත් පරිචයක් උදාහරණයක් වශයෙන් අස්තිත්වයක් අතීතයේදී ඉවත් වූ සේවකයන් සඳහා උද්ධමනයට සමවීමට වැඩි කළ ප්‍රතිලාභ ගෙවා ඇත්නම්, නෛතික බැඳීමක් නොමැති වුවද සම්මුතික බැඳීමක් වර්ධනයට එය තුඩු දෙනු ඇත.

30. නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් යටතේ,

(අ) ප්‍රවර්තන සහ කලින් සිටි සේවකයන්ට, සැලසීමට එකඟ වූ ප්‍රතිලාභ ගෙවීමට අස්තිත්වයට ඇති බැඳීම; හෝ

(ආ) හරය ලෙස, අස්තිත්වය මත පතිතවන, ආයුගණක අවදානම (ප්‍රතිලාභ අපේක්ෂිත පිරිවැයට වඩා වැඩි වීම) ආයුගණකයේ ආයෝජන පළපුරුද්ද අනුව අපේක්ෂිතය වඩා අයහපත් නම්; අස්තිත්වයේ බැඳීම් ඉහළ යනු ඇත.

31. 32-.49 ඡේද, බහු සේව්‍ය සැලසුම්වලට සම්බන්ධ නිර්වචිත දායක සැලසුම් සහ නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්, පොදු පාලනයක් යටතේ අවදානම අස්තිත්වයන් අතර බෙදාගන්නා නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්, රාජ්‍ය සැලසුම් සහ රක්ෂණ ප්‍රතිලාභ අතර ප්‍රභේදනය පැහැදිලි කරයි.

**බහු සේව්‍ය සැලසුම්**

32. සැලසුමේ කොන්දේසි යටතේ, අස්තිත්වයක් බහු සේව්‍ය සැලසුම් නිර්වචිත දායක සැලසුම් හෝ නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් ලෙස වර්ගීකරණය කළ යුතුය. (විධිමත් කොන්දේසි අභිබවා යන ඕනෑම සම්මුතික බැඳීමක් ඇතුළත්ව).

33. 34 වැනි ඡේදය ව්‍යවහාර වන්නේ නම් හැර බහු සේව්‍ය නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්වලට අස්තිත්වයක් සහභාගි වන්නේ නම්, එය විසින් :

(අ) වෙනත් එවැනි නිර්වචිත ප්‍රතිලාභ සැලසුමක් සඳහා වන ආකාරයටම නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්, සැලසුම් වත්කම් සහ සැලසුම ආශ්‍රිත පිරිවැය එහි සමානුපාතික කොටස සඳහා ගිණුම් තැබිය යුතුය; සහ

(ආ) 135-.148 ඡේද මගින් අවශ්‍ය තොරතුරු හෙළිදරව් කිරීම (148 (ඇ) ඡේදය හැර).

34. බහුසේව්‍ය නිර්වචිත ප්‍රතිලාභ සැලසුමක් සඳහා නිර්වචිත ප්‍රතිලාභ ගිණුම්කරණය භාවිතා කිරීමට ප්‍රමාණවත් තොරතුරු නොමැති කල්හි, අස්තිත්වයක් විසින් පහත සඳහන් පියවර ගත යුතුය .

(අ) එය නිර්වචිත ප්‍රතිලාභ සැලසුමක් ලෙස නම්, 51 සහ 52 ඡේද ප්‍රකාර සැලසුම සඳහා ගිණුම් තැබීම; සහ

(ආ) 148 ඡේදය මගින් අවශ්‍ය කරන තොරතුරු හෙළිදරව් කිරීම

35. බහු සේව්‍ය ප්‍රතිලාභ සැලසුමක එක උදාහරණයක් නම් :

(අ) ඉදිරියටයන ගමන් පදනමක් මත ගෙවීමේ සැලසුම මුල්‍යාණය කිරීම, එම කාලපරිච්ඡේදය තුළ ගෙවීමට සිදුවන ප්‍රතිලාභ ගෙවීම්වලට ප්‍රමාණවත් මට්ටමක දායක මුදල් නියම කිරීම, සහ ප්‍රවර්තන වර්ෂය තුළදී උපයනු ලැබූ අනාගත ප්‍රතිලාභ, අනාගත දායක මුදල්වලින්; වෙනු ලැබීම; සහ

(ආ) සේවකන්ට අදාල ප්‍රතිලාභ ඔවුන්ගේ සේවා කාලයේ දීර්ඝ ප්‍රමාණය අනුව නිර්ණයකරන අතර සහභාගිත්ව අස්තිත්වයන්ට එය ආපසු ගන්නා දිනය දක්වා ඔවුන් උපයන ලද ප්‍රතිලාභ ගෙවීමෙන් තොරව සැලසුමෙන් ඉවත් වීමට යථාර්තවාදී මාර්ගයක් නොමැත. එවැනි සැලසුමකින් අස්තිත්වය සඳහා ආයුහගණක අවදානමක් ඇති කරයි. වාර්තාකරණ කාලපරිච්ඡේදය සඳහා දැනටමත් උපයාගෙන ඇති අවසාන ප්‍රතිලාභ පිරිවැය අපේක්ෂා කල ප්‍රමාණයට වැඩි නම් අස්තිත්වයට තමාගේ දායකය වැඩි කිරීමට හෝ සේවකයනට අඩුකළ ප්‍රතිලාභ ලබාගන්නා ලෙස පෙළඹවීමට සිද්ධවෙයි. එමනිසා එවැනි සැලසුමක් නිර්වචිත ප්‍රතිලාභ සැලසුමකි.

36. බහුසේව්‍ය නිර්වචිත ප්‍රතිලාභ සැලසුමක් පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු පවත්නා විට, අස්තිත්වයක් එහි නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල එහි සමානුපාතික කොටස සඳහා, සැලසුම් වත්කම් සහ සැලසුම සමඟ ආශ්‍රිත පශ්චාත් සේවා පිරිවැය සඳහා වෙනත්

නිර්වචිත ප්‍රතිලාභ සැලසුමක ආකාරයට ගිණුම් තබයි. කෙසේ වෙතත් අස්තිත්වයක් සැලසුමේ පාදක වන මූල්‍ය තත්ත්වය සහ කාර්ය සාධනයේ කොටස ගිණුම් කරන අරමුණ සඳහා ප්‍රමාණවත් විශ්වාස දායකත්වය අතින් හඳුනා නොගැනීමට ඉඩකඩ ඇත. මෙය සිදුවීමට නම් ඃ

(අ) අනෙකුත් අස්තිත්තවල දැනට සිටින සහ කලින් සිටි සේවකයන් ආශ්‍රිත ආයුගණන අවදානම් වලට සැලස්ම විසින් සහභාගි වන අස්තිත්ව අනාවෘත කිරීමේ ප්‍රතිඵලය නම් බැඳීම සැලසුමේ වත්කම් සහ පිරිවැය සහ මේවා සැලසුම සඳහා සහභාගි වන එක් එක් අස්තිත්ව අතර වෙන් කිරීම සඳහා සංගත වූ ද, විශ්වශනීය වූ ද පදනමක් ඇති වීමක් ; හෝ

(ආ) මෙම ප්‍රමිතියේ අවශ්‍යතා සපුරාලීමට සැලසුම පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු සඳහා අස්තිත්වයට ප්‍රවේශයක් නැත.

එවැනි අවස්ථාවල නිර්වචිත දායක සැලසුමක ආකාරයට අස්තිත්වය වුයේ ලෙස සලකා සැලසුම සඳහා ගිණුම් තබා, 148 වන ඡේදය මගින් අවශ්‍ය තොරතුරු හෙළිදරව් කළ යුතු ය.

37. සැළසුමේ අතිරික්තය (හෝ ඌණතාවය අරමුදල් කරනය) බෙදාගන්නා ආකාරය නිශ්චය කිරීමට බහුසේව්‍ය සැලැස්මක සහ එහි සහභාගි වන්නන් අතර ගිවිසුම්ගත එකගවීමත් තිබිය හැකිය. 34 වන ඡේදය ප්‍රකාර සැලැස්මක් සඳහා නිර්වචිත දායක සැලැස්මක් ලෙස ගිණුම් තබන බහු සේව්‍ය සැලසුමක සහභාගිවන්නේ එවැනි ගිවිසුම්ගත එකගතාවයකින් පැනනගින වත්කම් සහ වගකීම් සහ ප්‍රතිඵලය මත ඇතිවන ආදායම හෝ වියදම ලාභයේ හෝ අලාභයෙහි හඳුනා ගත යුතුය.

| **37 වෙනි ඡේදය නිදර්ශන මගින් පැහැදිලි කරන උදාහරණයක්** |
|---|
| LKAS 19 පදනම මත තක්සේරු සැලසුම් පිළියෙල නොකරන බහු සේව්‍ය නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මකට අස්තිත්වයක් සහභාගිවෙයි. එම නිසා එය නිර්වචිත දායක සැලස්මක් වුයේ යයි යන ලෙසට සලකා සැලැස්ම සඳහා ගිණුම් තබයි. LKAS 19 පදනම් කර නොගත් අරමුදල්ගත තක්සේරුවක්, සැලසුමෙහි රුපියල් මිලියන 100 ක ඌනතාවයක් පෙන්නුම් කරයි. සැලැස්මේ පාර්ශවකාර සේවකදායින් සමග ගිවිසුමක් යටතේ උපලේඛනයක් මගින් ඊළඟ පස් වසර තුල ඌනතාවය ඉවත් කිරීමට සැලැස්ම එකගවී ඇත. ගිවිසුම යටතේ අස්තිත්වයේ සම්පුර්ණ දායකත්වය රුපියල් මිලියන 8 කි. දායකත්වය සඳහා කාලීන අගයට ගැලපුම් කර දායකත්වය සහ ලාභයට හෝ අලාභයට සමාන වියදම් සඳහා අස්තිත්වය වගකීමක් හඳුනා ගනී. |
| *(අ) මෙම නිදර්ශනයේ මූල්‍ය වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වේ.* |

38 බහුසේව්‍ය සැළසුම් සමූහ පරිපාලන සැළසුම්වලට වඩා වෙනස්ය. සමූහ පරිපාලන සැළසුම් යනු, අයෝජන කාර්යය සඳහා සහ ආයෝජන කළමණාකරන සහ පරිපාලන පිරිවැය අඩු කිරීම සඳහා සහභාගි වන එක් එක් සේවකයන්ට ඔවුන්ගේ වත්කම් එක්රැස් කිරීමේ යෙදෙන හුදු සේව්‍ය සැළසුම් ය. නමුත් විවිධ සේව්‍යයන්ගේ හිමිකම් ඉල්ලීම්, තම සේවකයන්ගේ ප්‍රතිලාභ සඳහා පමණක්ම වෙන් කරනු ලැබේ. සමූහ පරිපාලන සැළසුම් සඳහා විශේෂිත ගිණුම්කරන ගැටළු ඇති නොවේ. මක්නිසාද යත්, වෙනත් ඕනෑම කේවල සේව්‍ය සැළසුමක ආකාරයට, ඒවාට කටයුතු කිරීමට තොරතුරු පහසුවෙන් ලබාගත හැකිය. තව ද, එවැනි සැළසුම් වෙනත් අස්තිත්තවල ප්‍රවර්ථන සහ කලින් සිටි සේවකයන් සමඟ ආශ්‍රිත වූ ආයුගණක අවදානම් වලට සහභාගිවන අස්තිත්ව අනාවෘත නොවේ. සැලැස්මේ කොන්දේසි ප්‍රකාරව (විධිමත් කොන්දේසි අභිබවායන යම් සම්මුතික කොන්දේසි ද ඇතුලත් වේ.) මෙම ප්‍රමිතියේ ඇති නිර්වචනයන්ගෙන් සමූහ පරිපාලන සැලැස්මක් නිර්වචිත දායකත්ව සැලැස්මක් හෝ නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක් ලෙස අස්තිත්වයක් විසින් වර්ගීකරණය කිරීම අවශ්‍ය වෙයි.

39. **බහු සේව්‍ය නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක් විසුරුවා හැරීමකදී හෝ බහු සේව්‍ය නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මකින් අස්තිත්වය ඉවත් වීමකදී එයට අදාල වගකීම් හඳුනාගත යුතු වෙලාව සහ එය මැනිය යුත්තේ කෙසේද යන්න අස්තිත්වය LKAS 37 ප්‍රතිපාදන, අසම්භව්‍ය වගකීම් සහ අසම්භව්‍ය වත්කම් ව්‍යවහාර කළ යුතුය.**

**පොදු පාලනයක් යටතේ අස්තිත්වයන් අතර අවදානම් බෙදා ගන්නා නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්**

40. උදාහරණයක් ලෙස, පරිපාලකයක් සහ එහි පාරිපාලිත පොදු පාලනයක් යටතේ අස්තිත්වයන් අතර අවදානම් බෙදා ගන්නා නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් බහු සේව්‍ය සැලසුම් නොවේ.

41. එවැනි සැලැස්මකට සහභාගිවන අස්තිත්වයකට මෙම ප්‍රමිතිය ප්‍රකාර මිණුම් කරන ලද සමස්ථ සැලැස්ම එකී සැලැස්මට ව්‍යවහාරවන උපකල්පන පදනම්කර, සැලැස්ම පිළිබඳ තොරතුරු ලබා ගත යුතුය. සැලැස්ම සඳහා ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ පිරිවැය සමස්ථයක් ලෙස මෙම ප්‍රමිතිය ප්‍රකාර මිණුම්කරණ සමූහ අස්තිත්වයකට අය කිරීම සඳහා ගිවිසුම්ගත එකගවීමක් හෝ ප්‍රකාශිත ප්‍රතිපත්තියක් ඇතිනම් අස්තිත්වයේ එහි වෙන්ව ඉදිරිපත් කරන හෝ තනි මූල්‍ය ප්‍රකාශනයන්හි එසේ අය කරන ලද

ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ පිරිවැය හඳුනාගත යුතුය. එවැනි ගිවිසුමක් හෝ ප්‍රතිපත්තියක් නොමැති නම් ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ පිරිවැය සමූහ අස්තිත්වයෙහි එනම්, සැලසුමක් සඳහා නෛතික ග්‍රාහකත්වය දරණ සේව්‍යයාගේ වෙන්ව ඉදිරිපත් කරන හෝ තනි මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතුය. අනෙක් සමූහ අස්තිත්ව ඔවුන්ගේ වෙන්ව ඉදිරිපත් කරන හෝ තනි මූල්‍ය ප්‍රකාශන වල කාලපරිච්ඡේදය සඳහා ගෙවිය යුතු ඔවුන්ගේ දායක මුදලට සමාන පිරිවැයක් හඳුනාගත යුතුය.

42. එවැනි සැලැස්මක සහභාගිත්වයන් සෑම එක් එක් සමූහ අස්තිත්වය සඳහා සම්බන්ධිත පාර්ශවය ගනුදෙනුවකි. එම නිසා අස්තිත්වයක් විසින් එහි වෙන්ව ඉදිරිපත් කරන හෝ එක් එක් මූල්‍ය ප්‍රකාශනවල 149 වන ඡේදය මගින් අවශ්‍ය තොරතුරු හෙළිදරව් කළ යුතුය.

**රාජ්‍ය සැළසුම්**

43. **අස්තිත්වයක් රාජ්‍ය සැළසුම් සඳහා ගිණුම්ගත කිරීම් සඳහා වූ ගිණුම්ගත කිරීමේ ආකාරයටම කළ යුතුය. ( 32--39 ඡේද බලන්න)**

44. රාජ්‍ය සැළසුම් සියළුම අස්තිත්වයන් ආවරණය කිරීමට ව්‍යවස්ථාදායක මගින් ස්ථාපනය කරනු ලබන (හෝ නිශ්චිත කාණ්ඩයක ඇති සියළුම අස්තිත්වයක් උදාහරණ ලෙස, නිශ්චිත කර්මාන්තයක්) සහ ජාතික හෝ පළාත් පාලන හෝ වෙනත් ආයතනයක් (උදාහරණ ලෙස, එම කාර්යය සඳහාම විශේෂිත ඇති කරන ලද ස්වායත්ත නියෝජිත ආයතනයක්) මගින් මෙහෙයවන වාර්තා කරන අස්තිත්වය මගින් පාලනයට හෝ එහි බලපෑමකට යටත් නොවන්නකි. අස්තිත්වයක් මගින් ස්ථාපිත සමහර සැළසුම්, රාජ්‍ය සැලසුමක් යටතේ ආවරණය වන ප්‍රතිලාභ සඳහා ආදේශයන් ලෙස අනිවාර්ය ප්‍රතිලාභ සහ අමතර ස්වේච්ඡා ප්‍රතිලාභයද සලසනු ලබයි. එවැනි සැළසුම් රාජ්‍ය සැලසුම් නොවේ.

45. සැළසුම් යටතේ අස්තිත්වයේ බැඳීම් මත පදනම්ව එහි ගත් ලක්ෂණ අනුව රාජ්‍ය සැලසුම් නිර්වාචිත ප්‍රතිලාභ හෝ නිර්වාචිත දායක සේ නිර්වචනය කෙරේ. බොහෝ රාජ්‍ය සැළසුම් ඉදිරියට යන ගමන් ගෙවීම පදනම මත මූල්‍යකරණය කෙරේ. එනම් දායකත්වය අදාල කාලපරිච්ඡේදයේ ගෙවීමට අවශ්‍යවන ප්‍රතිලාභ වලට ප්‍රමාණවත් වන අපේක්ෂිත මට්ටමක දායකයන් නියම කෙරේ. ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ දී ඉපයූ අනාගත ප්‍රතිලාභ අනාගත ප්‍රතිලාභ වලින් ගෙවනු ලැබේ. කෙසේ වෙතත්, රාජ්‍ය සැලසුම් බොහොමයක එම ආනාගත ප්‍රතිලාභ ගෙවීමට අස්තිත්වයක නෛතික හෝ සම්මුතික බැඳීමක් නොමැත. රාජ්‍ය සැලැස්මක් සමාජිකයින් වන සේවකයින් සේවයේ යෙදීම අවසන් කළේ නම්, ඒවා ගෙවීම නියමිත කල්හි ඒවා ගෙවීම් අස්තිත්වයේ එකම බැඳීම වෙයි. පෙර වර්ෂ වලදී ස්වකීය සේවකයන් ඉපයූ ප්‍රතිලාභ ගෙවීමේ බැඳීමක් එයට නොමැත. මේ හේතුව නිසා රාජ්‍ය සැළසුම් සාමාන්‍යයෙන් නිර්වාචිත ප්‍රතිලාභ සැළසුමක් වේ. කෙසේ වෙතත් රාජ්‍ය සැළසුමක් නිර්වාචිත ප්‍රතිලාභ සැලසුමක් වන කල්හි අස්තිත්වයක් 32 / 39 ඡේද ව්‍යවහාර කරනු ලබයි.

**රක්ෂිත ප්‍රතිලාභ**

46. **අස්තිත්වයක් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලැස්මකට රක්ෂණ වාරික ගෙවිය හැකිය. අස්තිත්වය එවැනි සැලස්මක් නිපාත සඳහා කරුණු වල (සැලසුම් හරහා සෘජුව හෝ වක්‍රව) අස්තිත්වයට නෛතික හෝ සම්මුතික බැඳීමක් ඇත්නම් හැර නිර්වාචිත දායක සැලැස්මක් ලෙස සැලකිය යුතුය. නැතහොත්,**

**(අ) ගෙවීමට යුතු වන විට සෘජුවම ප්‍රතිලාභ ගෙවීමට හෝ,**

**(ආ) ප්‍රවර්තන සහ පූර්ව කාලපරිච්චේදයන් තුලදී සේවකයන්ගේ අනාගත සේවයට අදාල සියළුම ප්‍රතිලාභ රක්ෂකයා නොගෙවන්නේ නම් තවදුරටත් මුදල් ගෙවීම අස්තිත්වය එවැනි නෛතික හෝ සම්මුතික බැඳීමක් පවත්වා ගෙනයයි නම්. අස්තිත්වය එම සැලැස්ම නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක් ලෙස සැලකිය යුතුය.**

47 රක්‍ෂණ ඔප්පුවක් මගින් රක්ෂණය කළ ප්‍රතිලාභ සඳහා අස්තිත්වයට සේවක ප්‍රතිලාභ සමඟ සෘජු හෝ ස්වයංක්‍රීය සම්බන්ධතා තිබීම අවශ්‍ය නොවේ. රක්‍ෂණ ඔප්පු සමඟ සම්බන්ධ වන ප්‍රශ්චාත් සේවා ප්‍රතිලාභ සැළසුම්, වෙනත් අරමුදල් සැළසුම් ගිණුම්කරණය සහ අරමුදල්කරණය අතර මෙය එම වෙනසටම යටත් වෙයි.

48 අස්තිත්වයක් පශ්චාත්, සේවා ප්‍රතිලාභ බැඳීම් වෙනුවෙන් රක්‍ෂණ ඔප්පුවකට වාරික ගෙවීම මඟින් අර මුදල් සැපයීමේදී (සැලසුම් තුලින්, අනාගත වාරික නියම කිරීමේ යාන්ත්‍රනයක් තුලින් හෝ සම්බන්ධිත පාර්ශවයන් රක්‍ෂකයා සමඟ ඇති

සම්බන්ධතාවය තුළින් සෘජුව හෝ වක්‍රව) නෛතික හෝ සම්මුතික බැඳීමක් රඳවා ගන්නා අතර, වාරික ගෙවීම නිර්වචිත දායකත්ව පිළිවෙලක් බවට පත්වීමක් සිදුනොවේ. එම අස්තිත්වය පහත සඳහන් දෑ අනුගමනය කළ යුතුය.

(අ) සුදුසුකම් ලබන රක්ෂණ ඔප්පුව සැලැස්මේ වත්කමක් ලෙස ගිණුම්ගත කිරීම (ජේද 8 බලන්න)

(ආ) අනෙක් රක්ෂණ ඔප්පු ප්‍රතිපූර්ණ කිරීමේ අයිතිවාසිකම් ලෙස හඳුනාගනී. (116 ජේදයෙහි නිර්නායකයන් රක්ෂණ ඔප්පුව සපුරාපන්නේ කරන්නේ නම්).

49. එම රක්ෂණ ඔප්පුවක් නිශ්චිත සැලසුමේ සහභාගිවන්නෙකු හෝ සැලසුම් සහභාගිවන්නන් සමූහයක නමින් තිබෙන විට, ඔප්පුව මත ඇතිවන යම් අලාභයක් ආවරණය කිරීමට නෛතික හෝ සම්මුතික බැඳීමක්ද නොමැති වන අතර, අස්තිත්වයට සේවක ප්‍රතිලාභ ගෙවීමට බැඳීමක් නොමැතිව ප්‍රතිලාභ ගෙවීමේ සම්පූර්ණ වගකීම රක්ෂකයා සතුය. එවැනි ගිවිසුමක් යටතේ ස්ථාවර වාරික ගෙවීම හරය වශයෙන් සේවක ප්‍රතිලාභ බැඳීම් නිරවුල් කිරීමක් මිස බැඳීම් සපුරාලීම සඳහා ආයෝජනයක් නොවේ. ඒ අනුව අස්තිත්වයට තවදුරටත් වත්කම් හෝ වගකීමක් නොමැත. එම නිසා අස්තිත්වයක් එවැනි ගෙවීම් නිර්වචිත දායක සැලසුමකට දායක මුදල් ගෙවීමක් ලෙස සලකයි.

## පශ්චාත් සේවා ප්‍රතිලාභ, නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්

50 වාර්ථාකරණ අස්තිත්වයෙහි එක් එක් කාල පරිච්ඡේදය සඳහා බැඳීම් එක් එක් කාලපරිච්ඡේදය සඳහා දායක විය යුතු මුදල මගින් නිර්ණය කෙරෙන හෙයින්, නිර්වචිත දායක සැලසුම් සඳහා ගිණුම්කරණය සරළය එනිසා වෙන් බැඳීම හෝ වියදම් මැනීම සඳහා කිසිදු ආයුගණක උපකල්පන අවශ්‍ය නොවන අතර, කිසිදු ආයුගණක ප්‍රතිලාභ හෝ අලාභ ඇතිවීමට ඉඩක් ද නොමැත. තවද, සේවකයන් සම්බන්ධයෙන් තම සේවය සැපයු කාලපරිච්ඡේදය අවසන් වී වාර්තාකරණ කාල පරිච්ඡේදය පසු වී මාස දොලහක් ඇතුළත සම්පූර්ණයෙන් ගෙවීම ඔවුන් අපේක්ෂා නොකරන්නේ නම් හැර වට්ටම් නොකිරීමේ පදනම මත බැඳීම් මනිනු ලැබේ.

### හඳුනාගැනීම සහ මැනීම

51 සේවකයෙක් අස්තිත්වයකට කාලපරිච්ඡේදයක් තුළ සේවාවක් සපයා ඇති කල්හි, එම සේවයට හුවමාරුව සඳහා අස්තිත්වය නිර්වචිත දායක සැලස්මට ගෙවිය යුතු දායක මුදල හඳුනාගත යුතුය.

(අ) දැනටමත් ගෙවා ඇති දායක මුදල් අඩුකිරීමෙන් පසුව වගකීමක් ලෙස (උපචිත වියදම්). දැනටමත් ගෙවා ඇති මුදල් වාර්තාකරණ කාල පරිච්ඡේදයේ අවසානයට පෙර, නියමිත දායක මුදලට වැඩිනම්, පෙර ගෙවීම් ප්‍රමාණය දක්වා ඒ අතිරික්තය වත්කමක් (පෙර ගෙවූ වියදම) ලෙස අස්තිත්වය විසින් හඳුනාගත යුතුය. උදාහරණයක් ලෙස, අනාගත ගෙවීම්වල අඩුවීමක් හෝ මුදල් ආපසු ලැබීමක්.

(ආ) වෙනත් SLFRS මගින් දායකත්වය වත්කමක පිරිවැය තුළ අන්තර්ගත කිරීම අවශ්‍යයයි හෝ ඉඩදෙන්නේ නම් හැර, වියදමක් ලෙස (උදාහරණ ලෙස, LKAS 2 සහ LKAS 16 බලන්න)

.

52 සේවකයන් විසින් සම්බන්ධිත සේවය සැපයු වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයට පසු, මාස දොලහකට පෙර සම්පූර්ණයෙන් නිරවුල් කළ යුතුයයි අපේක්ෂිත නොවන නිර්වචිත දායක සැලසුමක දායක මුදල්, 83 වන ජේදයෙහි නිශ්චිතව දක්වා ඇති වට්ටම් අනුපාතය භාවිතා කරමින් වට්ටම් කළ යුතුය.

### හෙළිදරව් කිරීම්

53 අස්තිත්වයක් නිර්වචිත දායක සැලසුම් සඳහා වියදමක් ලෙස හඳුනාගත් වටිනාකම හෙළිදරව් කළ යුතුය.

54 LKAS 24 මගින් අවශ්‍ය කරන විට, අස්තිත්වය ප්‍රමුඛ කළමණාකරණ සේවක මණ්ඩලය සඳහා නිර්වචිත දායක සැලසුම් දායක මුදල් හෙළිදරව් කරයි.

## පශ්චාත් සේවා ප්‍රතිලාභ නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්

55 නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ගිණුම්කරණය සංකීර්ණ වන්නේ, බැඳීම් සහ වියදම් මැනීම සඳහා අයුගණක උපකල්පන අවශ්‍ය වන සහ ආයුගණක ප්‍රතිලාභ සහ අලාභ ඇතිවිය හැකි හෙයිනි. තව ද, සේවකයන් සම්බන්ධ සේවය සපයා වර්ෂ බොහොමයකට පසු බේරුම් කිරීම සිදුවිය හැකි හෙයින් බැඳීම් වට්ටම් කළ පදනම මත මිණුම් කරනු ලැබේ.

**හඳුනා ගැනීම සහ මැනීම**

56 නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් අරමුදල්කරණය නොකල හෝ ඒවා සම්පූර්ණයෙන් හෝ කොටසක් පමණක් අස්තිත්වය මගින් සහ සමහර විට එහි සේවකයන් අස්තිත්වයකට හෝ අරමුදලකට දායක මුදල් මතින් අරමුදල්කරණය කරන, වාර්තාකරණ අස්තිත්වයෙන් නෛතිකව සම්පූර්ණයෙන් වෙන් වූ එමගින් සේවක ප්‍රතිලාභ ගෙවයි. අරමුදල් කරණය කල ප්‍රතිලාභ ගෙවීම් නියමිත වූ විට, ගෙවීම් රඳා පවතිනුයේ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ ආයෝජනවල කාර්ය සාධනය මත පමණක් නොව, අරමුදලේ වත්කම්වල යම් හිඟයක් පියවීමට අස්තිත්වයට ඇති හැකියාව සහ කැමැත්ත මතය, එම නිසා හරය වශයෙන්, අස්තිත්වය සැලසුම ආශ්‍රිතව ආයුසණකය සහ ආයෝජන අවදානම් ප්‍රතිරක්ෂණය කරයි. එහි ඒ නිසාවෙන් නිර්වචිත ප්‍රතිලාභ සැලසුම සඳහා හඳුනාගත් වියදම, අත්‍යාවශ්‍යයෙන්ම කාල පරිච්ඡේදය සඳහා ගෙවිය යුතු දායක මුදලම නොවේ.

57 අස්තිත්වයක් විසින් නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ගිණුම්කරණයේදී පහත සඳහන් පියවර සම්බන්ධ කර ගැනේ.

(අ) ඌනතාවය හෝ අතිරික්තය නිර්නය කිරීම. මෙයට සම්බන්ධ වන්නේ,

(i) ප්‍රවර්තන සහ පූර්ව කාලපරිච්ඡේද තුළදී සේවකයන් ඔවුන්ගේ සේවාවන්ට ප්‍රතිචාර වශයෙන් උපයාගත් ප්‍රතිලාභ එනම් අස්තිත්වයේ අවසාන පිරිවැය සොයා ගැනීමට ආයුගණක ගිල්පක්‍රමය ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතා කිරීම (67-69 ඡේද බලන්න) ප්‍රතිලාභවල පිරිවැයට බලපෑ හැකි, ප්‍රවර්තන සහ පූර්ව කාල පරිච්ඡේදවලට ආරෝපනය වන ප්‍රතිලාභ කොතෙක්ද (70-.74 ඡේද බලන්න), සහ ජන කණ්ඩායමට සම්බන්ධ විචලන (සේවක පිරිවැටුම සහ මරණ වැනි) තක්සේරු කිරීම (ආයුසණක උපකල්පන) සහ මූල්‍ය විචලන (අනාගත වැටුප් වැඩිවීම, වෛද්‍ය ප්‍රතිලාභ වැනි) නිර්නය කිරීම අවශ්‍ය වේ. (75. 98 ඡේද බලන්න).

(ii) නිර්වචිත ප්‍රතිලාභ බැදීම් සහ ප්‍රවර්තන සේවා පිරිවැයෙහි වර්තමාන අගය නිර්නය කිරීම සඳහා එම ප්‍රතිලාභ වට්ටම් කිරීම. (67-69 සහ 83-86 ඡේද බලන්න).

(iii) නිර්වචිත ප්‍රතිලාභ බැදීම්වල වර්තමාන අගයෙන් සැලසුමේ යම් වත්කම්වල සාධාරණ වටිනාකම අඩු කිරීම (113.115 ඡේද බලන්න).

(ආ) (අ) හි නිර්නය කරන ලද ඌනතාවය හෝ අතිරික්ත මුදල, ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වත්කම්වල ඇතිවන යම් බලපෑමක් සීමාකිරීම සඳහා වත්කමේ උපරිම මට්ටමට (64 ඡේදය බලන්න) ගැලපීමෙන් නිර්නය වන ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම්) ලෙස නිර්නය කිරීම.

(ඇ) ලාභය හෝ අලාභයහි හඳුනාගතයුතු වටිනාකම් නිර්නය කිරීම.

(i) ප්‍රවර්තන සේවා පිරිවැය (70-74 ඡේද බලන්න);

(ii) යම් පූර්ව සේවා පිරිවැයක් සහ නිරවුල් කිරීමේදී ප්‍රතිලාභ හෝ අලාභ (99-112 ඡේද බලන්න);

(iii) ශුද්ධ නිර්වචිත වගකීම් (වත්කම්) මත ශුද්ධ පොළිය (123-126 ඡේද බලන්න).

(ඈ) වෙනත් විස්තීර්ණ ආදායමේ හඳුනාගත යුතු ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම (වත්කම) යළි මිණුම් කිරීම් නිර්ණය කිරීම සමන්විත වනුයේ ඃ

(i) ආයුසණක ප්‍රතිලාභ සහ අලාභ (128 සහ 129 ඡේද බලන්න);

(ii) ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම්) වල ඇතුළත් වටිනාකම් ප්‍රමාණයන් හැර, සැලසුම් වත්කම් මත ඵලදාව (130 ඡේදය බලන්න); සහ

(iii) ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම්) මත ඇතුළත් ශුද්ධ පොළී වටිනාකම් හැර, වත්කම් සීමාවන් කෙරෙහි බලපෑමේ යම් වෙනසක් (64 ඡේදය බලන්න).

අස්තිත්වයකට එක නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මකට වඩා ඇති අවස්ථාවල, එක් එක් ප්‍රමාණාත්මක සැලසුම් සඳහා වෙන් වෙන්ව මෙම ක්‍රියා පිළිවෙලවල් ව්‍යවහාර කරයි.

58 **වාර්තාකරණ කාල පරිච්ඡේදයේ අවසානයේදී නිර්ණය කරණු ලැබිය හැකි වටිනාකම, මූල්‍ය ප්‍රකාශයන්හි හඳුනාගත් වටිනාකම් වලින් ප්‍රමාණාත්මකව වෙනස් නොවීමට, අස්තිත්වයක් ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම්) ප්‍රමාණාත්මකව විධිමත් ලෙස නිර්ණය කළ යුතුය.**

59 සියලුම ප්‍රමාණාත්මක පශ්චාත් සේවා ප්‍රතිලාභ බැඳීම්, මැණීමේදී සුදුසුකම් ලැබූ ආයුසණකයෙන් ඉවහල් කිරීම අස්තිත්වයකට අවශ්‍ය නොවුවද, ඒ සඳහා මෙම ප්‍රමිතිය මගින් උනන්දු කරනු ලැබේ. ප්‍රායෝගික හේතු සඳහා වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයට පෙර බැඳීම්වල විස්තරාත්මක තක්සේරුවක් කිරීමට සුදුසුකම් ලැබූ ආයුගණක වර්යෙකු ඒ සඳහා අස්තිත්වයකට ඉල්ලා සිටිය හැකිය. කෙසේ වුවද, අවස්ථානුකූලව ප්‍රමාණාත්මක ගනුදෙනු සහ වෙනත් ප්‍රමාණාත්මක වෙනස්කම් සඳහා, වාර්තා කරණ කාල පරිච්ඡේදයේ අවසානය දක්වා (වෙළඳ මිල සහ පොළී අනුපාතික වෙනස්කම් ඇතුළත්ව) තක්සේරුවේ ප්‍රතිඵල යාවත්කාලීන කරනු ලැබේ.

60 ඇතැම් අවස්ථාවල ඇස්තමේන්තු සාමාන්‍යය සහ ගණනය කිරීමේ කෙටි ක්‍රම, මෙම ප්‍රමිතය මගින් නිදර්ශනාත්මකව දක්වා ඇති සවිස්තර ගණන් බැලීම්වල විශ්වාසදායක සමීපකරණයක් සපයනු ලැබේ.

**සම්මුතික බැඳීම් සඳහා ගිණුම්කරණය**

**61 අස්තිත්වයක් එහි නිර්වචිත ප්‍රතිලාභ සැලසුමෙහි විධිමත් නියමයන් යටතේ ඇති නෛතික බැඳීම් වලට පමණක් නොව අස්තත්වයෙහි අවිධිමත් පරිචයන් මගින් පැන නගින යම් සම්මුතික බැඳීම් සඳහාද ගිණුම්කරණය කළ යුතුය. අස්තිත්වයට සේවක ප්‍රතිලාභ ගෙවනු මිස වෙනත් කිසිදු යථාර්තවාදී විකල්පයක් නොමැති අවස්ථාවලදී අවිධිමත් පරිචයන් සම්මුතික බැඳීමත් ඇති කිරීම තුඩුදිය හැකිය. සම්මුතික බැඳීමක් පිළිබඳ උදාහරණයක් නම්, අස්තිත්වයේ අවිධිමත් පරිචයන් වෙනස් කරන විටකදී, එහි සේවකයන් සමඟ සම්බන්ධතා බැඳුණ පිළිගත නොහැකි හානි ඇතිවීම.**

62 නිර්වචිත ප්‍රතිලාභ සැලසුමක විධිමත් නියමයන් සැලසුම යටතේ එහි බැඳීම් අවසන් කිරීමට අවසර අස්තිත්වයකට දිය හැකිය. එසේ වුවද, සේවකයන් රඳවාගෙන තබාගත යුතු නම් සැලසුම යටතේ බැඳීම් (ගෙවීම් නොකර) අවසන් කිරීම සාමාන්‍යයෙන් අස්තිත්වයකට අපහසුය. එබැවින් විරෝධාකල්ප සාක්ෂි නොමැති වූ විට, පශ්චාත් සේවා ප්‍රතිලාභ ගිණුම්කරණය සඳහා අස්තිත්වය වර්තමානයේ එකගවන එවන් ප්‍රතිලාභ සේවකයන්ගේ ඉතිරි සේවා කාලය තුළදීද අබංඩව පවත්වාගෙන යනු ඇතැයි උපකල්පනය කෙරේ.

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

**63 අස්තිත්වයක් ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම්) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනාගත යුතුය.**

**64 අස්තිත්වයක නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මෙහි අතිරික්තයක් ඇති කල්හි, ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වත්කම් පහත සඳහන් දෑ වලින් අඩු වටිනාකම මිණුම් කළ යුතුය. ඃ**

**(අ) නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මේ ඇති අතිරික්තය, සහ**

**(ආ) 83 වන ඡේදයෙහි නිශ්චිතව දක්වා ඇති වට්ටම් අනුපාතිකය භාවිතා කරමින් නිර්නය කළ වත්කම් සීමාව.**

65 නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක්, අධි අරමුදල්කරණයක් වීමෙන් හෝ ආයුසණනක ප්‍රතිලාභ පැන ගැනීමෙන්, ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වත්කමක් පැනනැගිය හැකිය. එවැනි අවස්ථාවක අස්තිත්වයක් ශුද්ධ නිර්වචිත වත්කම හඳුනා ගැනීම කරනුයේ,

(අ) අස්තිත්වය සම්පත් පාලනය මගින් අනාගත ප්‍රතිලාභ ජනනය කිරීමට ඇති හැකියාව නිසා,

(ආ) එම පාලනය අතීත සිද්ධිවල ප්‍රතිඵලයක් වීම (අස්තිත්වය මගින් දායක මුදල් ගෙවීම් සහ සේවකයන් ලබාදුන් සේවාවන්);

සහ

(ඇ) අනාගත දායකමුදල් ගෙවීම අඩුවීම හෝ මුදල් ආපසු ලැබීමක්, එකසේ අස්තිත්වයට සෘජුව හෝ වෙනස් සැලැස්මක ඌනතාවයට වක්‍රව යන ආකාරයන් ගෙන අස්තිත්වයට අනාගත ප්‍රතිලාභ ඇතිවීම.වත්කම් සීමාව එම අනාගත ප්‍රතිලාභවල වර්තමාන අගයයි.

**හඳුනා ගැනීම සහ මැනීම : නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් සහ ප්‍රවර්තන සේවා පිරිවැයෙහි වර්තමාන වටිනාකම.**

66 නිර්වචිත ප්‍රතිලාභ සැලසුමක අවසාන පිරිවැය කෙරෙහි අවසාන වැටුප, සේවක පිරිවැටුම, සහ මරණ සංඛ්‍යාව, සේවක දායක මුදල් සහ වෛද්‍ය පිරිවැය ප්‍රවනතා වැනි විචල්‍යයන් මඟින් බලපෑම් ඇතිවිය හැකිය. සැලස්මේ අවසාන පිරිවැය අවිනිශ්චිත අතර, අවිනිශ්චිතතාවය දිගු කාල පරිච්ඡේදයක් පුරා දිගටම පැවතිය හැකිය. පශ්චාත්, සේවා ප්‍රතිලාභබැඳීම් සහ සම්බන්ධිත ප්‍රවර්තන සේවා පිරිවැයවල වර්තමාන වටිනාකම මැනීම හැකිවනු පිණිස පහත සඳහන් දෑ අවශ්‍ය වෙයි.

(අ) ආයුසණක තක්සේරු ක්‍රමයක් ව්‍යවහාර කිරීමට ( 67-69 ජේද බලන්න.)

(ආ) සේවා කාලපරිච්ඡේදවලට සේවා ප්‍රතිලාභ ආරෝපිත කිරීමට (70-74 ජේද බලන්න); සහ

(ඇ) ආයුසණක උපකල්පනයන් කිරීමට (75---98 ජේද බලන්න)

**ආයුඝණක තක්සේරු ක්‍රමය**

67 අස්තිත්වයක් එහි නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල සහ සම්බන්ධිත ප්‍රවර්තන පරිවැය සහ සමග අදාළ කල්හි පශ්චාත් සේවා පිරිවැයෙහි හා වර්තමාන අගය නිර්නය කිරීමේදී අස්තිත්වය ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතා කළ යුතුය.

68 ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය (ඇතැම් විට ගෙවීම් මත අනුපාතික කරන ලද උපචිත ප්‍රතිලාභ ක්‍රමය හෝ ප්‍රතිලාභ වර්ෂ සේවා ක්‍රමය ලෙස හඳුන්වනු ලබන) මගින් එක් එක් සේවා පරිච්ඡේදයේ දී ප්‍රතිලාභ හිමිකම ඉහල නැංවීමට අළුතින් එකතුවන ඒකක (75- - 98 ජේද බලන්න) සහ අවසාන බැඳීම් ගොඩ නැංවීමට එක් එක් ඒකකය වෙන වෙනම මැණීම් කරගනු ලබයි (75.98 ජේද බලන්න).

**68 වන ජේදය නිදර්ශන මගින් පැහැදිලි කරන උදාහරණය**

සේවය අවසන් කිරීමේදී එකවර ගෙවන ප්‍රතිලාභයක් ගෙවීම සහ එය එක් එක් වර්ෂයක සේවාව සඳහා අවසාන වැටුපෙන් 1% කට සමානය. පළමුවන වර්ෂයේ වැටුප රු. 10000ක් සහ එය වාර්ෂිකව 7% බැගින් (සංයුක්ත කර) වැඩිවේයයි උපක්ල්පනය කෙරේ. භාවිතා කළ වාර්ෂික වට්ටම් අනුපාතිකය 10%කි. වර්ෂ 5ක් අවසානයේ සේවකයකු සේවය අත්හරී යන අපේක්ෂාව සහ ආයුගණක උපකල්පනයන්හි වෙනසක් සිදු නොවේයයි සලකා එක් එක් සේවකයකු සඳහා බැඳීම් ගොඩ නැගෙන ආකාරය පහත සඳහන් වගුව පෙන්වයි. සරලකරනය සඳහා අවුරුදු 5කට කලින් හෝ ඊට පසුව සේවකයෙක් සේවය හැර යාමේ සම්භාවිතාවය පිළිඹිඹුවීම සඳහා අවශ්‍යය විය හැකි ගැලපුම් මෙම උදාහරණය සැලකිල්ලට ගෙන නැත.

| *වර්ෂය* | *1* | *2* | *3* | *4* | *5* |
|---|---|---|---|---|---|
| | *රු.* | *රු.* | *රු.* | *රු.* | *රු.* |
| *අදාළ වූ ප්‍රතිලාභවලට ඃ පෙර වර්ෂය* | *0* | *131* | *262* | *393* | *524* |
| *ප්‍රවර්තන වර්ෂය (අවසාන වැටුපෙන් 1%යි)* | *131* | *131* | *131* | *131* | *131* |
| *ප්‍රවර්තන සහ පෙර වර්ෂය* | *131* | *262* | *393* | *524* | *655* |
| *ආරම්භක බැඳීම්* | | *89* | *196* | *324* | *476* |
| *10% බැගින් පොළිය* | | *9* | *20* | *33* | *48* |
| *ජංගම සේවා පිරිවැය* | *89* | *98* | *108* | *119* | *131* |
| *අවසාන බැඳීම්* | *89* | *196* | *324* | *476* | *655* |

*සටහන ඃ-*

1 *ආරම්භක බැඳීම් යනු පූර්ව වර්ෂයන් සඳහා ආරෝපිත කළහැකි ප්‍රතිලාභයෙහි වර්තමාන වටිනාකමයි.*

2 *ප්‍රවර්තන සේවා පිරිවැය යනු ප්‍රවර්තන වර්ෂයට ආරෝපිත කළ හැකි ප්‍රතිලාභයෙහි වර්තමාන වටිනාකමයි.*

*අවසාන බැඳීම් යනු ප්‍රවර්තන සහ පූර්ව වර්ෂ වලට ආරෝපිත කළ හැකි ප්‍රතිලාභයෙහි වර්තමාන වටිනාකමයි.*

69 බැඳීමෙන් කොටසක් නිරවුල් කිරීමට අපේක්ෂා කලද, මුළු පශ්චාත් සේවා ප්‍රතිලාභයම වට්ටම් කරනු ලබයි.

**සේවා කාලයන්ට ප්‍රතිලාභ ආරෝපනය**

70 නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් සහ සම්බන්ධිත ප්‍රවර්තන සේවා පිරිවැය සහ, අදාළ අවස්ථාවල, පූර්ව සේවා පිරිවැයවල වර්තමාන අගය නිර්නය කිරීමේදී, අස්තිත්වයක් සැලසුමේ ප්‍රතිලාභ සූත්‍රය යටතේ සේවා කාල පරිච්ඡේදයට ප්‍රතිලාභ ආරෝපනය කළ යුතුය. කෙසේ වෙතත්, සේවකයකුගේ පසු වර්ෂයන්හි සේවය, පෙර වර්ෂ වලට වඩා ප්‍රමාණාත්මකව ඉහළ ප්‍රතිලාභ මට්ටමකට තුඩු දේ නම්, අස්තිත්වය විසින් සරල මාර්ග පදනම මත පහත දැක්වෙන දිනවල සිට ආරෝපනය කළ යුතුය.

(අ) සේවකයකු විසින් සැලසුම යටතේ ප්‍රතිලාභ වෙත යොමු කරන සේවයක් සැපයූ දින (තව දුරටත් සේවය සැපයීම කොන්දේසි මත ප්‍රතිලාභ පදනම් වුවද, නොවූවද) සිට.

(ආ) සැලසුම යටතේ තවදුරටත් වැටුප් වැඩිවීම හැරෙන්නට, සැලසුමට තවදුරටත් ප්‍රමාණාත්මක බලපෑම් ඇති නොවීමට හේතුවන පරිදි සේවකයා විසින් තවදුරටත් සේවය සපයන දිනය.

71 ප්‍රක්ෂේපනය කළ ඒකක ණය ක්‍රමය මගින් අස්තිත්වයක් ප්‍රතිලාභ ප්‍රවර්තන කාලපරිච්ජේදයට (ප්‍රවර්තන සේවා පිරිවැය නිර්නය කිරීම වෙනුවෙන්) සහ ප්‍රවර්තන සහ පූර්ව කාලපරිච්ජේදවලට (නිර්වචිත ප්‍රතිලාභ බැදිමෙහි වර්තමාන අගය නිර්නය කිරීම සඳහා) ආරෝපිත කිරීම අවශ්‍ය වේ. අස්තිත්වයක් පශ්චාත් සේවා ප්‍රතිලාභ පැන නගින කාලපරිච්ජේදවල බැදිම්වලට ප්‍රතිලාභ ආරෝපිත කරයි. එම බැදිම් පැන නගිනුයේ අස්තිත්වය අනාගත වාර්තාකරණ කාලපරිච්ජේදයන්හි ගෙවීම අපේක්ෂා කරන සේවකයන් සපයනු ලබන සේවාවලට හිලව්වීම සඳහා පශ්චාත් සේවක ප්‍රතිලාභ හේතුවෙනි. ආයුගණක ශිල්පක්‍රම වගකීමක් හඳුනාගැනීම, ප්‍රමාණවත් විශ්වාසදායකත්වයක් සහිතව සාධාරනියකරණය කිරීමට අස්තිත්වයකට ඉඩ දෙනු ලබයි.

**71 වන ජේදය නිදර්ශන මගින් පැහැදිලි කරන උදාහරණ**

1. නිර්වචිත ප්‍රතිලාභ සැලසුමක් සෑම වසරකම සේවා කාලයක් සඳහා රු 100 ක විශ්‍රාම ගැන්වීම මත එකවර ප්‍රතිලාභ ගෙවීමක් ප්‍රතිපාදනය කරයි.

   *සෑම වර්ෂයකටම රු 100ක ප්‍රතිලාභයක් ආරෝපිත වෙයි. ප්‍රවර්තන සේවා පිරිවැය වන්නේ රු. 100 හි වර්තමාන වටිනාකමයි. නිර්වචිත ප්‍රතිලාභ බැදීමෙහි වර්තමාන වටිනාකම රු.100 හි වර්තමාන වටිනාකම, වාර්තාකරණ කාළපරිච්ජේදය අවසානය දක්වා සේවය කරන ලද වර්ෂ ගණනින් ගුණ කිරීමෙන් ලැබෙන මුදලයි.*

   *සේවකයා අස්තිත්වය හැරයන අවස්ථාවේම වහාම ප්‍රතිලාභ ගෙවියයුතු කල්හි, සේවකයා සේවය අත්හැරයාම අපේක්ෂා කරන දිනට, ප්‍රවර්තන සේවා පිරිවැය සහ නිර්වචිත ප්‍රතිලාභ බැදිමෙහි වර්තමාන වටිනාකම පිළිබිඹු කරයි. වාර්තාකරන කල පරිච්ජේදය අවසානයේ දී සේවකයා සේවය හැරගියේ නම් නිර්නය කල යුතු වූ වටිනාකමට වඩා මට්ටම් කිරීමේ බලපෑමේ හේතුව නිසා ඒවා අඩුවේ.*

2. සැලසුමක් විසින්, සෑම වසරකම අවසාන වැටුපෙන් සියයට 0.2 ක් මාසික විශ්‍රාම වැටුපක් සඳහා ප්‍රතිපාදනය කරයි. විශ්‍රාම වැටුප වයස අවුරුදු 65 දී පටන් ගෙවිය යුතුය.

   *අපේක්ෂිත විශ්‍රාම ගැන්වීමේ දිනයට ගෙවිය යුතු ඇස්තමේන්තුගත අවසාන වැටුපෙන් 0.2%ක් වන මාසික විශ්‍රාම වැටුපක වර්තමාන වටිනාකම එම ප්‍රතිලාභය සමාන වන අතර, සෑම වසරකම සේවා කාලයට, අපෙක්ෂිත මියයන දිනය දක්වා ආරෝපිත කරනු ලබයි. ප්‍රවර්තන සේවා පිරිවැය එම ප්‍රතිලාභයෙහි වර්තමාන වටිනාකම වෙයි. නිර්වචික ප්‍රතිලාභ බැදීමෙහි වර්තමාන වටිනාකම වන්නේ, අවසාන වැටුපෙන් 0.2% වන මාසික විශ්‍රාම ගෙවීමෙහි වර්තමාන වටිනාකම, වාර්තා කරන කාලපරිච්ජේදයේ අවසාන දිනය දක්වා සේවය කරන ලද වර්ෂ ගනනෙන් ගුණ කිරීමෙන් ලබාගැනේ. විශ්‍රාම ගෙවීම වයස අවුරුදු 65 දී ආරම්භ කෙරෙන බැවින් ප්‍රවර්තන සේවා පිරිවැය සහ නිර්වචිත ප්‍රතිලාභ බැදිමෙහි වර්තමාන වටිනාකම වට්ටම් කළ යුතුවේ.*

72 ප්‍රතිලාභ අනාගත සේවා නියුක්තිය මත වන කොන්දේසි සහිත වුවද, නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක් යටතේ සේවක සේවාව බැදීම් ඇති කරයි. (වෙනත් වචනවලින් ඒවා හිමිකම් නොවේ). සේවක සේවය හිමිකම් පවරන දිනයට පෙර සම්මුතික බැදිමකට ඉඩ සලසයි, මක්නිසාදයත්, සෑම අනුක්‍රමික වාර්තාකරණ කාලපරිච්ජේදයකට, ප්‍රතිලාභ හිමිකම් ලැබීමට පෙර සේවකයකු සේවය කළයුතු අනාගත සේවා ප්‍රමාණය අඩුවන හෙයිනි. එහි නිර්වචිත ප්‍රතිලාභ බැදීම් මැනීමේ දී, අස්තිත්වයක් කිසිදු හිමිකම් අවශ්‍යතාවයක් සපුරා නොමැති සමහර සේවකයින්ගේ සම්භාව්‍යතාවය සැලකිල්ලට ගනී. එමෙන්ම, පශ්චාත් සේවා ප්‍රතිලාභ උදාහරණ ලෙස පශ්චාත්, සේවා වෛද්‍ය ප්‍රතිලාභ ගෙවීමට සිදුවන්නේ නිශ්චිත සිද්ධිය සේවකයා සේවයේ නොමැති කල්හි ඇතිවුයේ නම් පමණක් වන අතර, නිශ්චිත සිදුවීමක් සිදුව නොවේ. ප්‍රතිලාභවලට හිමිකම් සලසන, සේවාවක් සේවකයා ඉටුකරන අවස්ථාවේ දී බැදිම් ඇති කරයි. බැදීම මිණුම්කරණයේ දී, නිශ්චිත සිද්ධිය බලපෑමක් ඇති කිරීමේ සම්භාව්‍යතාවක් තිබුණ ද, වගකීම පවතින්නේ ද යන්න නිර්නය නොකරයි.

**72 වන ජේදය නිදර්ශණ මගින් පැහැදිලි කරන උදාහරණය**

1 සැලසුමක් සෑම වර්ෂයකම සේවාව සඳහා රු. 100ක ප්‍රතිලාභ ගෙවයි. ප්‍රතිලාභය හිමිවන්නේ වර්ෂ දහයක සේවයෙන් පසුවයි. *රු. 100ක ප්‍රතිලාභ සෑම වර්ෂයකම ආරෝපිත වෙයි. පළමු වර්ෂ දහයේ සෑම වර්ෂයකම ප්‍රවර්තන සේවා පිරිවැය සහ බැදිම්වල වර්තමාන වටිනාකම, සේවකයා වර්ෂ දහයක සේවය සම්පුර්ණ නොකිරීමට ඇති සම්භාව්‍යතාව පිළිබිඹු කරයි.*

2 වයස 25ට පෙර සේවය නොතකා හැර සැලැස්මක් සෑම වර්ෂයක සේවය සඳහාම රු 100ක ප්‍රතිලාභයක් ගෙවයි. ප්‍රතිලාභයට වහාම හිමිකම් පැවරේ.
*වයස 25ට පෙර සේවාවට ප්‍රතිලාභ ආරෝපිත නොවන බැවින්, එම දිනට පෙර ප්‍රතිලාභ යොමු නොවේ. (කොන්දේසි සහිත හෝ කොන්දේසි රහිත). ඊට පසුව එළඹෙන සෑම වර්ෂයකටම රු 100ක් ප්‍රතිලාභ ආරෝපිත වෙයි.*

73 සේවකයාගේ තවදුරටත් සේවය මගින් තවදුරටත් ප්‍රතිලාභ මුදල ප්‍රමාණාත්මකව වැඩිවීමට තුඩු නොදෙන තෙක්, බැඳීම් ඉහල යනු ලබයි. එම නිසා, එම දිනට හෝ එම දිනට කලින් අවසන් වන කාළපරිච්ඡේදවලට සියළු ප්‍රතිලාභ ආරෝපිත වෙයි. සැලැස්මේ ප්‍රතිලාභ සූත්‍රය යටතේ එක් එක් ගිණුම් කරන කාල පරිච්ඡේද සඳහා ප්‍රතිලාභ ආරෝපිත වෙයි. කෙසේ වෙතත්, සේවකයකුගේ සේවාවේ පසු වර්ෂයන්හි, පෙර වර්ෂවලට වඩා ප්‍රතිලාභ ප්‍රමාණාත්මකව ඉහළ මට්ටමකට යොමු වේ නම්, අස්තිත්වයක් සේවකයකුගේ සේවා තවදුරටත්, ප්‍රමාණාත්මක මුදලකින් වැඩි නොවීම යොමු වන දිනයතෙක්, ප්‍රතිලාභ සරල මාර්ග ක්‍රමය යටතේ ආරෝපිත කරයි. එසේ කරනුයේ සේවකයාගේ සේවා කාලය පුරාම, අවසාන වශයෙන් ඉහල මට්ටමක ප්‍රතිලාභවලට යොමුවන බැවිනි.

**73 වන ඡේදය නිදර්ශණ මගින් පැහැදිලි කරන උදාහරණය**

1 සැලැස්මක් වර්ෂ දහයක සේවා කාලයට පසු රු 1000 ක එකවර ගෙවන ප්‍රතිලාභයක හිමිකම පවරා ඇත. සැලසුම ඊට පසු වර්ෂවල සේවය සඳහා තවදුරටත් ප්‍රතිලාභ ප්‍රතිපාදන නොකරයි.

*රු. 100ක ප්‍රතිලාභයක් (රු. 1000 දහයෙන් බෙදීම මගින්) පළමු වර්ෂ දහය තුළ එක් එක් වර්ෂයට ආරෝපිත වෙයි. මුල් වර්ෂ දහයේ එක් එක් වර්ෂයේ ප්‍රවර්තන සේවා පිරිවැය සේවකයන් වර්ෂ දහයක සේවා කාලය සම්පූර්ණ නොකිරීමේ සම්භාව්‍යතාව පිළිබිඹු කරයි. ඊට පසු වර්ෂවලට ප්‍රතිලාභ ආරෝපිත නොවෙයි.*

2 තවමත් සේවයේ යෙදෙන, වර්ෂ විස්සක සේවා කාලය සම්පූර්ණ කළ අවුරුදු 55ක් වූ සියලුම සේවකයන්ට, හෝ වයස 65 දී තවමත් සේවයේ යෙදී සිටින්නන්ට සේවා කාලය නොසලකා එකවර ගෙවන විශ්‍රාම ප්‍රතිලාභ රු. 2000ක් සැලැස්මක් විසින් ගෙවනු ලබයි.

*සැලැස්මක් යටතේ වයස 35 කට පෙර සේවයට එක්වන සේවකයන්ට වයස 35 දී මුලින්ම ප්‍රතිලාභවලට යොමුවෙයි (සේවකයකු වයස 30 දී සේවයෙන් ඉවත්ව නැවත වයස 33 දී ආපසු පැමිණ ප්‍රතිලාභවල ප්‍රමාණයට හෝ කාලයට බලපෑමක් නොමැතිව). එම ප්‍රතිලාභ තවදුරටත් සේවය මත කොන්දේසි සහිත වෙයි. තවද, වයස 55න් පසු සේවා කාලය සඳහා ප්‍රමාණවත් මුදලකින් තවදුරටත් ප්‍රතිලාභ වැඩවීමකට යොමු නොවේ. මෙම සේවකයින් සඳහා අස්තිත්වය රු. 100 බැගින් (රු. 2000 බෙදීම විස්ය) එක් එක් වර්ෂය සඳහා වයස 35 සිට වයස 55 දක්වා ආරෝපණය කරයි.*

*වයස අවුරුදු 35 සහ 45 අතර සේවයට බැදෙන සේවකයන්ට වර්ෂ විස්සක සේවාකාලයකට පසු තවදුරටත් ප්‍රතිලාභවල ප්‍රමාණාත්මක මුදලක් වැඩිවීමට ඉඩක් නොමැත. මෙම සේවකයින් සඳහා අස්තිත්වය පළමු වර්ෂ විස්ස සඳහා හා එක් එක් වර්ෂයට රු 100 බැගින් ප්‍රතිලාභ ආරෝපනය කරයි (2000 බෙදීම විස්ස). වයස අවුරුදු 55 දී සේවයට බැඳුණ සේවකයකු සඳහා වර්ෂ දහයක සේවයෙන් පසුව තවදුරටත් ප්‍රතිලාභයට ප්‍රමාණාත්මක වටිනාකමන් එක් නොකරයි. මෙම සේවකයාට සඳහා පළමු වර්ෂ දහයේ එක් එක් වර්ෂය සඳහා රු. 200 (2000 බෙදීම දහය) ක් බැගින් අස්තිත්වය ආරෝපිත කරයි.*

*සියලුම සේවකයින් සඳහා, ප්‍රවර්තන සේවා පිරිවැය සහ බැඳීම්වල වර්තමාන වටිනාකම, සේවකයකු අවශ්‍ය සේවා කාලපරිච්ඡේදය සම්පූර්ණ නොකිරීමේ සම්භාව්‍යතාවය පිළිබිඹු කරයි.*

3 සේවකයකු වර්ෂ දහයක සේවා කාලයකට පසු හෝ වර්ෂ විස්සක සේවා කාලයකට පෙර සේවයෙන් ඉවත්වුව හොත්, පශ්චාත් - සේවා වෛද්‍ය සැලසුමක් වෛද්‍ය පිරිවැයෙන් සියයට 40ක් පශ්චාත් වෛද්‍ය සැලසුමක් ප්‍රතිපූර්ණ කරන අතර, සේවකයා වර්ෂ විස්සකට හෝ වැඩි සේවා කාලයකට පසු සේවයෙන් ඉවත් වුවහොත් ඒ පිරිවැය වලින් සියයට 50ක් ප්‍රතිපූර්ණය කරයි.

*සැලසුම් ප්‍රතිලාභ සූත්‍රය යටතේ, අස්තිත්වය අපේක්ෂිත වෛද්‍ය පිරිවැයේ වර්තමාන අගයෙන් සියයට 4ක් (සියයට 40 බෙදීම 10) මුල් වර්ෂ දහයේ සෑම වර්ෂයක් වෙනුවෙන්ම දෙවන වර්ෂය දහයේ සෑම වර්ෂයක් සඳහාම සියයට 1ක් (සියයට 10 ක් බෙදීම 10 මගින්) ආරෝපනය කරයි. ප්‍රතිලාභ හෝ ඉන් කොටසක් ඉපයීමට අවශ්‍ය කරන සේවා කාලසීමාව සම්පූර්ණ කල නොහැකිවන සේවකයන්ගේ සම්භාව්‍යතාවය සෑම වර්ෂයකම ප්‍රවර්තන සේවා පිරිවැයෙන් පිළිබිඹු වේ. වර්ෂ දහයක සේවා කාලයකට පෙර සේවයෙන් ඉවත් වීමට අපේක්ෂිත සේවකයන් සඳහා කිසිම ප්‍රතිලාභයක් ආරෝපිත නොවේ.*

4 සේවයකු වර්ෂ දහයක සේවා කාලයකට පසු හෝ වර්ෂ විස්සක සේවා කාලයකට පෙර සේවයෙන් ඉවත් වුවහොත් වෛද්‍ය පිරිවැයෙන් සියයට 10ක් ප්‍රතිපූර්ණය කරන අතර,සේවකයා වර්ෂ විස්සකට හෝ ඊට වැඩි සේවා කාලයකින් පසු සේවයෙන් ඉවත් වුවහොත් ඉවත්වේ නම් එම පිරිවැය වලින් සියයට 50ක් ප්‍රතිපූර්ණය කරයි.

*පසු වර්ෂ වලදී සේවය, පෙර වර්ෂවල සේවයට වඩා ප්‍රමාණාත්මකව ඉහල මට්ටමක ප්‍රතිලාභයකට හේතුවේ. එම නිසා, වර්ෂ විස්සකට හෝ ඊට වැඩි වර්ෂ ගනනක් සේවය කර සේවක හැර යෑමට අපේක්ෂිත සේවකයන් සඳහා 71 වන ඡේදය යටතේ*

*සරල මාර්ග පදනම මත ප්‍රතිලාභඅස්තිත්වය විසින් ආරෝපනය කරයි. වර්ෂ විස්සකට වැඩි සේවාවකින් පසු තවදුරටත් ප්‍රමාණාත්මක මුදලකින් ප්‍රතිලාභ වැඩිවීමක සිදු නොවේ. එම නිසා, පළමු වර්ෂ විස්ස තුළ සෑම වර්ෂයකටම ආරෝපිත ප්‍රතිලාභය, අපේක්‍ෂිත වෛද්‍ය පිරිවැයේ වර්තමාන වටිනාකමෙන් සියයට 2.5කි (සියයට 50 බෙදීමය 20).*

*වර්ෂ දහය සහ වර්ෂ විස්ස අතර සේවා කාලයකින් පසු සේවයෙන් ඉවත්වේයැයි අපේක්‍ෂිත සේවක සංඛ්‍යාව සඳහා පළමු වර්ෂ දහය තුළ සෑම වර්ෂයක් සඳහාම, අපේක්‍ෂිත වෛද්‍ය පිරිවැයෙහි වර්තමාන වටිනාකමෙන් සියයට 1ක ප්‍රතිලාභයක් ආරෝපනය වෙයි. මෙම සේවකයින් සඳහා වර්ෂ දහයක සේවා කාලයකින් පසු සේවයෙන් ඉවත්වේයයි අපේක්‍ෂා කරන දිනය දක්වා ප්‍රතිලාභ ආරෝපිත නොවේ. වසර දහයක් තුළ දී සේවයෙන් ඉවත්වීමට අපේක්ෂිත සේවකයාට ප්‍රතිලාභ ආරෝපණය නොවේ.*

74 ප්‍රතිලාභ මුදල සෑම වර්ෂයකම සේවාව සඳහා අවසාන වැටුපෙන් නියත සමානුපාතයක් වීමේ දී. අනාගත වැටුප් වැඩිවීම්, වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදයෙහි අවසාන දිනට පෙර පවත්නා සේවා සඳහා බැඳීම් නිරවුල් කිරීමට අවශ්‍ය මුදලට බලපෑම් ඇති නමුත්, අමතර බැඳීමක් ඇති නොකරයි. එම නිසා.

(අ) ප්‍රතිලාභ මුදල් අවසාන වැටුප මත තීරණය වන්නේ වුවද 70 (ආ) ඡේදයේ කාර්යය සඳහා වැටුප් වැඩිවීම් තවදුරටත් ප්‍රතිලාභ වැඩිවීමකට තුඩු නොදෙයි ; සහ

(ආ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම ආරෝපිත ප්‍රතිලාභයෙහි වටිනාකම, ප්‍රතිලාභය සමඟ බැඳුන වැටුපෙහි නියත සමානුපාතිකයකි.

**74 වන ඡේදය නිදර්ශනයක් මගින් පැහැදිලි කරන උදාහරණය**

වයස අවුරුදු 55ට පෙර සෑම වර්ෂයකම ඇස්තමේන්තු කරන අවසාන වැටුපෙන් සියයට 3ක ප්‍රතිලාභයකට සේවකයෙකුට හිමිකම් ඇත.

වයස අවුරුදු 55 දක්වා සෑම වර්ෂයකම ඇස්තමේන්තු කරන අවසාන වැටුපෙන් 3% ක ප්‍රතිශතයක් ආරෝපිත වේ.

සැලසුම යටතේ, තවදුරටත් සේවකයා විසින් සපයන සේවය මගින් ප්‍රතිලාභයෙහි ප්‍රමාණාත්මක වැඩිවීමක් තවදුරටත් සිදු නොවන දිනය වෙයි. එම දිනට පසු සේවාවන් ප්‍රතිලාභ ආරෝපිත නොවෙයි.

**ආයුගණක උපකල්පන**

**75 ආයුගණක උපකල්පන පක්‍ෂග්‍රාහී නොවූ සහ අනෝන්‍ය වශයෙන් අනුකූල විය යුතුය.**

76 ආයුගණක උපකල්පන අස්තිත්වයක පශ්චාත්සේවා ප්‍රතිලාභ සැලසීමේ අවසාන පිරිවැය නිර්නය කරන විචල්‍යයන්ගේ හොඳම ඇස්තමේන්තුව වෙයි. ආයුගණක උපකල්පන සමන්විත වනුයේ:

(අ) ප්‍රතිලාභ සඳහා හිමිකම් කියන ප්‍රවර්තන සහ කලින් සිටි සේවකයින්ගේ (සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ) අනාගත ගතිලක්‍ෂණ පිළිබඳ ජන විකාශ උපකල්පන, පහත සඳහන් කරුණු වැනි දෑ පිළිබඳ ජනවිකාශ උපකල්පන ක්‍රියා කරයි.

(i) මරණ සංඛ්‍යාව (81 සහ 82 ඡේද බලන්න);

(ii) සේවකයන්ගේ පිරිවැටුම, දුබලතාවය සහ කලින් විශ්‍රාම යෑමේ අනුපාතිකය;

(iii) ප්‍රතිලාභ සඳහා හිමිකම් සහිත යැපෙන්නන් ඇතුලත්ව සැලැස්මේ සාමාජිකයන්ගේ සමානුපාතිකය;

(iv) සැලැස්ම යටතේ පවත්නා තෝරාගැනීමට පවත්නා එක් එක් විකල්ප ගෙවීම් වර්ගයන් තෝරාගනු ලබන සැලැස්මේ සේවකයන්ගේ සමානුපාතිකය; සහ

(v) වෛද්‍ය සැලැසුම් යටතේ හිමිකම් අනුපාතිකය.

(ආ) පහත අයිතම වැනි දෑ පිළිබඳ කටයුතු කරන මූල්‍ය උපකල්පන

(i) වට්ටම් අනුපාතකය (83--86 ඡේද බලන්න);

(ii) සේවකයින් විසින් දැරිය යුතු යම් ප්‍රතිලාභ වල පිරිවැයක් හැර, ප්‍රතිලාභ මට්ටම සහ අනාගත වැටුප (85 - 97 ඡේද බලන්න);

(iii) වෛද්‍ය ප්‍රතිලාභවල දී, ඉල්ලීම් ගැන කටයුතු කිරීමේ පිරිවැය ඇතුළත්ව අනාගත වෛද්‍ය පිරිවැය (එනම්, නෛතික සහ ගැලපුම්කරුගේ ගාස්තු ඇතුළත්ව, ඉල්ලීම් සැකසීමට සහ නිරවුල් කිරීමට වැයවන පිරිවැය) (96-98 ඡේද බලන්න); සහ

(iv) වාර්තාකරණ දිනට පෙර සේවාවන්ට අදාළ දායක මුදල් මත සහ සේවාවන්ගේ ප්‍රතිඵලය වන ප්‍රතිලාභමත සැලසුම් මගින් ගෙවිය යුතු බදු.

77 විචක්ෂණශීලි නොවීම හෝ දැඩි ලෙස ගතානුගතික නොවේ නම්, ආයුගණක උපකල්පන පක්ෂග්‍රාහි නොවේ.

78 උද්ධමනය, වැටුප් වැඩිවීමේ අනුපාතික, සහ වට්ටම් අනුපාතිකවැනි සාධක අතර ආර්ථික සම්බන්ධතා ඒවා පිළිබිඹු කරන්නේ නම්,ආයුගණක අපකල්පන අන්‍යොන්‍ය වශයෙන් අනුරූප වෙයි. උදාහරණ ලෙස, නිශ්චිත උද්ධමන මට්ටම මත රැඳෙන සියළුම උපකල්පන (පොලී අනුපාතික සහ වැටුප් සහ ප්‍රතිලාභ වැඩිවීම වැනි), දෙනු ලබන අනාගත කාලපරිච්ඡේදයක උද්ධමන මට්ටම, ඉහත කාලපරිච්ඡේදයට සමාන වේයයි, උපකල්පන කරයි.

79 අස්තිත්වයක් සත්‍ය භාෂිතයෙන් ලබාගත හැකි ඇස්තමේන්තු (උද්ධමනයට ගැලපූ) වඩාත් විශ්වාසදායි වන්නේ නම් හැර, වට්ටම් අනුපාතිකය සහ අනෙකුත් මූල්‍ය උපකල්පන නාමික (ප්‍රකාශකල) භාෂිතයෙන් නිර්ණය කරයි. උදාහරණයක් ලෙස, අති උද්ධමනකාරී ආර්ථිකයක් (LKAS 29 ඇති උද්ධමනකාරී ආර්ථිකයක මූල්‍ය වාර්තාකරණය බලන්න) හෝ ප්‍රතිලාභය දර්ශකයක් හා බැඳී ඇති සහ එම ව්‍යවහාර මුදල් සහ කොන්දේසි සහිත පුළුල් වෙළඳපොලක් සහ දර්ශක හා බැඳුණු බැඳුම්කර.

**80 බැඳීම් නිරවුල් කළයුතු කාලපරිච්ඡේදය සඳහා වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදයෙහි අවසානයට මූල්‍ය උපකල්පන වෙළඳපොල අපේක්ෂාවන් මත පදනම් විය යුතුය.**

**ආයුගණක උපකල්පන සහ මරණ සංඛ්‍යාව**

**81 අස්තිත්වයක් සේවා නියුක්ති කාලය තුළ දි සහ ඉන් පසුව සැලැස්මේ සේවකයන්ගේ මරණ සංඛ්‍යාවට යොමුවීම් මගින් වඩාත් උචිත ඇස්තමේන්තු තුල මරණ සංඛ්‍යා උපකල්පනය නිර්ණය කල යුතුය.**

82 අවසාන ප්‍රතිලාභවල පිරිවැය ඇස්තමේන්තු කිරීමට අස්තිත්වයක් අපේක්ෂිත මරණ සංඛ්‍යා වෙනස්වීම් ද සැලකිල්ලට ගනී. උදාහරණ ලෙස, ප්‍රමිත මරණ සංඛ්‍යා වගු, මරණ සංඛ්‍යාව වඩා යහපත් බවට පත්වීම සමග ඇස්තමේන්තු සංශෝධනය කිරීම මගින්.

**ආයු ගණක උපකල්පන: වට්ටම් අනුපාතිකය**

**83. පශ්චාත් සේවා ප්‍රතිලාභ බැඳීම් වට්ටම් කිරීමට භාවිතා කරන අනුපාතිකය (අරමුදල්කරණය තුළ සහ අරමුදල්කරණය නොකල) වාර්තාකරණ කළපරිච්ඡේදයේ අවසානයට උසස් තත්ත්වයේ සංස්ථාපිත බැඳුම්කර මත, වෙළඳපොල ඵලදා වලට යොමු කර නිර්ණය කළ යුතුය. එවැනි බැඳුම්කර සඳහා ගැඹුරු වෙළඳපොළක් නොමැති රටවල රජයේ බැඳුම්කර මත වෙළඳපොල ඉපයීම් (වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයට) භාවිතා කළ යුතුය. සංස්ථාපිත බැඳුම්කර හෝ රජයේ බැඳුම්කර ව්‍යවහාර මුදල සහ කොන්දේසි පශ්චාත් සේවා ප්‍රතිලාභ බැඳීම් වල ව්‍යවහාර මුදල් සහ ඇස්තමේන්තුගත කොන්දේසි සමග ඒකාග්‍රතාවයක් දැක්විය යුතුය.**

84. ප්‍රමාණාත්මක බලපෑමක් ඇති එක ආයුගනක උපකල්පනයන් වන්නේ වට්ටම් අනුපාතිකයයි. වට්ටම් අනුපාතිකය මුදලෙහි කාලීන අගය පිළිබිඹු කරන නමුත් ආයුගණක හෝ ආයෝජන අවදානම් පෙන්නුම් නොකරයි. තවදුරටත් වට්ටම් අනුපාතිකය මගින් අස්තිත්වයේ ණයහිමියන් විසින් දරණු ලබන අස්තිත්ව නිශ්චිත ණය අවදානම් පෙන්නුම් නොකරන අතර, අනාගත අත්දකින අවදානම ආයුගණක උපකල්පණයන්ගෙන් වෙනස් වන බව පිළිබිඹු නොකරයි.

85. පුරුද්දක් ලෙස වට්ටම් අනුපාතිකය ප්‍රතිලාභ ගෙවීමෙහි ඇස්තමේන්තුගත කාලය පිළිබිඹු කරයි. ඇස්තමේන්තු ගත කාලය සහ ප්‍රතිලාභ ගෙවීම් මුදල සහ ප්‍රතිලාභ ගෙවීම් කරනු ලබන ව්‍යවහාරික මුදල අස්තිත්වයේ බොහෝ විට තනි බර තැබූ වට්ටම් අනුපාතිකයක් මගින් සපුරා ගනී.

86. සමහර අවස්ථා වලදී සියලුම ප්‍රතිලාභ ගෙවීම් වල ඇස්තමේන්තු ගත කල් පිරීම් වලට ගැලපෙන ප්‍රමාණත් දීර්ඝ කල්පිරීමක් සහිත බැඳුම්කර වලට පුළුල් වෙළඳ පොලක්ද නොමැති වීමට ඉඩ තිබේ. එවැනි අවස්ථා වලදී අස්තිත්වයක් කෙටි කාලීන ගෙවීම් වට්ටම් කිරීමට උචිත ප්‍රවර්තන වෙළඳපොල අනුපාතිකය භාවිතා කරන අතර, දිගු කාලීන කල් පිරීම් සඳහා ප්‍රවර්තන වෙළඳ අනුපාතික ඉපයීම් වක්‍රය උපයෝගී කර බහිර්නිවේශනය මගින් වට්ටම් අනුපාතිකය ඇස්තමේන්තු කරයි. නිර්වචිත ප්‍රතිලාභ බැඳීමක මුළු වර්තමාන වටිනාකම පවත්නා සංස්ථාපිත හෝ රාජ්‍ය බැඳුම්කර වල අවසාන කල්පිරීමේ කාලයෙන් ඔබ්බට ගෙවිය යුතු ප්‍රතිලාභයෙහි කොටසකට යොදා ගන්නා වට්ටම් අනුපාතිකය විශේෂයෙන් සංවේදී වන අවස්ථා ඇති වන්නේ කලාතුරකිනි.

**ආයුගණක උපකල්පන, වැටුප්, ප්‍රතිලාභ සහ වෛද්‍ය පිරිවැය**

**87. අස්තිත්වයක් එහි නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් පහත දෑ පිළිබිඹු වන පදනමක් මත මිණුම් කළ යුතුය.**

**(අ) වාර්තා කරන කාලපරිච්ඡේදයක අවසානයට සැලසුමෙහි නියමයන් වලින් දක්වා ඇති (හෝ එම කොන්දේසි අභිබවා යන ඕනෑම සම්මුතික බැඳීමක ප්‍රතිඵලය වන) ප්‍රතිලාභ;**

**(ආ) ගෙවිය යුතු ප්‍රතිලාභයන්ට බලපාන යම් අනාගත ඇස්තමේන්තු කළ වැටුප් වැඩි වීම්;**

**(ඇ) සේවාදායකයාගේ අනාගත ප්‍රතිලාභ පිරිවැය කොටස මත සීමා පිළිබඳ යම් බලපෑම්;**

**(ඈ) එම ප්‍රතිලාභ වලට අස්තිත්වයේ අවසාන පිරිවැය අඩු කරන සේවකයන්ගෙන් හෝ තුන්වන පාර්ශ්වයන්ගෙන් දායක වීම; සහ**

**(ඉ) නිර්වචිත ප්‍රතිලාභ වලට සැලසුමක් යටතේ ගෙවිය යුතු ප්‍රතිලාභ වලට බලපාන ඕනෑම ප්‍රකාශිත ප්‍රතිලාභ මට්ටමක ඇස්තමේන්තුගත අනාගත වෙනස් වීම්; එක්කෝ**

**(i) එම වෙනස් වීම් වාර්තා කරන කාලපරිච්ඡේදයේ අවසානයට පෙර නියමකර තිබීම; හෝ,**

**(ii) එම ප්‍රකාශිත ප්‍රතිලාභ යම් පුරෝකථනය කළ හැකි ආකාරයට වෙනස් විය හැකි බව පෙන්නුම් කරන අතීත දත්ත හෝ වෙනත් විශ්වාසදායක සාක්ෂි උදාහරණ ලෙස පොදු මිල මට්ටමේ හෝ පොදු වැටුප් මට්ටමේ අනාගත වෙනස් වීම් වලට අනුකූලව සපුරාලන්නේ නම් පමණක්.**

88. වාර්තාකරණ කාලපරිච්ඡේදයේ අවසානයේ සැලසුමක නියම කර ඇති විධිමත් නියමයන් (හෝ එම කොන්දේසි ඉක්මවා යන සම්මුතික බැඳීමක්) අනාගත ප්‍රතිලාභ වෙනස් කිරීම් ආයුගණක උපකල්පන පිළිබිඹු කරයි. සිද්ධිය එසේ නම්; උදාහරණ :

(අ) අස්තිත්වයට ප්‍රතිලාභ වැඩි කිරීමේ ඉතිහාසයක් තිබීම උදාහරණ ලෙස උද්ධමනයේ බලපෑම් සමනය කිරීමට සහ අනාගතයේ දී මෙම පරිචය වෙනස් කරන බවට ඇඟවීමක් නොතිබීමයි.

(ආ) සැලැස්මේ විධිමත් කොන්දේසි (හෝ එම කොන්දේසි ඉක්මවා යන සම්මුතික බැඳීම්) හෝ ව්‍යවස්ථාව මගින් සැලැස්මේ යම් අතිරික්තයක් සැලැස්මේ සහභාගිවන්නේ ප්‍රතිලාභ සඳහා භාවිතයට අස්තිත්වය බැඳී සිටීම (108 (ඇ) ඡේදය බලන්න); හෝ

(ඇ) කාර්ය සාධන ඉලක්ක හෝ වෙනත් නිර්නායකයන්ට ප්‍රතිචාර ලෙස ප්‍රතිලාභ වෙනස් වීම් : උදාහරණ ලෙස, සැළසුම් නියමයන් ප්‍රතිලාභ අඩු කර ගෙවීම් හෝ සැලැස්මේ වත්කම් ප්‍රමාණවත් නොවේ නම් සේවකයින්ගේ අමතර දායක මුදල් අවශ්‍යතාවය සැලැස්මේ සඳහන් කර තිබීම හැකිය. බැඳීම මැනීමෙන් කාර්යසාධන ඉලක්ක හෝ වෙනත් උපමානයන්ගේ බලපෑම් වඩාත් හොඳ ඇස්තමේන්තුව පිළිබිඹු වේ.

89. සැලැස්මේ දක්වා නොමැති විධිමත් කොන්දේසි (හෝ සම්මුතික බැඳීම් ) ආයුගණක උපකල්පන මගින් අනාගත ප්‍රතිලාභ වල වෙනස්වීම් මගින් වාර්තා කරන කාලපරිච්ඡේදයක අවසානයට පිළිබිඹු නොකරයි. එවැනි වෙනස් වීම් වල ප්‍රතිඵලය වනුයේ -

(අ) වෙනස්වීමට පෙර සේවා සඳහා ඒවා ප්‍රතිලාභ වෙනසට බලපාන ප්‍රමාණයට අතීත සේවා පිරිවැය; සහ

(ආ) වෙනස්වීමට පසු සේවා සඳහා ඒවා ප්‍රතිලාභ වෙනසට වෙනසින් පසු කාලපරිච්ඡේදය සඳහා ප්‍රවර්තන සේවා පිරිවැය.

90. අනාගත වැටුප් වැඩිවීම්, ඇස්තමේන්තු, උද්ධමනය, ජ්‍යෙෂ්ඨත්වය, උසස් වීම් සහ රැකියා වෙළඳපොලේ පවත්නා ඉල්ලුම සහ සැපයුම වැනි වෙනත් අදාල සාධක සැලකිල්ලට ගනී.

91. සමහර නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් අස්තිත්වයක් ගෙවීමට අවශ්‍ය කරන දායක මුදල් සීමා කරයි. දායකත්ව සීමා මත බලපෑම ප්‍රතිලාභයන්හි අවසාන පිරිවැය සැලකිල්ලට ගනී. දායකත්ව සීමා කෙරෙහි බලපෑම පහත එවායින් කෙටි කාලයක් මත නිර්ණය කෙරේ.

(අ) අස්තිත්වයේ ඇස්තමේන්තුගත ජීව කාලය; සහ

(ආ) සැලැස්මේ ඇස්තමේන්තුගත ජීව කාලය.

92. සමහර නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්, සැලසුමේ පිරිවැය වලට සේවකයන් හෝ තුන්වන පාර්ශ්වයන්ගේ දායකවීම අවශ්‍ය කරයි. අස්තිත්වයට ප්‍රතිලාභ පිරිවැය තුන්වන පාර්ශ්ව දායකත්වය මගින් අඩු කරන්නේද හෝ 116 වන ඡේදයෙහි විස්තර කර ඇති පරිදි ආපසු ගෙවීම් අයිතිවාසිකමක් ද යන්න සලකා බලයි. සේවකයන් හෝ තුන්වන පාර්ශ්ව මගින් එක්කෝ, දායකත්ව සැලැස්මේ විධිමත් කොන්දේසිවල සඳහන් වීම (හෝ එම කොන්දේසි අභිබවා යන සම්මුතික බැඳීම්වලින් පැන නගින) හෝ අභිමතය පරිදි වේ. සේවකයන් හෝ තුන්වන පාර්ශ්ව මගින් අභිමතය පරිදි දායකත්වය, සැලැස්මට දායක මුදල් ගෙවීමේ සේවා පිරිවැය කෙරෙහි අඩුවීමක් ඇති කරයි.

93. සැලැස්මේ විධිමත් කොන්දේසිවල නියමකර ඇති සේවකයන්ගෙන් හෝ තුන්වන පාර්ශ්වයන්ගෙන් වන දායකවීම් එක්කෝ සේවා පිරිවැය අඩු කිරීම (ඒවා සේවයට බැඳී ඇත්නම්) හෝ ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම) නැවත මැණීම අඩු කරයි (උදාහරණ ලෙස, සැලැස්මේ වත්කම් මත පාඩු හෝ ආයුගණක පාඩු මත පැන නගින ඌනතා අඩු කිරීමට දායකවීම අවශ්‍ය නම්). 70 වන ජේදය ප්‍රකාර සේවා කාලපරිච්ජේද වෙනුවෙන් සේවකයන්ගෙන් හෝ තුන්වන පාර්ශ්ව දායකත්ව ඍන ප්‍රතිලාභ ලෙස ආරෝපණය වෙයි (එනම්, ශුද්ධ ප්‍රතිලාභ එම ජේදය ප්‍රකාර ආරෝපිත වෙයි).

94. සේවාව වෙනුවෙන් සේවක හෝ තුන්වන පාර්ශ්ව දායකත්වයන්හි වෙනස්වීම්වල ප්‍රතිඵලය වනුයේ ඃ

(අ) ප්‍රවර්තන සහ අතීත සේවා පිරිවැය (සැලසුමේ විධිමත් කොන්දේසිවල සේවක දායකත්ව වෙනස්වීම් දක්වා නොමැති නම් සහ සම්මුතික බැඳීමකින් පැන නොනගී නම්); හෝ

(ආ) ආයුගණක ප්‍රතිලාභ සහ අලාභ (සැලැස්මේ විධිමත් කොන්දේසිවල සේවක දායකත්ව වෙනස්වීම් දක්වා ඇත්නම් හෝ සම්මුතික බැඳීම් වලින් පැනනගී නම්).

95. සමහර පශ්චාත් සේවා ඇතැම් ප්‍රතිලාභ රාජ්‍ය විශ්‍රාමික ප්‍රතිලාභ හෝ රාජ්‍ය වෛද්‍ය රැකවරණය මට්ටම වැනි විචල්‍යයන්ට බැඳී පවතී, ඓතිහාසික දත්ත සහ වෙනත් විශ්වාසදායක සාක්ෂි මත පදනම්, එවැනි ප්‍රතිලාභ මිණුම්කරණයේදී, එවැනි විචල්‍යයන්හි හොඳම ඇස්තමේන්තුව, පිළිබිඹු වෙයි.

**96. වෛද්‍ය පිරිවැය පිළිබඳ උපකල්පන උද්ධමනය සහ වෛද්‍ය පිරිවැයේ වෙනත් නිශ්චිත වෙනස්කම් යන දෙකේම ප්‍රතිඵලයක් ලෙස ඇතිවන අනාගත වෛද්‍ය පිරිවැයෙහි වෙනස්කම් සැලකිල්ලට ගත යුතුය.**

97. පශ්චාත් සේවා වෛද්‍ය ප්‍රතිලාභ මැණීම් කිරීමට, අනාගත හිමිකම් ඉල්ලීම් වලට සංඛ්‍යානය සහ ඒ පිළිබඳ මට්ටම සහ එවැනි හිමිකම් ඉල්ලීම් සපුරාලීමේ පිරිවැය ද පිළිබඳ උපකල්පන අවශ්‍ය වෙයි. අස්තිත්වයේ ඓතිහාසික දත්ත මත පදනම් වූ ස්වකීය පළපුරුද්ද සහ අතිරේක වශයෙන් රක්ෂණ සමාගම්, වෛද්‍ය පහසුකම් සපයන්නන් හෝ වෙනත් මාර්ග වලින් ලබාගත් ඓතිහාසික දත්ත පදනම් කරගෙන අස්තිත්වයක් අනාගත වෛද්‍ය පිරිවැය ඇස්තමේන්තු කරයි. අනාගත වෛද්‍ය වියදම් ඇස්තමේන්තු, තාක්ෂණික දියුණුවීම්, වෛද්‍ය සේවා උපයෝගී කරගැනීමේ වෙනස්කම් හෝ ප්‍රසූත රටාව සහ සැලසුමේ සහභාගි වන්නන්ගේ සෞඛ්‍ය තත්ත්වයේ බලපෑම සැලකිල්ලට ගනී.

98. හිමිකම් ඉල්ලීම්වල මට්ටම සහ සංඛ්‍යානය, වයස, සෞඛ්‍ය තත්ත්වය සහ සේවකයන්ගේ ස්ත්‍රී පුරුෂ භාවය (සහ ඔවුන්ගෙන් යැපෙන්නන්) වෙනුවෙන් විශේෂිතව සංවේදී වන අතර, භූගෝලීය පිහිටීම වැනි වෙනත් සාධක වලටද සංවේදී විය හැකිය. එම නිසා දත්ත සඳහා පදනම ලෙස භාවිතා කරන ජනගහනයේ වෙනස්කම්, ජනගහනයේ ජනවාර්ගික මිශ්‍රණය එම ඓතිහාසික දත්ත අදාල ප්‍රමාණයට ගැලපීම් කරනු ලබයි. ඓතිහාසික ප්‍රවනතා තවදුරටත් නොපවතින බවට විශ්වාසදායක සාක්ෂි ඇත්නම්, ඒවාටද ගැලපීම් කරනු ලබයි.

**නිරවුල් කිරීම මත අතීත සේවා පිරිවැය සහ ප්‍රතිලාභ සහ අලාභ**

**99. අතීත සේවා පිරිවැය හෝ නිරවුල් කිරීම මත පැනනගින ප්‍රතිලාභ හෝ අලාභ නිර්ණය කිරීමට පළමුව, අස්තිත්වයක් විසින් සැලසුමේ වත්කම්වල ප්‍රවර්තන සාධාරණ වටිනාකම සහ ප්‍රවර්තන ආයුගණක උපකල්පන (ප්‍රවර්තන වෙළඳපොළ පොලී**

**අනුපාතික සහ වෙනත් ප්‍රවර්තන වෙළඳ මිල ඇතුලත්ව), සැලැස්ම සංශෝධනය, කපා හැරීම හෝ නිරවුල් කිරීම් වලට පළමු සැලැස්ම යටතේ පිරිනමන ප්‍රතිලාභ පිළිබිඹුවන පරිදි භාවිතා කරමින් ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම්) නැවත මිණුම් කළ යුතුය.**

100. සැලැසුමේ සංශෝධනය මගින් ඇතිවන අතීත පිරිවැය කපා හැරීමේ ප්‍රතිඵලයන් මගින් අතීත පිරිවැය සහ නිරවුල් කිරීම මත ඇතිවන ප්‍රතිලාභ සහ අලාභ යන ගනුදෙනු එකවර ඇතිවන්නේ නම්, අස්තිත්වය ඒවායේ ප්‍රතිඵලය වන අතීත සේවා පිරිවැය අතර වෙන් කොට දැක්වීම අවශ්‍ය නොවේ. සමහර අවස්ථාවල අස්තිත්වයක් සැලසුම යටතේ ප්‍රතිලාභ වෙනස් කිරීම් කර, පසුව සංශෝධිත ප්‍රතිලාභ නිරවුල් කිරීම වැනි සැලැස්මේ සංශෝධන, නිරවුල් කිරීමට පළමු ඇති වෙයි. එවැනි අවස්ථාවල අස්තිත්වය නිරවුල් කිරීම මත ඇතිවන ප්‍රතිලාභ හෝ අලාභ, අතීත සේවා පිරිවැය කලින් හඳුනා ගනියි.

101. සැලැස්මේ සංශෝධන සහ කපා හැරීම්, බේරුම් කිරීම හා සමගම ඇතිවීනම්, ප්‍රතිඵලය සමග සැලැස්ම බැඳීම් නිරවුල් සැලැස්මේ පැවැත්ම අවසන් වෙයි. කෙසේ වෙතත්, සැලැස්ම අවසන්වීම, අලුත් සැලැස්මක් මතින් නැවත පිහිටුවා සැලැස්මේ ප්‍රතිලාභ හරය ලෙසම පිරිනමන්නේ නම් එය නිරවුල් කිරීමක් නොවේ.

**අතීත සේවා පිරිවැය**

102 සැලැස්මේ සංශෝධන හෝ කපා හැරීම් තුළින් ප්‍රතිඵලය වන නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම වෙනස්වීම් අතීත සේවා පිරිවැයයි.

**103 පහත සඳහන් දිනයන්ගෙන් පළමුව ඇතිවන දෑ වල දී අස්තිත්වයක් විසින් අතීත සේවා පිරිවැය වියදමක් ලෙස හඳුනාගත යුතුය.**

**(අ) සැලැස්ම සංශෝධනය හෝ කපා හැරීම් ඇති වූ කල්හි; සහ**

**(ආ) අස්තිත්වය ප්‍රතිසංවිධාන සම්බන්ධිත පිරිවැය (LKAS 37 බලන්න) හෝ අවස්ථාවේ ප්‍රතිලාභ හඳුනාගත් කල්හි (165 ඡේදය බලන්න)**

104 අස්තිත්වයක් නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක් හඳුන්වා දීමේදී හෝ ඉවත්කර ගැනීමේදී පවත්නා නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම යටතේ ගෙවිය යුතු ප්‍රතිලාභ වෙනස් කිරීම කරන කල්හි, සැලැස්ම ප්‍රතිශෝධනය වෙයි.

105 අස්තිත්වය සැලසුම යටතේ ආවරණයවන සේවක සංඛ්‍යාව සැලැකිය යුතු ලෙස අඩු කළ කල්හි, කපාහැරීමක් සිදුවෙයි. පිරියතක් වසා දැමීම, මෙහෙයුමක් නවතා දැමීම හෝ සැලැස්ම අවසන් කිරීම හෝ අත්හිටවීමක් වැනි හුදෙකලා සිද්ධියක් මගින් කපාහැරීමක් පැන නැගිය හැකිය.

106 අතීත පිරිවැය ධනාත්මක (ප්‍රතිලාභ අලුතෙන් ඇති කළ හෝ ප්‍රතිලාභ බැඳීම් වැඩිවන පරිදි වර්තමාන අගය වැඩිවන පරිදි වෙනසක් කළ කල්හි) හෝ ඍනාත්මක (ප්‍රතිලාභ ඉවත් කළ හෝ නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම අඩුවන පරිදි වෙනසක් කළ කල්හි) විය හැකිය.

107 පවත්නා නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක් යටතේ අස්තිත්වයක් ප්‍රතිලාභ අඩුකිරීම සහ එම විටම සැලසුම යටතේ එම සේවකයින් සඳහාම වෙනත් ප්‍රතිලාභ වැඩි කිරීම එය ශුද්ධ තනි වෙනසක් ලෙස අස්තිත්වය සලකයි.

108 අතීත සේවා පිරිවැය අත්හරින දෑ :

(අ) තත්‍ය සහ පෙර වර්ෂවල සේවා සඳහා ගෙවීමට බැඳී ඇති ප්‍රතිලාභ මත වැටුප් වැඩිවීම්වල වෙනස්කම්වල බලපෑම (ආයුගණක උපකල්පන ප්‍රතික්ෂේපිත වැටුප් සඳහා ඉඩ හරින හෙයින් අතීත සේවා පිරිවැයක් නොමැත)

(ආ) අභිමතය පරිදි විශ්‍රාම වැටුප් වැඩි කිරීම් සහ අඩුවෙන් තක්සේරු සහ අධි තක්සේරු කළ කල්හි, අස්තිත්වයට එවැනි සම්මුතික බැඳීම් ඉඩ හැරිය යුතු වීම (ආයුගණක උපකල්පන එවැනි ගෙවීම් සඳහා ඉඩහරින හෙයින් අතීත සේවා පරිවැයක් නොමැත).

(ඇ) සැලැස්මේ විධිමත් කොන්දේසි මගින් (හෝ එම කොන්දේසි ඉක්මවා යන සම්මුතික බැඳීම්) හෝ ව්‍යවස්ථාවෙන්, සැලැස්මේ යම් අතිරික්තයක් සැලැස්මේ සහභාගිවන්නන් අතර භාවිතයට ගතයුතු නම්, වැඩි වූ ප්‍රතිලාභ තවමත් විධිමත්ව ලබාදී නොමැති වුවද (ප්‍රතිඵලය වන බැඳීම් වැඩිවීම ආයුගණක අලාභයක් නිසා අතීත සේවා පිරිවැයක් නොමැති 88 වන

ජේදය බලන්න) මූල්‍ය ප්‍රකාශනයන්හි හඳුනාගත් සැලැස්මේ වත්කම් මත ඇතිවන ඵලදාවෙන් හෝ ආයුගණක ප්‍රතිලාභවල ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ප්‍රතිලාභ වැඩිවීම්වල ඇස්තමේන්තුව; සහ

(ඇ) අලුත් හෝ වර්ධනය වූ ප්‍රතිලාභ නොමැති කල්හි, පැවරූ ප්‍රතිලාභයන්හි වැඩිවීමක් (එනම්, ප්‍රතිලාභ අනාගත සේවා නියුක්තිය මත 72 වන ජේදය බලන්න) සේවකයන්ගේ පැවරීම් අවශ්‍යතාවයන් සම්පූර්ණ කරයි (අතීත පිරිවැයක් නොමැත මක්නිසාදයත් අස්තිත්වය සේවා ලබාගන්නා විට අස්තමේන්තු කළ සේවා ප්‍රතිලාභ ප්‍රවර්තන සේවා පිරිවැය ලෙස හඳුනාගන්නා හෙයිනි).

## නිරවුල් කිරීම මත ප්‍රතිලාභ හෝ අලාභ

109 නිරවුල් කිරීම මත ප්‍රතිලාභ පහත කරුණු අතර වෙනස්කම්ය ෘ

(අ) බේරුම් කරන දිනයේදී නිශ්චය කළ නිරවුල් කරනු ලබන නිර්වචිත ප්‍රතිලාභ බැදීම්වල වර්තමාන වටිනාකම ; සහ

(ආ) මාරු කළ යම් වත්කමක් සහ අස්තිත්වය මගින් බේරුම් කිරීමට අදාළ යම් සෘජු ගෙවීම් ඇතුළත්ව බේරුම් කිරීමේ මිල.

**110 අස්තිත්වයක් විසින් බේරුම් කිරීම ඇතිවන කල්හි, නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක බේරුම් කිරීම මත ඇතිවන ප්‍රතිලාභ සහ අලාභ හඳුනාගත යුතුය.**

111 නිර්වචිත සැලැස්මක් යටතේ සැලසිය යුතු ප්‍රතිලාභ සියල්ලම හෝ කොටසක් වෙනුවෙන් (සැලැස්මේ කොන්දේසි ප්‍රකාර සහ ආයුගණක උපකල්පනයන්හි ඇතුළත්, සේවකයන් වෙනුවෙන් හෝ ඔවුනට ගෙවන ප්‍රතිලාභ නොවන) නෛතික හෝ සම්මුතික බැඳීම් තවදුරටත් ඉවත් කරන ගනුදෙනුවකට අස්තිත්වයක් ඇතුළත් වූ කල්හි, බේරුම් කිරීමක් ඇති වෙයි. උදාහරණයක් ලෙස, සැලැස්ම යටතේ සැලකිය යුතු සේව්‍ය බැඳීමක්, රක්‍ෂණ සමාගමකින් රක්‍ෂණ ඔප්පුවක් මිලදී ගැනීම හරහා මුළුමනින්ම හුවමාරුව බේරුම් කිරීමක් වන අතර, සැලැස්මක කොන්දෙසි යටතේ, සැලැස්මකට සහභාගිවන්නන්, නිශ්චිත පශ්චාත් සේවා ප්‍රතිලාභ ලැබීම සඳහා හුවමාරුවට, එකවර මුදලක් ගෙවීම එවැන්නක් නොවේ. සමහර අවස්ථාවලදී අස්තිත්වයක් සේවකයින්ට අදාළ ප්‍රවර්තන සහ පූර්ව සේවා ප්‍රතිලාභ සමහරක් හෝ සියල්ලම වෙනුවෙන් රක්‍ෂණ ඔප්පුවක් අත්පත් කරගනී. රක්‍ෂණ ඔප්පුවේ නිශ්චිත ප්‍රතිලාභ රක්‍ෂකයා නොවුවහොත්, තවදුරටත් ගෙවීම් කිරීමට නෛතික සහ සම්මුතික බැදීම් රඳවාගෙන ඇත්නම් (46 වන ජේදය බලන්න) එවැනි ඔප්පුවක් අත්සන් කරගැනීම බේරුම් කිරීමක් නොවේ. සැලසුමක වත්කම් නොවන රක්‍ෂණ ඔප්පු යටතේ අයිතිවාසිකම් ආපසු ගෙවීම් හඳුනා ගැනීම සහ මැනීම පිළිබඳව 116-119 ජේද කටයුතු කරයි.

### හඳුනාගැනීම සහ මැනීම : සැලසුමේ වත්කම්

### සැලසුමේ වත්කම්වල සාධාරණ වටිනාකම

113 ඌනකාවය හෝ අතිරික්තය නිර්නය කිරීමේදී නිර්වචිත ප්‍රතිලාභ බැදීම්වල වර්තමාන වටිනාකමෙන් යම් සැලසුම් වත්කම්වල සාධාරණ වටිනාකම අඩු කරයි. වෙළඳ මිලක් නොමැති කල්හි සැලසුමේ වත්කම්වල සාධාරණ වටිනාකම තක්සේරු කරයි. උදාහරණ වශයෙන්, සැලැස්මේ වත්කම් සහ කල්පිරීම යන දෙකටම සම්බන්ධිත අවදානම පිළිබිඹුවන වට්ටම් අනුපාතයක් භාවිතාකර අපේක්ෂිත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමෙන් හෝ ඒ වත්කම්වල අපේක්ෂිත අපහරණ දිනය (හෝ ඒවාට කල් පිරීමක් නොමැති නම් සම්බන්ධිත බැදීම් බේරුම් කරන දිනය තෙක් අපේක්ෂිත කාලපරිච්ඡේදය)

114 වාර්තාකරන අස්තිත්වයන් අරමුදලට ලැබිය යුතු නොගෙවන ලද දායක මුදල් මෙන්ම, අරමුදල මගින් රඳවාගෙන ඇති අස්තිත්වය මගින් නිකුත් කළ හුවමාරු කළ නොහැකි මූල්‍ය සාධන පත්‍ර සැලැස්මේ වත්කම්වලට ඇතුළත් නොකරයි. සේවක ප්‍රතිලාභවලට සම්බන්ධ නොවන අරමුදල් යම් වගකීමක් මගින් සැලැස්මේ වත්කම් අඩුවෙයි. උදාහරණ වශයෙන් ව්‍යුත්පන්න මූල්‍ය සාධන පත්‍රවලින් ප්‍රතිඵලය වන වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ සහ වගකීම්.

115 සැලැස්ම යටතේ ගෙවිය යුතු මුදල් හා අදාළ කාලයට නියම ලෙස ගැළපෙන සුදුසුකම් ලබන රක්‍ෂණ ඔප්පු සැලැස්මේ වත්කම් වලට ඇතුළත් වන කල්හි සහ එම රක්‍ෂණ ඔප්පුවල සාධාරණ වටිනාකම සම්බන්ධිත බැදීම්වලට සමාන යැයි සැලකීම (රක්‍ෂණ ඔප්පු යටතේ ආපසු ලබාගත හැකි මුදල යම් අඩු කිරීම්වලට භාජනය වීමට අවශ්‍යතාවයට යටත්ව)

**ප්‍රතිපූර්ණ කිරීම**

116. නිර්වචිත ප්‍රතිලාභ බැඳීමක් බේරුම් කිරීමට අවශ්‍ය සම්පූර්ණ වියදම හෝ ඉන් කොටසක්, වෙනත් පාර්ශවයක් විසින් ප්‍රතිපූර්ණ කරනු ඇති බව සැබැවින්ම නිශ්චිත කල්හි,

(අ) ප්‍රතිපූර්ණය කිරීමේ අයිතිය වෙනම වත්කමක් වශයෙන් හඳුනාගත යුතු ය. අස්තිත්වය විසින් වත්කම සාධාරණ වටිනාකමට මැනිය යුතු ය.

(ආ) ප්‍රතිපූර්ණ කිරීමේ අයිතියේ සාධාරණ වටිනාකම වෙනස්වීම් සැලැස්මේ වත්කම්වල සාධාරණ වටිනාකම වෙනස් වීම් සඳහා වන ආකාරයටම වෙන්කර හඳුනා ගැනීම (124 සහ 125 ඡේද බලන්න). 120 වන ඡේදය ප්‍රකාර හඳුනාගත් නිර්වචිත ප්‍රතිලාභ පිරිවැය සංරචකයන්, ප්‍රතිපූර්ණ කිරීමේ අයිතියෙහි ධාරණ අංගයට අදාළ වෙනස්වීම් ශුද්ධ අංගයට හඳුනා ගත හැකිය.

117. ඇතැම් විට, නිර්වචිත ප්‍රතිලාභ බැඳීමක් බේරුම් කිරීමට අවශ්‍ය සම්පූර්ණ වියදම හෝ ඉන් කොටසක් රක්ෂකයා වැනි වෙනත් පාර්ශවයක් ගෙවීමට සකස් කළ හැකිය. 8 වන ඡේදයෙන් නිර්වචිත පරිදි සුදුසුකම් ලත් රක්ෂණ ඔප්පු සැලැස්මේ වත්කම්ය. අස්තිත්වයක් සැලැස්මේ අනික් සියලු වත්කම් ආකාරයටම සුදුසුකම් ලත් රක්ෂණ ඔප්පු සඳහා ගිණුම් තබන අතර, 116 වන ඡේදය අදාළ නොවේ (46-49 සහ 115 ඡේද බලන්න).

118. අස්තිත්වයක් රඳවාගෙන ඇති රක්ෂණ ඔප්පුවක් සුදුසුකම් ලත් රක්ෂණ ඔප්පුවක් නොවන කල්හි, රක්ෂණ ඔප්පුව සැලැස්මේ වත්කමක් නොවේ. එවැනි අවස්ථාවලට 116 වන ඡේදය අදාළ නොවේ. නිර්වචිත ප්‍රතිලාභ ඌනතාවය හෝ අතිරික්තය නිර්නය කිරීමේ දී අඩුකිරීමක් ලෙසට වඩා ප්‍රතිපූර්ණ කිරීමේ අයිතිය යටතේ රක්ෂණ ඔප්පුව වෙනම වත්කමක් ලෙස අස්තිත්වය හඳුනාගනී. ප්‍රතිපූර්ණ කිරීමේ අයිතිය සහ අදාළ බැඳීම අතර සම්බන්ධතාවය පිළිබඳ කෙටි විස්තරයක් අනාවරණය කිරීමට 140 (ආ) ඡේදය අස්තිත්වයකට අවශ්‍යතාවය ඇති කරයි.

119. රක්ෂණ ඔප්පුවක් යටතේ පැනනගින ප්‍රතිපූර්ණය කිරීමේ අයිතිය, නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම යටතේ ගෙවිය යුතු මුදල සහ වේලාව සමග සැම අතින්ම සැසඳේනම්, ප්‍රතිපූර්ණ කිරීමේ අයිතියේ සාධාරණ වටිනාකම අදාළ බැඳීමේ වර්තමාන වටිනාකම ලෙසට සලකනු ලැබේ. (ප්‍රතිපූර්ණ කිරීම සම්පූර්ණයෙන් අයකර නොගන්නේ නම්, අවශ්‍ය යම් අඩුකිරීම්වලට යටත්ව).

**නිර්වචිත ප්‍රතිලාභපිරිවැයෙහි සංරචක**

120. වෙනත් SLFRS එකකින් ඒවායේ ඇතුළත් කිරීම අවශ්‍ය කරන හෝ අවසර දෙන ප්‍රමාණයට හැර, අස්තිත්වයක් විසින් නිර්වචිත ප්‍රතිලාභ පිරිවැය සංරචකයන් පහත සඳහන් පරිදි හඳුනාගත යුතු ය.

(අ) සේවා පිරිවැය (66-.112 ඡේද බලන්න) ලාභය හෝ අලාභයෙහි.

(ආ) ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම්) මත ශුද්ධ පොළිය (123.126 ඡේද බලන්න) ලාභය හෝ අලාභයෙහි ;සහ

(ඇ) ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම) නැවත මිනුම් කිරීම් (127.130 ඡේද බලන්න) වෙනත් විස්තීර්ණ ආදායමෙහි.

121. වෙනත් SLFRS සමහර සේවක ප්‍රතිලාභ පිරිවැය, තොග සහ දේපළ,පිරියත සහ උපකරණ වැනි වත්කම්වල ඇතුළත් කිරීම අවශ්‍ය කරයි. ( SLAS සහ LLAS 16 බලන්න). එවැනි වත්කම්වල ඇතුළත් පශ්චාත් සේවා පිරිවැය, 120 වන ජේදයෙහි ලැයිස්තුගත සංරචකයන්හි උචිත කොටස ද ඇතුළත් වෙයි.

122. වෙනත් විස්තීර්ණ ආදායමෙහි හඳුනාගත් ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම්) නැවත මිණුම් කිරීම් පසු කාලපරිච්ඡේදයක නැවත වර්ගීකරණය නොකළ යුතු ය. කෙසේ වෙතත් වෙනත් විස්තීර්ණ ආදායමෙහි හඳුනාගත් මුදල් ප්‍රමාණයන් අස්තිත්වයකට ස්කන්ධය ඇතුළත මාරුකළ හැකිය.

**ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම්) මත ශුද්ධ පොළිය**

123. ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම (වත්කම) මත ශුද්ධ පොළිය නිර්නය කළයුත්තේ ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම) 83 වන ජේදයෙහි නිශ්චයකර ඇති වට්ටම් අනුපාතයෙන් වැඩි කිරීම මගිනි. එසේ කිරීමේ දී එම කරුණු දෙකම දායකත්ව සහ

**ප්‍රතිලාභ ගෙවීම්වල ප්‍රතිඵලය ලෙස ශුද්ධ නිර්වචික ප්‍රතිලාභ වගකීම් (වත්කම්) වල කාලපරිච්ඡේදය තුළ වෙනස්වීම් සැලකිල්ලට ගනිමින්, වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදය ආරම්භයේ දී නිර්නය කළ ආකාරයටය.**

124. ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ මත ශුද්ධ පොළිය, සැලසුම් වත්කම් මත පොළී ආදායම, නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් මත පොළී පිරිවැය සහ 64 වන ජේදයේ සඳහන් කර ඇති වත්කම් සීමාවන් මත ප්‍රතිඵලය යන ඒවායින් සමන්විත වන බව දර්ශනය කිරීමට පුළුවන.

125. සැලසුමේ වත්කම් මත පොළිය, සැලැස්මේ වත්කම් ඵලදාව මත සංරචකයන් සහ එය නිර්නය කරනුයේ 83 වන ජේදයෙහි නිශ්චිතව දක්වා ඇති වට්ටම් අනුපාතය මගින් සැලැස්මේ වත්කම්වල සාධාරණ අගය වැඩිකිරීමෙන් වන අතර, ඒ දෙකම වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදය ආරම්භයේ දී, කාලපරිච්ඡේදය තුළ දායක මුදල් ලැබීම් සහ ප්‍රතිලාභ ගෙවීම්වල ප්‍රතිඵලයක් ලෙස සැලැස්මේ වත්කම්වල යම් වෙනස්කම් සැලකිල්ලට ගැනීමෙන් නිර්නය කරයි. සැලැස්මේ වත්කම් මත පොළිය සහ සැලැස්මේ වත්කම් මත ඵලදාව අතර වෙනස ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම්) නැවත මිණුම් කිරීමෙහි ඇතුළත් කරනු ලබයි.

126. පොළිය වත්කම් සීමාව මත බලපෑම, වත්කම් සීමාවේ මුළු වෙනසේ කොටසක් වන අතර, එය 83 වන ජේදයෙහි නිශ්චිතව දක්වා ඇති වට්ටම් අනුපාතය මගින් වත්කම් සීමාවේ බලපෑම වැඩි කිරීම මගින් නිර්නය කරනු ලබයි. එම මුදලේ සහ වත්කම් සීමාවේ බලපෑමෙහි මුළු සංචලනය අතර වෙනස ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම (වත්කම) නැවත මිණුම් කිරීමෙහි ඇතුළත් කරයි.

**ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම්) නැවත මිණුම් කිරීම**

127. ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම (වත්කම) නැවත මිණුම් කිරීම් සමන්විත වනුයේ ඃ

(අ) ආයුගණක ප්‍රතිලාභ සහ අලාභ (128 සහ 129 ජේද බලන්න)

(ආ) ශුද්ධ නිර්වක ප්‍රතිලාභ වගකීම් (වත්කම්) මත ඇතුළත් කළ ශුද්ධ පොළිය (125 ජේදය බලන්න) හැර සැලැස්මේ වත්කම් මත ඵලදාව (130 වන ජේදය බලන්න) ඃ සහ

(ඇ) ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම්) වළ ඇතුළත් කළ ශුද්ධ පොළිය (126 වන ජේදය බලන්න) හැර වත්කම් සීමාවේ බලපෑමේ යම් වෙනසක්.

128 ආයුසණක උපකල්පන සහ පලපුරුදු ගැලපීම්වල වෙනස්වීම් හේතුවෙන්, නිර්වචිත ප්‍රතිලාභ වර්තමාන වටිනාකම වැඩිවීම් හෝ අඩුවීම්, ආයුගණක අලාභ සහ ප්‍රතිලාභවල ප්‍රතිඵලයි. උදාහරණ වශයෙන් ආයුගණක ප්‍රතිලාභ හෝ අලාභවලට ඇතුළත් වනුයේ ඃ

(අ) අනපේක්ෂිත අධික හෝ අඩු මට්ටමේ සේවක පිරිවැටුම, කලින් විශ්‍රාම ගැනීම හෝ වේතන වැඩිවීම, ප්‍රතිලාභ (සැලැසුමේ විධිමත් හෝ සම්මුතික කොන්දේසි උද්ධමන ප්‍රතිලාභ වැඩිවීම් සඳහා ප්‍රතිපාදනය) හෝ වෛද්‍ය වියදම්,

(ආ) විකල්ප ප්‍රතිලාභ ගෙවීම්වල අදාළ උපකල්පනයන්හි වෙනස්වීම්වල ප්‍රතිඵල ඃ

(ඇ) අනාගත සේවක පිරිවැටුම් කලින් විශ්‍රාම ගැනීම් හෝ මියයෑම් හෝ වැටුප් වැඩිවීම්, ප්‍රතිලාභ (සැලසුමේ විධිමත් හෝ සම්මුතික කොන්දේසි උද්ධමන ප්‍රතිලාභ වැඩිවීම් සඳහා ප්‍රතිපාදන) හෝ වෛද්‍ය වියදම් ඇස්තමේන්තු වෙනස්වීම්වල බලපෑම, සහ

(ඈ) වට්ටම් අනුපාතයෙහි වෙනස්වීම්වල බලපෑම

129 ඉදිරිපත් කිරීම, සංශෝධන, කප්පාදු කිරීම් හෝ නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මේ බේරුම් කිරීම් හෝ නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම යටතේ ගෙවීම්වලට වෙනස් කිරීම් හේතුවෙන්, ඇතිවන වෙනසකම් ආයුගණක ප්‍රතිලාභ හෝ අලාභවලට ඇතුළත් නොවන හෙයින් නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම වෙනස් නොවෙයි. එවැනි වෙනස්කම්වල ප්‍රතිඵලය අතීත සේවා පිරිවැයෙහි හෝ ප්‍රතිලාභ හෝ බේරුම් කිරීම් මත අලාභයන්හි ඇතුළත් ය.

130 සැලසුමේ වත්කම් මත ඵලදාව නිර්ණය කිරීමේ දී සැලසුමේ වත්කම් කළමණාකරණය කිරීමේ පිරිවැය සහ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් මිණුම් කිරීමට භාවිතාකළ, ආයුගණක උපකල්පනවල ඇතුළත් (76 වන ඡේදය බලන්න) බදු හැර සැලසුම මගින් ගෙවිය යුතු බදු අඩුකරයි. වෙනත් පරිපාලන වියදම් සැලසුමේ වත්කම් මත ඵලදාවෙන් අඩු නොකරයි.

**ඉදිරිපත් කිරීම**

**හිලව්කිරීම**

**131 අස්තිත්වයක් පහත සඳහන් අවස්ථාවල දී පමණක් එක් සැලැස්මකට අදාළ වත්කමක්, වෙනත් සැලසුමකට අදාළ වගකීමක් සමග හිලව් කිරීම් කළ යුතු ය.**

**(අ) එක් සැලසුමක අතිරික්තයක් අනෙක් සැලසුමක වගකීමක් බේරුම් කිරීමට භාවිතා කිරීමේ නෛතිකව ක්‍රියාත්මක කිරීමේ අයිතිය තිබීම ; සහ**

**(ආ) බැඳීම් ශුද්ධ පදනමක් යටතේ බේරුම් කිරීමට අපේක්ෂාව හෝ එක මත සැලසුමක අතිරික්තය උපලබ්ධි කර, අනෙක් සැලසුම් බැඳීම් සමගාමීව බේරුම් කිරීම.**

132 හිලව් කිරීමේ නිර්නායකයන් LKAS 32 මූල්‍ය සාධනපත්‍ර ඃ ඉදිරිපත් කිරීම හි මූල්‍ය සාධන පත්‍ර සඳහා ආදේශකළ නිර්නායකයන්ට සමාන වේ.

**ජංගම / ජංගම නොවන වෙනස්කම්**

133 සමහර අස්තිත්ව ජංගම වත්කම් සහ වගකීම්, ජංගම නොවන වත්කම් හා වගකීම්වලින් වෙන්කර දක්වයි. මෙම ප්‍රමිතය පශ්චාත් සේවා ප්‍රතිලාභවලින් පැන නගින ප්‍රතිලාභ, අස්තිත්වයක් විසින් ඒවා ජංගම සහ ජංගම නොවන කොටස්වලට වත්කම් සහ වගකීම් මෙම ප්‍රමිතය නිශ්චිතව වෙන් නොකරයි.

**නිර්වචිත ප්‍රතිලාභ පිරිවැයෙහි සංරචකයන්**

134 අස්තිත්වයක් සේවා පිරිවැය සහ ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම්) මත ශුද්ධ පොළිය ලාභ හෝ අලාභයෙහි හඳුනා ගැනීම 120 වන ඡේදය අවශ්‍ය කරයි. මෙම ප්‍රමිතය සේවා පිරිවැය සහ ශුද්ධ පොළිය අස්තිත්වයක් කෙසේ ඉදිරිපත් කළ යුතු ද යන්න නිශ්චිතව නොදක්වයි. අස්තිත්වයක් එම සංරචක LKAS 1 ප්‍රකාර ඉදිරිපත් කරයි.

**හෙළිදරව් කිරීම්**

**135 අස්තිත්වයක් විසින් පහත සඳහන් තොරතුරු හෙළිදරව් කළ යුතු ය.**

**(අ) නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මේ ලක්ෂණ සහ ඒවා සමග ආශ්‍රිය අවදානම් පැහැදිලි කිරීම (139 වන ඡේදය බලන්න).**

**(ආ) නිර්වචික ප්‍රතිලාභ සැලැස්ම මගින් පැන නගින, එහි මූල්‍ය ප්‍රකාශනයන්හි ඇති මුදල් ප්‍රමාණයන් හඳුනා ගැනීම සහ පැහැදිලි කිරීම (140 .144 ඡේද බලන්න) ; සහ**

**(ඇ) නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම එහි මුදල් ප්‍රමාණයන්, කාලීන බව සහ අවිනිශ්චිත භාවය, අස්තිත්වයේ අනාගත මුදල් ප්‍රවාහ කෙරෙහි බලාපන ආකාරය විස්තර කිරීම (145, 147 ඡේද බලන්න)**

136 135 ඡේදයෙහි අරමුණු සපුරාලීමට අස්තිත්වයක් පහත සඳහන් සියල්ලක්ම සලකා බැලිය යුතු ය.

(අ) හෙළිදරව් අවශ්‍යතා තෘප්ත කිරීමට අවශ්‍ය විස්තරවල මට්ටම

(ආ) එක් එක් විවිධ අවශ්‍යතා මත කෙතරම් අවධානයක් තැබිය යුතු ද?

(ඇ) කොතරම් ප්‍රමාණයක සමුච්චයකරණය හෝ අසමුච්චයකරණය පවරාගත යුතු ද; සහ

(ඈ) මූල්‍ය ප්‍රකාශනයන් භාවිතා කරන්නන්ට හෙළිදරව් කර ඇති ප්‍රමාණාත්මක තොරතුරු ඇගයීමට අමතර තොරතුරු අවශ්‍ය වන්නේ ද?

138 ප්‍රමාණාත්මක විවිධ අවදානම් සහිත සැලසුම් හෝ සමූහ සැලසුම් වෙන්කර දැක්වීමට, හෙළිදරව් කිරීම් සියල්ලම හෝ සමහරක් සමුච්චය නොකල යුතු ද යන්න අස්තිත්වයක් විසින් තක්සේරු කළ යුතු ය. උදාහරණ ලෙස අස්තිත්වයක් සැලසුමක් පිළිබඳ හෙළිදරව් කිරීම්, පහත සඳහන් ලක්‍ෂණ එකක් හෝ වැඩි ගණනක් දැක්වීමට වෙන්කර දැක්විය හැකිය.

(අ) විවිධ භූගෝලීය පිහිටීම්;

(ආ) තනි වේතන විශ්‍රාම සැලසුම්, අවසාන වේතන විශ්‍රාම සැලසුම් හෝ පශ්චාත් සේවා වෛද්‍ය සැලසුම් වැනි විවධ ලක්‍ෂණ;

(ඇ) විවිධ නියාමක පරිසරයන්;

(ඈ) විවිධ වාර්තාකරණ කාණ්ඩයන්;

(ඉ) විවිධ අරමුදල්කරණ සැකසුම් (උදා : සම්පූර්ණයෙන් හෝ කොටසක් අරමුදල් සැපයූ) නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් සහ ඒවා සමග ආශ්‍රිය අවදානම්වල ලක්‍ෂණ.

**නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක ගති ලක්ෂණ සහ ඒවාට සම්බන්ධිත අවදානම්**

139 අස්තිත්වයක් විසින් හෙළදරව් කළ යුතු ය.

(අ) පහත දෑ ඇතුළත්ව එහි නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්වල ලක්‍ෂණ පිළිබඳ තොරතුරු:

(i) සැලසුම මගින් සලසන ප්‍රතිලාභවල ස්වභාවය (උදා : අවසාන වේතන නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම හෝ දායකත්ව පදනම් සහතික සහිත සැලැස්ම)

(ii) සැලසුම මෙහෙයවන නියාමන ආකෘතියෙහි විස්තරයක්. උදාහරණ ලෙස, යම් අවම අරමුදල්කරණ අවශ්‍යතා මට්ටම සහ වත්කම් සීමා වැනි සැලසුම මත යම් නියාමන ආකෘති බලපෑම් (14 වන ඡේදය බලන්න)

(iii) සැලසුමේ පාලන විධිය සඳහා අස්තිත්වයේ වෙනත් යම් වගකීම් පිළිබඳ විස්තරයක්, උදාහරණ ලෙස සැලැස්මේ භාරකරුවන්ගේ හෝ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ වගකීම්.

(ආ) යම් අසාමාන්‍ය අස්තිත්ව නිශ්චිත හෝ සැලැස්ම නිශ්චිත අවදානම් සහ යම් වැදගත් ඒකාග්‍රතා අවදානම් මත අවධානය යොමුකර, අස්තිත්වය අනාවරණය වන සැලැස්මේ අවදානම් පිළිබඳ විස්තරයක්. උදාහරණයක් ලෙස සැලැස්මේ වත්කම් මූලික වශයෙන් එක් ආයෝජන පංතියක ආයෝජනය කර ඇත්නම්, උදා :- දේපළ, සැලසුම් විනිස් අස්තිත්වය, ඒකාග්‍රතා දේපළ වෙළඳ අවදානමට අනාවරණය කරයි.

(ඇ) සැලැස්මේ යම් සංශෝධන, කපාහැරීම් සහ බේරුම් කිරීම්.

**මූල්‍ය ප්‍රකාශනයන්හි වටිනාකම් පිළිබඳ පැහැදිලි කිරිම**

140. අදාළ වන්නේ නම්, අස්තිත්වයක් විසින් පහත සඳහන් එකිනෙක සඳහා ආරම්භක ශේෂයේ පටන් අවසාන ශේෂයට සන්සන්දනය කිරීමක් ඉදිරිපත් කළ යුතු ය.

(අ) පහත සඳහන් අයිතම සඳහා වෙනම සැසඳීම් දක්වමින්, ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම්) :

(i) සැලසුමේ වත්කම්.

(ii) නිර්වචිත ශුද්ධ ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගය.

(iii) වත්කම් සීමාවල බලපෑම.

(ආ) යම් ප්‍රතිපූර්ණ අයිතීන් අස්තිත්වය විසින් ප්‍රතිපූර්ණ කිරීමේ යම් අයිතියක් සහ බැඳීම් සම්බන්ධිත අතර සම්බන්ධතාවය ද විස්තර කළ යුතු ය.

141. අදාළ වන්නේ නම්, 140 වන ඡේදයෙහි ලයිස්තුගත සෑම සංසන්දනය කිරීමක පහත සඳහන් දෑ පෙන්විය යුතු ය :-

(ආ) ප්‍රවර්තන සේවා පිරිවැය;

(ආ) පොළී ආදායම හෝ වියදම;

(ඇ) පහත දක්වෙන දෑ වෙන්ව පෙන්වමින් ශුද්ධ නිර්වචික ප්‍රතිලාභ වගකීමක (වත්කමක) නැවත මිණුම් කිරීම් :-

(i) (ආ) හි ඇතුළත් පොළී මුදල් හැර සැලසුමේ වත්කම් මත ප්‍රතිලාභ.

(ii) ජනගහන උපකල්පන වෙනස්වීම් මත පැනනගින ආයුගණක ප්‍රතිලාභ සහ අලාභ (76 ආ ඡේදය බලන්න).

(iii) මූල්‍ය උපකල්පන වෙනස්වීම් වලින් පැනනගින ආයුගණක ප්‍රතිලාභ සහ අලාභ (76 ආ ඡේදය බලන්න).

(iv) (ආ) හි ඇතුළත් පොළී වටිනාකම හැර ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වත්කම්, වත්කම් සීමාවට යටත් කිරීම නිසා ඇති වූ වෙනස්කම් වල බලපෑම. අස්තිත්වයක් ලබාගත හැකි උපරිම ආර්ථික ප්‍රතිලාභ නිර්ණය කරන්නේ කෙසේ ද, එනම් ඒ ප්‍රතිලාභ ආපසු ලැබීමේ අකාරයෙන් ද, අනාගත දායක මුදල් අඩුවීම හෝ එම දෙවර්ගයේම සංයෝජනයකින් ද යන්න ද හෙළිදරව් කළ යුතු ය.

(ඈ) නිරවුල් කිරීම්වලින් පැන නගින අතීත සේවා පිරිවැය සහ ප්‍රතිලාභ සහ අලාභ 100 වැනි ඡේදය මගින් අවසර දී ඇති පරිදි අතීත සේවා පිරිවැය සහ ප්‍රතිලාභ සහ අලාභ නිරවුල් කිරීමේදී ඒවා එකවර ඇතිවන්නේ නම්, වෙන්කර දක්වීම අවශ්‍ය නොවේ.

(ඉ) විදේශ විනිමය අනුපාතිකයන්හි වෙනස්වීම් වල බලපෑම

(ඊ) සේවකයා මගින් සහ සැලසුමට සහභාගිවන්නන් මගින් සැලසුමට දායකත්වය වෙන්ව දක්වෙන පරිදි;

(උ) නිරවුල් කිරීම් සඳහා කරනු ලබන යම් ගෙවීම් වෙන්ව දක්වෙන පරිදි සැලසුමෙන් කරන ගෙවීම්;

(ඌ) ව්‍යාපාර සංයෝජනයන්හි සහ බැහැර කිරීම් බලපෑම.

142. සක්‍රීය වෙළඳපොළේ මිල ප්‍රකාශිත (SLFRS13 සාධාරණ වටිනාකම මැනීමේ නිර්වචනය කළ පරිදි[2]) ඒවා සහ එසේ නොවන ඒවා වෙන් වෙන් වශයෙන් එක් එක් සැලසුමේ වත්කම් පන්තිය උප කොටස් වශයෙන් බෙදා වත්කම්වල ස්වභාවය සහ අවදානම වෙන වෙනම හඳුනාගතහැකි ආකාරයෙන් අස්තිත්වය සැලසුම් වත්කම්වල සාධාරණ වටිනාකම පන්තිවලට බෙදා වෙන්කොට දක්විය යුතු ය. උදාහරණයක් ලෙස, 136 වන ඡේදයෙහි සාකච්ඡාකර ඇති හෙළිදරව් මට්ටම සලකා බැලීමේ දී අස්තිත්වයකට පහත කරුණු අතර වෙන්කර දක්විය හැකි ය.

(අ) මුදල් සහ මුදලට සමාන දෑ;

(ආ) ස්කන්ධ සාධන පත්‍ර (කර්මාන්ත වර්ගය, සමාගමේ විශාලත්වය, භූගෝලීයත්වය අනුව වෙන් කළ ආදිය);

(ඇ) ණය සාධන පත්‍ර (නිකුත්කරන්නාගේ වර්ගය, ණයෙහි ගුණාත්මක බව භූගෝලීයත්වය ආදිය අනුව වෙන්කළ);

(ඈ) නිශ්චල දේපළ (භූගෝලීයත්වය අනුව වෙන්කර);

(ඉ) ව්‍යුත්පන්නයන් (ගිවිසුමෙහි වර්ගය අනුව පාදක වන අවදානම්, උදාහරණ ලෙස, පොළී අනුපාතික ගිවිසුම්, විදේශිය විනිමය ගිවිසුම්, සකන්ධ ගිවිසුම, ණය පහසුකම්, දිගුකල් පවතින හුවමාරු ලෙස බෙදා වෙන්කළ හැක);

(ඊ) ආයෝජන අරමුදල් (අරමුදල් වර්ගය අනුව වෙන් කල);

(උ) වත්කම්වලින් ආරක්ෂිත සුරැකුම්පත්; සහ

(ඌ) ව්‍යුහගත ණය.

143. අස්තිත්වයක් සැලසුමේ වත්කම් ලෙස තබාගෙන ඇති ස්වකීය හුවමාරු කල හැකි මූල්‍ය සාධන පත්‍රවල සාධාරණ වටිනාකම හෙළිදරව් කළ යුතු අතර, අස්තිත්වය පදිංචිවී සිටින සැලසුමේ වත්කම් හෝ භාවිතා කරන වෙනත් වත්කම් කල සාධාරණ වටිනාකම ද හෙළිදරව් කළ යුතු ය.

144. නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගය නිර්නය කිරීමේදී භාවිතා කල වැදගත් ආයුගණක උපකල්පන අස්තිත්වයක් විසින් හෙළිදරව් කළ යුතුය. (76 වන ඡේදය බලන්න). එවැනි හෙළිදරව් කිරීම් නිරපේක්ෂ භාෂිතයන් මත (උදා : නිරපෙක්ෂ ප්‍රතිශතයක් ලෙස, මිස වෙනත් විචල්‍යයන් වෙනස් ප්‍රතිශත අතර හුදු අස්තිත්වයන් ලෙස නොව) විය යුතුය. සැලසුමේ සමූහයක් සඳහා එකතුව හෙළිදරව් කිරීමේ දී එම හෙළිදරව් කිරීම බර තැබූ සාමාන්‍යය හෝ සාපේක්ෂ පටු පරාස ආකාරයට විය යුතු ය.

---

*[2] අස්තිත්වයක් SLFRS13 ව්‍යවහාර කර නොමැතිනම් අදාළ වන්නේ නම් LKAS39 මූල්‍ය සාධන පත්‍ර හඳුනා ගැනීම සහ මැනීමෙහි ඇඋ 71 ඡේදයට හෝ SLFRS 9 මූල්‍ය සාධන පත්‍ර හි ආ 5.4.3 ඡේදයට යොමුකළ යුතුය.*

**අනාගත මුදල් ප්‍රවාහයන්හි වටිනාකම කාලීන බව සහ අවිනිශ්චිතතාව**

145. අස්තිත්වයක් හෙළිදරව් කළ යුතු දෑ

(අ) වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයට සෑම වැදගත් ආයුගණක උපකල්පන සඳහාම සංවේදිතා විශ්ලේෂණයක් (144 වන ඡේදය යටතේ හෙළිදරව් කර ඇති ලෙස) එදිනට අදාළ ආයුගණක උපකල්පනයන්හි ඇතිවිය හැකි සාධාරණ වෙනස්කම් මගින් නිර්වචිත ප්‍රතිලාභ බැඳීමකට ඇතිවිය හැකි බලපෑම් දක්වෙන ආකාරයට ;

(ආ) ඉහත (අ) හි අවශ්‍යවන සංවේදිතා විශ්ලේෂණය පිළියෙල කිරීමේ දි භාවිතා කළ ක්‍රම සහ උපකල්පනයන් සහ ඒවායේ සීමාවන් ;

(ඇ) සංවේදිතා විශ්ලේෂණය පිළියෙල කිරීමේ දී පෙර කාල පරිච්ඡේදයෙ දී භාවිතා කළ ක්‍රම සහ උපකල්පනවලින් වෙනස්වීම් සහ එවැනි වෙන්වීම්වලට හේතු.

146. අවදානම කළමණාකරනයට දිගුකාලීන හුවමාරු වැනි වාර්ෂික සහ වෙනත් ශිල්පක්‍රම ඇතුළත්ව සැලසුම හෝ අස්තිත්වයක භාවිතා කරන යම් වත්කම්. වගකීම් ගැලපීමේ භාවිතා කළ ක්‍රමෝපායන් පිළිබඳ විස්තරයක් අස්තිත්වය විසින් හෙළිදරව් කළ යුතු ය.

147. අස්තිත්වයේ මුදල් ප්‍රවාහයක නිර්වචිත ප්‍රතිලාභ සැලසුමක, ඇති කළ හැකි බලපෑම පිළිබඳ ඉගියක් සැපයීමට, අස්තිත්වයක් හෙළිදරව් කළ යුතු දෑ

(අ) අනාගත දායක මුදල්වලට බලපාන යම් අරමුදල් කරන පිළිවෙලක් සහ අරමුදල් කරන ප්‍රතිපත්ති විස්තරයක් ;

(ආ) සැලසුමට ඊළඟ වාර්තා කරන කාල පරිච්ඡෙදය සඳහා අපේක්ෂිත දායක මුදල් ;

(ඇ) නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්වල කල්පිරීමේ ආකාරය පිළිබඳ තොරතුරු. මෙයට නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් කාලය තුළදි බර තැබූ සාමාන්‍ය සහ ප්‍රතිලාභ ගෙවීම්වල කල් පිරීමේ විශ්ලේෂණයන් වැනි ප්‍රතිලාභ ගෙවීම්වල කාලය විහිද යෑම පිළිබඳ වෙනත් තොරතුරු ද ඇතුළත් විය හැකි ය.

**බහුසේව්‍ය සැලසුම්**

148. අස්තිත්වයක් බහුසේව්‍ය නිර්වචිත ප්‍රතිලාභ සැළසුමකට සහභාගි වන්නේ නම් එය හෙළිදරව් කළයුතු දෑ;

(අ) අස්තිත්වයේ දායකත්ව අනුපාතිකය නිර්නය කිරීමට සහ යම් අවම අරමුදල් කරන අවශ්‍යතා ඇතුළත් අරමුදල් කරණ පිළිබඳ විස්තරයක් ;

(ආ) බහුසේව්‍ය සැලැස්මේ නියමයන් සහ කොන්දෙසි යටතේ වෙනත් අස්තිත්වයන්හි බැඳීම් සඳහා අස්තිත්වයට වගකීමක් ඇති විය හැකි ප්‍රමාණය පිළිබඳ විස්තරයක් ;

(ඇ) පහත දෑ මත ඌනතාවයක් හෝ අතිරික්තයක් වෙන් කිරීමට යම් එකඟවීම් පිළිබඳ විස්තරයක් ඃ

(i) සැලැස්මේ කටයුතු අවසන් කිරීමේ දි; හෝ

(ii) සැලසුමෙන් අස්තිත්වය ඉවත්වීමක දී

(ඈ) 34 වන ඡෙදය ප්‍රකාරව සැලැස්ම නිර්වචිත දායකත්ව සැලැස්මක් ලෙස සලකා අස්තිත්වය ගිණුම් ගතකිරීම් කරන්නේ නම්, (අ) (ඇ) මගින් අවශ්‍ය තොරතුරුවලට අමතරව සහ 139-147 ඡේදයන්ගේ අවශ්‍යතා වෙනුවට පහත සඳහන් දෑ හෙළිදරව් කළ යුතු යඃ

(i) සැලසුම නිර්වචිත ප්‍රතිලාභ සැලසුමක් යන කරුණ;

(ii) සැලැස්ම නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක් ලෙස අස්තිත්වයට ගිණුම්ගත කිරීම හැකිවීමට ප්‍රමාණවත් තොරතුරු නොලැබීමට හේතුව;

(iii) ඊ ළඟ වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදය සඳහා සැලසුමට අපෙක්ෂිත දායක්ව මුදල්;

(iv) අනාගත දායක මුදල් ප්‍රමාණයට බලපෑමක් විය හැකි සැලැස්මේ යම් ඌනතාවයක් හෝ අතිරික්තයක් පිළිබඳ තොරතුරු සහ අනුමිතියද නිර්ණය කිරීමට භාවිතා කරන පදනම ඇතුළත්ව තොරතුරු;

(v) අස්තිත්වය සැලසුමේ අනෙක් සහභාගිවන්නන් සමඟ සසඳන කල්හි, අස්තිත්වයේ සහභාගිත්ව මට්ටම පිළිබඳ සඳහනක් උදාහරණයක් ලෙස එම තොරතුරු ලබාගැනීමට හැකි නම්, එවැනි සඳහනක් ලබාදිය හැකි මිනුම් වලට සැලසුමේ මුළු දායක මුදලින් අස්තිත්වයේ සමානුපාතිකය හෝ සක්‍රීය සමාජිකයින්ගේ මුළු ගණනින් අස්තිත්වයේ සමානුපාතිකය, සහ ප්‍රතිලාභවලට හිමිකම් ඇති විශ්‍රාමික සමාජිකයෝ සහ කලින් සමාජිකයින් පිළිබඳව සඳහනක් ඇතුළත් විය හැකි ය.

**පොදු පාලනයක් යටතේ අස්තිත්වයන් අතර අවදානම බෙදාගන්නා නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්.**

149. පොදු පාලනයක් යටතේ අවදානම් අස්තිත්වයන් අතර බෙදාගන්නා නිර්වචිත ප්‍රතිලාභ සැලසුමකට අස්තිත්වය සහභාගිවන්නේ නම්, එය විසින් පහත කරුණු හෙළිදරව් කළ යුතු ය ඃ

(අ) නිර්වචිත ප්‍රතිලාභ පිරිවැය අයකිරීම සඳහා ගිවිසුම්ගත එකඟවීම් හෝ ප්‍රකාශිත ප්‍රතිපත්තියක් හෝ එවැනි ප්‍රතිපත්තියක් නොමැති බව ;

(ආ) අස්තිත්වය මගින් දායකත්ව මුදල් ගෙවීම නිර්නය කිරීම සඳහා ප්‍රතිපත්තිය ;

(ඇ) 41 වැනි ඡේදයේ සටහන් කර ඇති ලෙස කාල පරිච්ජේදය සඳහා නිර්වචිත ප්‍රතිලාභ පිරිවැය වෙන්කිරීම සඳහා ගිණුම්ගත කිරීම් කරන්නේ නම්, 135-147 ඡේද මගින් සමස්ථයක් ලෙස අවශ්‍ය කරන සැලසුම පිළිබඳ සියලුම තොරතුරු ;

(ඈ) 41 වැනි ඡේදයේ සඳහන් කර ඇති ලෙස කාල පරිච්ඡේදය සඳහා ගෙවිය යුතු දායක මුදල් සඳහා අස්තිත්වය ගිණුම්ගත කිරීම කරන්නේ නම්, 135-137-139, 142-144 සහ 147 (අ) සහ (ආ) මගින් සමස්ථයක් ලෙස අවශ්‍ය කරන සැලසුම පිළිබඳ තොරතුරු.

150. පහත කරුණු සපුරා ඇත්නම්, 149 (ඇ) සහ (ඈ) ඡේද මගින් අවශ්‍ය කරන තොරතුරු, වෙනත් සමූහ අස්තිත්වයක මූල්‍ය ප්‍රකාශනවල හරස් යොමු කිරීම් මගින් හෙළිදරව් කළ හැකි ය.

(අ) එම සමූහ අස්තිත්වයේ මූල්‍ය ප්‍රකාශන, සැලසුම පිළිබඳ අවශ්‍ය තොරතුරු වෙනත් සමූහ අස්තිත්වයක මූල්‍ය ප්‍රකාශන වල වෙන්ව හඳුනාගැනීම සහ හෙළිදරව් කිරීම; සහ

(ආ) එම සමූහ අස්තිත්වයේ මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නට, අස්තිත්වයේ මූල්‍ය ප්‍රකාශනවල කොන්දෙසි මතම සහ එකම වේලාවේදී සහ හෝ අස්තිත්වයේ මූල්‍ය ප්‍රකාශන කලින් ලබාගත හැකි විය යුතු ය.

**වෙනත් SLFRSs වල හෙළිදරව් කිරීම් අවශ්‍යතා**

151. LKAS 24 මගින් අවශ්‍ය කරන කල්හි අස්තිත්වයක් පහත දෑ පිළිබඳ තොරතුරු හෙළිදරව් කෙරේ.

(අ) පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් සමග සම්බන්ධිත පාර්ශව ගනුදෙනු; සහ

(ආ) ප්‍රමුඛ කළමණාකරන පුද්ගලයන් සඳහා පශ්චාත් සේවා ප්‍රතිලාභ.

152. LKAS 37 මගින් අවශ්‍ය කරන කල්හි අස්තිත්වයක් සේවා ප්‍රතිලාභ බැඳීම් මගින් පැන නගින අසම්භව්‍ය වගකීම් පිළිබඳව තොරතුරු හෙළිදරව් කළ යුතු ය.

**වෙනත් දිගු කාලීන සේවක ප්‍රතිලාභ**

153. සේවකයින්ට සම්බන්ධිත සේවා සපයා වාර්ෂික වාර්තා කරන කාල පරිච්ජේදය අවසන් වී මාස දොළහකට පෙර සම්පූර්ණයෙන් නිරවුල් කිරීමට අපෙක්ෂා නොකරන්නේ නම්, පහත සඳහන් වැනි අයිතම වෙනත් දිගු කාලීන සේවක ප්‍රතිලාභවලට ඇතුළත් වේ.

(අ) දිගු සේවා හෝ අනුසප්තාබ්දක නිවාඩු වැනි දිගු කාලීන ගෙවූ නොපැමිණීම්;

(ආ) සංවත්සර හෝ වෙනත් දිගු සේවා ප්‍රතිලාභ ;

(ඇ) දිගු කාලීන ශාරීරික දුබලතා ප්‍රතිලාභ;

(ඇ) ලාභයට හවුල්වීම් සහ පාරිතෝෂික; සහ

(ඉ) විලම්බිත පාරිශ්‍රමිකය.

154. වෙනත් සේවක ප්‍රතිලාභ මැනීම, පශ්චාත් සේවා ප්‍රතිලාභ මැනීමේ දි ඇති ප්‍රමාණයට හා සමාන අවිනිශ්චිතතාවයට යටත් නොවේ. මේ හේතුව නිසා වෙනත් දිගු කාලීන සේවක ප්‍රතිලාභ සඳහා සරල ගිණුම්කරණ ක්‍රමයක් මෙම ප්‍රමිතියෙන් අවශ්‍ය වෙයි. පශ්චාත් සේවා ප්‍රතිලාභ සඳහා අවශ්‍ය ගිණුම්කරණය මෙන් නොව වෙනත් විස්තීර්ණ අදායම් නැවත මිණුම් කිරීම මෙම ක්‍රමයෙහි අවශ්‍ය නොවේ.

## හඳුනාගැනීම සහ මිණුම් කිරීම්

**155. වෙනත් දිගු කාලීන සේවක ප්‍රතිලාභ සැලසුම්වල අතිරික්තය හෝ ඌනතාවය හඳුනාගැනිමේ දී සහ මිනුම් කිරීමේ දී අස්තිත්වයක් 56-98 සහ 113-115 ඡේද ව්‍යවහාර කළ යුතුය. යම් ප්‍රතිපූර්ණ අයිතියක් හඳුනාගැනිමේ දී සහ මිණුම් කිරීමේ දී අස්තිත්වයක් විසින් 116, 119 ඡේද ව්‍යවහාර කළ යුතු ය.**

**156. වෙනත් SLFRS මගින් ඒවා වත්කමක පිරිවැයෙහි ඇතුළත් කිරීම අවශ්‍ය කරන හෝ අවසර දෙන ප්‍රමාණයට හැර වෙනත් දිගු කාලීන සේවක ප්‍රතිලාභ සඳහා අස්තිත්වයක් විසින් ලාභ, ලාභා ගිණුමේ පහත සඳහන් අයිත්තමයන්ගේ ශුද්ධ එකතුව හඳුනාගත යුතු ය.**

**(අ) සේවා පිරිවැය ( 66-112 ඡේද බලන්න)**

**(ආ) ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම්) මත ශුද්ධ පොළිය (123-126 ඡේද බලන්න); සහ**

**(ඇ) ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වගකීම් (වත්කම්) නැවත මිණුම් කිරීම (127-130 ඡේද බලන්න).**

157. එක් ආකාරයක දිගු කාලීන සේවක ප්‍රතිලාභයක් නම්, දිගු කාලීන ආබාධ ප්‍රතිලාභ වෙයි. ප්‍රතිලාභයේ මට්ටම සේවා කාලය මත රඳා පවති නම්, සේවාවන් ලබාදෙන කල්හි බැදීමක් පැන නගී. බැදීම් මිණුම් කිරීම ගෙවීම් කිරීමේ අවශ්‍යතාවයේ සම්භාව්‍යතාව සහ ගෙවීම් කිරීමට අතවශ්‍ය වන අපෙක්ෂිත කාලය පිළිබිඹු කරයි. සේවා කාලය නොසලකා යම් ආබාධිත සේවකයෙකුට සමාන මට්ටමක නම්, දිගු කාලීන ආබාධිත සිද්ධියක් ඇති වූ කල්හි අපේක්ෂිත ප්‍රතිලාභ පිරිවැය හඳුනාගනී.

### හෙළිදරව් කිරීම්

158. වෙනත් දිගු කාලීන සේවක ප්‍රතිලාභ පිළිබඳ නිශ්චිත හෙළිදරව් කිරීම් මෙම ප්‍රමිතියෙන් අවශ්‍ය නොකරන්නේ නමුත්, වෙනත් SLFRSs අනුව හෙළිදරව් කිරීම් අවශ්‍ය විය හැකිය. උදාහරණ ලෙස LKAS 24 ප්‍රමුඛ කළමණාකරන පුද්ගලයන්ගේ සේවක ප්‍රතිලාභ හෙළදරව්ව අවශ්‍ය කරයි LKAS සේවක ප්‍රතිලාභ වියදම හෙළිදරව් කිරීම අවශ්‍ය කරයි.

## සමාප්ති කිරීමේ ප්‍රතිලාභ

159 මෙම ප්‍රමිතය සමාප්ති කිරීමේ ප්‍රතිලාභ වෙනත් සේවක ප්‍රතිලාභවලින් වෙන්ව සලකා බැලීම් කරනුයේ, සේවක සේවයට වඩා රැකියාව සමාප්ත කිරීමේ සිද්ධින් නිසා බැඳීම් නැගිමට තුඩුදෙන හෙයිනි. එක්කෝ අස්තිත්වයේ තීරණය නිසා රැකියා සමාප්තිය හෝ රැකියා සමාප්තිය සඳහා හුවමාරුවට අස්තිත්වයේ ප්‍රතිලාභ පිරිනැමීමක් පිළිගැනීමට සේවකයාගේ තීරණයේ ප්‍රතිඵලයක් ලෙස සමාප්ති ප්‍රතිලාභ ඇතිවෙයි.

160. සමාප්ති ප්‍රතිලාභවලට අස්තිත්වයේ පිරිනැමීමක් නොමැතිව සේවකයාගේ ඉල්ලීම මත හෝ නීතිමය (අනුගම්‍ය / අනිවාර්ය) අවශ්‍යතාවයක ප්‍රතිඵලයක් ලෙස ඇතිවන රැකියා සමාප්ති ඇතුළත් නොවන්නේ එම ප්‍රතිලාභ ප්‍රශ්චාත් සේවා ප්‍රතිලාභ නිසා ය. සමහර අස්තිත්වයන් සේවකයාගේ ඉල්ලීම මත කරනු ලබන රැකියා සමාප්තිය සඳහා අස්තිත්වයේ ඉල්ලීම මත රැකියා සමාප්තිය වඩා අඩු මට්ටමක (හරය ලෙස පශ්චාත් සේවා ප්‍රතිලාභ) ප්‍රතිලාභ සලසයි. සේවකයාගේ ඉල්ලීම මත සලසනු ලබන සමාප්ති ප්‍රතිලාභ සහ අස්තිත්වයේ ඉල්ලීම මත සැලසෙන වැඩි ප්‍රතිලාභ අතර වෙනස සමාප්ත ප්‍රතිලාභ වේ.

161. සේවක ප්‍රතිලාභවල ස්වරූපය, සේවාව සඳහා හුවමාරුව වෙනුවෙන් සලසන ලද්දේ ද හෝ සේවකයාගේ රැකියාව සමාප්තිවීම සඳහා හුවමාරුව වෙනුවෙන් සලසන ලද්දේ ද යන්න නිර්ණය නොකරයි. සමාප්ති ප්‍රතිලාභ නියම වශයෙන් එකවර ගෙවීමක් නමුත් සමහර විට පහත කරුණු ද ඇතුලත් වෙයි:

(අ) සේවක ප්‍රතිලාභ සැලැස්මක් හරහා එක්කෝ වක්‍රව හෝ සෘජුව පශ්චාත් සේවා ප්‍රතිලාභ වැඩිකිරීමක්.

(ආ) අස්තිත්වයට සේවකයාගෙන් තවදුරටත් අස්තිත්වයකට ආර්ථික ප්‍රතිලාභ සලසන සේවා සැපයීමක් සිදු නොවන නිශ්චිත දැනුම් දුන් කාලපරිච්ඡේදයක් අවසානය තෙක් වේතනය.

162. සේවාව සඳහා හුවමාරුවට සේවක ප්‍රතිලාභ සැලසීමේ ඇඟවීම්වලට (දර්ශකවලට) පහත දෑ ඇතුලත් වෙයි.

(අ) තවදුරටත් අනාගත සේවා සැපයීම මත ප්‍රතිලාභ කොන්දේසි සහිත වීම ( තවදුරටත් සේවා සැපයුවහොත් ප්‍රතිලාභවැඩි කිරීම් ඇතුලත්ව;)

(ආ) ප්‍රතිලාභ සලසනුයේ සේවක ප්‍රතිලාභ සැලසුමක නියමයන් ප්‍රකාර බව.

163. සමහර සමාප්ති ප්‍රතිලාභ සලසනු ලබන්නේ, පවත්නා සේවක ප්‍රතිලාභ සැලසුමක නියමන් ප්‍රකාරවය උදාහරණ ලෙස, ඒවා ව්‍යවස්ථාව මගින් නිශ්චිතව තිබීම, සේවා ගිවිසුම් හෝ වෘත්තීය සංගම් එකඟවීම් හෝ සමාන ප්‍රතිලාභ සැලසීමේ සේව්‍යයාගේ අතීත සේවා පරිචයේ ප්‍රතිඵලයක් ලෙස ඇති වූ හැඟවීමක් තවත් උදාහරණයක් ගතහොත් අස්තිත්වය කෙටි කාලපරිච්ඡේදයකට වඩා වැඩි කාලයකට ප්‍රතිලාභ පිරිනැමීම පවත්වයි නම්, හෝ පිරිනැමීම සහ ඇත්ත වශයෙන් ම සමාප්තිය අපේක්ෂිත දිනය අතර කෙටි කාලපරිච්ඡේදය වැඩි නම් අස්තිත්වය අළුත් සේවක ප්‍රතිලාභ සැලැස්මක් ස්ථාපනය කර ඇත්දැයි සලකා බලන අතර, සැලසුම යටතේ පිරිනමා ඇති ප්‍රතිලාභ එබැවින් සමාප්ති ප්‍රතිලාභ හෝ ප්‍රශ්චාත් සේවක ප්‍රතිලාභ වන්නේ ද සේවක ප්‍රතිලාභ සේවක ප්‍රතිලාභ සැලැස්මක් නියමයන් ප්‍රකාර සපයා ඇති සේවක ප්‍රතිලාභ ඒවා අස්තිත්වයේ තීරණ මත සේවකයාගේ රැකියාව සමාප්ති කිරීම සහ අනාගත සේවා සැපයීම මත කොන්දේසි නොමැතිව ඒ දෙකෙහි ම ප්‍රතිඵල නම් ඒවා සමාප්ති ප්‍රතිලාභ වෙයි.

164. සේවකයාගේ ඉවත්ව යෑම සඳහා වන කරුණු සැළකිල්ලට නොගෙන ම සමහර සේවක ප්‍රතිලාභසලසනු ලබයි. එවැනි ප්‍රතිලාභගෙවීම් නිශ්චිත (යම් බලය පැවරීමක් හෝ අවම සේවා අවශ්‍යතා වලට යටත්ව) නමුත් ඒවායේ ගෙවීම් කාල නිර්ණය අවිනිශ්චිතය එවැනි ප්‍රතිලාභ සමහර අධිකරන බල ප්‍රදේශවල සමාප්ති හානිපූර්ණ හෝ සමාප්ති පාරිතෝෂික ලෙස විස්තර කල ද, ඒවා සමාප්ති ප්‍රතිලාභවලට වඩා පශ්චාත්සේවා ප්‍රතිලාභවන අතර, අස්තිත්වයක් ඒවා පශ්චාත්සේවා ප්‍රතිලාභ ලෙස ගිණුම් ගත කරයි.

**හඳුනා ගැනීම**

**165. අස්තිත්වයක් විසින් සමාප්ති ප්‍රතිලාභ සඳහා වගකීම සහ වියදම පහත සඳහන් දිනවලින් වඩා පෙරතම දිනයේ දී හඳුනාගත යුතු ය;**

**(අ) ඒ ප්‍රතිලාභ පිරිනැමීම අස්තිත්වයකට තවදුරටත් ඉවත්කර ගැනීමට නෙහැකි කල්හි; සහ,**

**(ආ) LKAS 37 විෂය පථය ඇතුලත ප්‍රතිසංවිධාන සඳහා සහ සමාප්ති ප්‍රතිලාභ ගෙවීමකට අදාළ පිරිවැයක් ලෙස අස්තිත්වය හඳුනාගන්නා කල්හි**

166. සේවා සමාප්තිය සඳහා හුවමාරුව ප්‍රතිලාභ පිරිනැමීමක් පිළිගැනීමට සේවකයාගේ තීරණයේ ප්‍රතිඵලය ලෙස සමාප්තිය ප්‍රතිලාභ සඳහා කාලය වනුයේ අස්තිත්ත්වයට තවදුරටත් පිරනැමීම ඉවත්කර ගැනීමට නොහැකි කල්හි, පහත සඳහන් ආසන්නතම දිනයයි:

(අ) සේවකයා පිරිනැමීම පිළිගත් දිනය; සහ

(ආ) අස්තිත්වයේ පිරිනැනීම ඉවත් කරගැනීමේ හැකියාවට ඇති සීමා කිරීම් බලපැවති දිනය. (උදා: නියාමන හෝ ගිවිසුම්ගත අවශ්‍යතාවයන්ගේ වෙනස් සීමාවන්) මෙය සිදුවන්නේ පිරිනැමීම කරන වේලාවේ නම්, සීමා කිරීම් පැවතියේ පිරිනැමීම කළ අවස්ථාවේ දී ය.

167. අස්තිත්වයේ තීරණයක ප්‍රතිඵලයක් සේවකයින්ගේ රැකියා සමාප්ති කිරීමට ගෙවන සමාප්ති ප්‍රතිලාභ සඳහා පහත සඳහන් ක්‍රමවේද සියල්ල සපුරා තිබෙන සැලසුම් දැනුම් දී ඇති කල්හි, අස්තිත්වයට තවදුරටත් පිරිනැමීම ඉවත් කර ගත නොහැකි ය.

(අ) සැලැස්ම සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාකාකරම් සැලැස්මට සැලකිය යුතු අන්දමින් වෙනස්කම් සිදු නොවන බවට ඇඟවීම,

(ආ) සේවය සමාප්ත කිරීමට යන සේවක සංඛ්‍යාව ඔවුන්ගේ රැකියා වර්ගීකරණයන් හෝ කාර්යයන් සහ ඔවුන්ගේ වැඩ කරන ස්ථාන (නමුත් සෑම සේවකයෙක් වෙනුවෙන් ම හඳුනා ගැනීම සැළසුමට අවශ්‍ය නොවේ) සහ අපේක්ෂිත අවසන් කරන දිනය.

(ඇ) සේවකයන්ට ඔවුන්ගේ සේවය සමාප්තිය වූ විට ලැබෙන ප්‍රතිලාභ වර්ගය සහ මුදල් ප්‍රමාණය නිර්ණය කරගත හැකිවන පරිදි ප්‍රමාණවත් විස්තර සමාප්ති ප්‍රතිලාභ සැළසුමේ ස්ථාපනය කිරීම.

168. අස්තිත්වයට සමාප්ති ප්‍රතිලාභ හඳුනාගත් කල්හි අස්තිත්වයට සැළසුමක සංශෝධනය සඳහා හෝ වෙනත් සේවක ප්‍රතිලාභ කපා හැරීම් සඳහා ද ගිණුම් තැබීමට සිදුවිය හැකිවේ. (103 ජේදය බලන්න).

**මිණුම් කිරම**

**169. සේවක ප්‍රතිලාභවල ස්වභාවය ප්‍රකාරව අස්තිත්වයක් විසින් මූලික හඳුනාගැනීම මත සමාප්ති ප්‍රතිලාභමිණුම් කිරීම සහ පසුව සිදුවන වෙනස්කම් හඳුනාගැනීම සහ මිණුම් කිරීම කළයුතු අතර, සමාප්ති ප්‍රතිලාභ, පශ්චාත් සේවා ප්‍රතිලාභ වැඩිදියුණු කිරීමක් වන්නේ නම්, අස්තිත්වය පශ්චාත් සේවා සඳහා අවශ්‍යතාවයන් ව්‍යවහාර කළ යුතු ය. එසේ නැතහොත්;**

**(අ) සමාප්ති ප්‍රතිලාභ හඳුනාගත්තාට පසු වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසන් වී මාස දොළහකට පෙර සමාප්ති ප්‍රතිලාභ සම්පූර්ණයෙන් නිරවුල් කිරීමට අපේක්‍ෂා කරන්නේනම්, අස්තිත්වය කෙටි කාලීන සේවක ප්‍රතිලාභ සඳහා අවශ්‍යතාවයන් ව්‍යවහාර කළ යුතු ය.**

**(ආ) වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසන් වී මාස දොළහකට පෙර සමාප්ති ප්‍රතිලාභ සම්පූර්ණයෙන් නිරවුල් කිරීමට අපේක්‍ෂා නොකරන්නේ නම්, අස්තිත්වය වෙනත් දිගු කාලීන සේවක ප්‍රතිලාභ අවශ්‍යතාවයන් ව්‍යවහාර කළ යුතු ය.**

170. සමාප්ති ප්‍රතිලාභ සේවා සඳහා හුවමාරුව සලසන්නේ නැති හෙයින්, 70-74 ඡේදවලට සම්බන්ධිත ආරෝපණයවීම් සේවා කාලපරිච්ඡේදයට ප්‍රතිලාභ නොවන හෙයින් අදාළ නොවේ.

**159 - 170 ඡේද නිදර්ශන මගින් පැහැදිළි කරන උදාහරණය**

**පසුබිම :**

*මෑතක සිදු වූ අත්පත්කර ගැනීමක ප්‍රතිඵලයක් ලෙස අස්තිත්වයක් මාස දහයක දී කම්හලක් වසා දැමීමට සැළසුම් කරන අතර, එම කාලයේ දී කම්හලේ ඉතිරි වී සිටින සියළුම සේවකයන්ගේ සේවය සමාප්ති කරනු ඇත. කම්හලේ සමහර ගිවිසුම් නිම කිරීමට ඇති හෙයින් අස්තිත්වයට විශේෂඥ ඥාණය ඇති සේවකයන් අවශ්‍ය වෙයි. එය පහත දැක්වෙන සමාප්ති සැළසුම් නිවේදනය කර ඇත.*

*කම්හල වසා දමනතුරු නැවතී සිට සේවා සපයන සේවකයන් ට සමාප්ති දිනකට එක් එක් සේවකයාට රු. 30,000ක් බැගින් ගෙවනු ඇත. කම්හල වැසීමට පෙර ඉවත් වන සේවකයින් ට ලැබෙන්නේ රු. 10,000 කි.*

*කම්හලේ සේවකයන් 120 ක් සිටී. සැළැස්ම ප්‍රකාශයට පත් කරන වේලාවේ දී වසා දැමීමට පෙර එයින් 20 ක් ඉවත් වේ යයි අස්තිත්වය අපේක්ෂා කරයි. ඒ අනුව සැළසුම යටතේ අපේක්ෂිත මුළු මුදල් ගලායාම රු. 3.200,000 (එනම් 20 × රු. 10000 + 100× රු. 30,000) කි. 160 වන ඡේදය මගින් අවශ්‍ය කරන පරිදි, අස්තිත්වය සේවාව සමාප්ති කිරීම සඳහා හුවමාරුව, සමාප්ති ප්‍රතිලාභ ලෙස ගිණුම් ගත කරන අතර, සේවා සඳහා හුවමාරු සලසන ප්‍රතිලාභ කෙටි කාලීන සේවක ප්‍රතිලාභ ලෙස ගිණුම්ගත කරයි.*

**සමාප්ති ප්‍රතිලාභ**

*රැකියාව සමාප්ති කිරීම සඳහා හුවමාරුවට සපයන ප්‍රතිලාභය රු. 10,000 කි. සේවකයන් කම්හල වසනතුරු රැඳී සිටිමින් සේවා සපයන්නේ ද හෝ වැසීමට පෙර ඉවත්වන්නේ ද යන්න නොසලකා, සේවය සමාප්ති කිරීමට අස්තිත්වය ගෙවිය*

*යුතු මුදල මෙයයි. වසා දැමීමට පෙර සේවකයන් ට ඉවත්වීමට හැකි වුව ද සියළුම සෙවකයන්ගේ රැකියා සමාප්ති කිරීම, අස්තිත්වය කම්හල වසා දැමීමට ඔවුන්ගේ රැකියාව සමාප්ති කිරීමට ගත් තීරණයේ ප්‍රතිඵලයකි. (එනම් , සියළුම සේවකයන් කම්හල වැසූ කල්හි, රැකියාවෙන් ඉවත් වීම) එමනිසා සේවක ප්‍රතිලාභ සැළසුම ප්‍රකාර, සැළසුම් සාමාප්තිය ප්‍රකාශයට පත් කළ කල්හි සේවක ප්‍රතිලාභ සැළසුමේ පෙර තම දිනයේ සහ කම්හල වැසීමට ආශ්‍රිත ප්‍රතිසංවිධාන පිරිවැය අසතිත්වය හඳුනාගත් කල්හි රු. 1,200,000 ක (එනම් 120 × 10,000) වගකීම අස්තිත්වය විසින් හඳුනාගනී.*

*සේවාව හුවමාරුවට සඳහා සලසන ප්‍රතිලාභ*
*සේවකයින් සම්පූර්ණ මාස දහයක සේවා කාලපරිච්ඡේදය සඳහා සේවාව හුවමාරු කරන්නේ නම් එම කාලපරිච්ඡේදය තුළ සැලසූ සේවයට වර්ධක ප්‍රතිලාභ ඔවුන් ට ලැබෙනු ඇත.*

*වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසන් වී මාස දොළහකට පෙර නිරවුල් කිරීමට අපේක්ෂා කරන හෙයින් අස්තිත්වය ඒවා කෙටි කාලීන සේවක ප්‍රතිලාභලෙස ගිණුම්ගත කරයි. මෙම උදාහරණයෙහි මාස දහයක කාලපරිච්ඡේදයය තුළ සෑම මාසයක ම රු. 200,000 ක (2,000,000 ÷ 10) වියදමක් අනුරූපි වගකීමේ ධාරණ මුදලෙහි හඳුනාගන්නා හෙයින් වට්ටම කිරීමක් අවශ්‍ය නොවේ.*

## හෙළිදරව් කිරීම

171. මෙම ප්‍රමිතිය මගින් ප්‍රතිලාභ සමාප්ති ප්‍රතිලාභ පිළිබඳ නිශ්චිත හෙළිදරව් කිරීම් අවශ්‍ය නොවුව ද වෙනත් SLFRSs අනුව හෙළිදරව් කිරීම් අවශ්‍ය විය හැකි ය. උදාහරණ ලෙස LKAS 24 ප්‍රමුඛ කළමණාකරණ පිරිස් සඳහා සේවක ප්‍රතිලාභ පිළිබඳ හෙළිදරව් කිරීම අවශ්‍ය කරයි. LKAS 1 සේවක ප්‍රතිලාභ වියදම හෙළිදරව් කිරීම අවශ්‍ය කරයි.

## සංක්‍රාන්තිය සහ බලාත්මක දිනය

172 අස්තිත්වයක් 2013 ජනවාරි 1 දින හෝ ඉන්පසු පටන් ගන්නා වාර්ෂික කළපරිච්ඡේද සඳහා මෙම ප්‍රමිතිය ව්‍යවහාර කළ යුතු ය. කලින් ව්‍යවහාර කිරීම අවසර දෙනු ලැබේ. අස්තිත්වයක් ඊට පෙර කාලපරිච්ඡේදයක් සඳහා මෙම ප්‍රමිතය ව්‍යවහාර කලේ නම්, එම කරුණ හෙළිදරව් කළ යුතු ය.

173. LKAS 8 ගිණුම් ප්‍රතිපත්ති, ගිණුම් ඇස්තමේන්තු වෙනස්වීම් හා වැරදි ප්‍රකාර අස්තිත්වයක් මෙම ප්‍රමිතිය අතීතයට බලපාන පරිද පහත දැවලට හැර ව්‍යවහාර කළ යුතු ය.

(අ) මූලික ව්‍යවහාරකරණ දිනයට පෙර, ධාරණ අගයේ ඇතුලත් සේවක ප්‍රතිලාභ පිරිවැයෙහි වෙනස්වීම් සඳහා මෙම ප්‍රමිතියේ විෂය පථයට බාහිර වත්කම්වල ධාරණ අගය ගැලපීම අස්තිත්වයකට අවශ්‍ය නොවේ. මූලික ව්‍යවහාරකරණය දිනය වන්නේ අස්තිත්වයක් මෙම ප්‍රමිතිය මූල්වරට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කරන පෙර තම පූර්ව කාලපරිච්ඡේදයේ ආරම්භක දිනයයි.

(ආ) 2014 ජනවාරි 1 ට පෙර ආරම්භ කරන කාලපරිච්ඡේද සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල 145 වන ඡේදය මගින් අවශ්‍ය කරන නිර්වචිත ප්‍රතිලාභබැදීම් පිළිබඳ සංවේදීතාවය පිළිබඳ තොරතුරුවලට සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

174. [ඉවත් කරන ලදී. ]

## LKAS20 – **රාජ්‍ය ප්‍රදාන සඳහා ගිණුම්කරණය සහ රාජ්‍ය අනුග්‍රහයන් හෙළිදරව් කිරීම**

| *ප්‍රමිතිය* | *පවත්නා ජේද යොමුව* | *ආදේශකල / එකතුකළ ජේදය* |
|---|---|---|
| LKAS20 | 10 අ ඡේදය | වෙළඳ පොළෙහි පවත්නා පොලී අනුපාතිකයට අඩුවෙන් රජයෙන් දෙනු ලබන ණයකින් ලැබෙන ප්‍රතිලාභය රාජ්‍ය ප්‍රදානයක් ලෙස සැළකේ. මෙම ණය ***LKAS 39 මූල්‍ය සාධන පත්‍ර හඳුනා ගැනීම සහ මැණීම*** ප්‍රකාරව හඳුනාගැනීම සහ මිණුම් කිරීම කළ යුතු ය. වෙළඳපොළ පොලී අනුපාතිකයට වඩා අඩුවීම නිසා වූ ප්‍රතිලාභය මැණිය යුත්තේ *LKAS 39* ප්‍රකාරව නිර්ණය කල ණය මුදලේ මූලික ධාරණ අගය සහ ලැබුණු මුදල අතර වෙනස ලෙසින් මෙම ප්‍රමිතිය ප්‍රකාරව ප්‍රතිලාභ සඳහා ගිණුම්ගත කරනු ලබයි. ණය මුදලෙන් හිලව් කිරීමට බලාපොරොත්තු වන ප්‍රතිලාභ පිරිවැය හඳුනාගන්නා කල්හි, අස්තිත්වයක් විසින් ඇති වූ කොන්දේසි සහ බැදීම් හෝ ඒවා සපුරාලීම් සලකා බැලිය යුතු ය. |

LKAS 21 –**විදේශ විනිමය අනුපාතික වෙනස්කම්වල බලපෑම්**

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකල / එකතුකළ ඡේද |
|---|---|---|
| LKAS21 | 3(ආ) ඡේදය | *LKAS39* **මූල්‍ය සාධන පත්‍ර හඳුනාගැනීම සහ මැණීමෙහි** විෂය පථයට ඇතුලත් වන ව්‍යුත්පන්න ගනුදෙනු සහ ශේෂයන් හැර විදේශීය ව්‍යවහාර මුදලින් කෙරෙන ගනුදෙනු සහ ශේෂ ගිණුම්කරණය. |
| | 4 ඡේදය | *LKAS 39* බොහෝ විදේශීය ව්‍යවහාර මුදල් ව්‍යුත්පන්නවලට ව්‍යවහාර වන බැවින් ඒවා මෙම ප්‍රමිතියේ විෂය පථයෙන් ඉවත්කර ඇත. කෙසේ වුවද, LKAS 39 විෂය පථයට ඇතුලත් නොවන විදේශ ව්‍යවහාර මුදල් ව්‍යුත්පන්න (උදා. වෙනත් ගිවිසුම්වල නිහිතව ඇති සමහර විදේශ ව්‍යවහාර මුදල් ව්‍යුත්පන්න) මෙම ප්‍රමිතියේ විෂය පථයට ඇතුලත් වෙයි. මීට අමතරව අස්තිත්වයක් විසින් භාවිත ව්‍යවහාරික මුදලේ ව්‍යුත්පන්නවලට සම්බන්ධ වටිනාකම් ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදලට පරිවර්තනය කිරීමේ දී මෙම ප්‍රමිතිය භාවිතා කෙරේ. |
| | 52 (අ) ඡේදය | *LKAS 39* ප්‍රකාර ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය සාධන පත්‍ර තුලින් පැන නගින දෑ හැර ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනාගත් විනිමය වෙනස්කම් වල වටිනාකම; සහ |

LKAS **27 ඒකාබද්ධ සහ වෙන් වශයෙන් වූ මූලය ප්‍රකාශන**

| ප්‍රමිතිය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකල / එකතුකළ ඡේදය |
|---|---|---|
| LKAS 27 | 35 ඡේදය | පරිපාලකයක්ට පරිපාලිත්යක ඇති පාලනය ගිලිහියන්නේ නම්, එම පරිපාලිතයට සම්බන්ධිත වෙනත් විස්තීරණ ආදායමෙහි හඳුනාගත් සියලුම වටිනාකම් අදාළ වත්කම් හෝ වගකීම්, පරිපාලකය විසින් ඍජුව බැහැර කළේ නම්, ගිණුම් ගත කරන පදනම මතම ගිණුම් ගත කළ යුතුය. එමනිසා වෙනත් විස්තීරණ ආදායමෙහි ප්‍රතිලාභයන් හෝ අලාභයන් කලින් හඳුනාගත්තේනම් ඒවා සම්බන්ධිත වත්කම් බැහැර කිරීමෙන් ලද ලාභයක් හෝ අලාභයක් ලෙස නැවත ලාභයට හෝ අලාභයට යලි වර්ගීකරණය කරන අතර පරිපාලකය ප්‍රතිලාභය හෝ අලාභය ස්කන්ධයෙන් ලාභයට හෝ අලාභයට (යළි වර්ග කිරීමේ ගැලපුමක් ලෙස) පරිපාලිතයේ පාලනය ගිලිහී යන අවස්ථාවෙන් යලිත් වර්ගීකරණය කරයි. උදාහරණයක් ලෙස පරිපාලිතයේ පාලනය පරිපාලකගෙන් ගිලිහි යන අවස්ථාවේහි පරිපාලිතයට **වෙළඳාම් සඳහා වන මූල්‍ය වත්කම්** ඇත්නම් **එම වත්කම්**වලට සම්බන්ධයෙන් වෙනත් විස්තීරණ ආදායම්වල කලින් හඳුනාගත් ප්‍රතිලාභ හෝ අලාභ පරිපාලකය විසින් ලාභ හෝ අලාභයට යලි වර්ගීකරණය කළ යුතුය. එසේම වෙනත් විස්තීරණ ආදායම්වල අදාළ කලින් හඳුනාගත් ප්‍රත්‍යාගණන අතිරික්තයක් වත්කම් බැහැර කිරීමේදී රඳවා ගත් ඉපැයීම් වලට කෙලින්ම මාරු කරන අතර, පරිපාලිතයේ පාලනය පරිපාලකගෙන් ගිලිහී යන කල්හි පරිපාලකය ප්‍රත්‍යාගණන අතිරික්තය කෙලින්ම රඳවා ගත් ඉපැයීම්වලට මාරු කරයි. |
| | 37 ඡේදය | පාලනය ගිලිහි ගිය දිනයේ, කලින් පරිපාලිතයේ රඳවා ගනු ලැබ තිබුණු කවර හෝ ආයෝජනයක සාධාරණ අගය *LKAS 39* **මූල්‍ය සාධන පත්‍ර හඳුනාගැනීම හා මිණුම්කරණය** ප්‍රමිතියට අනුව හෝ අදාළ වන කල්හි බද්ධව පාලනයකරන අස්තිත්වයක් හෝ ආශ්‍රිතයක ආයෝජනය මුල්වරට හඳුනාගත් මූල්‍ය වත්කමක සාධාරණ අගය ලෙස හඳුනාගනී. |
| | 38 (ආ) ඡේදය | *LKAS 29*ට **අනුකූලව** |
| | 38 ඡේදය | අස්තිත්වය සමාන ගිණුම්කරණය සෑම ප්‍රභේදනයක ආයෝජන සඳහා ව්‍යවහාර කළ යුතුය. පිරිවැයට ගිනුම්ගත කර ඇති ආයෝජන ඒවා SLFRS 05 අනුව ජංගම නොවන වත්කම් විකිණීම සඳහා සහ අසන්තතික මෙහෙයුම් සඳහා රඳවා ඇති ඒවා විකිණීම සඳහා තැබූ ලෙස වර්ගීකරණය කර (හෝ විකිණීම සඳහා තැබූ ලෙස වර්ග කර අපහරන කණ්ඩායමක ඇතුළත් කර ඇති) ඇති කල්හි *SLFRS 05* **ප්‍රකාර** ගිණුම්ගත කළ යුතුය. මෙවැනි අවස්ථාවලදී *LKAS 39* **ප්‍රකාර ගිණුම්ගත කළ ආයෝජන මිණුම්කරණය** වෙනස් නොවේ. |

| *ප්‍රමිතය* | *පවත්නා ඡේදය යොමු කිරීම* | *ආදේශකල / එකතුකළ ඡේද* |
|---|---|---|
| | 40 ඡේදය | *LKAS* 39 ඡේදය ප්‍රකාර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණය කර ඇති බද්ද පාලිත අස්තිත්වයන්හි සහ ආශ්‍රිතයන්හි ආයෝජන ආයෝජකයින්ගේ වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශනවලද එම ආකාරයටම ගිණුම්කරනය කළ යුතුය. |

LKAS **28 ආශ්‍රිතයන්හි ආයෝජන**

| *ප්‍රමිතිය* | *පවත්නා ඡේදය යොමු කිරීම* | *ආදේශකල / එකතුකළ ඡේදය* |
|---|---|---|
| LKAS 28 | 1 ඡේදය | **ආරම්භක හඳුනාගැනීම මත ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය ලෙස නම් කලහොත් හෝ වෙළඳාම සඳහා රඳවා ගෙන ඇති ලෙස වර්ගීකරණය කර *LKAS 39* මූල්‍ය ප්‍රකාශන හඳුනාගැනීම සහ මිණුම්කරණය ප්‍රකාර ගිණුම්ගතකළ එවැනි ආයෝජන *LKAS 39* ප්‍රකාර සාධාරණ අගයට මිණුම් කළ යුතු අතර,සාධාරණ අගයේ වෙනස්වීම් වෙනස් වූ කාලපරිච්ඡේදයේ ලාභයේ හෝ අලාභයේ හඳුනාගත යුතුය. එවැනි ආයෝජනයන් රඳවාගෙන සිටින අස්තිත්වයක් 37 (ඊ) ඡේදයෙහි අවශ්‍ය හෙළිදරව් කිරීම් කළ යුතුය**. |
| | 18 ඡේදය | ආශ්‍රිතය LKAS 31 හි නිර්වචනය කර ඇති පරිදි පරිපාලිතයක් හෝ බද්ධ ව්‍යාපාරයක් බවට පත් නොවුයේ නම්, ආශ්‍රිතය මත සැලකිය යුතු බලපෑම නැවතුන කල්හි, එදින සිට ආයෝජකයා ස්කන්ධ ක්‍රමය භාවිතය අත්හිටුවා එම දින සිට *LKAS 39*ට අනුකූලව ආයෝජනය ගිණුම්කරණය කළ යුතුය. සැලකිය යුතු බලපෑම අහිමි වූ විට මුලින් සඳහන් කළ ආශ්‍රිතයෙහි ආයෝජකයා රඳවා තබාගන්නා යම් ආයෝජනයක් සාධාරණ අගයට මිණුම්කරණය කළ යුතුය. ආයෝජකයා පහත සඳහන් දෑ අතර යම් වෙනසක් ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනාගත යුතුය. |
| | 19 (අ) ඡේදය | *LKAS 39*ට අනුකූලව ගිණුම්ගත කර ඇති ආයෝජනයක් ආශ්‍රිතයක් වීම නැවතුන කල්හි එය ආශ්‍රිතයක් වීම අවසන් වූ දින සිටම ආයෝජනයේ සාධාරණ අගය *LKAS 39* අනුකූලව මූල්‍ය වත්කමේ ආරම්භක හඳුනාගැනීම මත එහි සාධාරණ අගය ලෙස සැළකිය යුතුය. |
| | 19 (ආ) ඡේදය | ආශ්‍රිතයක් කෙරෙහි ඇති ආයෝජකයෙකුගේ සැලකිය යුතු බලපෑම අහිමිවූයේ නම් එම ආශ්‍රිතයට සම්බන්ධ හඳුනාගෙන ඇති වෙනත් විස්තීරණ ආදායම් සියලු වටිනාකම් ආශ්‍රිතය විසින් සම්බන්ධිත වත්කම් හා වගකීම් සෘජුවම බැහැර කලේ යැයි පදනම මතම ගිණුම්ගත කළ යුතුය. එම නිසා ආශ්‍රිතයක් විසින් මීට පෙර ප්‍රතිලාභයන් හෝ අලාභයක් වෙනත් විස්තීරණ ආදායම්වල හඳුනාගෙන ඇත්නම් සම්බන්ධිත වත්කම් හෝ වගකීම් ඉවත් කළ විට ලැබුණු ලාභ හෝ අලාභ ලෙසට ප්‍රති වර්ගීකරණය කළ යුතු අතර, ආයෝජකයා ආශ්‍රීතය කෙරෙහි තම සැලකිය යුතු බලපෑම අහිමි වූ කල්හි ඇති වන ප්‍රතිලාභ හෝ අලාභ ස්කන්ධය, ලාභ හෝ අලාභයට ප්‍රතිවර්ගීකරණය (ප්‍රතිවර්ගීකරණ ගැලපුමක් ලෙස) කරනු ලබයි. උදාහරණයක් ලෙස ආශ්‍රිතයක් කෙරෙහි ආයෝජකයාගේ ඇති සැළකිය යුතු බලපෑම් අහිමි වී, එම ආශ්‍රිතයට ***අලෙවිය සඳහා වන මූල්‍ය වත්කම්*** ඇත්නම් එම වත්කම්වලට අදාලව සම්බන්ධිත කළින් වෙනත් විස්තීරණ ආදායමෙහි හඳුනාගෙන ඇති ප්‍රතිලාභ සහ අලාභ, ආයෝජකයා ලාභයට ප්‍රතිවර්ගීකරණය කළ යුතුය. ආයෝජකයෙකුගේ ආශ්‍රිතයක ඇති ආයෝජනය අයිතිවාසිකම් හිමිකම අඩුවී නමුත් ආයෝජිත අස්තිත්වයේ දිගටම පවතින විට ආයෝජකයා කලින් වෙනත් විස්තීරණ ආදායමෙහි හඳුනාගෙන ඇති ප්‍රතිලාභ සහ අලාභවලින් සමානුපාතික ප්‍රමාණයක් පමණක් ලාභය හෝ අලාභයට ප්‍රති වර්ගීකරණය කළ යුතුය. |

LKAS 31**බද්ධ ව්‍යාපාරයන්හි හිමිකම**

| *ප්‍රමිතය* | *පවත්නා ඡේදය යොමු කිරීම* | *ආදේශකල / එකතුකළ ඡේද* |
|---|---|---|
| LKAS 31 | 1 ඡේදය | බද්ධ ව්‍යාපාර ක්‍රියාකාරකම් සිදුවන්නේ කවර ව්‍යුහයක් හෝ ස්වරූපයක් යටතේද යන්න නොසලකා බද්ධ ව්‍යාපාරයන්හි හිමිකම් සඳහා ගිණුම්කරණය කිරීමේ දී සහ බද්ධ ව්‍යාපාරයේ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ව්‍යාපාරිකයන් සහ අයොජකයන්ගේ මූල්‍ය ප්‍රකාශනවල වාර්තාකිරීමේදී මෙම ප්‍රමිතිය ව්‍යවහාර කළ යුතුය. එසේ වුවද පහත සඳහන් අය මගින් දරණ බද්ධව පාලනය කරනු ලබන අස්තිත්වවල ව්‍යාපාරිකයන්ගේ හිමිකම්වලට එය ව්‍යවහාර වන්නේ නැත.<br>(අ) අවදානම් ප්‍රාග්ධන සංවිධාන, හෝ<br>(ආ) ආයෝජනවලට සම්බන්ධ රක්ෂණ අරමුදල් ඇතුළු අනෝන්‍ය අරමුදල්, ඒකක භාර සහ ඒ හා සමාන අස්තිත්වයන්.<br>මේවා මූලිකව හඳුනාගැනීම් මත ලාභ හෝ අලාභ මගින් සාධාරණ වටිනාකම නම් කර ලාභය හෝ අලාභය හෝ විකිණීම සඳහා තබාගෙන ඇති ලෙස වර්ගීකරණය කර, *LKAS 39* මූල්‍ය සාධන පත්‍ර : හඳුනාගැනීම සහ මිණුම් කරණයට අනුකූලව ගිණුම්ගත කළ යුතුය. එවැනි ආයෝජන *LKAS 39* ප්‍රකාරව මූල්‍ය සාධාරණ වටිනාකමට මිණුම්කරණය කළ යුත්තේ, සාධාරණ වටිනාකමේ වෙනස්වීම්, වෙනස සිදුවූ කාලපරිච්ඡේදයේ ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනිමින්ය. එවැනි හිමිකමක් දරණ ව්‍යාපාරිකයෙක් 55 සහ 56 ඡේද වලින් අවශ්‍ය කරන හෙළිදරව් කිරීම් කළ යුතුය. |
| | 45 ඡේදය | අස්තිත්වයක් කෙරෙහි ආයෝජකයෙකු සතු බද්ධ පාලනය අවසන් වූ කල්හි, කලින් බද්ධව පාලනය කරන අස්තිත්වය පරිපාලිතයක් හෝ ආශ්‍රිතයක් බවට පත් නොවූයේ නම්, එම දිනයේ පටන් තවත් ඉතිරිව ඇති යම් ආයෝජනයක් සඳහා LKAS 39 ප්‍රකාරව ගිණුම්කරණය කළ යුතුය. බද්ධ පාලිත අස්තිත්වයක් ආයෝජකගේ පරිපාලිතයක් බවට පත්වන දින සිට, ආයෝජකයා එහි හිමිකම LKAS 27 සහ SLFRS 3 ව්‍යාපාර සංයෝජන (2008 දී සංශෝධිතය ලෙස) ප්‍රකාරව ගිණුම්ගත කළ යුතුය. බද්ධ පාලිත අස්තිත්වයක් ආයෝජකගේ ආශ්‍රිතයක් බවට පත්වන දින සිට ආයෝජකයා එම හිමිකම සඳහා LKAS 28 ප්‍රකාරව ගිණුම්කරණය කළ යුතුය. බද්ධ පාලනය අහිමි වීමේදී කලින් බද්ධව පාලිත අස්තිත්වයේ ආයෝජකයා විසින් යම් ආයෝජනයක් රඳවා ඇත්නම් ඒවා සාධාරණ අගයට මැනිය යුතුය. ආයෝජකයා පහත සඳහන් දෑ අතර යම් වෙනස්කමක් ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනාගත යුතුය : |
| | 45 (අ) ඡේදය | බද්ධව පාලනය අහිමි වූ අස්තිත්වයක ඇති යම් ආයෝජනයක් *LKAS 39* අනුකූලව ගිණුම්කරණය කරන කල්හි බද්ධව පාලනය අහිමි වූ අස්තිත්වයේ ඇති ආයෝජනයක සාධාරණ අගය, *LKAS 39* ට අනුකූලව මූල්‍ය වත්කමක් ලෙස මූලික හඳුනාගැනීමේ දී එහි සාධාරණ අගය ලෙස සැලකිය යුතුය. |
| | 45 (ආ) ඡේදය | ආයෝජකයෙකුට අස්තිත්වයක් කෙරෙහි ඇති බද්ධ පාලනය අහිමි නම්, එම අස්තිත්වයට අදාළ වෙනත් විස්තීරණ ආදායම්වල හඳුනාගත් සියලුම වටිනාකම් බද්ධව පාලිත අස්තිත්වය, අදාළ වත්කම් හෝ වගකීම් බැහැර කළේ නම් එම පදනම මතම සලකා ගිණුම්කරණය කළ යුතුය. එම නිසා, වෙනත් විස්තීර්ණ ආදායම්වල කලින් හඳුනාගෙන ඇති ප්‍රතිලාභ හෝ අලාභ වෙතොත්, අදාළ වත්කම් හෝ වගකීම් බැහැර කිරීම් වලින් ලැබුණු ලාභ හෝ අලාභවලට ප්‍රතිවර්ගිකරණය අතර, ආයෝජකයා හට අස්තිත්වයේ බද්ධ පාලනය අහිමි වූ කල්හි, ප්‍රතිලාභ හෝ අලාභ ස්කන්ධයේ සිට ආයෝජකයා විසින් ලාභ හෝ අලාභ ලෙස ප්‍රතිවර්ගීකරණය (ප්‍රතිවර්ගීකරණ ගැලපුමක් ලෙස) කළ යුතුය. උදාහරණයක් ලෙස බද්ධව පාලනය වන අස්තිත්වයකට විකිණීම සඳහා තබාගෙන ඇති මූල්‍ය වත්කම් ඇත්නම්, ආයෝජකයාට අස්තිත්වයේ බද්ධ පාලනය අහිමි වී නම්, එම වත්කම් වලට අදාළ වෙනත් විස්තීරණ ආදායම්වල කලින් හඳුනාගෙන ඇති ප්‍රතිලාභ සහ අලාභ ආයෝජකයා විසින් ලාභ හෝ අලාභයට ප්‍රතිවර්ගීකරණය කළ යුතුය. බද්ධව අස්තිත්වයක ආයෝජකයාගේ අයිතිවාසිකම් හිමිකම අඩු වී ඇති නමුත්, ආයෝජන බද්ධව පාලනය කරන අස්තිත්වයක් ලෙස තවදුරටත් පවතී නම්, ආයෝජකයා විසින් ලාභ හෝ අලාභයට ආයෝජකයා විසින් ලාභ හෝ අලාභයට ප්‍රතිවර්ගීකරණය කළ යුත්තේ කලින් වෙනත් විස්තීර්ණ ආදායමේ හඳුනාගෙන ඇති ප්‍රතිලාභ හෝ අලාභ වලින් සමානුපාතික ප්‍රමාණය පමණි. |

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකල / එකතුකළ ඡේද |
|---|---|---|
| | 51 ඡේදය | බද්ධ පාලනය නොමැති බද්ධ ව්‍යාපාරයක ආයෝජකයකු එම ආයෝජනය *LKAS 39*ප්‍රකාරව හෝ එයට බද්ධ ව්‍යාපාරය තුළ සැලකිය යුතු බලපෑමක් ආයෝජකයා සතු වේ නම්, LKAS 28 ප්‍රකාරව ගිණුම්ගත කළ යුතු ය. |

LKAS 32 **මූල්‍ය සාධන පත්‍ර : ඉදිරිපත් කිරීම**

| ප්‍රමිතිය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකළ / එකතුකළ ඡේදය |
|---|---|---|
| LKAS 32 | ඡේද 3 | මෙම ප්‍රමිතියේ සඳහන් මූලධර්ම මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හඳුනාගැනීම සහ මැනීම සඳහා වන ***LKAS 39* මූල්‍ය සාධන පත්‍රඃහෙළිදරව් කිරීම සහ මැනීම** යන ප්‍රමිතියේ සඳහා හෙළිදරව් කිරීම් වලට සහ SLFRS 7 මූල්‍ය සාධන පත්‍රඃ හෙළිදරව් කිරීම් අනුපූරකයකි. |
| | ඡේද 4 (අ) | LKAS 27-ඒකාබද්ධ හා වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශන, LKAS 28- ආශ්‍රිතයන්ගෙන් ආයෝජන හෝ LKAS 31 බද්ධ ව්‍යාපාරයන්හි හිමිකම් යන ප්‍රමිත ප්‍රකාරව ගිණුම් තබන පරිපාලිත ආශ්‍රිත හෝ බද්ධ ව්‍යාපාර වල හිමිකම් කෙසේ වෙතත් සමහර අවස්ථා වලදී LKAS 39- භාවිත කරගෙන පරිපාලිත ආශ්‍රිත හා බද්ධ ව්‍යාපාර වල හිමිකම සඳහා ගිණුම් තැබීමට LKAS 27, LKAS 28 හෝ LKAS 31 මගින් අස්තිත්වයකට අවසර ලබා දී ඇත. එම අවස්ථා වලදී මෙම ප්‍රමිතියේ අවශ්‍යතා අස්තිත්වය ව්‍යවහාර කරගත යුතුවේ. එසේම පරිපාලිත, ආශ්‍රිත හා බද්ධ ව්‍යාපාර වල හිමිකම් සම්බන්ධයෙන් සියලු ව්‍යුත්පන්නයන් සඳහා අස්තිත්වයන් විසින් මෙම ප්‍රමිතිය යොදාගත යුතු වේ. |
| | 4 (ඈ) ඡේදය | SLFRS 4 රක්ෂණ ගිවිසුම් හි නිර්වචනය කර ඇති ලෙස රක්‍ෂණ ගිවිසුම් කෙසේවෙතත් LKAS 39 ට අනුව රක්‍ෂණ ගිවිසුම්තුළම ඇතුළත් ව්‍යුත්පන්නයන් සඳහා අස්තිත්වය විසින් වෙනම ගිණුම් තැබීම අවශ්‍යනම්, මෙම ප්‍රමිතය ඒවාට අදාළ වේ. තවදුරටත් මූල්‍ය ඇප ගිවිසුම් හඳුනාගැනීමේදී නිකුත් කරන්නකු විසින් LKAS 39 ව්‍යවහාර කරන්නේ නම්, එම ගිවිසුම් සඳහා නිකුත් කරන්නා, මෙම ප්‍රමිතිය යොදාගත යුතු නමුත්, නිකුත් කරන්නා SLFRS 4 ව්‍යවහාර කිරීමට තෝරාගෙන ඇත්නම්, ඒවා ඇත්නම් ඒවා හඳුනා ගැනීමේදී සහ මැනීමේදී SLFRS 4 හි 4 (ඈ) ඡේදය යොදාගත යුතු ය. |
| | 4 (ඉ) ඡේදය | අභිමතානුසාරි සහභාගීත්ව ලක්‍ෂණ ඒවාට අඩංගු බැවින් SLFR 4 හි විෂය පථයට අයත්වන මූල්‍ය සාධනපත්‍ර නිකුත්කරන්නා මූල්‍ය වගකීම් සහ සාධන පත්‍ර අතර වෙන්කොට දැක්වීම සම්බන්ධයෙන් මෙම ප්‍රමිතියේ ඡේද 15.-32 සහ අඋ- 25 - අඋ 35 දක්වා ඇති ලක්‍ෂණ ව්‍යවහාර කිරීමෙන් නිදහස් කර ඇත. කෙසේවෙතත්, මෙම සාධන පත්‍ර මෙම ප්‍රමිතියේ අනෙකුත් සියළුම අවශ්‍යතාවයන්ට යටත් වේ. තවදුරටත් මෙම මූල්‍ය සාධන පත්‍ර තුළ දැඩිව ඇතුළත් ව්‍යුත්පන්නයන්ටද මෙම ප්‍රමිතිය භාවිතා වේ ( LKAS 39 බලන්න). |
| | 12 ඡේදය | පහත සඳහන් පද LKAS 39 හි 9 වන ඡේදයේ නිර්වචනය කර ඇති පරිදි ද LKAS 39 හි සඳහන් සමාන තේරුම් සහිතව මෙම ප්‍රමිතිය භාවිතා කෙරේ :-<br>• මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වගකීමක ක්‍රමක්ෂය කළ පිරිවැය<br>• <u>විකිණීම සඳහා ලබාගත හැකි මූල්‍ය වත්කම්</u><br>• ප්‍රතිහඳුනා ගැනීම<br>• ව්‍යුත්පන්න<br>• සඵල පොලී ක්‍රමය<br>• <u>ලාභ හෝ අලාභ හරහා මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් සාධාරණ අගයට දැක්වීම</u><br>• මූල්‍ය ඇප ගිවිසුම<br>• ස්ථිර බැඳීම |

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකල / එකතුකළ ඡේද |
|---|---|---|
| | | • පුරෝකතනය කළ ගනුදෙනු<br>• ඉදිරි රැකුම් සඵලදායකත්වය<br>• ඉදිරි රැකුම් අයිතමය<br>• ඉදිරි රැකුම් සාධන පත්‍රය<br>• <u>කල්පිරීම් දක්වා රඳවා ගන්නා ආයෝජන</u><br>• <u>ණය සහ ලැබිය යුතු දෑ</u><br>• විධිමත් ක්‍රමයේ ගැණුම් හෝ විකුණුම් ගණුදෙනු පිරිවැය |
| | 23 ඡේදය | 16 අ සහ 16 ආ ඡේදයන් හෝ 16 ඇ සහ 16 ඈ ඡේදයන් හි විස්තර කර ඇති අවස්ථාවන් හැර අස්තිත්වයකට ස්වකීය තමන්ගේම ස්කන්ධ සාධන පත්‍ර මුදලට හෝ වෙනත් මූල්‍ය වත්කමකට මිලදී ගැනීමට ඇතුළත් වන බැඳීමක් සහිත ගිවිසුමකින් වර්තමාන අගයට මුදලින් නිදහස් කිරීම සඳහා මූල්‍ය වගකීමක් පැනනගී. (උදා : ලෙස වර්තමාන අගයට ඉදිරි ප්‍රති මිලදී ගැනීමේ මිල, විකල්ප ක්‍රියාත්මක මිල හෝ වෙනත් නිදහස් කිරීමේ මුදලක්). ගිවිසුමම ස්කන්ධ සාධන පත්‍රයක් වන්නේ වුවද තත්ත්වය මෙයයි. එක් උදාහරණයක් වන්නේ ස්වකීය ස්කන්ධ සාධන පත්‍ර මිලදී ගැනීම සඳහා ඉදිරි ගිවිසුමක් යටතේ අස්තිත්වයක් බැඳීම. LKAS 39 යටතේ මුලින්ම මූල්‍ය වගකීම හඳුනාගත් කල්හි එහි සාධාරණ අගය (නිදහස් කරන වටිනාකම් වර්තමාන අගය) ස්කන්ධයෙන් නැවත වර්ගීකරණය කෙරේ. |
| | 31 ඡේදය | මූල්‍ය වත්කම් සහ වගකීම් මැනීම සඳහා LKAS 39 කටයුතු කරයි. අස්තිත්වයක සියළුම වගකීම් අඩුකල පසු වත්කම් සඳහා අවශේෂ හිමිකමකට සාක්ෂි දරන්නා වූ සාධනපත්‍ර ස්කන්ධ සාධන පත්‍ර වේ. එම නිසා, සංයුක්ත මූල්‍ය සාධන පත්‍රයක මූලික ඉදිරියට ගෙන ආ ධාරන අගය එහි ස්කන්ධය සහ වගකීම් සංරචක අතර වෙන් කරනු ලැබේ. එමෙන්ම වෙනම නිර්නය කරනු ලැබූ වගකීම් සංරචකයේ වටිනාකම මුළුමනින්ම එම සාධන පත්‍රයේ සාධාරණ අගයෙන් අඩුකර ලැබෙන අවශේෂ වටිනාකම ස්කන්ධ සංරචකයට අනුයුක්ත වෙයි. කිසියම් ව්‍යුත්පන්නයක ලක්‍ෂණයක් අගය (ඇරයුම් විකල්ප වැනි) ස්කන්ධ සංරචක හැර, සංයුක්ත මූල්‍ය සාධනපත්‍ර තුළ අන්තර්ගත වී ඇති වගකීම් සංරචකය තුළ අඩංගු වේ. මූලික හඳුනා ගැනීමේදී වගකීම් සහ ස්කන්ධ සංරචකයන්ට අනුයුක්ත ධාරණ අගයන්ගේ එකතුව සැම විටම සාධන පත්‍රවල සමස්ථයට ආරෝපනය වූ සාධාරණ අගයට සමාන වේ. සාධන පත්‍රයේ සංරචකය වෙන් වෙන්ව මූලිකව හඳුනාගැනීම තුළින් ලාභයන් හෝ අලාභයක් පැන නොනගී. |
| | 42 ඡේදය | ප්‍රති හඳුනා ගැනීම සඳහා සුදුසුකම් නොලබන මූල්‍ය වත්කමක් පැවරීම සඳහා ගිණුම්කරණයේදී අස්තිත්වයන් විසින් පැවරූ වත්කම සහ ආශ්‍රිත වගකීම හිලව් නොකළ යුතු ය. (LKAS 39, 36 ඡේදය බලන්න) |

LKAS 36 - **වත්කම් හානිකර ණය**

| ප්‍රමිතිය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකළ / එකතුකළ ඡේදය |
|---|---|---|
| LKAS 36 | 2(ඉ) ඡේදය | LKAS 39 මූල්‍ය සාධන පත්‍ර: හඳුනාගැනීම සහ මිණුම්කරණයෙහි විෂය පථය ඇතුළත මූල්‍ය වත්කම් ; |
| | 5 ඡේදය | මෙම ප්‍රමිතය LKAS 39 විෂය පථය යටතේ ගැනෙන මූල්‍ය වත්කම්වලට LKAS 40 ප්‍රකාර සාධාරණ අගයට මිණුම්කරණය කර ඇති ආයෝජන දේපළ වලට හෝ LKAS 41 ප්‍රකාර විකුණුම් පිරිවැය අඩුකර, සාධාරණ අගයට මිණුම්කෙරෙන කෘෂිකාර්මික ක්‍රියාකාරකම් වලට අදාළ ජීව විද්‍යාත්මක වත්කම් සඳහා ව්‍යවහාර නොකෙරේ. කෙසේ |

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකල / එකතුකළ ඡේද |
|---|---|---|
| | | වෙතත්, LKAS 16 දේපළ, පිරියත හා උපකරණ හි ප්‍රත්‍යාගණන ආදර්ශය වැනි, වෙනත් SLFRS$_{S}$ ප්‍රකාර ප්‍රත්‍යාගණන වටිනාකමට (එනම්, සාධාරණ අගය) දක්වා ඇති වත්කම් සඳහා මෙම ප්‍රමිතය භාවිතා කෙරේ. ප්‍රත්‍යාගණනය කළ වත්කමක් හානිකරණය වී ඇද්ද යන්න රඳා පවතින්නේ සාධාරණ අගය නිර්ණය කිරීමට භාවිතා කළ පදනම මතය. |

LKAS 37- **ප්‍රතිපාදන, අසම්භව්‍ය වගකීම් සහ අසම්භව්‍ය වත්කම්**

| ප්‍රමිතිය | පවත්නා ඡේද යොමු කිරීම | ආදේශකළ / එකතුකළ ඡේද |
|---|---|---|
| LKAS 37 | 2 ඡේදය | මෙම ප්‍රමිතිය *LKAS* 39 මූල්‍ය සාධන පත්‍ර හඳුනා ගැනීම සහ මැනීමෙහි විෂය පථයට ගැනෙන මූල්‍ය සාධනපත්‍ර (ඇපවීම ඇතුළත්ව) වලට ව්‍යවහාර නොවේ. |

LKAS 39 **මූල්‍ය සාධන පත්‍ර හඳුනා ගැනීම සහ මැනීම**

| ප්‍රමිතිය | පවත්නා ඡේද යොමු කිරීම | ආදේශකළ / එකතුකළ ඡේද |
|---|---|---|
| LKAS 39 | ශීර්ෂය | පරමාර්ථය |
| | 1 ඡේදය | **මෙම ප්‍රමිතයේ පරමාර්ථය වනුයේ මූල්‍ය වත්කම්, මූල්‍ය වගකීම් සහ මිලදී ගැනීම සහ විකිණීම සඳහා වන මූල්‍ය නොවන අයිතම සඳහා වන සමහර ගිවිසුම් හඳුනා ගැනීම සහ මිණුම්කරණය සඳහා මූලධර්ම ස්ථාපනය කිරීමය. *LKAS* 32 හි මූල්‍ය සාධනපත්‍ර ඉදිරිපත් කිරීම පිළිබඳ අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇත. මූල්‍ය සාධනපත්‍ර හෙළිදරව් කිරීම් අවශ්‍යතා *SLFRS 7* මූල්‍ය සාධනපත්‍ර පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීම ප්‍රමිතයෙහි ඇතුළත් වේ.** |
| | 2 (අ) ඡේදය | LKAS 27 ඒකාබද්ධ සහ වෙන් වූ මූල්‍ය ප්‍රකාශන, LKAS 28 ආශ්‍රිතයන්හි ආයෝජන හෝ LKAS 31 බද්ධ ව්‍යාපාරවල හිමිකම් යටතේ ගිණුම් තබන පරිපාලිත, ආශ්‍රිත සහ බද්ධ ව්‍යාපාරවල හිමිකම් කෙසේවෙතත්, මෙම ප්‍රමිතය යටතේ ගිණුම් ගතකළ LKAS27, LKAS28, හෝ LKAS31 අනුව ගිණුම් ගත කරනු ලබන පරිපාලිතයක, ආශ්‍රිතයක සහ බද්ධ ව්‍යාපාරයක හිමිකම් වෙනුවෙන් අස්තිත්වයක් මෙම ප්‍රමිතය ව්‍යවහාර කළ යුතු ය. ව්‍යුත්පන්නයක් අස්තිත්වයේ ස්කන්ධ සාධන පත්‍රයක, LKAS 32 හි නිර්වචනය සපුරාලන්නේ නම් මිස, පරිපාලිතයක, අශ්‍රිතයක හෝ බද්ධ ව්‍යාපාරයක හිමිකම් සඳහා වන ව්‍යුත්පන්නයන් සඳහා අස්තිත්වයන් මෙම ප්‍රමිතය ව්‍යවහාර කළ යුතු ය. |
| | 2 (ආ)(i) ඡේදය | බදු දෙන්නා විසින් හඳුනාගනු ලැබූ කල්බදු ලැබීම්, මෙම ප්‍රමිතයේ ප්‍රතිහඳුනා ගැනීම සහ හානිකරණ ප්‍රතිපාදනවලට යටත්ය **(15-37, 58, 59, 63-65 ඡේදයන් සහ පරිශිෂ්ඨය අ හි අළ 36, අළ 52 සහ අළ84, අළ 93 බලන්න).** |
| | 2(ආ)(ii) ඡේදය | බදුගන්නෙක් විසින් හඳුනාගන්නා ලද ගෙවිය යුතු මූල්‍ය කල්බදු **මෙම ප්‍රමිතයේ** ප්‍රතිහඳුනා ගැනීමේ ප්‍රතිපාදනවලට යටත් වේ. **(39-42 ඡේදයන් සහ පරිශිෂ්ඨය අල අළ 57 - අළ 64 ඡේදයන් බලන්න)** ; සහ |
| | 2 (අ) (iii) ඡේදය | කල්බදු වල නිහිත වූ ව්‍යුත්පන්න මෙම ප්‍රමිතයේ නිහිත ව්‍යුත්පන්න ප්‍රතිපාදන වලට යටත් වේ **(10-13 ඡේදයන් සහ පරිශිෂ්ඨ අ හි ඡේද අළ27 - අළ33 බලන්න).** |
| | 2 (ඉ) ඡේදය | 9 වන ඡේදයේ ඇතුළත් මූල්‍ය සහතිකවීම් ගිවිසුමක නිර්වචනය සපුරාලන රක්ෂණ ගිවිසුම් යටතේ පැනනගින නිකුත්කරන්නාගේ හිමිකම් සහ බැඳීම් හැර (i) SLFRS 4 **රක්ෂණ** |

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකල / එකතුකළ ඡේද |
|---|---|---|
| | | **ගිවිසුම්** හි නිර්වචිත රක්‍ෂණ ගිවිසුම් යටතේ පැනනගින හිමිකම් සහ බැඳීම් හෝ (ii) අභිමතානුසාරී සහභාගිවීමේ ලක්‍ෂණය අඩංගුවීම හේතුවෙන්, SLFRS 4 විෂය පථය තුළ ඇති ගිවිසුමකි. කෙසේවෙතත්, SLFRS 4 විෂය පථය ඇතුළත ගිවිසුමක නිහිත ව්‍යුත්පන්නයක් SLFRS 4 විෂය පථය ඇතුළත, ව්‍යුත්පන්නය මගින්ම ගිවිසුමක් නොවේ නම්, මෙම ප්‍රමිතය ව්‍යුත්පන්නයට ව්‍යවහාර වේ (මෙම ප්‍රමිතියේ 10-13 ඡේදයන් සහ පරිශිෂ්ඨය අ හි ඡේද අළ 27 - අළ 33 බලන්න). එපමණක් නොව, මූල්‍ය ඇපකර ගිවිසුම් නිකුත් කරන්නෙක් මීට පෙර එම ගිවිසුම් රක්‍ෂණ ගිවිසුම් ලෙස සලකා පැහැදිලිව ප්‍රකාශ කර සහ රක්‍ෂණ ගිවිසුම් සඳහා අදාල වන ගිණුම් තැබීම ව්‍යවහාර කර ඇති කල්හි, එම නිකුත්කරන්නාට එවැනි මූල්‍ය සහතිකවීම් ගිවිසුම්වලට මෙම ප්‍රමිතය හෝ SLFRS 4 ව්‍යවහාර කිරීම සඳහා තෝරාගත හැකිය. (අළ 4 සහ අළ 4 අ ඡේද බලන්න). නිකුත් කරන්නා එම තෝරා ගැනීම ගිවිසුමෙන් ගිවිසුමට කළහැකි නමුත්, එක් එක් ගිවිසුම සඳහා තෝරා ගැනීම වෙනස් කළ නොහැකිය. |
| | 2 (ඍ) ඡේදය | හතරවන ඡේදයෙහි විස්තර කර ඇති ණය බැඳීම් හැර එම ණය බැඳීම්, මෙම ප්‍රමිතයේ විෂය පථය ඇතුළත නොවන ණය බැඳීම්වලට, ණය බැඳීම් නිකුත්කරන්නා විසින් LKAS 37 ***ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්*** ව්‍යාවහාර කළ යුතුය. කෙසේවෙතත්, සියලුම ණය බැඳීම් මෙම ප්‍රමිතයේ ප්‍රතිහඳුනාගැනීම් ප්‍රතිපාදනයන්ට යටත් වේ (15-42 ඡේද සහ පරිශිෂ්ඨ අ හි අළ 36 අළ 63 ඡේද බලන්න). |
| | 4 (අ) ඡේදය | ලාභය හෝ අලාභය හරහා මූල්‍ය වගකීම් ලෙස සාධාරණ අගයට අස්තිත්වයක් නම්කර ඇති ණය බැඳීම්. එහි ණය බැඳීම්වල ප්‍රතිඵලය වන වත්කම්, ඒවායේ ප්‍රභවයෙන් කෙටිකාලයකට පසු විකිණීමේ අතීත පළපුරුද්ද ඇති අස්තිත්වයක් එහි එකම පංතියේ සියලුම ණය බැඳීම් වලට මෙම ප්‍රමිතය ව්‍යවහාර කළ යුතුය. |
| | 4 (ඇ) ඡේදය | වෙළඳ පොලේ පොලී අනුපාතිකයට අඩුවෙන් ණයක් සලසාදීමට බැඳීම්. මෙවැනි ණය බැඳීම් මගින් පැනනගින වගකීම පසුව මිණුම් කිරීම, 47(ඇ) ඡේදයෙහි දක්වයි. |
| | 8 ඡේදය | LKAS 32 හි නිර්වචනය කරන ලද පද මෙම ප්‍රමිතයේ භාවිතා කරන අතර , ඒවායේ තේරුම LKAS 32 හි 11 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇත. පහත සඳහන් පද LKAS 32 හි නිර්වචනය කර ඇත. එම නිර්වචනය ව්‍යවහාර කිරීම මත උපදෙස් ද සපයා ඇත.<br>• මූල්‍ය සාධන පත්‍ර<br>• මූල්‍ය වත්කම්<br>• මූල්‍ය වගකීම්<br>• ස්කන්ධ සාධන පත්‍ර |
| | 9 ඡේදය | පහත සඳහන් පද මෙම ප්‍රමිතියේ නිශ්චිතව දක්වා ඇති තේරුම සහිතව භාවිතා කෙරේ. ව්‍යුත්පන්නයක නිර්වචනය ව්‍යුත්පන්නයක් යනු මූල්‍ය සාධන පත්‍රයක් හෝ මෙම ප්‍රමිතියේ (2-7 ඡේද බලන්න) විෂය පථය තුළ පවත්නා පහත සඳහන් සියළුම ගති ලක්ෂණ තුනම සහිත වෙනත් ගිවිසුමකි.<br>(අ) විශේෂයෙන් සඳහන් කළ පොලීඅනුපාතික, මූල්‍ය සාධන පත්‍ර මිලක වෙළඳ භාණ්ඩ මිලක විදේශිය විනිමය අනුපාතිකයක, මිල හෝ අනුපාතික මිල දර්ශකයක, ණය වර්ගීකරනය. ණය දර්ශකයක හෝ වෙනත් විචල්‍යක මූල්‍ය නොවන විචලයක් සම්බන්දයක් (ඇතැම්විට පෙනන මතු පිටට යමින් පවතියද) ලෙස හඳුන්වනු ලබන ගිවිසුමකට බැඳුණ පාර්ශ්වයකට විශේෂිත නොවන විචල්‍යයන් වන්නේ නම් පමණක් ඇති වන්නා වූ වෙනසට ප්‍රතිචාර වශයෙන් එහි වටිනාකම වෙනස් වේ. |

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකල / එකතුකළ ඡේද |
|---|---|---|
| | | (ආ) එයට මූලික ශුද්ධ ආයෝජනයක් හෝ වෙළඳ පොළ වෙනස්කම් වලට සාමාන්‍ය ආකාරයේ ප්‍රතිචාර දැක්වීමට අපේක්ෂිත වෙනත් වර්ගයේ ගිවිසුම් සඳහා තරමක් කුඩා වූ මූලික ශුද්ධ ආයෝජනයක් අවශ්‍ය නොවේ.<br><br>(ඇ) ඉදිරි දිනයකදී එය නිරවුල් කරනු ලැබේ.<br>ප්‍රභේද හතරක මූල්‍ය සාධන පත්‍ර වලට නිර්වචනයන් ලාභ හෝ අලාභ හරහා මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වගකීමක් යනු පහත සඳහන් ඕනෑම කොන්දේසියක් සපුරාලන මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වගකීමකි.<br><br>(අ) එය විකිණීම සඳහා රඳවා ගෙන ඇති ලෙස වර්ග කිරීම. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වගකීමක් විකිණීම සඳහා රඳවා ගෙන ඇති ලෙස වර්ග කිරීමට නම් ;<br><br>(i) එය අත්පත් කරගන්නේ හෝ ප්‍රධාන වශයෙන් වැය කරන ලද්දේ නුදුරු කාලයේ දී විකිණීම හෝ ප්‍රති මිලදී ගැනීමේ අරමුණින් වන විට;<br><br>(ii) මූලික හඳුනාගැනීමේ දී එක්ව පාලනය කරන හඳුනාගත් මූල්‍ය සාධන පත්‍ර කළඹක් වන අතර එය කෙටි කාලීන ලාභ ලබා ගැනීමේ වර්තමාන සත්‍ය රටාවක් පිළිබඳ සාක්ෂි සහිත වීම ; හෝ<br><br>(iii) එය ව්‍යුත්පන්න වීම (මූල්‍ය ඇපකාර ගිවිසුමක් හෝ නම් කරන ලද සහ සඵල ඉදිරි රැකුම් සාධන පත්‍රයක් හැර).<br><br>(ආ) මූලික හඳුනාගැනීම් මත අස්තිත්වයක් මගින් එය ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයකට නම් කරනු ලැබේ. 11 අ ඡේදය මගින් අවසර දී ඇති කල්හි පමණක් අස්තිත්වයක් මෙම නම් කිරීම භාවිතා කළ හැකි වීම හෝ එසේ කිරීමේ දී අදාල තොරතුරු වැඩියෙන් ලැබීම ප්‍රතිඵල වෙයි. එයට හේතුව වන්නේ, එක්කෝ<br><br>(i) විවිධ පදනම් මත වත්කම් හෝ වගකීම් ලාභ හෝ අලාභ මිණුම් කිරීමේ දී හෝ ඒවායේ ලාභ හෝ අලාභ හඳුනා ගැනීමේ දී අන් වශයෙන් පැන නැගිය හැකි මැනීමේ හෝ හඳුනා ගැනීමේ අසංගත තාවයන් සැළකිය යුතු අන්දමින් අඩුවීම හෝ ඉවත්වීම සිදුවේ. (සමහර විට මෙය ගිණුම් කරන නොගැලපීම් ලෙස යොමු කෙරේ) ; හෝ<br><br>(ii) මූල්‍ය වත්කම් මූල්‍ය වගකීම් කාණ්ඩයක හෝ ඒදෙකේම කළමණාකරනය සහ එහි කාර්ය සාධනය ලේඛනගත අවදානම් කළමණාකරනය හෝ ආයෝජන ක්‍රමෝපායන් ප්‍රකාර සාධාරණ අගය පදනම මත අගය කිරීම සහ එම කාණ්ඩය පිළිබඳ තොරතුරු පදනම මත අභ්‍යන්තරව ප්‍රමුඛ කළමණාකරනය සේවක පිරිස් වලට සැපයීම් (LKAS 24 සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීමෙහි හි නිර්වචනය කළ ඇති පරිදි) උදාහරණ ලෙස අස්තිත්වයේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන විධායක නිලධාරි)<br><br>SLFR 7 හි 9 -11 සහ ආ 4 ඡේද වලින් අස්තිත්වයේ ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් දැක්වීම එය මෙම කොන්දේසි කෙසේ තෘප්ත කළේද යන්න ඇතුළුව හෙළදරව් කිරීම අවශ්‍ය කරයි. ඉහත (ii) සමඟ සාධන පත්‍ර සඳහා අස්තිත්වයේ ලේඛනගත අවදානම් කළමණාකරනය හෝ ආයෝජන ක්‍රමෝපායන් අනුකූලව ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයකට හැඳින්වීම කෙසේ සංගත වන්නේද යන්න පිළිබඳ ලිඛිත විස්තරයක් හෙළිදරව් කිරීමේ ඇතුලත් වේ. |

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකල / එකතුකළ ඡේද |
|---|---|---|
| | | සක්‍රිය වෙළඳ පොලක මිල කියුම්ලත් වෙළඳ මිලක් නොමැති සහ ඒවායේ සාධාරණ අගය විශ්වාස දායක ලෙස මිණිය නොහැකි. ස්කන්ධ සාධන පත්‍රයන්හි ආයෝජන ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට මෙය නම් නොකළ යුතුය. (46 (ඇ) ඡේදය සහ පරිශිෂ්ඨ අ හි අළ80 සහ අළ 81 ඡේද බලන්න).<br><br>මුල්‍ය වත්කමක හෝ මුල්‍ය වගකීමක සාධාරණ අගය විශ්වාසදායක ලෙස නිර්ණය කිරීමට 48, 48 අ, 49 සහ අ පරිශිෂ්ඨයේ අළ 69-අළ 82 හි දක්වා ඇති ඡේදවලින් නියම කර ඇති අවශ්‍යතාවයන් ඒවායේ සාධාරණ අගය හෙලිදරව් කලේ නම්කිරීම මගින් හෝ අන් අයුරකින්ද හෝ වුයේ වුවද සාධාරණ අගයට මනිනු ලබන සියළුම අයිතම සඳහා එකහා සමාන ලෙස ව්‍යවහාර කිරීමට සටහන් කර ගත යුතුය.කල්පිරීමට තබාගෙන ඇති ආයෝජනය යනු අස්තිත්වයේ නිසැක අභිප්‍රාය සහිත කල් පිරෙන තුරු තබා ගැනීමේ හැකියාව ඇති ස්ථාවර හෝ නිර්නය කළහැකි ගෙවීම් සහ නියත කල්පිරීමක් සහිත පහත සඳහන් ව්‍යුත්පන්න නොවන මුල්‍ය වත්කම් (පරිශිෂ්ඨ අ හි අළ 16 -- අළ 25 ඡේද බලන්න.)<br><br>(අ) අස්තිත්වයේ මුලික හඳුනාගැනීමෙන් පසු ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගය ලෙස නම් කරන ඒවා;<br><br>(ආ) අස්තිත්වයේ විකිණීම සඳහා ඇති ලෙස නම් කරන ලද ඒවා; සහ<br><br>(ඇ) ණය සහ ලැබිය යුතු දෑ වන නිර්වචන සපුරාලන ඒවා.<br><br>පරිනතවීමට පෙර සැළකිය යුතු තරම් අන්දමේ නොවන වටිනාකමකදී (සැළකිය යුතු තරම් අන්දමේ නොවන යන්න පරිනතවන තෙක් තබාගෙන ඇති මුළු ආයෝජන වටිනාකමට සාපේක්ෂවය) වැනි පරිනතවන තෙක් තබාගෙන ඇති ආයෝජන පහත සඳහන් විකිනීම හෝ යලි වරගිකරනය හැර ප්‍රවර්තන මුල්‍ය වර්ෂයේ හෝ පූර්වගාමි මුදල් වර්ෂ දෙකෙහිම මුල්‍ය වත්කමක් විකුණා හෝ යලි වර්ගිකරණය කර ඇත්නම් ඒවා පරිනත වන තෙක් තබා ගන්නා මුල්‍යවත්කම් ලෙස අස්තිත්වයන් වර්ගීකරණය නොකළ යුතුය.<br><br>(i) මුල්‍ය වත්කමේ සාධාරන අගයට සැලකිය යුතු අන්දමේ බලපෑමක් ඇති නොවිය හැකි ඇරයුම් දින හෝ පරිනත වීමට ඉතා ආසන්න මුල්‍ය වත්කමක් (උදාහරන වශයෙන් පරිනතවීමට මාස තුනකට අඩු කාලයක) වෙලද පොළ පොලි අනුපාතිකවල වෙනස්වීම්;<br><br>(ii) නියමිත ගෙවීම් හෝ පෙර ගෙවීම් මගින් ආරම්භක මුල්‍ය වත්කම් මුල් මුදල සම්පූර්ණයෙන්ම වාගේ අයකරගත් පසු සිදුවීම්; හෝ<br>(iii) පුනරාවර්තනය නොවන සහ අස්තිත්වය සාධාරන ලෙස අපේක්ෂා නොකළ හුදකලා සිද්ධියකට ආරෝපිත.<br><br>ණය සහ ලැබිය යුතු දෑ යනු පහත ආකාර සක්‍රිය වෙළඳපොළක මිල කියුම් නොලත් ස්ථාවර හෝ නිර්නය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මුල්‍ය වත්කම්ය.<br><br>(අ) අස්තිත්වය වහාම හෝ නුදුරු කාලයේ විකිණීමට අපේක්ෂිත විකිණීම සඳහා තබාගෙන ඇති ලෙස නම් කළ යුතු සහ අස්තිත්වය මුලික හදුනා ගැනීම මත ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගය ලෙස හඳුනා ගෙන ඇති ඒවා;<br><br>(අ) අස්තිත්වය ආරම්භක හඳුනා ගැනීමේදි විකිණීම සඳහා පවත්නා ලෙස; හෝ |

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකල / එකතුකළ ඡේද |
|---|---|---|
| | | (ඇ) ණය පිරිහීමේ හේතුව හැර, දරන්නෙකුට මූලක ආයෝජනයේ සැලකිය යුතු ප්‍රමාණයක් අයකර ගත නොහැකි, විකිණීම සඳහා ලබාගත හැකි ඒවා ලෙස වර්ගීකරණය කරන ලද ඒවා.<br><br>ණය හෝ ලැබිය යුතු දෑ නොවන වත්කම් එකතුවක අත්පත් හිමිකම (උදාහරණ ලෙස අන්‍යෝන්‍ය අරමුදලක හෝ ඒ සමාන අරමුදලක හිමිකම) ණය හෝ ලැබිය යුතු දෑ නොවේ.<br><br>විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් යනු විකිණීම සඳහා පවත්නා ලෙස නම් කරන ද ව්‍යුත්පන්න (අ) සිට (ඇ) දක්වා වර්ගීකරණ නොකළ ඒවාය මූල්‍ය වත්කම් හෝ (අ) ණය හෝ ලැබිය යුතු දෑ (ආ) කල්පිරෙන තෙක් තබාගන්නා ආයෝජන (ඇ.) ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයකට මූල්‍ය වත්කම්.<br><br>මූල්‍ය ඇපකාර ගිවිසුමක නිර්වචනය<br><br>මූල්‍ය ඇපකාර ගිවිසුමක් යනු සාධන පත්‍රයක මුල් හෝ සංශෝධිත නියමයන් අනුව නිශ්චිත ණය ගැතියන් විසින් ගෙවිය යුතුව තිබූ විටක ගෙවීමට අපොහොසත් වීම නිසා දරණ්නට සිදුවූ පාඩුව ප්‍රතිපූර්ණ කිරීම් සඳහා නිකුත් කරන්නා විසින් ගෙවිය යුතු නිශ්චිත ගෙවීම කිරීම අවශ්‍ය කරන ගිවිසුමකි.<br><br>හඳුනාගැනීම සහ මැණීමට සම්බන්ධිත නිර්වචනය<br><br>මූල්‍ය වත්කම හෝ මූල්‍ය වගකීම මත ක්‍රමක්‍ෂය එය කල පිරිවැය යනු මුල් වරට හඳුනා ගැනීමේදී මූල්‍ය වත්කම හෝ මූල්‍ය වගකීම මනිනු ලැබූ අගයේ මුල් මුදලින් ආපසු ගෙවීම් අඩුකර මූලික මුදල සහ කල්පිරෙන මුදල අතර අනියම් වෙනසකට සඵල පොලී ක්‍රමය යොදා ගනිමින් සමුච්චිත ක්‍රමක්‍ෂය එකතුකර හෝ අඩුකර ලැබෙන අගයෙන් හානිකරණය හෝ එකතු කිරීමට නොහැකියාව සඳහා (ඍජුව හෝ දීමනා ගිවිසුමක් යොදා ගනිමින්) යම් අඩු කිරීමක් කලපසු ලැබෙන අගයයි.<br><br>සඵල පොලී ක්‍රමය යනු මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වගකීමක (හෝ මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වගකීම් සමූහයක) ක්‍රමක්‍ෂය පිරිවැය ගණනය කරන ක්‍රමයක් හා අදාළ කාලපරිච්ඡේදය තුළ පොලී ආදායම සහ පොලී වියදම වෙන් කිරීම වෙයි. මූල්‍ය සාධන පත්‍රයක අපේක්‍ෂිත ජීව කාලය තුළ ඇස්තමේන්තු ගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් නිවැරදිව වට්ටම් කරගනු ලබන අනුපාතිකය සඵල පොලී අනුපාතිකය හෝ උචිත කල්හි, කෙටි කාලයකට මූල්‍ය වත්කමකට හෝ මූල්‍ය වගකීමක ශුද්ධ ධාරණ වටිනාකමයි. සඵල පොලී අනුපාතිකය ගණනය කිරීමේදී අස්තිත්වයක්, සියලුම ගිවිසුම්ගත නියමයන් සලකා බලමින් මුදල් ප්‍රවාහය ඇස්තමේන්තු කළ යුතු (උදාහරණ ලෙස, පෙර ගෙවීම්, ඇරයුම් සහ සමාන විකල්පයක්) නමුත් අනාගත ණය අහිමි වීම් සළකා නොබැලිය යුතුය. ගණනය කිරීම් වලට ගිවිසුමට පාර්ශ්වකරුවන් අතර ගෙවූ සියලුම ගාස්තු සහ ගෙවූ හෝ ලැබූ සියලු ලකුණු අඩංගු වන අතර (LKAS 18 අයහාර බලන්න), ගණුදෙනු කිරීමේ පිරිවැය ; සහ<br><br>සියලු වෙනත් අධි මිලයන් හෝ වට්ටම්, යන ඒවා සඵල පොලී අනුපාතිකයේ වැදගත් කොටසක් වෙයි. සමාන මූල්‍ය සාධනපත්‍ර සමූහයක මුදල් ප්‍රවාහ සහ අපේක්‍ෂිත ජීවිත කාලය විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කිරීමට කළ හැකි බවට අනුමිතියක් ඇත. කෙසේවෙතත්, එවැනි විරල සිද්ධීන් වලදී මුදල් ප්‍රවාහ හෝ මූල්‍ය සාධන පත්‍රයේ අපේක්‍ෂිත ජීව කාලය (මූල්‍ය සාධන පත්‍ර සමූහයක) විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කිරීමට නොහැකි කල්හි, අස්තිත්වය විසින් |

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකල / එකතුකළ ඡේද |
|---|---|---|
| | | මූල්‍ය සාධන පත්‍රයේ (හෝ මූල්‍ය සාධන පත්‍ර සමූහයේ) සම්පූර්ණ ගිවිසුම්ගත කාලය තුළ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ භාවිතා කළ යුතුය.<br><br>ප්‍රති හඳුනා ගැනීම යනු අස්තිත්වයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කලින් හඳුනාගෙන තිබූ මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් ඉවත් කිරීමයි.<br><br>සාධාරණ වටිනාකම යනු දැනුමැති, කැමැත්තෙන් සිටින පාර්ශ්වයන් අතර අතේ දුරින් සිදුවන ගණුදෙනුවකදී වත්කමක් හුවමාරු කළ හැකි හෝ වගකීමක් නිරවුල් කළ හැකි වටිනාකමයි.<br><br>විධිමත් ක්‍රමයේ ගැණුම් හෝ විකිණුම් යනු ගිවිසුමක් යටතේ මිලදී ගැනීම හෝ විකිණීම කරන මූල්‍ය වත්කමක් වන අතර ගිවිසුමේ නියමයන් අනුව වත්කම් රෙගුලාසි හෝ සම්මුතීන් මගින් තහවුරු කළ රාමුවක් යටතේ නියමිත වෙළඳපොළක දී භාරදීම අවශ්‍ය කරන්නකි.<br><br>ගණුදෙනු පිරිවැය යනු මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වගකීමක් අත්පත් කර ගැනීම, නිකුත් කිරීම හෝ බැහැර කිරීමේදී (පරිශිෂ්ඨ අ හි අද 13 ඡේදය බලන්න) සෘජුවම ආරෝපණය වූ වර්ධක පිරිවැයයි. වර්ධක පිරිවැය යනු අස්තිත්වයක් මූල්‍ය සාධන පත්‍ර අත්පත් කර ගැනීම නිකුතුව හෝ බැහැර කිරීම නොකළේ නම්, වැය නොවන පිරිවැයයි. |
| | 9 ඡේදය (පාදක සටහන්) | 48.-49 ඡේද සහ පරිශිෂ්ට අ හි අද 69 - අද 82 ඡේදයන්හි මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වගකීමක සාධාරණ අගය නිර්ණය කිරීම සඳහා අවශ්‍යතා දක්වේ. |
| | ශීර්ෂය | නිහිත ව්‍යුත්පන්න |
| | 10ඡේදය | නිහිත ව්‍යුත්පන්නයක් යනු දෙමුහුන් (සංයුක්ත) සාධන පත්‍ර සංරචකයක් වන අතර, එයට ව්‍යුත්පන්න නොවන සත්කාරක ගිවිසුමක්ද ඇතුල් වෙයි. එහි ප්‍රතිඵලය සංයුක්ත සාධන පත්‍රයක සමහර මුදල් ප්‍රවාහයන් ඒ හා සමාන ආකාරයට ස්වයංවම ව්‍යුත්පන්නයට වෙනස් වේ. නිශ්චිත පොළී අනුපාතික මූල්‍ය සාධන පත්‍ර මිල, වෙළඳ ද්‍රව්‍ය මිල, විදේශ විනිමය අනුපාතිකය, මිල හෝ අනුපාත, දර්ශක ණය වර්ගීකරනය හෝ මූල්‍ය නොවන විචල්‍ය කරුණු ප්‍රකාරව සෑම විචල්‍ය ගිවිසුමට සම්බන්ධ පාර්ශ්වයක් වැනි නිශ්චිත නොවන, ප්‍රකාරව, ඒ අනුව වෙනත් ලෙසකින් ගිවිසුමේ අවශ්‍යතා අනුව සංශෝධනය කළයුතු සමහර හෝ සියලුම ප්‍රවාහවලට නිහිත ව්‍යුත්පන්නයක් හේතුවිය හැකිය. මූල්‍ය සාධන පත්‍රයකට අනුයුක්ත ව්‍යුත්පන්නයක් නමුත්, ගිවිසුම්ගතව එම සාධන පත්‍රය ස්වාධීනව පැවරිය හැකි හෝ සාධන පත්‍රයට වෙනස් වූ ප්‍රති පාර්ශ්වකරුවන් සිටී නම්, එය නිහිත ව්‍යුත්පන්නයක් නොවන නමුත් වෙන්වූ මූල්‍ය සාධන පත්‍රයකි. |
| | ඡේදය 11 | නිහිත ව්‍යුත්පන්නයක්, සත්කාරක ගිවිසුමකින් වෙන්කළ යුතු අතර මෙම ප්‍රමිතිය යටතේ ගිණුම්ගත කළ යුත්තේ එය පහත සඳහන් පරිදි වේ නම් පමණි :<br><br>(අ) නිහිත ව්‍යුත්පන්නයක ආර්ථික ගති ලක්ෂණයක් සහ අවදානම්, සත්කාරක ගිවිසුමක ආර්ථික ගති ලක්ෂණ සහ අවදානම් වලට සමීපව සම්බන්ධ නොවීම (පරිශිෂ්ට අද 30 සහ අද 33 ඡේද බලන්න).<br><br>(ආ) නිහින ව්‍යුත්පන්නයක් හා සමාන නියමයන් ඇති වෙනත් සාධන පත්‍රයක් ව්‍යුත්පන්නයක නිර්වචනය සමඟ එකඟවීම; සහ<br><br>(ඇ) ලාභ හෝ අලාභ වල හඳුනාගත් සාධාරණ අගයේ වෙනස්වීම් සමඟ සාධාරණ අගයට මනිනු නොලබන දෙමුහුම් (සංයුක්ත) සාධන පත්‍රයක් (එනම් ලාභ හෝ |

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකල / එකතුකළ ඡේද |
|---|---|---|
| | | අලාභ හරහා වෙන් නොකළ සාධාරණ අගයට මුල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම්වල නිහිත වූ ව්‍යුත්පන්නයක්) නිහිත ව්‍යුත්පන්නයක් වෙන්කළ හොත් එම සත්තාරක ගිවිසුම මූල්‍ය සාධන පත්‍රයක් නම්, මෙම ප්‍රමිතිය යටතේ සහ එය මූල්‍ය සාධන පත්‍රයක් නොවේ නම්, වෙනත් උචිත ප්‍රමිතියක් ප්‍රකාර ගිනුම්ගත කළ යුතුය. මෙම ප්‍රමිතිය නිහිත ව්‍යුත්පන්නයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙන්ව ඉදිරිපත් කළ යුතුද යන්න ගැන ආමන්ත්‍රණය නොකරයි. |
| | 11 අ ඡේදය | 11වන ඡේදයේ කෙසේ සඳහන් කලද, ගිවිසුමක එකක් හෝ ඊට වැඩි නිහිත ව්‍යුත්පන්න අඩංගු වේ නම්, අස්තිත්වයක් සමස්ථ දෙමුහුන් (සංයුක්ත) ගිවිසුමක් පහත දැ වන්නේ නම් හැර ලාභ හෝ අලාභ හරහා මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වගකීමක් ලෙස සාධාරණ අගයට නම් කළ හැකිය,<br><br>(අ) නිහිත ව්‍යුත්පන්නය (යන්) ගිවිසුමේ අවශ්‍යතා පරිදි වෙනත් විදියකින් මුදල් ප්‍රවාහ සැලකිය යුතු ලෙස වෙනස් නොවීම; හෝ,<br><br>(ආ) සමාන දෙමුහුන් (සංයුක්ත) සාධන පත්‍රයක් මුලින් සලකා බලන කල්හි, නිහිත ව්‍යුත්පන්නයක් (යන්) වෙන්කිරීම තහනම් බව සුළු හෝ විග්‍රහයක් නොමැතිව පැහැදිලි වන අතර, දරන්නා විසින් ණය මුදලේ දළ වශයෙන් ක්‍රමක්ෂය පිරිවැය පෙර ගෙවීම් සඳහා අවසරය ඇති වැනි ණය මුදලේ නිහිත විකල්පයක් ලෙස පෙර ගෙවීම් වැන්නකි. |
| | 12 ඡේදය | මෙම ප්‍රමිතිය අනුව අස්තිත්වයක් එහි සත්කාරක ගිවිසුමකින් නිහිත ව්‍යුත්පන්නයක් වෙන් කිරීමට අවශ්‍ය වේ නම්, නමුත් අත්පත් කරගැනීමේදී හෝ පසු එන මූල්‍ය වාර්තාකරන කාලපරිච්ඡේදයකදී නිහිත ව්‍යුත්පන්නය වෙන්ව, මිණුම්කිරීම නොහැකි නම්, අස්තිත්වය සම්පූර්ණ දෙමුහුන් (සංයුක්ත) ගිවිසුමක් ලාභ හා අලාභ කාණ්ඩය හරහා සාධාරණ අගයට නම් කළ යුතුය. සමාන ආකාරයේ දෙමුහුන් (සංයුක්ත) ගිවිසුමක සාධාරණ වටිනාකම ලාභ හෝ පාඩු හරහා ගණන් ගැනෙන වර්ගයෙන් ඉවත්කොට යළි වර්ගීකරණයේදී වෙන් කල යුතුව තිබෙන ගැබ් වී ඇති ව්‍යත්පන්නය වෙනම මැනීමට අස්තිත්වයට නොහැකිවන්නේ නම් එම වර්ගීකරණය තහනම්ය. එවැනි අවස්ථාවල දී දෙමුහුන් (සංයුක්ත) ගිවිසුම ලාභ හෝ අලාභ හරහා එය සම්පූර්ණයෙන්ම සාධාරණ අගයට වර්ගීකරණය පවතී. |
| | 13 ඡේදය | අස්තිත්වයකට විශ්වාසදායක ලෙස ඒවායේ නියමයන් හා කොන්දේසි පදනම් කරගෙන, නිහිත ව්‍යුත්පන්නයක සාධාරණ අගය නිර්ණය කළ නොහැකි නම් (උදාහරණ වශයෙන්, නිහිත ව්‍යුත්පන්නයක් මිල කියුම් නොලත් ස්කන්ධ සාධන පත්‍ර මත පදනම් වීම හේතුවෙන්) නිහිත ව්‍යුත්පන්නයේ සාධාරණ අගය වන්නේ දෙමුහුන් (සංයුක්ත) සාධන පත්‍රයේ සාධාරන අගය සහ සත්කාරක ගිවිසුමේ සාධාරණ අගය අතර වෙනසයි. මෙම ක්‍රමය භාවිතා කර අස්තිත්වයක නිහිත ව්‍යුත්පන්නයක සාධාරණ අගය අතර වෙනසයි. මෙම ක්‍රමය භාවිතා කර අස්තිත්වයක නිහිත ව්‍යුත්පන්නයක සාධාරණ අගය නිර්ණය කළ නොහැකි නම්, 12 වන ඡේදය ව්‍යවහාර වන අතර දෙමුහුන් (සංයුක්ත) සාධන පත්‍රය ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට නම් කළ යුතුය. |
| | ශීර්ෂය | හඳුනා ගැනීම හා ප්‍රති හඳුනාගැනීම |
| | ශීර්ෂය | මූලික හඳුනා ගැනීම |
| | 14 ඡේදය | අස්තිත්වය විසින් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වගකීමක් එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනා ගත යුත්තේ, අස්තිත්වය සාධන පත්‍රයේ ගිවිසුම්ගත ප්‍රතිපාදනවලට පාර්ශ්වකරුවෙක් වන කල්හි සහ එම අවස්ථාවේදී පමණි ( මූල්‍ය වත්කම් මිලදී ගැනීමේ විධිමත් ආකාරය සම්බන්ධව 38 ඡේදය බලන්න). |

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකල / එකතුකළ ඡේද |
|---|---|---|
| | **ශීර්ෂය** | **මූල්‍ය වත්කමක් ප්‍රති හඳුනා ගැනීම** |
| | 15 ඡේදය | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන්හි, 16.-23 ඡේද සහ පරිශිෂ්ඨ අ හි අද 34--52 ඡේද ඒකාබද්ධ මට්ටමේදී ව්‍යවහාර වේ. එබැවින් අස්තිත්වයක් LKAS 27 සහ SIC -12- ඒකාබද්ධ කිරීම විශේෂ කාර්යය අස්තිත්වයන් ප්‍රකාරව සියලුම පරිපාලිතයන් ඒකාබද්ධ කර ඊට පසු 16-.23 ඡේද සහ පරිශිෂ්ඨ ආ හි, අද 34 - අද 52 ඡේදයෙන් ප්‍රතිඵලය වන සමූහයට ව්‍යවහාර කරනු ලබයි. |
| | 16 ඡේදය | ප්‍රති හඳුනා ගැනීම කොතෙක් දුරට 17-.23 ඡේදයන් යටතේ උචිතද යන්න ඇගයීමක් කිරීමට පෙර සහ මූල්‍ය වත්කමකට හෝ කොටසකට (හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසකට) හෝ මූල්‍ය වත්කමක (හෝ සමාන මූල්‍ය වත්කමක් සමූහයක) පහත පරිදි සම්පූර්ණයෙන් ඒ ඡේදයෙන් ව්‍යවහාර කළ යුතුද යන්න අස්තිත්වයක් නිර්ණය කරයි.<br><br>(අ) මූල්‍ය වත්කම් කොටසකට 17--23 ඡේද ව්‍යවහාර කිරීමට (හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසකට) ප්‍රතිහඳුනාගැනීම සඳහා සලකා බැලීමට පහත සඳහන් කොන්දේසි තුනෙන් එකක් හෝ සපුරාලන්නේ නම් පමණකි:<br><br>(i) එම කොටස සමන්විත වන්නේ මූල්‍ය වත්කමක නිශ්චිතව හඳුනාගත් මූල්‍ය ප්‍රවාහවලින් පමණක් වීම (හෝ සමාන මූල්‍ය වත්කමේ සමූහයක) උදාහරණයක් ලෙස, අස්තිත්වයක් පොළී අනුපාතිකවල කොටසකට ඇතුළත් වන විට එමගින් ප්‍රතිපාර්හවය පොළී මුදල් ප්‍රවාහවල හිමිකම ලබාගනී. එහෙත් ණය සාධන පත්‍රයක ප්‍රධාන මූල්‍ය ප්‍රවාහවල හිමිකම නොලැබේ. පොළී මුදල් ප්‍රවාහ සඳහා 17-23 ඡේද ව්‍යවහාර වේ.<br><br>(ii) එම කොටස සමන්විත වන්නේ මූල්‍ය වත්කමේ මුදල් ප්‍රවාහයේ සම්පූර්ණ සමානුපාතික (ප්‍රමාණ කළ) වන ප්‍රමාණයකින් පමණයකින් (හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයකි). උදාහරණයක් ලෙස, අස්තිත්වය ගිවිසුමකට ඇතුළත් වන විට, එමගින් ප්‍රතිපාර්ශවය ණය සාධන පත්‍රයේ සියලු මුදල් ප්‍රවාහවලින් සියයට 90 අයිතිය ලබාගත් විට 17. 23 ඡේදයන් ව්‍යවහාර කළ යුත්තේ එම මුදල් ප්‍රවාහවලින් සියයට 90 ක් දක්වා පමණි. එක ප්‍රතිපාර්ශවයකට වඩා සිටින විට, පවරණ අස්තිත්වයට සම්පූර්ණ සමානුපාතික කොටස තිබේ නම් පමණක්, සෑම ප්‍රතිපාර්ශවයකටම මුදල් ප්‍රවාහයේ සමානුපාතික කොටසක් ලැබීම අවශ්‍ය නොවේ.<br><br>(iii) එම කොටස මූල්‍ය වත්කමේ විශේෂිතව හඳුනාගත් මුදල් ප්‍රවාහයේ කොටසෙහි (හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක) සම්පූර්ණ සමානුපාතික (ප්‍රමාණ කල) වන ප්‍රමාණයක් පමණක් සමන්විත වෙයි. උදාහරණ ලෙස, අස්තිත්වය එකඟවීමකට ඇතුළත් වන විට, එමගින් ප්‍රතිපාර්ශවය මූල්‍ය සාධන පත්‍රයේ පොළී මුදල් ප්‍රවාහයන්ගෙන් සියයට 90 අයිතිය ලබා ගන්නා විට, 17. 23 ඡේද ව්‍යවහාර කරනුයේ එම මුදල් ප්‍රවාහවලින් සියයට 90 සඳහා පමණි. එක ප්‍රතිපාර්ශවයකට වඩා ඇති කල්හි, පවරණ අස්තිත්වය සම්පූර්ණ සමානුපාතික කොටස තීබේ නම් පමණක් සෑම ප්‍රතිපාර්ශවයකටම විශේෂිතව හඳුනාගත් මුදල් ප්‍රවාහයේ සමානුපාතික කොටසක් ලැබීම අවශ්‍ය නොවේ.<br><br>(ආ) සියලුම වෙනත් සිද්ධීන්වලදී, 17-23 ඡේදයන් මූල්‍ය වත්කම්වලට සම්පූර්ණයෙන්ම ව්‍යවහාර වෙයි (හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයකට සම්පූර්ණයෙන්ම). උදාහරණ ලෙස අස්තිත්වයක් විසින්<br><br>(i) මූල්‍ය වත්කමකින් (හෝ මූල්‍ය වත්කමේ සමූහයක) පළමු හෝ අවසාන සියයට 90ක් මුදල් එකතු කිරීමේ අයිතිය හෝ (ii) ලැබිය යුතු මුදල් ප්‍රවාහ |

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකල / එකතුකළ ඡේද |
|---|---|---|
| | | සමූහයෙන් සියයට අනූව දක්වා අයිතිය, පවරන නමුත් ලැබිය යුතු මුදලින් සියයට 8 දක්වා ණය හානි සඳහා ගැණුම්කරුට වන්දි ගෙවීමට ඇපකරයන් සකසන විටකදී 17-23 ඡේදයන් සමස්ථ මූල්‍ය වත්කම්වලට (හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයකට) ව්‍යවහාර වෙයි.<br><br>17-26 ඡේදයන්හි 'මූල්‍ය වත්කම්' යන පදය එක්කෝ ඉහත (අ) හි හඳුනාගත් මූල්‍ය වත්කම්වල කොටසකට (සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) හෝ එසේ නැතහොත් හඳුනාගත් මූල්‍ය වත්කම් (හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක්) සමස්ථයක් සඳහා යොමු වෙයි. |
| | 17ඡේදය | අස්තිත්වයක් මූල්‍ය වත්කමක් ප්‍රති හඳුනා ගැනීම කළ යුත්තේ පහත සඳහන් අවස්ථාවක දීම පමණක් විය යුතුය:<br><br>(අ) මූල්‍ය වත්කමෙන් වන මුදල් ප්‍රවාහයන් සඳහා වූ ගිවිසුම්ගත අයිතීන් කල් ඉකුත්වීම;<br><br>හෝ<br><br>(ආ) එය 18 සහ 19 ඡේදයන්හි නියමකර ඇති මූල්‍ය වත්කම් පැවරීමක් සහ පැවරීම 20 වන ඡේදය ප්‍රකාර ප්‍රති හඳුනා ගැනීම සඳහා සුදුසුකම් ලබා තිබීම. (විධිමත් ආකාරයේ මූල්‍ය වත්කම් විකුණන ආකාරය සඳහා 38 වන ඡේදය බලන්න) |
| | 18 ඡේදය | අස්තිත්වයක් මූල්‍ය වත්කමක් පැවරීම පහත සඳහන් දැවලින් එකක් සපුරාලන්නේ නම් පමණි:<br><br>(අ) එක්කෝ මූල්‍ය වත්කම්වල මුදල් ප්‍රවාහය ලැබීමට ඇති ගිවිසුම්ගත අයිතිය පැවරීම;<br><br>හෝ<br><br>(ආ) මූල්‍ය වත්කම්වල මුදල් ප්‍රවාහ ලැබීම සඳහා අයිතිය රඳවා ගන්නා නමුත්, 19 වන ඡේදයේ කොන්දේසිවලට එකඟව අර්ථලාභීන් එක්කෙනෙකුට හෝ වැඩි ගණනකට මුදල් ප්‍රවාහයන් ගෙවීමේ ගිවිසුම්ගත බැඳීම් භාර ගැනීම. |
| | 19 ඡේදය | අස්තිස්වයක් මූල්‍ය වත්කමක (මුල් වත්කම) මුදල් ප්‍රවාහය ලැබීමට ඇති ගිවිසුම්ගත අයිතිය රඳවා ගන්නා කල්හි, නමුත් අස්තිත්ව එකකට හෝ වැඩි ගණනකට (අවසාන අර්ථලාභි) එම මුදල් ප්‍රවාහ ගෙවීමට ගිවිසුම්ගත බැඳීමක් භාරගැනීමේදී අස්තිත්වය ගණුදෙනුව මූල්‍ය වත්කමක් පැවරුමක් ලෙස සලකනුයේ පහත සඳහන් කොන්දේසි තුනම සපුරාලන්නේ නම් පමණි:<br><br>(අ) මුල් වත්කමෙන් එකතු කර ගන්නා සමාන වටිනාකමක් වේ නම් හැර අවසාන අර්ථලාභීන්ට ගෙවීමට වෙනත් බැදීමක් අස්තිත්වයට නොමැත. අස්තිත්වය විසින් දෙනු ලබන කෙටි කාලින ණය අත්තිකාරම් මුදලට අමතරව, එයට වෙළඳ පොළ අනුපාතිකය මත උපචිත පොළිය සම්පූර්ණයෙන්ම ආපසු අයකර ගැනීම මෙම කොන්දේසි කඩකිරීමක් නොවේ.<br><br>(ආ) ගිවිසුමේ පැවරීමේ කොන්දේසී මගින්, අවසාන අර්ථලාභීන්ට මුදල් ප්‍රවාහ ගෙවීම සඳහා බැඳීම වෙනුවෙන් ඇපයක් ලෙස තැබීමට හැර මුල් වත්කම විකිණීම හෝ ඔඩපනය කිරීම අස්තිත්වයට තහනම් කර තිබීම.<br><br>(ඇ) අවසාන අර්ථලාභීන් වෙනුවෙන් එකතු කර ගනු ලබන මුදල් ප්‍රවාහ සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව ප්‍රේෂණය කිරීමේ බැදීම අස්තිත්වයකට තිබීම. මීට අමතරව අස්තිත්වයකට අවසාන අර්ථලාභීන්ට අවශ්‍ය ප්‍රේශන කිරීමේදී මුදල් හෝ මුදලට සමාන දෑ එකතු කර ගැනීම හා නිරවුල් කිරීමේ කෙටි කාලපරිච්ඡේදය හැර වෙනත් ලැබෙන මුදල් ප්‍රවාහය ආයෝජනයට අස්තිත්වයට හිමිකමක් නැත. එවැනි ආයෝජනවලින් ලැබෙන පොළිය අවසාන අර්ථලාභීන්ට ලබාදිය යුතුය. |

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකල / එකතුකළ ඡේද |
|---|---|---|
| | 20 ඡේදය | අස්තිත්වයක් මුල්‍ය වත්කමක් පවරන කල්හි (18 ඡේදය බලන්න) මුල්‍ය වත්කමක අයිතියේ අවදානම් සහ ප්‍රතිලාභ රඳවා ගන්නා ප්‍රමාණයන් ඇගයීම් කළ යුතුය. මෙම සිද්ධියේදී :<br><br>(අ) අස්තිත්වයක් මුල්‍ය වත්කමක අයිතියේ අවදානම් සහ ප්‍රතිලාභ සියල්ලම සහිතව පවරයි නම්, අස්තිත්වය මුල්‍ය වත්කම ප්‍රති හඳුනාගත යුතු වීම සහ පැවරුම් කිරීමේදී උපදවාගත් හෝ රඳවාගත් යම් අයිතියක් සහ බැඳීමක් වන්නේ හෝ වගකීම් ලෙස වෙන්ව හඳුනාගත යුතුය.<br><br>(ආ) මුල්‍ය වත්කමේ සෑහෙන පමණට සියලුම අවදානම් සහ ප්‍රතිලාභ අස්තිත්වය රදවා ගන්නේ නම් අස්තිත්වය මුල්‍ය වත්කම තවදුරටත් අඛණ්ඩව හඳුනාගත යුතුය.<br><br>(ඇ) අස්තිත්වය මුල්‍ය වත්කමක අයිතියේ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සෑහෙන දුරට පවරා හෝ රඳවා ගෙන නොමැති නම් , අස්තිත්වය විසින් එම වත්කමේ පාලනය රඳවා ගෙන තිබේද යන්න නිර්ණය කළ යුතුය. මෙම සිදධියේ දී :<br><br>(i) අස්තිත්වය පාලනය රඳවාගෙන නැත්නම් අස්තිත්වය මුල්‍ය වත්කම ප්‍රති හඳුනාගැනීම අත්හල යුතු අතර, පැවරීමේ දී ඇති වූ හෝ රඳවාගත් යම් අයිතියක් හෝ බැඳීමක් වෙන් වෙන් වශයෙන් වගකීමක් හෝ වත්කමක් ලෙස හඳුනාගත යුතුය.<br><br>(ii) අස්තිත්වය පාලනය රඳවාගෙන ඇත්නම්, අස්තිත්වය එම මුල්‍ය වත්කමේ අඛණ්ඩව සම්බන්ධතාවයේ ප්‍රමාණයට තවදුරටත් හඳුනාගත යුතුය (30 ඡේදය බලන්න). |
| | 21. ඡේදය | පැවරුම් කළ වත්කම් පැවරුමට පෙර සහ පසුව ශුද්ධ මුදල් ප්‍රවාහයන්හි වටිනාකම සහ කාල නියමයන්හි විචල්‍යතා වලින් අස්තිත්වයේ අනාවරණය වීම් මගින් අවදානම් සහ ප්‍රතිලාභ (20 ඡේදය බලන්න) අගයනු ලැබේ. පැවරීමේ ප්‍රතිඵලයක් ලෙස මුල්‍ය වත්කම් වල අනාගත මුදල් ප්‍රවායන්හි වර්තමාන අගය අනාවරණය සැලකිය යුතු ලෙස වෙනස් නොවේ නම්, අස්තිත්වය මුල්‍ය වත්කමේ අයිතියේ අවදානම් සහ ප්‍රතිලාභ සියල්ලක්ම වාගේ රඳවාගෙන ඇත<br><br>(උදා. අස්තිත්වය මුල්‍ය වත්කම් විකුණා ඇත්තේ ඒවා ස්ථාවර මිලකට හෝ ණය හිමියාගේ ප්‍රතිලාභය විකිණුම් මිලට එකතු කර එය ආපසු මිලදී ගැනීමේ එකගතාවයකට යටත්වයි). මුල්‍ය වත්කම ආශ්‍රිතව අනාගත ශුද්ධ මුදල් ප්‍රවාහයන්හි වර්තමාන අගයේ සම්පූර්ණ විචල්‍යතාවට , සම්බන්ධයේ එවැනි විචල්‍යතාවයටත් එහි අනාවෘත තවදුරටත් සැලකිය යුතු තරම් නොවන්නේ නම්, මුල්‍ය වත්කමේ අයිතිය සඳහා වන සියලුම අවදානම් සහ ප්‍රතිලාභ අස්තිත්වය විසින් පැවරුම් කර ඇත. (උදා : අස්තිත්වයක් ප්‍රතිමිලදී ගන්නා වේලාවේ ඇති සධාරණ අගයට ප්‍රති මිලදී ගැනීමට යන විකල්පය යටතේ පමණක් මුල්‍ය වත්කමක් විකුණා ඇති විටක හෝ ණය උප. සහාගිත්ගිත්වයක් වැනි එකගවීමක දී, විශාල මුල්‍ය වත්කමකින් සම්පූර්ණ සමානුපාතික මුදල් ප්‍රවාහවල කොටසක් පැවරීමේ හේතුව නිසා එය 19 වන ඡේදයේ කොන්දේසි සපුරාලයි). |
| | 22 ඡේදය | අස්තිත්වයක් අයිතියේ අවදානම් සහ ප්‍රතිලාභ සියල්ල සෑහෙන ප්‍රමාණයක් පැවරීම හෝ රඳවාගැනීම බොහෝ විට පැහැදිලි අතර, කිසිඳු ගණනය කිරීමක් කිරීම අවශ්‍ය නොවේ. වෙනත් සිද්ධීන්වලදී පැවරුමට පෙර සහ පසු අස්තිත්වයක අනාගත ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කර සහ සැසඳීම මගින් විචලතාවයන්ට අස්තිත්වයේ අනාවෘතය දැනගැනීම අවශ්‍ය වෙයි. ගණනය කිරීම සහ සැසඳීම කරනුයේ උචිත වර්තමාන වෙළඳපොල පොළී අනුපාතිකය, වට්ටම් අනුපාතිකය ලෙස භාවිතා කිරීමෙනි. බොහෝ දුරට සිදුවිය හැකි ප්‍රතිඵලයකට වඩා බරතැබූ ශුද්ධ මුදල් ප්‍රවාහයට සාධාරණ ලෙස විය හැකි විචලතාවයන් සලකා බලනු ලබයි. |

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකල / එකතුකළ ඡේද |
|---|---|---|
| | 23 ඡේදය | පැවරූ වත්කමේ පාලනය අස්තිත්වය රඳවාගෙන තිබේද යන්න (20(ඇ) ඡේදය බලන්න) රඳා පවතින්නේ පැවරුම්ලාභියාගේ වත්කම විකිණීමට ඇති හැකියාව මතය. පැවරුම්ලාභියා ඒ ආකාරයෙන්ම සම්පූර්ණයෙන් සම්බනධතාවයක් නැති තුන්වන පාර්ශවයකට වත්කම විකිණීමේ ප්‍රායෝගික හැකියාවක් ඇත්නම් සහ පැවරුම සම්බන්ධයෙන් අමතර සීමාවන් පැනවීමේ අවශ්‍යතාවයකින් තොරව එම හැකියාව ඒක පාර්ශව ක්‍රියාත්මක කළ හැකි නම්, එවිට අස්තිත්වය පාලනය රඳවාගෙන නොමැත. අනෙකුත් සෑම සිද්ධියකදීම අස්තිත්වය පාලනය රඳවාගෙන ඇත. |
| **ශීර්ෂය** | **ප්‍රතිහඳුනාගැනීම සඳහා සුදුසුකම් ලබන පැවරුම්<br>20 (අ) සහ ඈ (i) ඡේද බලන්න.** | |
| | 24 ඡේදය | අස්තිත්වයක් මූල්‍ය වත්කමක් පැවරුම් කරන්නේ නම්, පැවරීමේ දි එය ප්‍රති හඳුනා ගැනීම් සඳහා මුළුමනින්ම සුදුසුකම් ලැබීම මූල්‍ය වත්කම ගාස්තුවක් සඳහා සේවා සැපයීමේ අයිතිය රඳවාගෙන තිබෙන විට එය එක්කෝ එම සේවා සපයන ගිවිසුමේ සේවා සපයන වත්කමක් හෝ සේවා සපයන වගකීමක් ලෙස හඳුනාගත යුතුය. ලැබීමට නියමිත ගාස්තුව අස්තිත්වය විසින් සේවා සැපයීමේ කාර්යය ඉටුකිරීම සඳහා හානිපූර්ණයට ප්‍රමාණයත් නොවේයැයි අපෙක්ෂා කරන්නේ නම් සේවා බැඳීම සඳහා සේවා සැපයිමේ වගකීම එහි සාධාරණ අගයට හඳුනාගත යුතුය. ලැබීමට නියමිත ගාස්තුව සේවා සැපයීම සඳහා හානි පූර්ණ ප්‍රමාණවත් වඩා වැඩියයි අපේක්ෂා කරන්නේ නම්, සේවා සැපයීමේ අයිතිය සඳහා වූ වටිනාකම නිර්නය කළ යුත්තේ 27 වන ඡේදය ප්‍රකාරව විශාල මූල්‍ය වත්කමේ ධාරණ වටිනාකම වෙන් කිරීම පදනම් කරගෙනය. |
| | 25 ඡේදය | පැවරුමක ප්‍රතිඵලයක් වශයෙන් මූල්‍ය වත්කමක් මුළුමන්ම ප්‍රති හඳුනාගත්තේ නම්, නමුත් පැවරුමේ ප්‍රතිඵලය අස්තිත්වය අළුත් මූල්‍ය වත්කමක් ලබා ගැනීම හෝ අළුත් වගකීමක් භාර ගැනීම හෝ වගකීමක් නඩත්තු කිරීම නම් අස්තිත්වයක අළුත් වත්කමක්, මූල්‍ය වගකීමක් හෝ වගකීමක් නඩත්තු කිරීම සාධාරණ අගයට හඳුනාගත යුතුය. |
| | 26 ඡේදය | මූල්‍ය වත්කමක් මුළුමනින්ම ප්‍රති හඳුනා ගැනීමේ දි, පහත සඳහන් කරුණු අතර වෙනස ලාභය හෝ අලාභයෙහි හඳුනාගත යුතුය.<br>(අ) ධාරණ අගය සහ<br>(ආ) (i) ලැබුණ ප්‍රතිඡ්ඨාව (ලබාගත් යම් අළුත් වත්කම් වලින් භාර ගත් යම් වගකීම් අඩුකර, ඒවා ඇතුලත්ව ); සහ<br>(ii) වෙනත් විස්තීර්ණ ආදායම් වල හඳුනාගත් යම් සමුච්චිත ප්‍රතිලාභ සහ අලාභ (55 ආ ඡේදය බලන්න). වල එකතුව |
| | 27 ඡේදය | පැවරුම් කළ වත්කම විශාල වත්කමේ කොටසක් නම්, (උදා ඃ අස්තිත්වයේ ණය සාධන පත්‍රයක කොටසක් වන පොලී සඳහා මුදල් ප්‍රවාහ පැවරුමක දී (16 අ) ඡේදය බලන්න) සහ පැවරුම් කරන ලද කොටස මුළුමනින්ම ප්‍රති හඳුනා ගැනීම සඳහා සුදුසුකම් ලබයි නම්, පැවරුම් කළ දින එම කොටස් වල සාපෙක්ෂ සාධාරණ වටිනාකම පදනම් කරගෙන විශාල මූල්‍ය වත්කමේ මීට පෙර ධාරණ අගය අඛණ්ඩව හඳුනාගෙන ඇති කොටස් සහ ප්‍රතිහඳුනාගත් කොටස් අතර බෙදා වෙන් කළ යුතුය. මෙම අරමුණ සඳහා රඳවාගත් නඩත්තු වත්කම අඛණ්ඩව හඳුනාගන්නා කොටස ලෙස සැලකිය යුතුය. පහත සඳහන් කරුණු අතර වෙනස;<br>(අ) ඉවත්කල කෙටසකට බෙදා වෙන්කල ධාරණ අගයේ කොටස; සහ<br>(ආ) (i) ඉවත් කළ කොටස සඳහා ලැබුණු ප්‍රතිඡ්ඨාව (ලබාගත් යම් අළුත් වත්කමකින්, පවරාගත් යම් වගකීමක් ඇතුළුව) සහ |

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකල / එකතුකළ ඡේද |
|---|---|---|
| | | (ii) වෙනත් විස්තීර්ණ ආදායම් වල හඳුනාගත් යම් සමුච්චිත ප්‍රතිලාභ හෝ අලාභ (55(අ) ඡේදය බලන්න) වල එකතුව.ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනාගත යුතුය.<br><br>වෙනත් විස්තීර්ණ ආදයම්වල හඳුනාගත් සාමුච්චිත ප්‍රතිලාභ හෝ අලාභ එම කොටස් වලට සාපෙක්ෂ සාධාරණ වටිනාකම පදනම්කර අඛණ්ඩව හඳුනාගන්නා සහ ප්‍රති හඳුනාගත් කොටස් අතර බෙදා වෙන් කළ යුතුය. |
| | 28 ඡේදය | අස්තිත්වයක් විශාල මූල්‍ය වත්කමක පෙර ධාරණ අගය, අකණ්ඩව හඳුනාගත යුතු කොටස සහ ප්‍රති හඳුනාගත් කොටස අතර බෙදා වෙන් කරන කල්හි, අඛණ්ඩව හඳුනා ගන්නා අවශ්‍ය කොටසේ සාධාරණ අගය නිර්ණය කිරීම අවශ්‍ය අස්තිත්වයට අඛණ්ඩව හඳුනා ගතයුතු කොටස් හා සමාන කොටස් විකිණීමේ ඉතිහාසයක් ඇති කල්හි හෝ එවැනි කොටස් සඳහා වෙනත් වෙළඳ ගණුදෙනු පැවතීම තත්‍ය ගණුදෙනුවල මෑතක මිල ගණන් ඒවායේ සාධාරණ අගය ගැන හොඳම ඇස්තමේන්තුව සපයයි.<br><br>මිල කියුම් හෝ අඛණ්ඩව හඳුනා ගන්නා කොටසේ සාධාරණ අගය තහවුරු කරන මෑතක වෙළඳ ගනුදෙනු නොමැති කල්හි, සාධාරණ අගයේ හොඳම ඇස්තමේන්තුව, සමස්ථයක් ලෙස විශාල මූල්‍ය වත්කමේ සධාරණ අගය සහ ප්‍රතිහඳුනාගත් කොටස සඳහා පැවරුම් ලාභියාගෙන් ලැබුණු ප්‍රතිෂ්ඨාව අතර වෙනසයි. |
| **ශිර්ෂය** | **ප්‍රති හඳුනා ගැනීම සඳහා සඳහා සුදුසුකම් නොලබන පැවරුම් (20(ආ) ඡේදය බලන්න)** | |
| | 29 ඡේදය | පැවරුම් කල වත්කමේ අයිතිය අවදානම් සහ ප්‍රතිලාභ සැහෙන ප්‍රමානයකට අස්තිත්වයේ රඳවාගැනීමේ හේතුව නිසා එහි ප්‍රතිඵලය ලෙස ප්‍රතිහඳුනා ගැනීමත් නොවේ නම් පැවරූ වත්කම අකණ්ඩව සම්පූර්ණයෙන් හඳුනාගන්නා අතර, ලැබුණු ප්‍රතිෂ්ඨාව සඳහා මූල්‍ය වගකීම හඳුනාගත යුතුය. පසු කාලපරිච්ඡේද වලදී අස්තිත්වය පැවරීම් කළ වත්කම් මත යම් අවදානමක් සහ මූල්‍ය වගකීම් මත දැරූ යම් වියදමක් හඳුනාගත යුතුය. |
| **පැවරූ වත්කම් මත අඛණ්ඩ සම්බන්ධතාවය (20)(ඇ) (ii) බලන්න** | | |
| | 30 ඡේදය | අස්තිත්වයක් අයිතිය පැවරූ වත්කමක සියලුම අවදානම් සහ ප්‍රතිලාභ හෝ පැවරීම සැහෙන පමණට රඳවාගෙන නොහැකි නම්, සහ පැවරූ වත්කමේ පාලනය රඳවා ගෙන තිබ්මෙන් අස්තිත්වය පැවරූ වත්කමේ එහි අඛණ්ඩ සම්බන්ධතාවේ ප්‍රමාණයට අස්තිත්වය අඛණ්ඩව හඳුනාගත් පැවරූ වත්කමේ අස්තිත්වයේ අඛණ්ඩ සම්බන්ධතාවයේ ප්‍රමාණය වනුයේ, පැවරූ වත්කමේ වටිනාකම වෙනස් වීමට එය අනාවරණය වී ඇති ප්‍රමාණයයි. උදාහරණයක් ලෙසඃ<br><br>(අ) අස්තිත්වයේ අඛණ්ඩ සම්බන්ධතාව පවරන ලද වත්කමේ ඇපවීමේ සමරූපයක් ගන්නා කල්හි, අස්තිත්වයේ අඛන්ඩ සම්බන්ධතාවයේ ප්‍රමාණය වනුයේ (i) වත්කමේ වටිනාකම සහ (ii) අස්තිත්වයේ ආපසු ගෙවිය යුතු වන ලැබුණු ප්‍රතිෂ්ඨාවේ ප්‍රමාණය (ඇප වූ ප්‍රමාණය) යන දෙකෙන් අඩු එකය.<br><br>(ආ) අස්තිත්වයේ අඛණ්ඩ සම්බන්ධතාවය පවරන ලද වත්කමේ ලිඛිත හෝ මිලදී ගත විකල්පයක (හෝ දෙකම) ස්වරූපය ගන්නා කල්හි, අස්තිත්වයේ අඛණ්ඩ සම්බන්ධතාවයන්හි ප්‍රමාණය වන්නනේ, එම පැවරූ වත්කම අස්තිත්වය ප්‍රතිමිලදීගැනීමේ වටිනාකම විය හැකිය. කෙසේ වෙතත්, වත්කම් සාධාරණ අගයට මනිනූ ලබන ලිඛිත ගැනුම් විකල්ප සිද්ධියක දී, අස්තිත්වයේ අඛණ්ඩ සම්බන්ධතාවයේ ප්‍රමාණය පැවරූ වත්කමේ සාධාරණ අගය සහ විකල්ප ක්‍රියාත්මක කිරීමේ මිල (අැද 48 ඡේදය බලන්න) සහ වටිනාකම් වලින් අඩු වටිනාකම වේ. |

| ප්‍රමිතය | පවත්නා ජේදය යොමු කිරීම | ආදේශකල / එකතුකළ ජේද |
|---|---|---|
| | | (ඇ) අස්තිත්වයේ අකණ්ඩ සමබන්ධතාවය පවරන ලද වත්කමේ මුදලින් නිරවුල් කිරීමේ විකල්පය හෝ සමාන ප්‍රතිපාදනවල ස්වරූපය ගන්නා කල්හි, අස්තිත්වයේ අඛණ්ඩ සම්බන්ධතාවයේ ප්‍රමාණය, ඉහත (ආ) හි දක්වා ඇති මුදල් නොවන බේරුම් විකල්පය ලෙස ලැබෙන ප්‍රතිඵලය එම ආකාරයටම මිණුම් කරනු ලැබේ. |
| | 31. ඡේදය | අස්තිත්වය අඛණ්ඩ සම්බන්ධතාවයේ ප්‍රමාණය අඛණ්ඩව හඳුනාගන්නා කල්හි, අස්තිත්තයේ ආශ්‍රිත වගකීම් ද හඳුනාගත යුතුය. මෙම ප්‍රමිතියේ වෙනත් මැනීමේ අවශ්‍යතා නොසලකා පැවරූ වත්කම සහ ආශ්‍රිත වගකීම් මැනිය යුත්තේ අස්තිත්වය රඳවාගත් අයිතීන් සහ බැඳීම් පිළිබිඹු වන පදනම මතය. ආශ්‍රිත වගකීම් මනිනුයේ පැවරූ වත්කමේ සහ වගකීමේ ශුද්ධ ධාරණ අගය දැක්වෙන ආකාරයටය. ඒ අනුවඃ<br><br>(අ) පැවරූ වත්කම් ක්‍රමක්‍ෂය පිරිවැයට මනින්නේ නම්, අස්තිත්වය රඳවාගත් අයිතීන් සහ බැඳීම් වල ක්‍රමක්‍ෂය පිරිවැය; හෝ<br><br>(ආ) ස්වාධීන පදනම මත මිනුම් කරන කල්හි වත්කම, මනින්නේ සාධාරන අගයට නම් අස්තිත්වය මගින් රඳවාගත් අයිතීන් සහ බැඳීම සාධාරණ අගයට සමානව. |
| | 32 ඡේදය | පැවරූ වත්කමක් මත ඇති වන යම් ආදායමක් තවදුරටත් අස්තිත්වය අඛණ්ඩව පවත්නා සම්බන්ධතා ප්‍රමාණයට හඳුනාගත යුතු අතර ආශ්‍රිත වගකීමක් මත දරන ලද යම් වියදමක් ද හඳුනාගත යුතුය. |
| | 33 ඡේදය | පසුව මිණුම් කිරීමේ කාර්යය සඳහා පැවරූ වත්කමේ සාධාරන අගයේ හඳුනාගත් වෙනස්වීම් සහ ආශ්‍රිත වගකීම් 55 වන ඡේදය ප්‍රකාර සංගතව ගිණුම්ගත කල යුතුය. එකිනෙකට හිලව් නොකළ යුතුය. |
| | 34 ඡේදය | අස්තිත්වයේ අඛන්ඩ සම්බන්ධතාවය මූල්‍ය වත්කමේ කොටසකට පමණක් නම් (උදා අස්තිත්වය පැවරූ වත්කම් කොටසක් ප්‍රතිමිලදී ගැනීමට විකල්පයක් රඳවාගෙන ඇති කල්හි හෝ අස්තිත්වය අවශේෂ කොටසක් රඳවාගැනීමේ ප්‍රතිඵලය ලෙස අස්තිත්වයේ අවදානම් සහ ප්‍රතිලාභ වලින් සැහෙන කොටසක් රඳවාගත නොහැකි සහ අස්තිත්වයේ පාලනය රඳවාගෙන ඇති) අස්තිත්වය මූල්‍ය වත්කමේ කලින් ධාරණ අගය අකණ්ඩ සම්බන්ධතාවය යටතේ තවදුරටත් හඳුනාගෙන ඇති කොටස් සහ පැවරුම්කරන දින තවදුරටත් සාධාරණ අගය පදනම මත රඳවා නොගන්නා ලෙස හඳුනා ගන්නා කොටස අතර වෙන් කරයි. මෙම කාර්යය සඳහා 28 වන ඡේදයේ අවශ්‍යතා ව්‍යවහාර වෙයි. පහත කරුණු අතර වෙනස්කම්<br><br>(අ) තවදුරටත් හඳුනා නොගත් කොටසට වෙන් කළ ධාරණ අගය; සහ<br><br>(ආ) (i) තවදුරටත් හඳුනා නොගත් කොටස සඳහා ලැබුණු ප්‍රතිශ්‍යාව සහ<br><br>(ii) එයට වෙන් කළ වෙනත් විස්තිරණ ආදායමේ හඳුනාගත් යම් සමුච්චිත ප්‍රතිලාභ හෝ අලාභ (55 ආ ඡේදය බලන්න) වල එකතුව,ලාභයේ හෝ අලාභයේ හඳුනාගත යුතුය.වෙනත් විස්තීර්ණ ආදායමෙහි හඳුනාගෙන ඇති සමුච්චිත ප්‍රතිලාභ සහ අලාභ අඛංඩව හඳුනාගන්නා කොටස් සහ එම කොටස් වල සාපෙක්ෂ සාධාරණ අගය මත අඛංඩව හඳුනා නොගන්නා කොටස අතර වෙන් කල යුතුය. |
| | 35 ඡේදය | පැවරූ වත්කමක් ක්‍රමක්‍ෂය පිරිවැයට මනින්නේ නම්, ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට ලෙස මූල්‍ය වගකීමක් නම් කිරීමට මෙම ප්‍රමිතියේ ඇති විකල්පය ආශ්‍රිත වගකීමක් සඳහා අදාළ නොවේ. |

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකල / එකතුකළ ඡේද |
|---|---|---|
| | | **ශීර්ෂය සියළුම පැවරුම්** |
| | 36 ඡේදය | පැවැරුම වත්කමක් තවදුරටත් හඳුනාගන්නේ නම් වත්කම සහ ආශ්‍රිත වගකීම් එකිනෙකට හිලව් නොකළ යුතුය. එමෙන්ම, අස්තිත්වය පැවරූ වත්කමෙන් ලැබෙන ආදායමක්, ආශ්‍රිත වගකීම් මත දරූ යම් වියදමක් සමග හිලව් නොකළ යුතුය (LKAS 32, 42 වන ඡේදය බලන්න). |
| | 37 ඡේදය | පවරන්නා, පැවරුම් ලාභියාට මුදල් නොවන අතිරේක ඇපයක් (ණය හෝ ස්කන්ධ සාධන පත්‍ර) සපයා ඇත්නම්, පවරන්නා සහ පැවරිම් ලාභියා ඇපය සඳහා ගිණුම් තැබීම රදා පවතින්නේ, පැවරුම්ලාභියාට අතිරේක ඇපය විකිණිම හෝ නැවත ඔඩපනය අයිතිය තිබේ ද සහ පවරන්නා පැහැර හැරියේ ද යන්න මතය. පවරන්නා සහ පැවරුම් ලාභියා අතිරේක ඇප සඳහා පහත සඳහන් පරිදි ගිණුම්තැබිය යුතුය:<br><br>(අ) ගිවිසුමක් හෝ පුරුදු අනුව පැවරුම්ලාභියාට අතිරේක ඇපය විකිණිමට හෝ ඔඩපනය කිරීමට අයිතිය ඇත්නම්, එවිට පවරන්නා එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ (උදා : ණයට දුන් වත්කමක්, ඔඩපනය කරන ලද ස්කන්ධ සාධන පත්‍ර හෝ ලැබියයුතු ප්‍රතිමිලදීගත් දෑ) එම වත්කම් අනෙක් වත්කම් වලින් වෙන් කොට යලි විග්‍රහ කළ යුතුය.<br><br>(ආ) පැවරුම්ලාභියා එයට ඔඩපනය කළ අතිරේක ඇපය විකුණන්නේ නම්, එය විකිණිමෙන් ලැබුණු මුදල් සහ ආපසු දීමට ඇති අතිරේක ඇප බැදීම් සඳහා වගකීම් සාධාරණ අගයට මනිනන ලද වගකිම හඳුනා ගත යුතුය<br><br>(ඇ) පවරන්නා ගිවිසුමේ නියමයන් යටතේ කොන්දෙසි පැහැරහැරීම සහ තවදුරටත් අතිරේක ඇපය නිදහස් කිරීමේ හිමිකමක් නොමැති නම්, අතිරේක ඇපය ප්‍රතිහඳුනාගත යුතු අතර, පැවරුම්ලාභියා අතිරේක ඇපය එහි වත්කමක් ලෙස මුලින් මිණුම්කල සාධාරණ අගයට හඳුනාගත යුතු වීම හෝ දැනටමත් අතිරේක ඇපය විකුණා ඇත්නම් අතිරේක ඇපය ආපසු භාරදීමට ඇති බැදීම ප්‍රති හඳුනාගත යුතුය.<br><br>(ඈ) ඉහත (ඇ) හි ප්‍රතිපාදන කර ඇති පරිදි හැර තවදුරටත් පවරන්නා අතිරේක ඇපය එහි වත්කමක් ලෙස පවත්වා ගෙන යා හැකි අතර, පැවරුම්ලාභියා අතිරේක ඇපය වත්කම් ලෙස හඳුනා නොගත යුතුය. |
| | **ශීර්ෂය** | **මූල්‍ය වගකීමක් ප්‍රති හදුනා ගැනීම** |
| | 38 ඡේදය | විධිමත් ක්‍රමයේ මූල්‍ය වත්කම් මිලදී ගැනීම හෝ විකිණිම අදාළ වන පරිදි වෙළඳ දිනයේ ගිණුම්කරනය හෝ බේරුම් කරන දිනයේ ගිණුම්කරණය භාවිතා කරමින් හඳුනා ගැනීම් සහ ප්‍රති හඳුනා ගැනීම කල යුතුය (අ පරිශිෂ්ඨයෙහි අද53 - අද-56 ඡේද බලන්න). |
| | **ශීර්ෂය** | **මූල්‍ය වගකීමක් ප්‍රති හදුනා ගැනීම** |
| | 39 ඡේදය | අස්තිත්වයක් මූල්‍ය වගකීමක් (හෝ මූල්‍ය වගකීමක කොටසක්) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන්, එහි පැවැත්ම අහෝසිවන කල්හිදි පමණක් ඉවත් කළ යුතුය. එනම්, ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති බැදීම ඉටු කිරීම හෝ අවලංගු කිරීම හෝ කාලය ඉකුත් වූ කල්හි. |
| | 40 ඡේදය | සැහෙන පමණට වෙනස් වූ නියමයන් සහිත ණය සාධන පත්‍ර දැනට සිටින ණය ගැණුම්කරුවෙකු සහ ණය දෙනුලබන්නන් අතර හුවමාරුවක දී, මුල් මූල්‍ය වගකීමේ පැවැත්ම අහෝසි ලෙස සහ නව මූල්‍ය වත්කමක් හඳුනාගැනීම සඳහා ගිණුම්ගත කළ යුතුය. එමෙන්ම, පවත්නා මූල්‍ය වගකීමක හෝ එයින් කොටසක කොන්දෙසි සැහෙන පමණට වෙනස් කිරීම (ණයගැතියාගේ මූල්‍ය අපහසුතාවලට ආරෝපිතව හෝ නව මූල්‍ය වගකීමක් හඳුනාගත් ලෙස ගිණුම්ගත කළ යුතුය). |

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකල / එකතුකළ ඡේද |
|---|---|---|
| | 41 ඡේදය | පැවැත්ම අහෝසි වූ මූල්‍ය වගකීමක (හෝ මූල්‍ය වගකීමේ කොටසක) හෝ වෙනත් පාර්ශවකට මාරුකල ප්‍රතිශ්ඨාව සහ යම් මුදල් නොවන වත්කමක් හෝ භාරගත් වගකීමක් ඇතුළත්ව, මේ අතර ඇතිවන වෙනස ලාභයේ හෝ අලාභයේ හඳුනාගත යුතු ය. |
| | 42 ඡේදය | අස්තිත්වයන් මූල්‍ය වගකීමක කොටසක් ප්‍රතිමිලදී ගත්තේ නම් අස්තිත්වය විසින් මූල්‍ය වගකීමේ පෙර ධාරණ වටිනාකම අඛංඩව හඳුනා ගත යුතු වන විට සහ ප්‍රති හඳුනාගත්නා කොටස් අතර ප්‍රතිමිලදී ගන්නා දින එම කොටස්වල සාපේක්ෂ සාධාරණ අගයන් පදනම මත වෙන්කල යුතු ය. (අ) ප්‍රති හඳුනාගත් කොටස සඳහා වෙන් කල ධාරණ අගය සහ (ආ) පැවරූ වත්කමේ යම් මුදල් නොවන වත්කම් ඇතුලුව හෝ භාරගත් වගකීම් ඇතුළත්ව ගෙවූ ප්‍රතිශ්ඨාව අතර වෙනස ප්‍රති හඳුනාගත් කොටස සඳහා ලාභයේ හෝ අලාභයේ හඳුනාගත යුතු ය. |
| | **ශීර්ෂය** | **මිණුම් කිරිම** |
| | **ශීර්ෂය** | **මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් මූලික මැනීම්** |
| | 43 ඡේදය | මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වගකීමක් මූලිකව හඳුනාගත් කල්හි, අස්තිත්වය විසින් එය මැනිය යුත්තේ එහි සාධාරණ අගයට සහ එයට ලාභ හෝ අලාභ මගින් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වගකීමක් සාධාරණ අගයට නොවන සිද්ධියක දී, මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වගකීම අත්පත්කරගැනීම හෝ නිකුත් කිරීම සඳහා සෘජුව ආරෝපණය වූ ගනුදෙනු කිරීමේ පිරිවැය එකතු කිරීමෙනි. |
| | 44 ඡේදය | අස්තිත්වයක් පිරිවැයට හෝ ක්‍රමක්ෂය පිරිවැයට පසුව මනින ලබන වත්කමක්, ගිණුම්කරනයේ දී නිරවුල් කරන දිනය භාවිතා කළ කල්හි, එම වත්කම මූලිකව හඳුනාගත යුත්තේ වෙළඳ දින එහි සාධාරණ අගයටය (පරිශිෂ්ඨ අ හි, අද 53- අද 56 ඡේද බලන්න). |
| | | **මූල්‍ය වත්කම් පසුව මැනීම** |
| | 45 ඡේදය | මූලික හඳුනාගැනීමෙන් පසුව මූල්‍ය වත්කමක් මැනීමේ කාර්යය සඳහා මෙම ප්‍රමිතිය නමවන ඡේදයේ නිර්වචනය කර ඇති පරිදි මූල්‍ය වත්කම් පහත සඳහන් ප්‍රභේද හතරකට වර්ග කරනු ලබයි:<br>(අ) ලාභ හෝ අලාභය හරහා සාධාරණ අගයට මූල්‍ය වත්කම්;<br>(ආ) කල්පිරෙන තෙක් තබාගන්නා ආයෝජන;<br>(ඇ) ණය සහ ලැබිය යුතු දෑ; සහ;<br>(ඈ) විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්<br><br>මෙම ප්‍රමිතිය යටතේ මැනීම සහ ලාභ හෝ අලාභ හඳුනාගැනීම සඳහා මෙම ප්‍රභේද ව්‍යවහාර කෙරේ. අස්තිත්වයක් මූල්‍ය ප්‍රකාශනයන්හි තොරතුරු ඉදිරිපත් කරන කල්හි, මෙම ප්‍රභේද සඳහා වෙනත් විස්තර භාවිතා කළ හැකිය. අස්තිත්වයන් SLFRS 7 මගින් අවශ්‍ය තොරතුරු සටහන් මගින් හෙළිදරව් කළ යුතු ය. |
| | 46 ඡේදය | මූලික හඳුනාගැනීමෙන් පසුව අස්තිත්වයක් මූල්‍ය වත්කම වන ව්‍යුත්පන්නයන් ද ඇතුළත්ව ඒවා සාධාරණ අගයට මිනුම් කල යුතු අතර එසේ කිරීමේ දී විකුණුම් හෝ ඉවත්කිරීම සඳහා එයට වැය වූ ගනු දෙනු පිරිවැය සඳහා යම් අඩුකිරීමක් නොකෙර්. මෙය අදාළ වන්නේ පහත සඳහන් මූල්‍ය වත්කම් වලට හැරය:<br>(අ) 9 වන ඡේදයෙහි නිර්වචනය කර ඇති පරිදි ණය සහ ලැබිය යුතු දෑ, සඵල පොළී අනුපාතික ක්‍රමය භාවිතාකරමින් ක්‍රමක්ෂය පිරිවැයට මිණුම් කල යුතු; |

| ප්‍රමිතය | පවත්නා ජේදය යොමු කිරීම | ආදේශකල / එකතුකළ ජේද |
|---|---|---|
| | | (ආ) 9 වැනි ඡේදයෙහි නිර්වචනය කර ඇති පරිදි කල් පිරීමට තබා ඇති ආයෝජන, සඵල පොලී අනුපාතික ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට මිණුම් කළ යුතු; සහ<br>(ඇ) සක්‍රීය වෙළඳපොළක මිල කියුම්ලත් වෙළඳපොළ මිලක් නොමැති ස්කන්ධ සාධන පත්‍ර ආයෝජන සහ ඒවායේ සාධාරණ වටිනාකම විශ්වාසදායක ලෙස සාධාරණ වටිනාකම මිණුම් කළ නොහැකි සහ සම්බන්ධ ව්‍යුත්පන්න එවැනි මිල කියුම් නොලත් ස්කන්ධ සාධනපත්‍ර භාරදීම මගින් නිරවුල් කළ යුතු ඒවා පිරිවැයට මැනිය යුතු ය (අ පරිශිෂ්ටයෙහි අ.උ. 80 සහ අ.උ. 81 ඡේද බලන්න).<br><br>ඉදිරි රැකුම අයිතම ලෙස නම් කරන ලද මූල්‍ය වත්කම් මැනිය යුත්තේ 89-102 ඡේදයන් හි ඉදිරි රැකුම් ගිණුම්කරණයේ අවශ්‍යතාවයන්ට යටත්වය. ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම් හැර අන්සියලු මූල්‍ය වත්කම් 58 - 70 ඡේද සහ පරිශිෂ්ට ඇති අහි. 84 - අ.උ. 93 ඡේද ප්‍රකාරව හානිකරණය සඳහා සමාලෝචනයට යටත්ව මැනිය යුතුවේ. |
| | **ශීර්ෂය** | **මූල්‍ය වගකීම් පසුව මැනීම** |
| | 47 ඡේදය | මූලික හඳුනාගැනීමෙන් පසුව අස්තිත්වයක් පහත දැ හැර, සියලුම මූල්‍ය වගකීම් සඵල පොලී ක්‍රමය භාවිතාකර ක්‍රමක්ෂය පිරිවැයට මැනිය යුතුයː<br>(අ) ලාභය හෝ අලාභය හරහා මූල්‍ය වත්කම් සාධාරණ අගයට, එවැනි වගකීම්, වන ව්‍යුත්පන්නයන් ද ඇතුලුව සාධාරණ අගයට මැනිය යුතු නමුත්, මිල කියුම් නොලත් ඒවායේ සාධාරණ අගය විශ්වාසදායක ලෙස සාධාරණ අගයට මැනිය නොහැකි ස්කන්ධ සාධන පත්‍ර භාරදීම මගින් නිරවුල් කිරීමට සම්බන්ධ ව්‍යුත්පන්න වගකීම් අත්හල යුතු අතර ඒවා මැනිය යුත්තේ පිරිවැයටය.<br>(ආ) මූල්‍ය වත්කමක් පවරන කල්හි, ප්‍රතිහඳුනා ගැනීම සඳහා සුදුසුකම් නොලබන හෝ අඛණ්ඩ සම්බන්ධතා ප්‍රවේශය ව්‍යාවහාරවන කල්හි, මූල්‍ය වගකීම් පැන නගී. එවැනි මූල්‍ය වගකීම් මැනීම සඳහා 29 හා 31 ඡේද ව්‍යවහාර වෙයි.<br>(ඇ) මූල්‍ය ඇපකර ගිවිසුම් 9 වැනි ඡේදයෙහි නිර්වචනය කර ඇත. මූලික හඳුනාගැනීමෙන් පසුව, එවැනි ගිවිසුම් නිකුත් කරන්නා (47 (අ) හෝ (ආ) ඡේද ව්‍යවහාර නොවේ නම්) පහත සඳහන් ඒවායින් වැඩි අගයකට මැනිය යුතු යː<br>(i) LKAS 37 ප්‍රකාර නිර්ණය කළ වටිනාකම; සහ<br>(ii) මූලිකව හඳුනාගත් වටිනාකමෙන් (43 වැනි ඡේදය බලන්න) උචිත කල්හි, LKAS 18 ප්‍රකාර හඳුනාගත් සමුච්චිත ක්‍රමක්ෂය අඩුකර ;<br>(ඇ) වෙළඳපොළ පොලී අනුපාතිකයට අඩුවෙන් ණය මුදල් සැපයීමට වන බැඳීමක්. මූලික හඳුනාගැනීමෙන් පසුව එවැනි බැඳීමක් ඇති නිකුත් කරන්නෙකු (47(අ) ඡේදය ව්‍යවහාර නොවේ නම්) පහත සඳහන් ඒවායින් වැඩි අගයකට මැනිය යුතුයː<br>(i) LKAS 37 ප්‍රකාර නිර්ණය කළ වටිනාකම ; සහ<br>(ii) මූලිකව හඳුනාගත් වටිනාකමෙන් (43 වැනි ඡේදය බලන්න) උචිත කල්හි LKAS 18 ප්‍රකාර හඳුනාගත් සමුච්චිත ක්‍රමක්ෂය අඩුකර,<br>ඉදිරි රැකුම් අයිතම ලෙස නම්කර ඇති මූල්‍ය වගකීම් ඉදිරි රැකුම් ගිණුම්කරණය සඳහා වන 89 - 102 ඡේදයන්හි අවශ්‍යතාවලට යටත් වෙයි. |
| | **ශීර්ෂය** | **සාධාරණ අගය මැනීමේ ප්‍රතිෂ්ඨාව** |

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකල / එකතුකළ ඡේද |
|---|---|---|
| | 48 ඡේදය | මෙම ප්‍රමිතිය LKAS 32 හෝ SLFRS 7 ව්‍යවහාර කිරීමේ අරමුණ සඳහා මූල්‍ය වත්මක හෝ මූල්‍ය වගකීමක සාධාරණ අගය නිර්ණය කිරීමේ දී අස්තිත්වයක් පරිශිෂ්ට අ හි අළ69 - අළ 82 ඡෙදයන් ව්‍යවහාර කල යුතු ය. |
| | 48 අ ඡේදය | සාධාරණ වටිනාකම ගැන හොඳම සාක්ෂිය වන්නේ සක්‍රිය වෙළඳ පොලක මිල කියුම්ලත් මිලයි. මූල්‍ය සාධන පත්‍ර සඳහා වෙළඳ පොල ක්‍රියාකාරී නොවේ නම්, අස්තිත්වයක් තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රමයක් භාවිතා කරමින් සාධාරණ වටිනාකම ස්ථාපනය කරයි. තක්සේරු කිරීමේ ශිල්පක්‍රමයක් භාවිතා කිරීමේ පරමාර්ථය සාමාන්‍ය ව්‍යාපාරික ප්‍රතිශ්ඨාවක් මගින් අතේදුර හුවමාරුවක මිණුම් කරන දිනට අභිප්‍රේරණය වූ ගණුදෙනුවක වෙළඳ මිල කුමක්දැයි ස්ථාපනය කිරීමයි. තක්සේරු කිරීමේ ශිල්පක්‍රමයන්ට දැනුම සහ කැමැත්ත ඇති පාර්ශව අතර අතේ දුරින් සිදුවන වර්තමාන වෙළඳපොල ගනුදෙනු භාවිතා කිරීම, පවතින්නේ නම් බොහෝ දුරට සමාන වෙනත් සාධන පත්‍රයක වර්තමාන සාධාරන අගයට යොමු කිරීම, වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහ විශ්ලේෂණ සහ විකල්ප මිල කිරීමේ ආදර්ශය ද ඇතුලත් වෙළඳපොල සහභාගිවන්නන් විසින් සාධන පත්‍ර මිල කිරීමට පොදුවේ භාවිතා කරන තක්සේරු කිරීමේ ශිල්පක්‍රමයන් ඇත්නම්, සහ එම ක්‍රමවේදය සත්‍ය වෙළඳපොලේ ගනුදෙනුවල ලබා ගන්නා මිල ඇස්තමේන්තුවල විශ්වාසදායක බව නිරූපණය කර තිබීමෙන්, අස්තිත්වය ඒ ක්‍රමවේදය භාවිතා කරයි. තෝරාගත් තක්සේරු ශිල්පක්‍රමය වෙළඳපොළ යෙදවුම් උපරිම ලෙස භාවිතා කරන අතර, අස්තිත්වය විශේෂිත වූ යෙදවුම් මත අඩුවෙන් විශ්වාසය තබයි. වෙළඳපල සහභාගිවන්නන් මිල නියම කිරීමේ දී සලකා බලන සියළුම සාධක සංයුක්ත කරන අතර, මූල්‍ය සාධන පත්‍ර මිල කිරීම සඳහා පිළිගත් ආර්ථික ක්‍රමවේද සමඟ සංගත වේ. විටින් විට අස්තිත්වයක් ශිල්පක්‍රමවල එහි වලංගුතාවය පරීක්ෂා කිරීමට එම සාධන පත්‍රවය (එනම් වෙනස් කිරීමකින් සහ යළි තක්සේරු කිරීමකින් තොරව) හෝ නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපොළ දත්නා මිල ගණන් භාවිතා කළ ප්‍රමාණ සංශෝධන කිරීමක් කරයි. |
| | 49 ඡේදය | ඉල්ලුවිට ගෙවීමේ ලක්ෂණ සහිත මූල්‍ය වගකීමක සාධාරණ අගය (උදා ඉල්ලුවිට ගෙවීමේ තැන්පතු) ඉල්ලුම මත ගෙවිය යුතු මුදලට අඩු නොවන පළමු දිනයෙන් වට්ටම් කර ගෙවීමට අවශ්‍ය කරන වටිනාකම වේ. |
| | **ශීර්ෂය** | **යලි වර්ගීකරණය** |
| | 50 ඡේදය | අස්තිත්වයක් :<br>(අ) ව්‍යුත්පන්නයක් රඳවා ගැනීම හෝ නැවත නිකුත් කරන අතර ලාභය හෝ අලාභය හරහා ප්‍රභේදයෙන් සාධාරණ අගයට ඉවත් කර යලි වර්ගීකරණය නොකළ යුතුය.<br>(ආ) අස්තිත්වයක් විසින් එය මුල් හඳුනාගැනීම මත ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයකට නම් කරන ලද නම්, යම් මූල්‍ය සාධන පත්‍රයක් ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට යන ප්‍රභේදයෙන් ඉවත් කර යලි වර්ගීකරණය නොකළ යුතුය.<br>(ඇ) 50 ආ හෝ 50 ඇ ඡෙදයන්හි අවශ්‍යතා සපුරාලන්නේ නම්, මූල්‍ය සාධන පත්‍රයක් ඉතා මෑතක (මූල්‍ය වත්කම අත්පත්කර ගෙන ඇත්තේ හෝ ප්‍රධාන වශයෙන් මුදල් වැය කර ඇත්තේ ඉතා මෑතක විකිණීමේ හෝ ප්‍රතිමිලදී ගැනීමේ කාර්යය සඳහා විය හැකි නමුත්) විකිණීමේ හෝ මිලදී ගැනීමේ කාර්ය සඳහා තවදුරටත් රඳවා ගෙන නොමැති නම්, එම මූල්‍ය වත්කම ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගය යන ප්‍රභේදයෙන් ඉවත්කර යලිවර්ගීකරණය කළ හැකිය.<br>මුල් හඳුනාගැනීමෙන් පසුව යම් මූල්‍ය සාධන පත්‍රයක් ලාභ අලාභ හරහා සාධාරණ අගයකට යන ප්‍රභේදයට යලි වර්ගීකරණය නොකළ යුතුය. |

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකල / එකතුකළ ඡේද |
|---|---|---|
| | 50 අ ඡේදය | 50 වන ඡේදය අරමුණු සඳහා අවස්ථාවන් පහත සඳහන් පරිදි වෙනස්වීම් ප්‍රතිවර්ගීකරණයන් නොවේ :<br>(අ) මුදල් ප්‍රවාහ ඉදිරි රැකුමක හෝ ශුද්ධ ආයෝජන ඉදිරි රැකුමක කලින් නම් කරන ලද සහ සඵල ඉදිරි රැකුම් සාධන පත්‍රයක් වූ ව්‍යුත්පන්නයන් තව දුරටත් එලෙස සුදුසුකම් නොලබයි.<br>(ආ) ව්‍යුත්පන්නයක මුදල් ප්‍රවාහ ඉදිරි රැකුමක හෝ ශුද්ධ ආයෝජන ඉදිරි රැකුමක නම් කරන ලද සහ සඵලදායි ඉදිරි රැකුමක සාධන පත්‍රයක් වේ.<br>(ඇ) රක්ෂණ සමාගමක් විසින් SLFRS 4 හි 45 වන ඡේදය ප්‍රකාර එහි ගිණුම් ප්‍රතිපත්ති වෙනස් කරන කල්හි මූල්‍ය වත්කමක් යළි වර්ගීකරණය කරයි. |
| | 50 ආ ඡේදය | 50 (ඇ) ඡේදය ව්‍යවහාර වන මූල්‍ය වත්කමක් (50 ආ ඡේදයේ විස්තර කර ඇති අවස්ථාවන්හි දී හැර ඉතා විරල අවස්ථාවල දී පමණක් ලාභ හෝ අලාභය හරහා සාධාරණ අගයකට යන ප්‍රභේදයෙන් ඉවත් කර යලි වර්ගීකරණය කළ හැකිය. |
| | 50 ඇ ඡේදය | 50 ආ ඡේදය ප්‍රකාර අස්තිත්වයක් මූල්‍ය වත්කමක් ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට යන ප්‍රභේදයෙන් ඉවත් කර යළි වර්ගීකරණය කරන්නේ නම් එම මූල්‍ය වත්කම යලි වර්ගීකරණය කල යුත්තේ, යළි වර්ගීකරණය කරන දිනය මත එහි සාධාරණ අගයටය. ලාභ හෝ අලාභ වල දැනටමත් හඳුනාගෙන ප්‍රතිලාභ හෝ අලාභ ඇත්නම්, ඒවා ප්‍රතිවර්ත්‍ය නොකළ යුතුය. ප්‍රතිවර්ගීකරණය කරන ලද දිනය මත මූල්‍ය වත්කමේ සාධාරණ අදාළ පරිදි ව්‍යවහාර කළ යුතු පරිදි එහි අළුත් පිරිවැය හෝ ක්‍රමක්‍ෂය පිරිවැය වන්නේය. |
| | 50 ඇ ඡේදය | ණය සහ ලැබිය යුතු දෑ යන නිර්වචනයේ අවශ්‍යතා සපුරාලන (මුල් හඳුනාගැනීමේ දී මූල්‍ය වත්කම වෙළඳාම සඳහා රඳවා තබාගෙන ඇති ලෙස වර්ගීර්ණය කිරීමට අවශ්‍ය නොවූවා නම්) 50 (ඇ) ඡේදය ව්‍යවහාර වන මූල්‍ය වත්කමක් පූර්වා දාශ්‍ය අනාගත කාලයක හෝ කල්පිරෙන තුරු රඳවාගැනීමට අස්තිත්වයක් හැකියාව සහ අභිප්‍රායක් ඇත්නම්, ලාභ හෝ අලාභය හරහා සාධාරණ අගයට යන ප්‍රභේදයේ එම මූල්‍ය වත්කම ඉවත් කර යළි වර්ගීකරණය කල හැකිය. |
| | 50 ඉ ඡේදය | ණය සහ ලැබිය යුතු දූ යන නිර්වචනයේ අවශ්‍යතා සපුරාලන, විකිණීම සඳහා ලබාගතහැකි මූල්‍ය වත්කමක් ලෙස වර්ගීකරණය ඇති (එය විකිණීම සඳහා ලබාගතහැකි ලෙස නම් කර නොමැති නම්) මූල්‍ය වත්කම පූර්වාදෘශ්‍ය අනාගත චිරාත්කාලයක් හෝ කල්පිරෙන තුරු රඳවා ගැනීම සඳහා හැකියාව සහ අපෙක්ෂා ඇත්නම් විකිණීම සඳහා පවත්නා යන ප්‍රභේදයෙන් ඉවත්කර, ණය සහ ලැබිය යුතු දෑ ප්‍රභේදයට යළි වර්ගීකරණය කළ හැකිය. |
| | 50 ඊ ඡේදය | අස්තිත්වයක් මූල්‍ය වත්කමක් 50 ඇ ඡේදය ප්‍රකාර, ලාභය හෝ අලාභ හරහා සාධාරණ අගයෙන් ඉවත් කර හෝ 50ඉ ප්‍රකාර විකිණීම සඳහා තබාගෙන ඇති ප්‍රභේදයන් ඉවත්කර, එය වර්ගීකරණය කරන්නේනම්, යළි වර්ගීකරණය කරන දිනට එහි සාධාරණ අගයට යළි වර්ගීකරණය කළ හැකිය. 50ඇ ප්‍රකාර ප්‍රතිවර්ගීකරණය කළ වත්කමක් සඳහා යම් ප්‍රතිලාභයක් හෝ අලාභයක් දැනටමත් ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනාගෙන ඇත්නම්, එය ප්‍රතිවර්ත්‍ය නොකල යුතුය. ප්‍රතිවර්ගීකරණය කළ දිනයේ දී මූල්‍ය වත්කමේ සාධාරණ අගය අදාළවන පරිදි එහි අළුත් පිරිවැය හෝ ක්‍රමක්ෂය පිරිවැය වෙයි. 50 ඉ ඡේදය ප්‍රකාර විකිණීම සඳහා වූ ප්‍රභේදයෙන් ඉවත්කල යළි වර්ගීකරණය කර මූල්‍ය වත්කම සඳහා කලින් යම් ප්‍රතිලාභයක් හෝ අලාභයක් 50අ ඡේදය ප්‍රකාරව වෙනත් විස්තීර්ණ අදායමෙහි හඳුනාගෙන ඇත්නම්, 54 වන ඡේදය ප්‍රකාරව ගිණුම්ගත කළ හැකිය. |

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකල / එකතුකළ ඡේද |
|---|---|---|
| | 51 ඡේදය | අභිප්‍රාය හෝ හැකියාව වෙනස්වීමේ ප්‍රතිඵලයක් ලෙස ආයෝජනයක් කල්පිරෙනතෙක් රඳවා ගන්නා ලෙස වර්ගීකරණය තව දුරටත් උචිත නොවේ නම් , එය විකිණීම සඳහා ලබාගත හැකි ලෙස ප්‍රතිවර්ගීකරණය කර එහි සාධාරණ අගයට නැවතත් මිණුම්කර එහි ධාරණ අගය සහ සාධාරණ අගය අතර වෙනස 55 (ආ) ඡේදය ප්‍රකාර ගිණුම්ගත කල යුතුය. |
| | 52 ඡේදය | සැලකියයුතු අන්දමේ නොවන වටිනාකමට වඩා වැඩි කල්පිරෙන තෙක් තබාගෙන ඇති වත්කමක් 9 වන ඡේදයේ තබාගෙන ඇති කොන්දේසි කිසිවක් සපුරාලන්නේ නැති යම් ඉතිරි කල් පිරෙනතෙක් තබා ගන්නා ආයෝජන, විකිණීම සඳහා තබාගෙන ඇති ආයෝජන ලෙස ප්‍රතිවර්ගීකරණයකදී ඒවායේ ධාරණ අගය සහ සාධාරණ අගය අතර ඇති වෙනස 55 (ආ) ඡේදය ප්‍රකාර ගිණුම්ගත කළ යුතුය. |
| | 53 ඡේදය | මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වගකීමක් විශ්වාසදායක ලෙස මැනීම සඳහා මීට පෙර එවැනි මිනුමක් නොතිබූ විශ්වාසදායක මිණුමක් ලබාගතහැකි නම්, වත්කම හෝ වගකීම සාධාරණ අගයට මිණුම් කිරීම අවශ්‍ය විශ්වාසදායක මැනීම (46 (ඇ) සහ 47 ඡේදයන් බලන්න) වත්කම හෝ වගකීම සාධාරණ අගයකට නැවත මිණුම්කළ යුතු සහ ධාරණ අගය සහ සාධාරණ වටිනාකම අතර වෙනස 55 වන ඡේදය ප්‍රකාර ගිණුම්ගත කළ යුතුය. |
| | 54 ඡේදය | අභිප්‍රාය හෝ හැකියාව වෙනස්වීමේ ප්‍රතිඵලයක් ලෙස හෝ ඉතා විරල අවස්ථාවකදී විශ්වාසදායක සාධාරණ අගයට මැණිමේ මිම්මක් තවදුරටත් ලබාගැනීමට නොමැති නම්, (46 (ඇ) සහ 47 ඡේද බලන්න) හෝ 9 වන ඡේදයේ යොමුකර ඇති, පසුවූ මුදල් වර්ෂ දෙක ගත වී තිබීම හේතුවෙන්, මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් සාධාරණ වටිනාකමකට වෙනුවට පිරිවැයට හෝ ක්‍රමක්ෂය පිරිවැයට පවත්වා ගෙන යාම උචිත වන විට එදිනට මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වගකීමේ සාධාරණ වටිනාකමේ උචිත පරිදි එහි අළුත් පිරිවැය හෝ ක්‍රමක්ෂ පිරිවැය බවට පත් වෙයි. 55 (ආ) ඡේදය ප්‍රකාර වෙනත් විස්තීර්ණ ආදායමෙහි කළින් හඳුනාගෙන ඇති ප්‍රතිලාභ හෝ අලාභ පහත සඳහන් පරිදි ගිණුම්ගත කළ යුතුය.<br><br>(අ) ස්ථාවර කල්පිරීමක් සහිත මූල්‍ය වත්කම් සිද්ධියකදී සඵල පොළී අනුපාතික ක්‍රමය භාවිතා කරමින් ප්‍රතිලාභ හෝ අලාභ කල්පිරීමට තබා ගන්නා ආයෝජන වල ඉතිරිව ඇති කාලය පුරා ලාභය හෝ අලාභයට ක්‍රම ක්‍රමයෙන් ක්ෂය කල හැකිය. අළුත් ක්‍රමක්ෂය පිරිවැය සහ කල්පිරීම වටිනාකම අතර යම් වෙනසක් අධිමිල හෝ වට්ටම් ක්‍රමක්ෂය කරන ආකාරයටම සඵල පොලී ක්‍රමය භාවිතා කරමින් මූල්‍ය වත්කමේ ඉතිරි ආයු කාලය පුරා ක්‍රමක්ෂය කළ යුතුය. මූල්‍ය වත්කම පසුව හානිකරන වී නම්, වෙනත් විස්තීර්ණ ආදායම්වල හඳුනාගෙන ඇති ප්‍රතිලාභ සහ පාඩු 67 වන ඡේදය ප්‍රකාර ස්කන්ධයෙන් ලාභය හෝ අලාභයට යළි වර්ගීකරණය කරනු ලැබේ.<br><br>(ආ) ස්ථාවර කල්පිරීමක් නොමැති මූල්‍ය වත්කම් සිද්ධියකදී, මූල්‍ය වත්කම විකිණීම හෝ වෙනත් අකාරයක ඉවත් කිරීමක් කළ කල්හි, ප්‍රතිලාභ හෝ අලාභ, ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනාගත යුතුය. මූල්‍ය වත්කම පසුව හානිකරණය වී නම් වෙනත් විස්තීර්ණ ආදායම්වල හඳුනාගෙන ඇත පෙර ප්‍රතිලාභ සහ පාඩු 67 වන, ඡේදය ප්‍රකාර ස්කන්ධයෙන් ලාභය හෝ අලාභයට යළි වර්ගීකරණය කරනු ලැබේ. |
| | **ශීර්ෂය** | **ප්‍රතිලාභ සහ අලාභය** |
| | 55 ඡේදය | ඉදිරි රැකුම් සම්බන්ධතාවයේ කොටසක් නොවන (89 .-102 ඡේද බලන්න) මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වගකීමක සාධාරණ අගය වෙනස් වීම නිසා පැන නගින ප්‍රතිලාභ හෝ අලාභ හඳුනාගත යුත්තේ පහත සඳහන් පරිදිය. (අ) ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගය |

| ප්‍රමිතය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශකල / එකතුකළ ඡේද |
|---|---|---|
| | | ලෙස වර්ගීකරණය ඇති මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වගකීමක් මත ප්‍රතිලාභ හෝ අලාභ, ලාභ හෝ අලාභ වල හඳුනාගත හැකිය. (ආ) මූල්‍ය වත්කම ප්‍රතිහඳුනාගන්නා තුරු, හානිකරන අලාභ (67-70 ඡේද බලන්න) සහ විදේශ විනිමය ප්‍රතිලාභ සහ අලාභ (පරිශිෂ්ඨ අ හි අද 83 ඡේදය බලන්න) හැර විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කමක ප්‍රතිලාභ හෝ අලාභ වෙනත් විස්තීර්ණ ආදායමෙහි කලින් හඳුනාගත් වෙනත් විස්තීරණ ආදායමේ හඳුනාගත යුතුය. එම වෙලාවේදී සමුච්ත ප්‍රතිලාභ හෝ අලාභ, ස්කන්ධයෙන් ලාභය හෝ අලාභයට ප්‍රතිවර්ගීකරණය ගැලපුමක් ප්‍රතිවර්ගීකරණය කළ යුතුය. (LKAS 1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම බලන්න (2007 සංශෝධිත)). කෙසේ වෙතත් සඵල පොළී ක්‍රමය භාවිතා කරමින් (9 වන ඡේද බලන්න) ගණනය කළ පොළිය ලාභය හෝ අලාභයෙහි හඳුනාගත යුතුය (LKAS 18 බලන්න). අස්තිත්වයට ගෙවීම, ලැබීමට ඇති අයිතිය ස්ථාපනය (LKAS 18 බලන්න) වූ කල්හි, විකිණීම සඳහා ඇති ස්කන්ධ සාධන පත්‍ර මත ලාභාංශ ලාභය හෝ අලාභයෙහි හඳුනාගනී. |
| | 56 ඡේදය | මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වගකීමක් ප්‍රතිහඳුනාගැනීම හෝ හානිකරනයවීම ක්‍රමක්ෂය ක්‍රියාවලිය හරහා ඇති වූ කල්හි, ක්‍රමක්ෂය පිරිවැයට ඉදිරිපත් කල මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වගකීමක් (46 සහ 47 ඡේද බලන්න) සඳහා ප්‍රතිලාභ හෝ අලාභ ලාභය හෝ අලාභයයෙහි හඳුනාගනී. කෙසේ වෙතත්, ඉදිරි රැකුම් අයිතම වන මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සඳහා ( 78 .84 සහ පරිශිෂ්ට අ හි අද 98 අද 101 ඡේද බලන්න) ප්‍රතිලාභ හෝ අලාභ සඳහා 89 .102 ඡේදයෙන් අනුගමනය කර ගිණුම්ගත කළ යුතුය. |
| | 57 ඡේදය | අස්තිත්වයක් නිරවුල් කිරීමේ දින ගිණුම්කරණය භාවිතා කරමින් මූල්‍ය වත්කම් හඳුනාගනී නම්, (38 වන ඡේදය සහ පරිශිෂ්ඨ අ හි අද 53 සහ අද56 ඡේද බලන්න) ලැබීමට නියමිත වත්කමේ සාධාරණ අගයට වෙළඳ දින සහ බේරුම් කිරීමේ කාල පරිච්ඡේදය අතර, කිසියම් වෙනසක් සිදුවුවහොත් එය වත්කම් වල ධාරණ පිරිවැයට හෝ ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගනු නොලැබේ (හානිකරණ අලාභ හැර). කෙසේ වෙතත්, සාධාරණ අගයට පවත්වාගෙන සාධාරණ අගයේ වෙනස්වීමක් ලාභය හෝ අලාභයෙහි හෝ විස්තීර්ණ ආදායමෙහි, 55 වන ඡේදය යටතේ උචිත පරිදි හඳුනාගත යුතුය. |
| | **ශිර්ෂය** | **මූල්‍ය වත්කම් හානිකරණ හෝ එකතු කර ගැනීමට නොහැකි වීම** |
| | 58 ඡේදය | අස්තිත්වයක් විසින් සෑම වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසානයේ මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරනය වී ඇද්දැයි යම් අරමුණු ගත සාධක කරුණු තක්සේරු කළ යුතුය. එවැනි යම් සාක්ෂියක් පවතී නම්, අස්තිත්වයේ 63 වන ඡේදය (ක්‍රමක්ෂය අගයට ඉදිරියට ගෙන ගිය මූල්‍ය වත්කම සඳහා ) 66 වන ඡේදය (මූල්‍ය වත්කම් ඉදිරියට ගෙන ගිය) යම් හාණිකරන අලාභයක් නිර්ණය කිරීමට ව්‍යවහාර කළ යුතුය. |
| | 61 ඡේදය | 59 වන ඡේදයේ සිද්ධීන් වර්ගවලට අමතරව ස්කන්ධ සාධනපත්‍රවල අයෝජනය සඳහා හානිකරණය අරමුණුගත සාක්ෂි පිළිබඳව නිකුත් කරන්නා මෙහෙයුම් කරන පරිසරයේ තාක්ෂණික වෙළඳපොල, ආර්ථික සහ නෛතික අවාසිදායක බලපෑමක් ඇති සැලකිය යුතු තොරතුරු ඇතුළත් වන අතර, ස්කන්ධ සාධනපත්‍ර ආයෝජනයේ පිරිවැය ආපසු ලබාගත නොහැකිවේද යන්න ඇඟවීම් කරයි. ස්කන්ධ සාධන පත්‍රයක ආයෝජනයේ සාධාරණ අගය සැලකිය යුතු හෝ දිගින් දිගටම එහි පිරිවැයට වඩා අඩුවීම හානිකරණය සඳහා අරමුණුගත සාක්ෂියකි. |
| | **ශිර්ෂය** | **ක්‍රමක්ෂයට පවත්නා ගෙනයන මූල්‍ය වත්කම්** |
| | 63 ඡේදය | ක්‍රමක්ෂය පිරිවැයට පවත්නා ගෙනයන ණය සහ ලැබිය යුතු දෑ හෝ කල්පිරෙන තෙක් රඳවාගෙන අති ආයෝජන මත හාණිකරන අලාභයක් ඇති වූ බවට අරමුණුගත වූ සාක්ෂි තිබේ නම්, මුල් සඵල පොළී අනුපාතිකය (එනම් මූලික හඳුනාගැනීමේ දී ගණනය |

| ප්‍රමිතිය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශ කල / එකතුකළ ඡේදය |
|---|---|---|
| | | කරන ලද සඵල පොළී අනුපාතිකය) අනුව වට්ටම් කළ අනාගත මුදල් ප්‍රවාහවල (දැරීමට සිදු නොවූ අනාගත ණය අලාභ හැර) අස්තමේන්තු කළ වර්තමාන අගය අතර වෙනසයි. වත්කමේ ධාරණ මුදල සෘජුවම හෝ දීමනා ගිණුමකින් භාවිතයෙන් අඩුකළ යුතුය. අලාභයේ ප්‍රමාණය ලාභ හෝ අලාභයේ හඳුනාගත යුතුය. |
| | **ශීර්ෂය** | **පිරිවැයට පවත්වාගෙන යන මූල්‍ය වත්කම්** |
| | 66 ඡේදය | සාධාරණ අගය විශ්වාසදායක ලෙස මැනිය නොහැකි හෝ එවැනිම මිල කියුම් නොලත් ස්කන්ධ සාධන පත්‍ර භාරදීම මගින් නිරවුල් කළ යුතු ව්‍යුත්පන්න වත්කමකට සම්බන්ධ හේතුව නිසා,හෝ සාධාරණ අගයට ඉදිරියට ගෙන නොගිය මිලකියුම් නොලත් ස්කන්ධ සාධන පත්‍ර මත හානිකරණ අලාභයක් සිදුවී ඇති බවට අරමුණුගත සාධක ඇත්නම් හානිකරණ අලාභයේ ප්‍රමාණය මිණුම්කරනුයේ මූල්‍ය වත්කමේ ධාරණ අගය සහ ඒ හා සමාන මූල්‍ය වත්කමක වර්තමාන වෙළඳපොල ප්‍රතිලාභ අනුපාතිකයෙන් වට්ටම් කරන ලද ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහ වල වර්තමාන අගය අතර වෙනස ලෙසය ( 46 (ඇ) සහ පරිශිෂ්ඨ අ හි අඋ80 සහ අඋ81 ඡේද බලන්න) එවැනි හානිකරන අලාභ ප්‍රතිවර්තනය නොකළ යුතුය. |
| | **ශීර්ෂය** | **විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්** |
| | 67 ඡේදය | වෙනත් විස්තීර්ණ ආදායමෙහි විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ පහත වැටීමක් හඳුනාගත් කල්හි සහ වත්මක හානිකරණය වූ බවට (99 වන ඡේදය බලන්න) අරමුණු ගත සාක්ෂි තිබෙන විටෙක, මූල්‍ය වත්කම ප්‍රති හඳුනාගැනීම නොකළ ද, වෙනත් විස්තීර්ණ අදායම්වල හඳුනාගත් සමුච්චිත අලාභයේ යළි වර්ගීකරණ ගැලපුමක් ලෙස ස්කන්ධයෙන් ලාභ හෝ අලාභ ලෙස යලි වර්ගීකරණය කළ යුතුය. |
| | 68 ඡේදය | 67 වන ඡෙදය යටතේ ස්කන්ධයෙන් ලාභ හෝ අලාභ වලට යළි වර්ගීකරණය කරන ලද සමුච්චිත අලාභයේ වටිනාකම විය යුත්තේ අත්පත් කර ගැනීමේ පිරිවැය (යම් මුල් මුදලේ ආපසු ගෙවීමක් සහ ක්‍රමක්ෂය අඩු කර) සහ වර්තමාන සාධාරණ අගය අතර වෙනසින් මෙයට පෙර ලාභ හෝ අලාභ යන්නයි. හඳුනාගත් මූල්‍ය වත්කම මත යම් හානිකරණ අලාභයක් අඩු කිරීමෙහි |
| | 69 ඡේදය | විකිණීම සඳහා ඇති ලෙස වර්ගීකරණය කළ ස්කන්ධ සාධනපත්‍ර වල ආයෝජනයක් සඳහා ලාභ හෝ අලාභයෙහි හඳුනාගත් හානීකරණ අලාභ, ලාභ හෝ අලාභ හරහා ප්‍රතිවර්ත්‍ය නොකළ යුතුය. |
| | 70 ඡේදය | පසුව එන කාල පරිච්ඡේදයකදී විකිණීම සඳහා ඇති ලෙස වර්ගීකරණය කළ ණය සාධන පත්‍රයක සාධාරණ අගය වැඩිවුවහොත් සහ එම වැඩිවීම ලාභ හෝ අලාභවල හානිකරණ අලාභය හඳුනාගත් පසුව සිදු වූ අරමුණු සිද්ධියකට අදාළ කළ හැකි නම්, අදාළ කළ හැකි නම් ලාභ හෝ අලාභවල හඳුනාගත් ප්‍රතිවත්‍යකර වටිනාකමින් හානිකරණ අලාභය ප්‍රතිවර්තනය කළ යුතුය. |
| | 79 ඡේදය | එබඳු ආයෝජනයක පොළී අනුපාතිකවල වෙනස්වීම්වලට ආරෝපණය කළ හැකි සාධාරණ වටිනාකමේ හෝ මුදල් ප්‍රවාහවල වෙනස්වීම් ගැන නොසලකා කල්පිරීම දක්වා තබාගැනීමේ අභිලාශය කල්පිරීමට තබා ඇති ආයෝජන ලෙස නම් කරනු ලැබීමේ දී අවශ්‍ය නිසා ණය සහ ලැබිය යුතු දෑ මෙන් නොව කල්පිරීමට තබා ඇති ආයෝජනයන් පොළී අනුපාතික අවදානම් හෝ පෙර ගෙවීමේ අවදානම් සම්බන්ධයෙන් ඉදිරි රැකුම් අයිතමයන් විය නොහැකිය. කෙසේ වෙතත්, කල් පිරෙන තෙක් රඳවා ගන්නා ආයෝජනයන් විදේශ ව්‍යවහාර මුදල් විණිමය අනුපාතිකය සහ ණය අවදානම් වෙනස්වීම සම්බන්ධ අවදානම් සඳහා ඉදිරි රැකුමක් විය හැකිය. |

| ප්‍රමිතිය | පවත්නා ඡේදය යොමු කිරීම | ආදේශ කල / එකතුකළ ඡේදය |
|---|---|---|
| | **88 (ඈ) ඡේදය** | ඉදිරි රැකුමක සඵලදායකත්වය විශ්වාසදායක ලෙස මැනිය හැකිය. එනම්, ඉදිරි රැකුම් අයිත්තමයක සාධාරණ අගය හෝ මුදල් ප්‍රවාහ සහ ඉදිරි රැකුම් සාධන පත්‍රයක සාධාරණ අගය විශ්වාසදායක ලෙස මැනිය හැකිය (සාධාරණ අගය නිර්නය කිරීම සඳහා වන උපදේශ සඳහා 46 සහ 47 ඡේද සහ පරිශිෂ්ඨ අ හි, අඋ80 සහ අඋ 81 ඡේද බලන්න). |
| | **89 (ආ) ඡේදය** | ඉදිරි රැකුම් අවදානමකට ආරෝපිත ඉදිරි රැකුම් අයිතමයක් මත ප්‍රතිලාභ හෝ අලාභ ඉදිරි රැකුම් අයිතමයේ ධාරණ වටිනාකම ගැලපිය යුතු අතර, ලාභයේ හෝ අලාභයේ හඳුනාගත යුතුය. පිරිවැයට හැර වෙනත් ආකාරයකට ඉදිරි රැකුම් අයිතමය මිණුම් කරයි නම්, මෙය ව්‍යවහාර වෙයි. ඉදිරි රැකුම් අයිතමය විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කමක් නම්, ඉදිරි රැකුම් අවදානමකට ආරෝපිත ප්‍රතිලාභ හෝ අලාභ, ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනාගැනීමට ව්‍යවහාර වෙයි. |
| | **90 ඡේදය** | ඉදිරි රැකුම් අයිතමයකට ආරෝපිත වන විශේෂිත අවදානමක් පමණක් ඉදිරි රැක්ම නම්, ඉදිරි රැකුම් අයිත්තමයේ හඳුනාගත් සාධාරණ අගයේ වෙනස්වීම්, ඉදිරි රැකුම් අවදානමට සම්බන්ධතාවයක් නොමැති නම්, 55 වන ඡේදයේ දක්වා ඇති පරිදි හඳුනාගත යුතුය. |
| | **96 (ඇ) ඡේදය** | අස්තිත්වයක විශේෂිත වූ ඉදිරි රැකුම සම්බන්ධතාවයක ලේඛනගත කළමණාකරන ක්‍රමෝපායන් ඉදිරි රැක්මේ ප්‍රතිලාභ සහ අලාභ නිශ්චිත කොටසක සඵලදායකත්වය හෝ ඉදිරි රැක්ම සාධන පත්‍රයක අදාළ මුදල් ප්‍රවාහ (74.75 සහ 88 (අ) ඡේදයන් බලන්න) තක්සේරු කිරීමේ දී බැහැර කළහොත්, එම බැහැර කළ සංරචකයේ ප්‍රතිලාභ හෝ අලාභ 55 වන ඡේදය ප්‍රකාරව හඳුනාගත යුතුය. |

03-279

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.